I NEED YOU LIKE A HEART NEEDS A BEAT...

# සීගිරි 2

2019 SPRING COLLECTION



සුජීව ප්‍රසන්න ආරච්චි

# SUJEEWA PRASANNA ARACHCHI

# සීගිරි 2

## සුජීව ප්‍රසන්න ආරච්චි

# 01

දේවක සුබ නැකතට මෙන් සීගිරි එකට පය තැබුවේය. මේ ගමන දෛවෝපගතය. අදින් පසුව වෙනස් වන්නේ දේවකගේ දෛවයද නොවේනම් මේ සීගිරි සුපර් හි දෛවයද කියා කිසිවෙක් දැනගෙන උන්නේ නැත.

"ගුඩ් මෝනිං සර්"

සීගිරි හී ආරක්ෂක නිළධාරියාට දැන් ඔහුව දැක පුරුදුය.

"ගුඩ් මෝනිං අන්කල්. ඔෆිස් එක තාම ඇරලා නැද්ද?"

"සර් ඉන්න ටිකක්. භාවනා මිස්නම් ආවා. මම අහලා එන්නම්."

දේවකගේ සිතට තුනී සහනයක් දැනුණි. 'ඔයා අද වේලාසනම ඇවිත් වගේ' ටික වෙලාවකින් ආරක්ෂක නිළධාරියා ආවේය.

"සර්ට මිස් එන්නලු."

දේවක ගියේ කාර්යාලයට පිවිසෙන තැන වූ පින්තූර ටික දෙසද බලාගෙනය. නර්මදාගේ ඡායාරූපයද එහි විය. ඔහු ගියේ අම්මාගේ පින්තූරය යන්තමට මෙන් අතගාගෙනය. 'මාව අරන් අම්මේ.' ඔහු සිතින් කීවේය. මුළින්ම තැබුවේ දකුණ පයය. ඔහු තමාට පමණක් ඇසෙන්නට 'බුදු සරණයි' කියා

පැතුවේය. එය තමාටම පතාගත් අහිංසක පැතුමක් විය.

"එන්න දේවක"

භාවනා දොර ළඟටම පැමිණ කීවාය. ඇයගේ ලස්සන ඔහු දැක්කේ එවිටය. 'උදෙන්ම දැකගන්න දාහක් වටී.' ඔහු බලාගෙන ඉන්නේ තමා දෙස බව කෙල්ල දනී. කෙල්ලගේ තොල්පට එක්වී තදවිය.

"ගුඩ් මෝනිං මිස්"

"ගුඩ් මෝනිං දේවක. ඉඳගන්න."

දේවක ඉඳගත්තේ ඇයගේ මේසය ඉදිරිපිට වූ පුටුවෙනි. එහි දාහක් දේවල් ඇත. ඔහුගේ ඇස් ගියේ එහි වූ කුඩා ටෙඩී බෙයාටය. ඇය ඇගේ අත් අකුරෙන් ලියූ ටැග් එකක් එහි එල්ලා ඇත. එහි ඇය ලියා ඇත්තේ 'යූ ආ ස්වීටර් දෑන්

එනිතිං' කියාය. එහි සරල තේරුම 'ඔයා හැමදේකටම වඩා සුන්දරයි' කියන එකය. ඔහු බලාගෙන සිටින්නේ ඒ දෙස බව ඇය දනී. කෙල්ලට දැන් ලැජ්ජය. 'ඒක දිහා මොකටද බලන්නේ පිස්සෝ'

"බනී කියන්නේ ඇත්ත තමයි මිස්."

දේවක කීවේය. කෙල්ල තොල්පට තදකරගෙන බිම බලාගත්තාය. ඔහු තත්පරයකට ඇයගේ ලස්සන ළඟට දැකගත්තේය.

"හරි."

ඇය කීවාය. භාවනා කියන්නේ දැන් කෝළං කිව්වා ඇති කියාය. දේවක පියවි සිහියට ආවේය. 'උඹත් ඕනවට වඩා වැඩියි' හිත කියයි.

"සීයා එනකොට ටිකක්

ලේට්වෙනවා"

"කමක් නෑ මිස්. මම ඉන්නම්."

භාවනා දෑස් එසෙව්වාය. අද ඔහු චාම්ය. සුදු අත්කොට කමිසයට ඔහුගෙන් පේන්නේ වෙනස්ම ලාබාළ පෙනුමකි.

"දේවක"

"කියන්න මිස්."

"දෙයක් කියන්න තියෙනවා. ප්‍රශ්නයක් නෙමේ. ඒත් මේක චුට්ටක් අහගන්න ඕන. ම්"

"හරි මිස්."

දේවක කීවේය.

"දැන් හිතන්නකෝ දේවක ලංකා ටීම් එකේ බැට්ස්මන් කෙනෙක් කියලා අපි හිතමුකෝ මහේල කියලා."

කෙල්ල කතාවට එන්නේ වටින් ගොඩිනි.

"හරි මිස්. මම මහේල ජයවර්ධන. කොල්ලා මාර බැට්ස්මන් නේද මිස්. ඩිෆෙන්සිව්නම් එහෙම ඇටෑක්නම් එහෙම. අතින් නෙමේ ගහන්නේ ඔළුවෙන්"

ඔහු කතාකරන්නේ එහෙමය.

"මි. ඉතින් දැන් මේ ෆයිනල් වන්ඩේ එක දිනන්නම ඕන මැච් එකක්."

"හරි මිස් නැත්නම් සීරීස් එකම ලොස්."

"මි. ඉතින් ඔන්න ඔයා එනවා. ඒ කියන්නේ කවුද?"

"මහේල"

"දැන් ඔන්න ඔයා ග්‍රව්න්ඩ් එකට එනවා. එනකොටම කැප්ටන් කියනවා මෙහෙම. ඒ කියන්නේ සංගක්කාර කියනවා"

"කොහොමද මිස්"

"අද මහේල සෙන්චරියක් දාන්නම ඕන නැත්නම් අපි ලොස් කොල්ලෝ කියලා."

දේවක ඒ මුව දෙස බලාගෙනම උන්නේය

"හරි මිස්"

"එතකොට වට් ආ යූ ඩුයින්."

"ගහන්න කියන්නේ සෙන්චරියක්නේ මිස්."

"ම්."

"ගහනවා මම ඩබල් සෙන්චරියක්. ටාගට් එකක් දෙනකොට මිස් ඒක ෆලෝ අප් කරන්න ලේසියි. නිකං වැනියන් කලූ වැනියන් වෙනවට වඩා"

භාවනාගේ පපුව ගැස්සිණා. ඊයේ ඔහු ගැන සිතද්දී තමා සිතුවේද

මෙයමම නොවේද ඇයට පුදුම ඒ දේම ඔහු කියූ එකටය.

"ආ යූ ෂුව."

"ඔව් මිස්. ඒක ෂුව. මම හරිම ආසයි මට ටාගට් දෙනවට. සේල්ස් කරද්දී ඒක ඕන මිස්. කතාවට කියන්නේ හඳට ඉලක්ක කරන්න කියලා."

"එතකොට."

"පොඩ්ඩක් මිස් වුණත් මිස් අපි තරු අතරවත් රැඳෙනවා. ෂූට් ෆො ද මූන්. ඊවන් එෆ් යූ මිස් යූ විල් ලෑන්ඩ් අමන් ද ස්ටාර්ස්. එහෙමයි කතාව මිස්"

භාවනා දේවක දෙස බලාගෙනම උන්නාය. ඇයට දැන් සැනසීමය. මින් එහාට කියන්න දෙයක් නැත. කතාවට ඔහු තිර රචනයක්ද දමා

අවසානය.

"තැන්කියු. මටත් දැනගන්න ඕන වුනේ ඔයා එහෙමද කියලා තමයි."

කෙල්ල කීවාය. දේවක බලාගෙ නම උන්නේය.

"එහෙනම් හොඳ ළමයා වගේ ඩබල් සෙන්චරියකටම ටාගට් කරන්න. ම්."

"හරි මිස්. ඒ ගැන බයවෙන්න එපා. හැබැයි මිස් පොඩි දෙයක් තියෙනවා."

"මොකක්ද?"

"මිස් දන්නවනේ විකට් දෙකක් තියෙනවා කියලා."

"ම්"

"මම මේ පැත්තේ ඉඳලා නෙලාගෙන එනකොට."

"අනිත් පැත්තේ හොඳ

පාට්නර් කෙනෙක් ඕන. ඒකනේ කියන්න යන්නේ.”

“ඔව් මිස් සංගක්කාර හරි ඩිලා හරි. එහෙනම් ගොඩම තමයි.”

“ඉතින්.”

“ඉතින් මිස් මට මේ.”

දේවක හිස කැසුවේය. භාවනා දැක්කේ කිසිවකින් ඉඳුල් නොවූ අහිංසක කොල්ලෙකි.

“බයවෙන්න එපා. මම මේ පැත්තේ ඉන්නවා. හැබැයි මට ගොඩක් බෑ. තට්ටුවක් අල්ලලා දුවලා එන්නම්. ම්”

දේවකගේ පපුව දැවීගෙන ගියේය. ‘ඔයා මේ මොනවද මිස් කියන්නේ’

“තැන්කියු මිස්. මට ඒ ඇති. ඔතන මිස් දෙන්නෙක් එහෙම

ඉන්නකොට කවුද ගහන්නේ කියන එක වැදගත් නෑ.”

“ඇයි?”

“වැදගත් වෙන්නේ මිස් පාට්නෂිප් එකනේ. පළවෙනි කඩුල්ලට හරි දෙවෙනි කඩුල්ලට හරි අගනා සම්බන්ධතාවයක් රැකගන්නයි ඕන.”

අර සිනහව ආයෙත් පහලට බේරීගෙන ආවේය. ‘ඔයා වෙන මොනවද කියනවත් වගේනේ. මාව වෙව්ලනවා’

“මේකයි. ඔයා සීගිරි එකට එනවට කැමති නැති කෙනෙක් දෙන්නෙකුත් ඉන්නවා. ඒක චුට්ටක් මතක තියාග න්න.”

භාවනා එය මුලින්ම කීවාය. ඒවා ගැන ඔහු දැනගෙන ඉන්නා එක හොඳය.

"මට තේරෙනවා මිස්. මට මිස් එහෙම වැඩකරලා හොඳට පුරුදුයි."

"මී. මේක මම කිව්වේ දේවකව බයකරන්න නෙමේ."

දේවක සිනාසුනේය. එහෙම හිනාවෙන්නේ කොහොමද කියා අසන්නට ඇයට සිතෙයි. ඒ තරම්ම ඒ සිනහව සැහැල්ලුය.

"චුට්ටක් බයකරන්න මිස්. එතකොට තමයි වැඩ කරන්නේ."

ඔහුගේ කතාව පුදුමාකාරය.

"මේවා සීයට කියන්න ඕන නෑ. සීයා කියන්න ඕන දේවල් කියයි."

"හරි මිස්"

"උදේටත් ඉතින් ඉව්වද?"

ඇය හදිස්සියේ මෙන් එයද ඇසුවාය. දේවක සිනාසුනේය.

"ඉව්වා මිස්. අප්පච්චී කාලා

යන්න ඕනනේ නැත්නම් එයා කන්නේ නෑ."

මෙහෙම පුතෙක් ලද අප්පච්චි පුදුමාකාර වාසනාවන්ත විය යුතුය.

"ඉතින් මොනවද හැදුවේ?"

"අනේ අද පුටුවෙන් නැඟිටිනකොට උදේ පහයි මිස්. ඒ නිසා මහ දෙයක් ඉව්වේ නෑ සුදු බත් හදලා පොල් සම්බෝල හදලා බිත්තර බුල්සයි දැම්මා."

භාවනා බැබලෙන දෙනෙතින් සිනාසුනාය.

"ඉතින් රහයිනේ"

දේවකට දුකය.

"එහෙම රහයි තමයි මිස්."

'මාත් එහෙම කන්න ඕන' ඇය සිතාගත්තාය.

"ඇයි පාන්දර පහ වෙනකල්

ඇහැරලා හිටියේ."

දේවක ඔහුගේ සයිඩ් බෑග් එකෙන් ෆයිල් කවරයක් ගත්තේය.

"මේ ප්‍රොජෙක්ට් ටික හැදුවා මිස්. සර්ට පෙන්නන්න ඕනනේ."

භාවනාට පුදුමය. 'ඔයා එනකොටම මම හිතුවා මේ එන්නේ සාමාන්‍ය කෙනෙක් නෙමේය කියලා. ඒකයි මට පුදුම. ඔයා වෙනුවෙන් ඊයේ රෑ අරම කතාකරපු එක ගැන දැන් මම ආඩම්බර වෙනවා'

"සීයට පෙන්නන්න. පස්සේ මම බලන්නම්."

"මම මිස් ලක්ෂ දහයක සේල්ස් ටාගට් එකක හැදුවේ."

"දහයක."

"ඔව් මිස්."

"කොච්චර දවසකින්ද?"

"මාස දෙකකින්"

ඊයේ තමා පොරොන්දු වූයේ මාස තුනකින් ලක්ෂ පහකි. එහෙත් ඔහු ඉලක්ක කර ඇත්තේ මාස දෙකකින් ලක්ෂ දහයකි. ඇයට පුදුමය.

"අපිට පුළුවන්ද දේවක?"

දේවකගේ සිනහව දිරි ගන්වන සුළුය.

"පුළුවන් මිස්. ටිකක් දුක් විඳින්න වෙයි. ඒත් පුළුවන්."

"මාත් හිතනවා දේවකට පුළුවන් කියලා."

භාවනා කීවේ එහෙමය. ඔහු දිලිසෙන දෑසින් බලාගෙන උන්නේය. වචනවල මල්ටි විටමින් ඇත.

මිහිරංග අහන්නේවත් නැතුවම භාවනාගේ කාමරයට කඩාගෙන ආවේය. ඔහු දේවකව දැක

ගැස්සුණේය.

"ගුඩ් මෝනිං සර්"

දේවක කීවේය. 'කිසිම හැදිච්ච කමක් නෑ. මොනවද දන්නේ නෑ කොළඹ හොඳම කොලේජ් එකකට ගිහින් ඉගෙන ගත්තේ. කෙනෙක් එක්ක කතාකරනකොට කාමරවලට මෙහෙම කඩාගෙන එන්නේ නෑ. ඒකවත් දන්නේ නෑ'

"කවුද මේ බබා?"

මිහිරංග නොදන්නා ගාණට ඇසුවේය. 'කොල්ලා කවුද කියලා දන්නවා. මෙයා පොර කියලා පෙන්නන්න යන්නේ දේවක ඉස්සරහ'

"ඇයි මිහිරංග අයියට මතක නැද්ද මේ දේවක? අපි අලුතින් ගන්න ප්‍රමෝෂන් මැනේජර්."

දේවක යළිත් සිනාසුනේය. එහෙත්

මිහිරංග උන්නේ ඔහුව ගණන්ගන්නේ නැතුවය.

"තාම කාවවත් අපොයින්ට් කරලා නෑනේ. ප්ලීස් ස්ටේ අවුට්සයිඩ්."

මිහිරංග කීවේ දේවකට කාමරයට පිටින් ඉන්න කියාය.

"මම මේ දේවකත් එක්ක කතාකරකර හිටියේ. දේවක ඉන්න. මිහිරංග අයියා කියන්නකෝ."

තමා කතාකරමින් ඉන්නා කෙනෙක්ව එහෙම කාමරයෙන් එළියට දාන්නට තරම් මිහිරංගට මහා මිනිහෙක් වෙන්නට ඉඩදිය නොහැක. 'මේ කොල්ලා එතකොට මං ගැන හිතන්නේ මොකක්ද? මේ කතාව ඉවරවෙනකල් එයයි එළියෙන් ඉන්න ඕන.'

"මම මිස් එළියෙන් ඉන්නම්."

දේවක එසේ කියා නැඟිට්ටේය. භාවනා මිහිරංග දෙස බැලුවේ කෝන්තියෙනි.

"මොකක්ද ඔයා ඒ කළේ මිහිරංග අයියේ. දිස් ඊස් නොට් අ ගුඩ් මැනර්."

කෙල්ල කීවේ වේදනාවෙනි.

"මේ කබ්බෝ එක මොන මැනර්ස්ද බබා. ඔයත් මුන්ව ඔළුවට ගන්න එපා. ආව ගමන් මේසේ ළඟින් වාඩිකරගෙන. මුන් එතකොට ඔළුවට එනවා. ගං ගප්පිනේ."

භාවනා සිනාසුනාය.' ගං ගප්පියෙක්ද ගෝල්ඩ් ෆිෂ් කෙනෙක්ද කියලා දවසක කොල්ලා පෙන්නයි' කෙල්ලට කියන්නට හිතෙන්නේ එහෙමය. ඒත් ඒක කියන්නට තවම වේලාසන වැඩිය.

"හරි දැන් කියන්නකෝ මොකක්ද කාරණාව කියලා. මට වැඩ තියෙනවා."

මිහිරංග සිනාසුණේය.

"මේ කබ්බා එක්කනේ බබා කතාකරකර හිටියේ මොන වැඩක්ද?"

භාවනා කට පියාගෙන උන්නේ අමාරුවෙනි.

"සීයා එයාට කියන්න කියලා දේවල් ටිකක් කිව්වා. මෙතන වැඩ කරන විදිහ. ඒකයි එක්ස්ප්ලේන් කරකර හිටියේ."

නිදහසට කරුණු කියන්නට ඕනා නැත. එහෙත් භාවනා එහෙම කීවේ මෙතන වෙන දෙයක් හිතනා නිසාය.

"මගේ බර්ත් ඩේ එක නෙක්ස්ට් සටඩේ."

භාවනා සිනාසුනාය.

"ආ. ඉතින් මොකද කරන්නේ."

"පොඩී පාටියක් දාන්න හිතන් ඉන්නේ. ඔන්න ඉස්සෙල්ලාම ඉන්වයිට් කරන්නේ බබාට."

මොනවා කියන්නද කියා ඇයට තේරෙන්නේ නැත.

"තැන්කියු. පොඩි පාටියක්ද ලොකු පාටියක්ද?"

"දන්නේ නැද්ද කොල්ලෝ ටික එනවා බබා එන්නම ඕන."

"ගෙදරනේ."

"අනේ නෑ. අපි කොල්ලෝ කෙල්ලෝ සෙට් එක විතරයි. ලේක් වීව් එකේ තියෙන්නේ. සෙවන් ටු මිඩ් නයිට්."

"මි. මම අක්කි එක්ක එන්නේ."

"අක්කා එක්ක පාටීස්වලට එන්න බෑනේ බබා. මම ඔයාව පික් කරගෙ

නම යන්නම්.”

‘හොඳට හිටී මෙයා එක්ක’ ඇය කිව්වේ නැත.

“අක්කා පව් මිහිරංග අයියේ. එහෙම එයාව දාලා මම කොහේවත් යන්නේ නෑ. ඒක මගේ ප්‍රතිපත්තිය මම එන්නම්. පුළුවන් උනොත් පොඩි අක්කිවත් එක්කගෙන එන්නම්.”

“ඔය කිව්වට අක්කා එන්නේ නෑනේ. මම පික් කරන්නම්.”

“මිහ්. එපා. මම කොහොමහරි අක්කා එක්කම තමා එන්නේ. අයියා යන්නකෝ.”

‘ගැළවෙන්නම බෑනේ මෙයා එක්ක අර කොල්ලත් බලනවා ඇති මොකෝ මේ කියලා’ භාවනාගේ හිතට සහනයක් නැත.

“දැන් මෙයාව ගන්නවා.

එහෙමද?"

"කාවද?"

"මේ මෙතන ඉඳලා ගිය කබ්බව."

"අපි මිහිරංග අයියේ අපේ ස්ටාෆ් එකට වැදගත් විදිහට කතාකරමු. මී අපි ළඟ වැඩ කරන අයනේ. එහෙම හොඳ නෑ. කබ්බෙක්ද නැද්ද කියලා ප්‍රෑ කරන්න එයාලටම චාන්ස් එකක් දෙන්න ඕන. සමහරවිට පොරවල් කියලා හිතන අය කබ්බෝ වෙන්න පුළුවන් කබ්බෝ පොරවල් වෙන්න පුළුවන්. එහෙමනේ අද කාලේ. රොයෙල් එකේ කොල්ලෝ කැපෙනවා රත්ගම මහා විද්‍යාලයේ කොල්ලෝ ටීම් එකට එනවා"

"බලමුකෝ."

"මාත් කියන්නේ ඒකම තමා. අපි බලමුකෝ"

කෙල්ල අන්තිම වචනය කිව්වේ ටිකක් බර කරය. මිහිරංග බැලුවේය. 'කබ්බා කිව්වේ මටද මේකී' ඔහු එහෙම හිතන්නේ නැත.

"අද තාත්තිත් එනවා මම හිතන්නේ"

භාවනා කීවාය.

"ඕකේ. එකක් කියන්නම් බබා. මේ සීගිරි එක ලේසියෙන් ගොඩගන්න බෑ. අපි වෙන දේකට යන්නෝන. ඒක තේරුම් ගන්නේ නෑ මේ නම්බර් වන් සුපර් මාර්කට් කම්පනි එක්ක අපිට හැරෙන්නවත් බෑ. සූ ගාලා සෙනඟ. අපරාදේ මේ ප්‍රොපටීස්."

භාවනා සිනාසුනාය.

"අපි ඒකත් බලමුකෝ මිහිරංග අයියේ. එක දෙයක්"

"මොකක්ද?"

"සීගිරි එක වහන්නේ නෑ. ඒක ෂුවර්. මැරිලා හරි අපි මේක කරනවා."

භාවනා කීවේ ඇය අත තිබූ පෑන මේසයට දමමිනි.

# 02

"සොරි. එන්න දේවක"

භාවනා එළියට පැමිණාම දේවකට කීවාය.

"අනේ ඇයි එහෙම කියන්නේ මිස්? ඒක මොකක්ද?"

ඇය දෙනෙත් ඔසවා බැලුවාය.

"සමහර දේවල් තේරුම් ගන්නෝන. හරි."

"ගොඩක් හොඳට තේරෙනවා මිස්."

දේවක කීවේය. භාවනා සිනාසුනාය. 'ඒක මට ඇති' ඇය සිතුවාය.

"සීයා ඇවිත් අපි යන්. මගේ තාත්තත් ඇවිත් ඉන්නේ. සීගිරි එකේ තාත්ති දැන් නෑ. ඒත් මේ සීගිරි එක හැදුවේ සීයයි මගේ තාත්තියි මගේ නැන්දියි. නැන්දි නැතිවුණා."

කෙල්ල දුක්බරව කීවාය. ඇය නැන්දි කිව්වේ අම්මාට බව දේවක දනී.

"අතන ෆොටෝ එකේ ඉන්නේ මිස් සුදු මල් මාලයක් දාලා."

"ම්. එයා තමයි."

"පව්"

කොල්ලාගේ මුවින් එසේ පිටවිණ. භාවනා ගැස්සී මෙන් බැලුවාය.

"යන්."

දේවකව එක්කාගෙන ආවේ කෙල්ලය. 'මං ගැන මොනවා හිතනවද දන්නේ නෑ තාත්තිත්. මේ කොල්ලෙක්ව එක්කගෙන එනකොට. මටත් චුට්ටක් විතර පිස්සු අනේ' ඇය කියන්නේ හිතටය.

මිලින්ද පමණක් නොව රඹුක්වැල්ල මහතාද නේත්‍රාද උන්නෝය. තුන්දෙනාම බලාගෙන උන්නේ දෙන්නා එකටම ආ අයුරුය. අක්කාගේ මුවඟ තුනී සිනාවක් ඇඳෙනවා කෙල්ල බලාගෙනය. ඔය සිනාව භාවනා හොඳින් දනී. 'මේකිට හොඳ ඉව' භාවනා සිතුවේ අක්කා ගැනය.

මිලින්ද දේවක දෙස බැලුවේය. කොල්ලා දකිද්දී ඔහුටද මොකක්ද හුරු පුරුදු ගතියක් දැනුණි. ඒ

කුමක්ද කියා තේරෙන්නේ නැත.

"ගුඩ් මෝනිං සර්. මෝනිං සර්."

දේවක දෙදෙනාටම එසේ කිවේය. මිලින්ද සිනාසුනේය.

"මේ ලොකු පුතේ"

"මේ දේවක තාත්තේ."

නේත්‍රා කිවාය.

"දේවක ඉඳගන්න."

මිලින්ද කීවේ කරුණාවෙනි. ඔහු එහෙමය. තද හිතක් ඇති කෙනෙක් නොවේ.

"තැන්කියු සර්."

කොල්ලා විනීත අහිංසක කොල්ලෙකි. එහෙත් සීගිරි එකට ඕනා දක්ෂ කොල්ලෙකි.

"මේ දේවක මිලින්ද සර්. අපේ ඩිපියුටි එම් ඩී. අපේ තාත්තා. සීගිරි එක හැදුවේ අපේ සීයයි තාත්තියි

අපේ නැන්දියි."

නේත්‍රා කීවාය.

"භාවනා මිස් කිව්වා මිස්."

දේවක කීවේය. 'මේකි තව මොනවා කියලද දන්නේ නෑ' නේත්‍රා සිනාබරව සිතුවාය.

"හොඳයි දේවක. අපි ඔයාව සිලෙක්ට් කරලා තියෙන්නේ. ඒත් අපි කැමතියි දැනගන්න මොනවද ඔයාට තියෙන ප්‍රොජෙක්ට් කියලා අපේ සේල්ස් අප් කරන්න."

කොල්ලා ෆයිල් එක අතට ගත්තේය. එහි කොළ දෙසීයක පමණ දේවල් විය.

"මම සර් එහෙම සේල්ස් ප්‍රමෝෂන් විසි දෙකක් හදලා තියෙන්නේ. සමහර දේවල් හරි ඉක්මනට කරන්න පුළුවන් දේවල්.

සමහර දේවල් ටිකක් කල් යනවා. තවත් සමහර දේවල්වලට අපි ටිකක් ඉන්වෙස්ට් කරන්න ඕන."

දේවක පැය එකහමාරක් පුරා එකින් එක ඒ දේවල් ගෙන පැහැදුවේය. පොඩි එකාගේ උගුරත් වියලී ගොස් යැයි මිලින්දට සිතුණි.

"චූටි මැණිකා බොන්න මොනවාහරි ගෙන්නන්න."

තාත්තා එහෙම කිව්වේ දේවල් එක දිගට පැය එකහමාරක් කතාකළ නිසා බව භාවනා දැනී.

"මේ බේකරි සෙක්ෂන් එකයි බුක් ෂොප් එකයි ඕපන් කිචන් එකයි සර් අපි හරි ඉක්මනට දාගන්න ඕන. මම ඒකට පොඩි බජට් එකක් හැදුවා. මේ ඒක."

කොල්ලා එයට යන වියදම පවා

දුන්නේය.

"ඔයා ඒකට බජට් එකකුත් හැදුවද?"

"එහෙම නැතුව බෑනේ සර්. අපේ සේල්ස් වලින් සියයට තිහක් අපිට මේකෙන් කවර් කරන්න පුළුවන්. ඒකට සර් අපි මේ එළියේ වෙනමම බ්‍රෙඩ් කැබින් එකකුත් දාන්න ඕන ඒ කියන්නේ සර් සුපර් මාර්කට් ක්‍රව්ඩ් එකට නෙමේ. මේ පාරේ යන අයට යන ගමන් සැන්ඩ්විච් බ්‍රෙඩ් එකක් කඩේ පාන් එකක් අරන් යන්න."

මිලින්ද සිනාසුනේය.

"මොකක්ද දේවක කඩේ පාන්."

ඔහු ඇසුවේය.

"කඩේ පාන් කියන්නේ සර් අච්චු පාන්වලට. අපි ඒකට දාන නම තමයි කඩේ පාන්. ඒක රසට ගන්න රෙසපි

එකත් මම ගාව තියෙනවා සර්. පාන් පිච්චෙනකොට මේ ටවුම පුරා සුවඳ යන රෙසපි එකක්"

"හා. සුවඳට."

"ඔව් සර්. ඒ සුවඳ හොඳට එනවා. අපි සුපර් මාර්කට් එක ඇතුලෙත් බ්‍රෙඩ් සේල් කරනවා එළියේ බ්‍රෙඩ් කවුන්ටරයෙත් සේල් කරනවා. මට පුළුවන් සර් මාසයක් ඇතුළත බේකරි සෙක්ෂන් එකේ සැලරියි ඒකේ ගෑස් බිල් එකයි බඩුවල වියදමයි ඇරලා නෙට් පොෆිට් ලක්ෂ අටක් හොයන්න."

මිලින්දගේ ඇස් උඩ ගියේය. ඔහු රඹුක්වැල්ල මහතා දෙස බැලුවේය.

"ෂුව"

"ඔව් සර්. අපි සර් රසම රස බටර් කේක් එකකුයි චොකලට් කේක්

එකකුයිත් දානවා. ඊට අමතරව සර් අපි තව බේකරි අයිටම් විස්සක් විතර දානවා. අපිට බේකරි සෙක්ෂන් එකට තුන්දෙනෙක් ඇති. හොඳටම ඇති දැනට."

දේවක කීවේය. භාවනා තේ අරගෙන ආවාය.

"දේවකට දෙන්න පුතේ"

කෙල්ල ඔහුට තේ එකක් දුන්නාය.

"තැන්කියු මිස්."

මිලින්ද සිනාසුනේය.

"බුක් සෙක්ෂන් එක දේවක."

දැන් මිලින්දටද ආසය.

"අපි සර් මේ පළාතටම පොත් දෙමු. බුක් ලිසිට් ඔක්කොම දෙමු. ස්ටේෂනරිත් දෙමු. ඒවා ක්‍රෙඩිට් එකට ගන්න පුළුවන් සර්. මම හොයලා බැලුවා අපිට ලස්සනට බුක් සෙක්ෂන්

එක දාන්න විතරයි තියෙන්නේ. පොඩ් උන් නැත්තේ මොන ෆැමිලි එකේද සර්. හැම කස්ටම කෙනෙක්ටම අපිට පිටු අසුවේ පොතක් හරි දෙන්න පුළුවන්. අනික මේ ටවුන් එකේ හොඳ බුක් ෂොප් එකක් නෑ. ඒ අඩුවත් අපිට පියවන්න පුළුවන්"

"ම්"

"මොකක්ද එතකොට මේ ඕපන් කිචන් එක?"

"ඒක සර් ඕපන් ලයිව් කිචන් එකක්. අර මීට් සෙක්ෂන් එක තියෙන තැනට එහායින් ඉඩක් තියෙනවා සර්. මේ ඔක්කොම අපි හදනවා සර්"

දේවක කොළය දුන්නේය. මිලින්දට පුදුමය. ඔහු විවෘත කුස්සියේ හදන දේවල් පවා ලියා ඇත.

"තාත්තේ"

"පුතේ."

"මේ අයිඩියා එක ඉස්සර නංගිත් ගෙනාවා තාත්තට මතකද?"

මිලින්ද නංගී කිව්වේ ඔහුගේ මියගිය නැගණියටය. නර්මදාටය. කොල්ලාගේ අම්මාටය. දේවකගේ මුහුණ වේදනාබරව බරවිය. 'ඒ මගේ අම්මා කියලා ඔයාලට කොහොම කවදා කියන්නද'

"මට මතකයි දේවක එදා මේක කියද්දීත් මට පුදුම හිතුණා."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඒක ෂෝක් දේවක. මිනිස්සු එහෙම දේවල්වලට කැමතියි."

"ඔව් සර්. දැන්මම නෙමේ සර්. ඒත් ටිකක් කල් ගිහින් අපි සේල්සුත් හදාගත්තට පස්සේ අපි

චළියේ පොඩි ෆුඩ් කවුන්ටරයකුත් දාමු සර්. අපේ බ්‍රෙඩ් කවුන්ටරයට එහායින්. දවල්ට අපි ලන්ච් පැකට් දෙමු. මේ ටවුන් එකේ සර් ආසාවට හොඳ ලන්ච් පැකට් එකක් නෑ සර් ගන්න. අපිට ඒ මාකට් එකත් තියෙනවා. අපි ඒක හිම්හිට කරමු සර්. අපිට වෙජිටබල් තියෙනවා මස් මාළු තියෙනවා රයිස් තියෙනවා. චෙෆ් කෙනෙක්ව දාන එක විතරයි තියෙන්නේ"

මිලින්ද සිනාසුණේය.

"ඔයා කියන්නේ සේල්ස් ප්‍රමෝෂන් එකක් නෙමේනේ දේවක. සීගිරි එක සමූහ ව්‍යාපාරයක් කරන්න ඕන කියලනේ."

රඹුක්වැල්ල මහතාද හිස වැනුවේය.

"ඒකම තමා සර් අපි කරන්නත් ඕන. අපි පුළුවන් තරම් සෙනඟක් මේ මායිමේ නවත්තගන්න ඕන. මොකක්හරි දේකට. කරන්න අමාරුත් ඒකම තමා. අපි කරන්න යන්නෙත් ඒකයි."

දේවක කීවේය. ඇවිත් ඉන්නේ ලේසි පාසු පුතෙක් නොවන බව දැන් මිලින්දද දනී. කෙල්ල ඊයේ කට්ටිය ඉදිරියේ කොල්ලා ගැන අභියෝග කළ හේතුව දැන් මිලින්ද දනී.

"අපි කරමු දේවක. ඔයා හෙට ඉඳලා වැඩට එන්න. ඔයාගේ ප්ලෑන් එක කරගෙන යන්න. නේත්‍රා මිසුයි භාවනා මිසුයි ඔයාට උදව් කරයි. ඕන වෙලාවක මටත් කතාකරන්න. මම ඔයාට හෙල්ප් කරනවා. මී."

මිලින්ද බියක් නැතුව කීවේය.

රඹුක්වැල්ල මහතා සිනාසුණේය. මිලින්ද එහෙම කෙනෙක් බව ඔහු දනී. ඔහු තීරණ ගන්න කල් ගන්නේ නැත. භාවනා ලස්සනට සිනාසුනාය. නේත්‍රා ඒ සිනහව දැක්කාය. පසුය ඇය මේසය යටින් අත දමා කෙල්ලගේ කලවා කෙනිත්තුවාය. භාවනා සිනාව තදකරගත්තේ අමාරුවෙනි.

"ලොකු දුව"

"තාත්තා."

"නිරංජන් පාවිච්චි කරපු බයික් එක දේවකට දෙන්න දේවකට ලයිසන් තියෙනවද?"

"ඔව් සර්."

"හොඳයි. එහෙනම් ඔයාව සීගිරි එකට අපි සාදරයෙන් පිළිගන්නවා හෙට ඉඳලා මේක ඔයාගේ කියලා

හිතලා වැඩ කරන්න. ම්."

"තැන්කියු සර්. තැන්කියු සෝ මච්."

දේවක මිලින්දගේ දෙනෙත් දෙස බලාගෙනම කීවේය.

"දේවක එහෙනම් පොඩ්ඩක් එළියෙන් ඉන්නකෝ. සර් ඔයාට කතාකරයි"

මිලින්ද එසේ කියා දේවකට ටිකක් එළියට යැව්වේය. ඔහු ගිය පසු මිලින්ද බැලුවේ කෙල්ල දෙසය.

"ඔයාලා කිව්වා හරි. මේ හොඳ ඔළුවක් තියෙන කොල්ලෙක්"

මිලින්ද කිව්වේය. 'ඉතින් ඒකට මම උඩ යන්නෝන නෑනේ. මගේ කොල්ලා නෙමේනේ. මොකටද මේ මගේ ඇස් කැවෙන්නේ' භාවනා සිතුවාය.

"තාත්තා."

"පුතේ."

"මේකා පුදුම එකෙක් තාත්තේ"

"අපිත් එදා කතාවුනේ ඒකයි පුතේ"

"කොල්ලගේ ප්ලෑන් එක හරි තාත්තේ. ඒක කරමු. අපිට සල්ලි ටිකක් දාන්න පුළුවන්නේ."

"සල්ලි ටිකක් දාන්න හොඳ ප්ලෑන් එකක් නැතුවනේ අපි හිටියේ."

"අපි කරමු කොල්ලා කියනවා වගේ අපි සතියක් දෙකක් සීගිරි එක වහලා දැම්මත් කමක් නෑ."

"මටත් හිතෙනවා."

මිලින්දට තවමත් හිතාගන්නට බැරි මේ කොල්ලාගෙන් හිතට දැනෙන හුරුපුරුදු ගතිය මොකක්ද කියාය. 'තාත්තා ඔයාට ගොඩක්

පැහැදිලා එයාට එහෙම ලේසියෙන් කෙනෙක්ව හිතට අල්ලන්නේ නෑ දේවක.' භාවනා කිවේ සිතිනි.

මිහිරංග කාමරයට ආවේ ඒ වෙලාවේය. 'ඔන්න ආවා උදැල්ල දාන්න' භාවනා සිතින් කීවාය. මිහිරංගගේ මුහුණ කොහොමත් හොඳම නැත. දේවකට පාට් එකක් දමන්නට ඔහු සීගිරි එක දොරඩකට එවා තිබූ මැරයන් දේවකගේ කතාවකින් බියවී ගොස් තිබුණි. 'උඹලා මොන ගොන්නුද යකෝ. උගේ මාමා ඕ අයි සී වෙන්නේ කොහොමද? මෙතන ඕ අයි සී වික්‍රමනේ.' දේවක ඔවුන්ට බැන්නෝය. කොහොමත් දේවක සමඟ ලේසිවෙන්නේ නැතැයි අද මිහිරංගට සිතුණි.

"මට ටිකක් කතාකරන්න ඕන මාමා."

මිහිරංග කීවේය. මිලින්ද බැලුවේ තේ එක අතට ගන්නා ගමන්ය.

"කතා කරමු මිහිරංග. හැබැයි එක දෙයක්."

"ඔව් මාමේ."

"මේ ගන්න කොල්ලා ගැන කතාකරන්න එපා අපි කොල්ලව සියයට සීයක් විශ්වාස කරලා තියෙන්නේ. ඒ නිසා වෙන දෙයක් ගැන කතාකරමු"

මිලින්ද කීවේය. මිහිරංග කියන්න ආවේද දේවක ගැනය.

"මේ කබ්බෝ අරන් සීගිරි එක ගොඩදාන්න පුළුවන්ද මාමේ. මොකක්ද මෙයාට මාකටින් ඩිග්‍රියක් තියෙනවද?"

මිලින්ද සිනාසුණේ රඹුක්වැල්ල මහතා දෙස බලාය.

"මේ සීගිරි එක පටන් ගත්තේ මිහිරංග මායි ඔයාගේ සීයයි නැන්දියි එකතුවෙලා හරි. අපි කාටවත් මාකටින් ඩිග්‍රියක් තිබුණේ නෑ. මාකට් එක අල්ලන්න ඉවක් ඕනේ. ඒකට මාකටින් ඩිග්‍රි ඕන නෑ."

මිලින්ද කීවේය. දැන් දේවක වෙනුවෙන් කතාකරන්නේ තමා නොව තාත්තා යැයි භාවනාට සිතුණි. ඊට වඩා සතුටක් ඇයට තවත් නැත.

"දේවක එක්ක එකතුවෙලා වැඩකරන්න මිහිරංග. අපි ඒ වගේ දක්ෂ කොල්ලන්ට තැනක් දෙන්න ඕන. කබ්බෝ කියලා ජාතියක් ලෝකේ නෑ."

මිලින්ද කීවේය. භාවනා තොල්පට

තදකරගෙන සිනාසුනාය. මිහිරංග ඒ සිනහව දැක්කේය. 'මේකී හිනාවෙන්නේ මටද' ඔහු සිතුවේය.

"දවසක මාමට තේරෙයි. සීයටත් තේරෙයි."

රඹුක්වැල්ල මහතා කතාකළේ නැත. මිහිරංග සමඟ කතාකරන එක තේරුමක් නැති දෙයකි. සුරංගිත් එකය. මිහිරංගත් එකය.

# 03

දේවක නේත්‍රාගේ මේසයට ආවේ 'යන්නම්' කියා කියන්නටය. තමාව මේ සීගිරි එකට ගැනීම පිටුපස නේත්‍රාත් භාවනාත් ඉන්නා බව දේවක හොඳින්ම දැනගෙන උන්නේය.

"මම මිස් එහෙනම් හෙට එන්නම්. මිස්ට ගොඩක් ස්තූතියි මං ගැන විශ්වාස කළාට"

දේවක නේත්‍රාගේ මේසයට පැමිණ කිවේය. නේත්‍රා තත්පරයක්

දෙකක් ඔහු දෙස බලාගෙන උන්නේය. කොල්ලාගෙන් දැනෙන හුරුපුරුදු ගතිය කුමක්ද කියා ඇයට තේරෙන්නේ නැත. 'කෙල්ලටත් මොකක්හරි දැනෙනවා ඇති. ඒකී එහෙමයි' නේත්‍රා සිතුවාය.

"ඉඳගන්නකෝ දේවක ටිකක්"

දේවක ඉඳගත්තේය.

"ටාගට් එකකට වැඩකරන්න ඕන කියලා භාවනා මිස් කියන්න ඇතිනේ. නේද?"

"ඔව් මිස්. උදේ මිස් ගොඩක් වෙලා මට ඒක පහදලා දුන්නා."

නේත්‍රා සිනාසුනාය.

"එහෙම කිව්වේ ඇයි කියලා විතරක් මම ඔයාට විතරක් කියන්නම්. මී. මේක ඔයාට අද කියන්නම ඕන. ඒක දේවක දැනගෙන

ඉන්න එක හොඳයි"

දේවක හිස වැනුවේය.

"භාවනා මිස් ඒ කියන්නේ මගේ පොඩි නංගා ඔයා වෙනුවෙන් හැමෝම ඉස්සරහ අභියෝගයක් බාරගත්තා. දේවක මාස තුනකින් සීගිරි එකේ සේල්ස් අප් කරනවා කියලා ඒ වෙනුවෙන් එයා සහතික වෙනවා කියලා. ඒක සාමාන්‍ය අභියෝගයක් නෙමේ දේවක."

දේවකගේ ඇස් යන්තමට බොඳවීගෙන ගියේය. නේත්‍රා ද එය දැක්කාය. නේත්‍රා මේ කතාව දේවකට කීවේ එච්චර කම්පනයක් කොල්ලාට ඇතිවේ කියා සිතා නොවේ.

"භාවනා මිස් එහෙම මං ගැන විශ්වාස කළානම් මිස් මම ඒ විශ්වාසය හිතුවටත් වඩා හොඳට

රකිනවා. කෙනෙක්ගේ විශ්වාසයක් රකින එක හිතට හරි සතුටක් මිස්"

දේවක කීවේය. නේත්‍රා හිස වැනුවාය.

"අපි ඒක දන්නවා. ඒත් හැමෝම ඉස්සරහ කෙල්ල තමයි ඒක කිව්වේ. එයා ලොකු අවධානමක් අරන් එහෙම කිව්වේ. ඒ නිසා අපි හොඳ කැපවීමකින් මේ වැඩේ කරමු දේවක. ම්."

"හදවතින්ම මිස්. මට මිසුත් උදව් කරනවනේ."

නේත්‍රා ලස්සනට සිනාසුනාය. නේත්‍රාට ඇත්තේ කෙනෙක්ගේ හදවත නිවාලන දයාබර සිනහවකි.

"හදවතින්ම. අපි එක රෑනක් කියලා හිතලා මේක කරමු. ම්. මම අද බයික් එක සර්විස් එකට

දාන්නම්. හෙට යනකොට අරන් යන්න බයික් එක.මි."

"හොඳයි මිස්. මම එහෙනම් යනවා මිස්. බුදු සරණයි."

නේත්‍රාට දේවක ගැන පුදුම නැත. 'කෙල්ල මේකා වෙනුවෙන් අරම චැලේන්ජ් එකක් ගත්තේ ඇයි කියලා දැන් මම දන්නවා. මොකක්ද දෙයක් තියෙනවා දේවකගේ' නේත්‍රා සිතුවාය.

යන්නට ගිය දේවක ආපසු හැරුණේය.

"ඇයි දේවක"

"නෑ මිස්. තරහ නැත්නම් මම දෙයක් අහන්නද මිස්?"

"මි අහන්න දේවක"

"මේ මිස්ගේ කකුල මෙහෙම වුනේ මිස්. ඇක්සිඩන්ට් එකකින්ද?"

නේත්‍රාට පුදුමය.

"ඔව් දේවක. වෙහිකල් ඇක්සිඩන්ට් එකකින් නෙමේ. මාව මේ ස්ටෙයා කේස් එකකින් පහළට වැටුණා. අඩි විස්සක් උඩින්"

ඒ අමිහිරි දවස් ඇය මතක් කරන්නටවත් කැමති නැත. ඒත් කොල්ලා අහද්දී ඇයට ඇත්තම කියවිණ.

"ඇයි දේවක එහෙම ඇහුවේ?"

"නෑ මිස් මම දන්න හොඳ වෙද මහත්තයෙක් ඉන්නවා උඩ පේරාදෙණියේ. එයා මෙහෙම වෙච්ච මගේ යාළුවෙක්වත් සනීප කළා. ඇවිදින්න බැරුව අවුරුදු එකහමාරක් හිටියා කොල්ලා. දැන් ඩයලොග් එකේ සේල්ස් එක්සකටිව් කෙනෙක්. මායි කොල්ලව

වෙද මහත්තයා ළඟට හැමදාම සෙනසුරාදා එක්කගෙන ගියේ"

නේත්‍රාගේ දෑස් දැල්විණා.

"අනේ. ම..ට හොයලා කියන්නකෝ දේවක. ගොඩක් වෙදකම් කළා. සිංගප්පූරුවෙත් ගියානේ දේවක. ඒත් ගුණයක් නෑ."

"මම අදම බලන්නම් මිස් වෙද මහත්තයාගෙන වෙලාවක් ගන්න. එහෙම වුනොත් අපි පේරාදෙණියේ යමු මිස්"

නේත්‍රා සිනාසුනාය.

"ඔයාට පින් දේවක"

"මිස් වගේ කෙනෙක් මෙහෙම ඉන්න විදිහක් නෑ. දෙවියෝ ඉඳලා හිටලා පිස්සු වැඩ කරනවා. මම අදම කතාකරන්නම් මිස්."

දේවක ගියේ එසේ කියාය. නේත්‍රා

ඔහු යන දෙස බලාගෙනම උන්නාය. කොල්ලා එහෙට මෙහෙට ගොස් හෙව්වේ කෙල්ලවය. භාවනාවය. එහෙත් ඇය සීට් එකේද නැත. සුපර් මාර්කට් එකේද නැත.

"භාවනා මිස්ව දැක්කද දන්නේ නෑ."

කොල්ලා ගොස් කැෂියර් එකේ අනුගෙන් ඇසුවේය. කෙල්ලෝ ටික සිනාසුනෝය. දේවක බලාගෙන උන්නේද සිනාබරවය.

"හිනාවෙන්නේ නැතුව කියන්නකෝ ළමයෝ. මිස්ව දැක්කද කියලා"

දේවක කීවේය. කොල්ලාගේ කට ගැන කෙල්ලෝ ටික දන්නේ නැත.

"මිස් මේ දැන් හිටියනේ. දැන් නෑ."

අනූ කීවේ සිනාබරවය. දේවක සිනාසුනේය.

"මමම හොයාගන්නම්කෝ."

ඔහු එසේ කියා භාවනාගේ අංකයට ඇමතුමක් ගත්තේය.

"මිස් මම දේවක."

"ආ. ඇයි දේවක?"

ඔහු යන්නට බැරිව ඉන්නේ තමා නැති නිසා බව භාවනා දනී. කෙල්ලට දැන් හරි ආසය.

"මම මිස් යන්න කියලා බැලුවේ. මේ මිස්ට කියලා යන්න හෙව්වා. මේ කැෂියර් එකේ ළමයිගෙන් ඇහුවා කට්ටිය හිනාවෙනවා"

දේවක කීවේ ඔවුන් දෙසද බලාගෙනය.

"එයාලා එහෙම තමයි හැරුණත් ඇති හිනාවෙන්න."

"මිස් සීගිරි එකේද ඉන්නේ."

"මී. ස්ටෝර්ස් එකේ. තත්පරයක් ඉන්නකෝ. මගේ රූම් එකට යන්න. ඉඳගෙන ඉන්න."

"මම ඉන්නම් මිස්."

ඇයව නොදැක යන්නට අමාරුය. 'ෆෝන් එකෙන් යනවා කියලා යන්න තිබ්බනේ. මොකටද මාව බලලම යන්න ඉන්නේ' භාවනාද සිතුවාය. එහෙම හිතපු එක ගැන ඇයට දැන් ඇත්තේ වෙනමම ආනන්දයකි.

භාවනා හිතාමතාම ටික වෙලාවක් ගෙන පසුව ගියාය. කෙල්ල ගියේ තේ හදන අනුලාට තේ දෙකක් ගෙන්න කියාගෙනමය.

කෙල්ල යද්දී ඔහු ඇගේ මේසය ඉදිරිපිට පුටුවේ වාඩිවීගෙන හනී බනී දෙසම බලාගෙන සිටියි.

භාවනා ලොකු හුස්මකින් පපුව පුරවාගත්තාය.

"සොරි. ස්ටෝර්ස්වල පොඩි ප්‍රශ්නයක්. ඒක බැලුවා."

ඇය කීවාය.

"මිස්ද ස්ටෝර්ස් බලන්නේ?"

"මම හැමදේම බලනවා දේවක."

"මම නේත්‍රා මිස්ටත් යන්නං කියලා මිස්ව හෙව්වා"

"අක්කා මොනවද කිව්වේ?"

දේවක සිනාසුනේය. 'අක්කා මොනවා කිව්වද දන්නේ නෑ' භාවනාට සිතුණි.

"මම නේත්‍රා මිස්ට කිව්වේ මිස් මිස්ගේ කකුල් දෙක සනීපකරගන්න හොඳ වෙද මහත්තයෙක් ඉන්නවා මම දන්න. ඒ ගැන."

භාවනා ඒ තොරතුරු දේවකගෙන්

අසා දැනගත්තාය.

"අපි හරි දුකෙන් ඉන්නේ ඒ ගැන. දේවක එහෙම කෙනෙක් හොයලා දුන්නොත් ලොකු පිනක්."

"මම අදම බලනවා මිස්."

"එයා එහෙම ඉන්න ඕන කෙනෙක් නෙමේ. පව්"

"එහෙම වුනොත් අපි මිස්ව එක්කගෙන යන් මිස්. උත්සහකරලා බලන්න පුළුවන්නේ."

"ම්."

අනුලා තේ අරගෙන ආවාය.

"මේ දේවක සර් අනුලා. හෙට ඉඳලා අපි ළඟ වැඩ."

අනුලාට ඇය දේවකව හඳුන්වා දුන්නාය.

"අනුලගේ තේ එක රසයි. මම උදෙත් එකක් බිව්වා"

දේවක කීවේය. අනුලාට එය සරසවි සම්මානය වාගේය.

"හෙට ටයි එක ඇඳලා එන්න ඕන. මී."

භාවනා කීවාය. දේවක සිනාසුනේය.

"එහෙම කරන්නම් මිස්."

තමාව ඒ තරම් ලස්සනට මෙතන තියන්නට ඇය සිතන්නේ ඇයි? 'ඒ කෙල්ලගේ හොඳකම. වෙන දෙයක් නෙමේ පිස්සෝ' ඔහුගේ හිත කීවේය.

"දැන් ගෙදර යනවා"

ඇය ඇසුවාය.

"ඔව් මිස් මෙහෙමම ගෙදර යනවා. මම එහෙනම් යන්නම් මිස්. හැමදේකටම මිස්ට පින්."

ඔහු වෙලාගෙන කීවේය. භාවනාට ඒ වචනවල අමුත්තක් දැනුණි.

'අක්කා මොකක්හරි කියලද එයාට'

"මී බුදු සරණයි."

"බුදු සරණයි මිස්. මට මොකක් හරි දැනගන්න ඕන වුනොත් මම කතාකළාට කමක් නැද්ද මිස්ට."

ඔහු ඇසුවේය. කෙල්ල ලස්සනට සිනාසුනාය.

"මී. ගන්න."

ඔහු ගියේ අහිංසක සිනාවක් මේසය මත තබා මෙන්ය. භාවනා ඔහු යනතුරුම බලා හිඳ පසුව සාරි පොට යටින් අත දමා පපුව ටිකක් පිරිමැද ගත්තාය. එතන කැක්කුම් දෙන්නේ ඇයි.?

භාවනා ඒ ගමන්ම ගියේ නේත්‍රා ළඟටය.

"අන්න අර කොල්ලා හැමතැනම හෙව්වා බබාව."

නේත්‍රා කීවාය.

"මට හම්බවුණා. යනවා කියන්න අනේ."

නේත්‍රා සිනාසුනාය.

"මොකද හිනාවෙන්නේ?"

"ඉතින් අනේ හිනාවුණාම මොකද?"

"මොනවද ඔයා කිව්වේ දේවකට අක්කේ."

"ඇයි?"

"නිකං. මට පින්දීලා ගියේ."

"එහෙම විශේෂයක් නෑ බබා."

නේත්‍රා කීවාය. ඔහු වෙනුවෙන් බාරගත් අභියෝගය ගැන අක්කා කියන්නට ඇත. අරම කිව්වේ ඒ නිසාය.

"එයා අක්කේ මේ වෙද මහත්තයෙක් ගැන කිව්වද?"

"අනේ බලන්නකෝ. යන්නත් ගිහිල්ලා ඇවිත් ඇහුවේ කකුල් දෙක ගැන. කොල්ලට දුක හිතිලා."

"ම්. මටත් කිව්වා."

"හොඳ වෙද මහත්තයෙක්ලු"

"එයා බලයි එහෙම වුනොත් අපි යන් අක්කේ."

"ම්. මටත් ආසයි චුට්ටක් ඇවිදින්න බබා. මේ වීල් චෙයාර් එක මාව කොටුකළා."

නේත්‍රා කීවේ දුක්බරවය.

"එහෙම වෙන්නේ නෑ සදාකාලයට. අපි බලමුකෝ"

"බබා"

"ම්"

"කොල්ලා දිහා බලද්දි හරි හුරුපුරුදු ගතියක් දැනෙනවනේ"

භාවනා දෙනෙත් බරකළාය.

"මී. මටත් ඇයි අක්කා ඒ?"

"දන්නේ නෑ. හොඳ කොල්ලෙක්. මට ඒකට මල්ලි කියලා කියවෙන්නත් ගියා"

භාවනා බලාගෙනම උන්නාය.

"අද අක්කේ සීගිරි එකම පාළුයි. කස්ටමස්ලා ඉන්නේ දෙන්නයි"

භාවනා කීවේ හූල්ලා මෙන්ය.

"අපි බලමු බබා. දැන් මේකා ඇවිත් මොනවා හරි කරයිනේ."

"මී. අපිට නොදැනී සීගිරි එක පල්ලටම වැටිලා අක්කේ"

"බිස්නස්වල එහෙම තත්වයන් තියෙනවා බබා. ඒකට දෙයක් කළාම ආයෙත් නඟිනවා."

භාවනා හිස වැනුවාය. කරන්නේ මොනවාද කියා දැන් දන්නේ දේවකම පමණි. 'ඔයා පොඩි කොල්ලෙක්.

කොහොම මේවා කරයිද කියලා තමයි හිතාගන්න අමාරු දේවක.' ඇය සිතුවාය. එහෙත් බොහෝ දේවල් වෙනස්කර ඇත්තේ පොඩි කොල්ලන්ය. එයද සත්‍යයකි.

# 04

දේවක එනගමන් කුකුල් මස් පන්සීයකුත් අල ටිකකුත් පිපිඤ්ඤා ගෙඩියකුත් සලාද කොළ සීයකුත් අරගෙන ආවේ හවසට පොඩියට කහ බතක් හදා පාටියක් දාන්නටය. එන ගමන් ඔහු සිතුවේ අල තෙල් දානවාද නැත්නම් අල කිරිහොදි හදනවාද කියාය.

"මස් ටික දැවිල්ලට හදනවනේ.ඒ නිසා අල කිරි හොද්ද තමා මරු.

ඒකට සලාද කොළ තියලා පිපිඤ්ඤා සලාදයක් හැදුවාම මරු.”

ඔහු මඟින් පොඩි අන්නාසි ගෙඩියක්ද ගත්තේය. සලාදය රස අන්නාසි පෙතිත් තැබුව විටය. අද පාටියක් දාන්න තරම් දේවල් වූ දවසකි. හිත මෙහෙම දිලිසෙන්නේ බැබලෙන්නේ කාළාන්තරයකට පසුය. එන මඟ දිගට ඔහුට සිහිවෙන්නේ ඈයවය. ඒ කතාකරන ඇස්දෙකය. ‘මේවා හරි නරක වැඩ දේවක. මොනවද මේ හිතන්නේ’ හිත එහෙම කීවද මේවා මතක් කරකර දෙන්නේද ඒ හිතමය.

“අනේ ඉතින් ඔයා මගේ පොඩි නෑනනේ. කියන්න පුළුවන්නම් ඒ ගැන ඔයාට.”

දේවකට හීල්ලින. සීගිරි එකේ

හෙට සිට ජීවිතය පටන් ගන්නේ රහස් රැසක් සඟවාගෙනය. ඒ රහස් කාටනම් කියන්නද? ‘කොහොම උනත් අම්මේ ඔයාව පේන මානේ ඉඳගෙන මම වැඩකරන්නේ. මට වරදින්නේ නෑ කියලා මම දන්නවා.’ ඔහු සිතින් කීවේ අම්මාටය.

දවල්ට උයන්නේ නැත. එකපාරම උයන්නේ රෑටය. ඒ නිසා දේවක දවල්ට කන්නට ක්ෂණික නූඩ්ල්ස් එකක් ගත්තේය. ඒක පහසුය. කන්නටද පුළුවන. පොඩි ගෑරප්පුවක් ගෙන දොරකඩ පඩියේ ඉඳගත් විට ඒක රස විඳ විඳ කන්නට පුළුවන. ඕනා උණු වතර ටිකක් විතරය.

“දවසක ඔයාගෙන් එක දෙයක් අහන්න තියෙනවා මිස්. ඇයි මං වෙනුවෙන් එච්චර ලොකු අභියෝග

යක් බාරගත්තේ කියන එක. ඒකේ මොකක්ද දෙයක් තියෙනවා."

පපුව දාගෙන එන්නේ එය සිහිවෙද්දීය. හෙට සිට මේ පාළු ජීවිතය නැත. දහසක් අභියෝග මැද්දේ සීගිරි එක මැද සටන් කරන්නට සිදුවෙයි. අලුත් ජීවිතය කොහොම වේද කියාවත් දේවක සිතුවේ නැත.

"මොනවා වුනත් මම ඔයාගේ විශ්වාසය රකිනවා මිස්. එච්චරයි. ඔයා මාව විශ්වාස කරපු පළවෙනි කෙල්ල. ඒකට මම හිස නමා ගෞරව කරනවා"

දැන් හදවතට ඇත්තේ පහදා කියන්නට බැරි ශක්තියකි.

** ** ** ** ** ** ** ** **

දවල් දෙක තුන වෙද්දී සීගිරි එකේ ඉන්නට බැරි ගතියක් භාවනාට දැනුණි. අද කොහොමත් සීගිරි සුපර් පාළුය. බිලක් වැටෙන්නේ විනාඩි දහයකට පමණ එකකි. එයද රුපියල් දාහක හමාරක බිලකි. රුපියල් හාර පන්දාහක බිලක් අද වැටුනේම නැත. කෙල්ලට ටිකක් උණ ගන්නත් වාගේය.

සියල්ලටම වඩා අද සීගිරි එක පාළුය. ඒ පාළුවත් සමඟ ඉන්නට හිත් දෙන්නේද නැත. භාවනා දවල් ලන්ච් ගත්තේද නැත. ඇය ගෙන ආ ලන්ච් එක අනුලාට දුන්නාය. පසුව අත් බෑගයද දමාගෙන නේත්‍රා වෙත ආවාය.

"අනේ මොකෝ මේ කෙල්ල

යන්නද අද?"

"යනවා අක්කේ."

කෙල්ලගේ හිතට මොකක් හෝ වී ඇති බව නේත්‍රා දනී. ඇය ඉන්නේ මේ වයස පසුකරය.

"ම්. මම මේ පර්චසින් ඕඩර්ස් වගයක් බලනවා පැටියෝ. එහෙනම් යන්න."

භාවනා පැමිණ නේත්‍රාගේ මුහුණ සිපගත්තාය. කෙල්ල ළඟින් එන්නේ අහිංසක සුවඳකි.

"අපි අර දේවක කියපු වෙද මහත්තයා ළඟට යන්. එයා බලනවා කිව්වා."

නේත්‍රා සිනාසුනාය.

"ම්. අපිට යනවා නම් කොල්ලවත් දාගෙන තමා යන්න වෙන්නේ."

කෙල්ලගේ මුහුණ පුරා නැති

හිනාවක් පායා ආවේය.

"එයත් යන්න ඕනද?"

"අපි දන්නවායෑ බබා උඩ පේරාදෙණිය ගැන. මී."

"ඒකත් ඇත්ත."

"කොල්ලත් හෙට ආවාම වැඩ පටන් ගමු. ටිකක් මහන්සිවෙන්න වෙයි වගේ."

"කරමු අක්කා. මේ යන්නෙත් හිතට හරි නෑ. මේ කස්ටමර් කවුන්ටි එක බහිනකොට ඉන්න හිතෙන්නෙත් නෑ. මමත් ආස දේවක කිව්වා වගේ මේක ඇතුලේ සැණකෙළිය වගේ තියෙනකොට. එතකොට පාළුවක් නෑ. දැන් මේ රජයේ සමූපකාරයක් වගේ. කිසිම හැල හොල්මනක් නෑ. එයා කිව්ව වගේ සැණකෙළියක් ඕන"

"මී. සුපර් මාර්කට් එකක් එහෙම

වෙන්න ඕන බබා. ගෙදරම යන්නේ. චුට්ටක් ෂොප් එකක් පැත්තේ ගිහින් ෂොපින් පාරක් එහෙම දාලා යන්න තිබ්බනේ.”

“මිහ් අද මූඩ් එකක් නෑ ෂොපින් යන්න. යන වෙලාවක යන්. අපි දෙන්නම.”

“අනේ”

“අනුලට කියන්නද ඔයාට හොඳ තේ එකක් එවන්න කියලා.”

“මි කියාගෙනම යන්න. ටී එපා බබා. ප්ලේන්ටී එකක් එවන්න කියන්න.”

අක්කා පව් කියා භාවනාට සිතුණි. ඇය මෙහෙම වැඩකරන්නේ හිතේ ඇති හිස් බව යන්නත් එක්ක බව භාවනා දනී. ‘ජීවිතේ එක තැනකට කොටු වුණාම එහෙමයි. යන එන මං

නැතිවුණා වගේ'

භාවනා නිවසට ආවේ ඇඟ ටිකක් සෝදාගෙන නිස්කලංකයේ ඉන්නත් බලාගෙනය. හිත ටිකක් එහෙට මෙහෙට වුණා වැඩිය.

"අද වේලාසන මැණිකෙ?"

කෙල්ල එද්දීම ඉඳුනිල් ඇසුවාය.

"ටිකක් වේලාසන ආවා අම්මා. මහන්සියි අද මේ."

"ඒක හොඳයි. ලන්ච් ගත්ත නේද?"

කෙල්ලගේ දෙනෙත් බරවිය.

"අද එච්චර පිරියක් තිබුණේ නෑ කන්න අම්මා. මම අනුලට දුන්නා ලන්ච් එක."

"අද ඔයා ආස නැති මෙනු එකක් තමා තිබ්බෙත්. මම මොනවා හරි හදලා එවන්නම්."

භාවනා කාමරයට ආවේ හිත බරකරගෙනය. ඇය අත් බෑගය මේසය මතට දමා ටික වෙලාවක් අතරමං වූවාක් මෙන් උන්නාය. 'මොකද වුණේ මට.' ඇය සිතුවාය. පසුව කෙල්ල කැඩපත ළඟට ගොස් මුහුණ බැලුවාය. 'ඔනී කියන්නේ ඇත්ත තමයි මිස්' ඔහු කියූ වදන් ඇයට සිහිවෙයි. ඔනීගේ බෙල්ලේ ගැට ගසා ඇති ටැග් එකේ ඇත්තේ 'යූ ආ ස්විටර් දෑන් එනිතිං' කියාය. ඔහු කියන්නේ ඒ කතාව ඇත්ත කියාය. භාවනා සිනාසුනාය. 'පිස්සෙක්' පසුව ඇය සිතින් කීවාය.

"මොනවද දන්නේ නෑ මේ හවස කරන්නේ. තනියම. අතුරුගිරියේ කොයි හරියෙද දන්නේ නෑ ඉන්නේ."

හිතෙන්නේම ඔහු ගැන නොවේද

කියා භාවනාට සිතුණි. ඒ හැඟීමෙන් කෙල්ල ගැස්සීගෙන ගියේය. මොකක්හෝ අහන්නට ඔහු හවස කතාකළොත් හොඳයි කියා භාවනාට සිතුණි. 'මං ගන්නේ කොහොමද එයාට කාරණාවක් නැතුව'

ඒත් ඔහු හෙට සිට ස්ටාෆ් එකේය. ඒ නිසා හොඳය. හෙට සිට සීගිරි එකට යන්නට ඇයට නැති ආසාවක් එයි. භාවනා ඇඟ ටිකක් සෝදාග න්නට ගියේ සරල සායකුත් බ්ලවුස් එකකුත් තෝරාගෙනය. හිතුනොත් හවස ෆිල්ම් එකක් දාගෙන බලනවා කියා ඇය සිතුවාය. සීඩී එකක් දමාගෙන අහන එක ඊට වඩා ලස්සනය. එවිට එක එක දේවල් සිතමින් සිංදු අහන්නට පුළුවන. ඇය ළඟ එහෙම සීඩී දාන්නට හැකි කුඩා සීඩී ප්ලේයර් එකක් ඇත. එය

ගෙනවිත් දුන්නේ තාරකාය.

** ** ** ** ** ** ** ** **

දේවක භාවනාට ගත්තේ මහ රෑය. හරියටම රෑ නමයයි හතළිස් පහට පමණය. අද කහබත් කාපු නිසාදෝ නැති නිදිමතක් එයි. ඊටත් වඩා ඊයේ රාත්‍රියම ගතකළේ නිදි වර්ජිතවය. එහෙත් ඇයට එක ඇමතුමක් හෝ දී මොකක් හෝ අහනවා කියා දේවක සිතාගත්තේය. ජීවන් අද කොල්ලාට ලස්සන සැම්සුන් වර්ගයේ අලුත් ජංගම දුරකථනයක් ගෙන ආවේය. ඒ ඔහු රැකියාවට යන එකේ සතුටටත් එක්කය. ටිකක් මිළ අධික වුවද ජීවන් එය ගත්තේ ඩිස්කවුන්ට්

එකකටය. ඉන්නේ එක කොල්ලෙකි. ඒකා අතේවත් ස්මාට් දුරකථනයක් නැත්නම් වැඩක් නැත. අද කොල්ලෝ අතේ ඇත්තේ ඒ වැනි හොඳ ස්මාට් දුරකථනය.

"අනේ අප්පච්චී. මේක මරු බඩුවක්නේ. ෂා සුපර්නේ"

කොල්ලාට හරි සතුටුය. ඇත්තටම කියනවානම් දේවක මේ වාගේ ස්මාට් ජංගම දුරකථනයකට ආසාවෙන් උන්නේය. ඒත් ඔහු හිතාගෙන උන්නේ රැකියාවක් කළ කාලයක ගන්නටය.

"හොඳද පුංචි මහත්තයෝ."

"මාරයි අප්පච්චී. මම හරි ආසාවෙන් හිටියේ. දැන් ඉතින් බස බස ගාලා ඉන්ටර්නෙට් එකට යන්න පුළුවන්"

"ඉතින් කියන්නෙපැයි මහත්තයෝ."

"අපිට ඊට වඩා වැඩ තියෙනවනේ අප්පච්චී. මේත් අපරාදේ කියලා මට හිතෙන්නේ."

"මට මේක ටිකක් අඩුවට ලැබුනේ. රස්සාවක් කරනකොට බාල ෆෝන් එකක් අතේ තියෙන්න හොඳ නෑ. හැමෝම බලනවා."

"මරු. වට්ස් ඇප් දාගන්නත් පුළුවන්. වයිබ දාගන්නත් පුළුවන් දැන්."

'ඔයා වයිබ වට්ස් ඇප් ඉන්නවද දන්නේ නෑ. අද අහන්න ඕනේ. අහන්න දේකුත් නෑ.ඉන්නවානම් පේනවනේ' දේවක සිතුවේය. කොල්ලා ෆෝන් එක අතේ තියාගෙන බලාගෙන ඉඳිද්දී ජීවන්ට හරි

සතුටුය. ඔහු හැමදාමත් සතුටු වූයේ කොල්ලාව සතුටුකරය.

"අප්පච්චි."

"පුංචි මහත්තයෝ"

"අප්පච්චි පච්"

කොල්ලා ඒ ස්තූතියි කියා කියන විදිහය. ජීවන් නිදාගන්න ගියේ ඔහුගේ හිසද අතගාය. අද කොල්ලාගේ කහබත් ටික කද්දී ජීවන්ට සිහිවුනේ ඔහුගේ නර්මදාවය.

"ආ හේරත් මඟ පුතේ. රෑ වෙද්දි එයි. බලන්න ටිකක්."

"හා අප්පච්චී. හවස වෙන්න ඇති එහෙන් එන්න ඇත්තේ. මම කෑම ටිකක් ඉතුරු කළා. මම බලන්නම් අප්පච්චී නිදාගන්න."

දේවක හරි ආසාවෙන් ෆෝන් එක ඒ අත මේ අත පෙරළුවේය. සැම්සුන්

වර්ගයේ දුරකථන ලස්සනය. ඕන වැඩක් කරන්නටද පුළුවන.

ඔහු භාවනාට ඇමතුමක් ගත්තේ ඇඟත් ටිකක් සෝදාගෙන විත් හරි සනීපයට ඉඳගෙනය.

ඔහුගේ ඇමතුම එද්දි කෙල්ලගේ මුවඟ ලස්සන සිනාවක් සටහන් විය. 'තැන්කියු සෝ මච් දේවක.' ඇය සිතින් මුමුණාමෙන් කීවාය.

"ගුඩ් ඊව්නිං මිස්"

"මී. ගුඩ් ඊව්නිං. මොනවද කරන්නේ."

"කාලා ආවේ දැන් මිස්."

ඔහු කීවේය. භාවනා සිනාසුනාය.

"මොනවද අද කෑවේ ඉතින්?"

"අප්පච්චියි මායි අද පොඩි පාටියක් දැම්මා මිස්."

"අනේ ඔය දෙන්නා විතරක්?"

"අපි ඉඳලා හිටලා එහෙම දානවා මිස්. අපි දෙන්නා විතරයි."

"ඉතින්. පාටියට මොනවද ගෙනාවේ?"

"ගෙනාවේ නෑ මිස් හැදුවා. මම හවස හැදුවා. කහබත් හැදුවා චිකන් බිලැක් කරියක් හැදුවා. ඒකට අල කරියක් හැදුවා අන්නාසි පිපිඤ්ඤා සලාදයක් හැදුවා."

භාවනා කෙළ ගිල්ලාය. ඔහු මොකක් හෝ කෑමක් කිවහොත් තමාට එසේ වෙන්නේ ඇයි?

"ෂෝක් මෙනූ එකක්නේ. කහබත් හදන්නත් දන්නවද?"

"දන්නවා මිස්. ෆරයිඩ් රයිස් හදන්නත් දන්නවා. අපේ අප්පච්චි මරු කුක් මිස්. ඉතින් මටත් උගන්නලා තියෙන්නේ. අපි දෙන්නා

ඉතින් එක එක ඒවා හදාගෙන කනවා"

දෙන්නාගේ ජීවිතය කොච්චර ලස්සනදැයි කෙල්ල සිතුවාය.

"ඇයි පාටියක් දැම්මේ."

"මම සීගිරි එකේ රස්සාවට යනවට මිස්."

"ඒකටද?"

"ඔව්. අප්පච්චි මට තෑග්ගකුත් ගෙනත් මිස්."

"මොනවද දුන්න ප්‍රසන්ට් එක?"

"සැම්සුන් ස්මාට් ෆෝන් එකක්. මේ ඒකෙන් ෆස්ට් කෝල් එක ගන්නේ මිස්ට තමයි."

භාවනාට දුකය. ඔහු පුංචි පුංචි දේවලින් කොතරම් සතුටක් විඳිනවාද හැම කොල්ලෙක්ම එහෙම නැති බව ඇය දනී.

"හැපී කෝල් එහෙනම්."

"තැන්කියු මිස් මේක මරු ෆෝන් එක"

"ම් මටත් තියෙන්නේ සැම්සුන් එකක් තමයි."

ඇය කීවාය.

"මිස් වට්ස් ඇප්වල නෑනේ මිස්"

'ඒ කියන්නේ මං වට්ස් ඇප් ඉන්නවද කියලා ඔයා බැලුවා' භාවනා සිතුවාය.

"ම්. න්නෑ තමයි. පොඩි අක්කිත් කිව්වා දාගන්න කියලා මම දාගත්තේ නෑ"

"වයිබර් එකෙත් නෑනේ මිස්."

"මිහ්"

"ඇයි ඒ?"

ඔහුට ඉබේටම ඇසුණි.

"දාන්න හිතුනේ නෑ. එහෙමට

කියලා මැසේජස් යවන්නේ නෑනේ. කෝල් ගන්නෙත් නෑ."

භාවනා ඇත්තම කීවාය.

"වෙලාවක දාගන්න ඕන"

"දාගත්තොත් මට කියන්න මිස්."

ඔහු කීවේය.

"ම්."

"මම හවස තවත් පොඩි ප්‍රොජෙක්ට් දෙකක් හැදුවා මිස්. පොඩි පොඩි දේවල් ටිකකුත් හිතුවා. අපිට මිස් මාසයක් දෙකක් වගේ දෙන්න අපේ සීගිරි ලෝගෝ එක දාලා ෂොපින් බෑග් ටිකක් ගහගන්න වෙනවා. අපි අලුත්වෙලා කියලා වටේ අය දැනගන්න ඕනේ. ඒක කරන්න හොඳ විදිහක් තමයි මේ පොඩි බෑග් එක."

"ම්. වටේට යනවනේ ඕකත්

අරගෙන නේද?"

"ඒකනේ මිස්. ඒකට එහෙමට කියලා මහ ගාණක් යන්නේ නෑ මිස්."

"උදෙන්ම එන්නකෝ. ඇවිත් අපි සීයත් එක්කත් කතාකරමු."

"හා මිස්. මිස් නිදාගන්නනේ යන්නේ නේද?"

ඔහු ඇසුවේය. මේ දවස්වල තමාට නින්ද යන්නේ නැති ලෙඩක් තියෙන බව කොහොම කියන්නද?

"එහෙමත් නෑ. මම මේ සීඩී එකක් අහ අහ හිටියේ. ආෂිකී ෆිල්ම් එකේ"

"ඒකේ සෝන්ග්ස් ලස්සනයි නේද මිස්. ෆිල්ම් එකත් ලස්සනයි."

"බැලුවද?"

"බැලුවේ නෑ මිස්. මම යූ ටියුබ් එකේ සෝන්ග්ස් ටික බැලුවා. සුන් රහා හේ සෝන්ග් එක මාරයි නේද

මිස්"

'ඔයත් එහෙනම් ඒවා බලනවා' භාවනා සිතුවාය. ඇයත් සුන් රභා හේ සිංදුවට කැමතිය.

"දේවක"

භාවනා එක වෙලාවක වෙනස්ම හඬකින් කතාකළාය. කොල්ලාගේ පපුවම ඇවිලීගෙන ගියේය.

"මිස්."

ඔහු කීවේ උගුරෙන් මෙන්ය. ඇය කුමක් හෝ බරපතල දෙයක් කියන්නට යන බව දේවකට දැනුණි. ඒත් පපුව මේ තරම් හිරකරගන්නට තරම් දෙයක් ඇය නොකියන බවත් ඔහු දනී.

"මි මේක කිව්වා කියලා කලබල වෙන්න ඕන නෑ."

"න්නෑ මිස්. මොකක්ද

කියන්නකෝ."

"එන යන කොට ටිකක් පරිස්සමින් අතුරුගිරිය පාරේ කොයි හරියේ වගේද දේවකලා ඉන්නේ."

එහෙම කියන්නේ ඇයි.? ඔහුට හිතාගන්නට නොහැක.

"මේ මිලේනියම් සිටි එක කිට්ටුව මිස්. ඊට කළින් දිග වෙල්යායක් හම්බවෙනවා ඒ හරියේ. ඇයි මිස් අරම කිව්වේ."

දේවක ඇසුවේය.

"ඔය ඉතින් කලබල වෙලානේ මේ ළමයා."

"මට කියන්න මිස් ඇයි කියලා."

භාවනාට හීල්ලින.

"මම උදෙත් කිව්වේ සීගිරි එකට දේවක එනවට සමහරු කැමති නැහැ. ඉතින්."

භාවනා කිවාය.

"මට මඟදී මොකක්හරි කරන්නත් පුළුවන් නේද මිස්."

දේවක ඇසුවේය. උදේ සීගිරි එක ළඟ නැවතී තමාගෙන් පාර ඇසූ පිරිස දේවකට සිහිවිය.

"මම එහෙමම කියනවා නෙමේ. ඒත් සමහරු හිතන තරම් හොඳ නෑ."

දේවකට පුදුම නැත. ඔහුට පුදුම ඇය මේක තමාට අද කිව්ව එක ගැනය.

"මම මිස්ට එහෙනම් දෙයක් කියන්නද?"

"ම්."

"අද උදේ මිස්. මම සීගිරි එකට එනකොට."

දේවක භාවනාට සියල්ලම

කීවේය. ඇයගේ හිතට මොකක්ද බියක් දැනුණි. එහෙම දෙයකට මිහිරංග සම්බන්ධ නොවෙන්නට හේතුවක් නැත. ඔහු පරිස්සම් විය යුත්තේ ඒ නිසාය.

"ඒකනේ මම කිව්වේ. අප්පච්චි එක්ක එන්න අමාරුද?"

මේ තරමටම කැක්කුමකින් කතාකරන්නේ ඇයි?

"අප්පච්චී සමහර දවස්වලට වේලසාන යනවා මිස්. සයිට් විසිට් තියෙනවනේ පෙලක් දවස්වලට වෙහිකල් එක නෑ"

ද්වේක කීවේය.

"තව බයික් එකකුත් දිලා."

ඒ කතාවට ඔහුට සිනාගියේය.

"දුන්නට මම හැමදාම බයික් එකේ යන්නේ නෑ මිස් එතකොට

අමාරුයි."

"ඒක හොඳයි."

භාවනා කීවේ හිත සැහැල්ලු කරගෙනය. 'එයත් බලනවා ඇති මේ මොකෝ කියලා.' භාවනා සිතුවාය.

# 05

තාරකා භාවනාගේ කාමරයට ආවේ මහ රෑ දහයට පමණය. ඇය නිවසට ආවේ දැන් ටිකකට කලින්. පවුලේ කෙල්ලෝ තුන්දෙනාටම මිලින්ද අවශ්‍ය තරම් නිදහසක් දී ඇත. ඒ නිදහසින් අයුතු ප්‍රයෝජන ගන්නවාද නැද්ද කියා තීරණය කළ යුත්තේ ඔවුන්ම යැයි මිලින්දට සිතෙයි. ජීවිතයේ වූ අභාග්‍ය සම්පන්න දේවල් ටිකක් නිසා නේත්‍රා

කොහොමත් ඉන්නේ කාමරයටත් සීගිරි එකටත් කොටුවීය. එය ඇයට නිවනකි. භවනාගේ තත්වයද ඊට වඩා වෙනස් නැත. ඉඳහිට පොඩි රවුමක් ගියද ඇය වැඩිම වුනොත් යන්නේ සාප්පුවකටය. නැත්නම් ඇගේ මිතුරියක් බලන්නටය.

මිලින්ද කෙල්ලෝ තුන්දෙනාට දුන් නිදහසින් වැඩිම ප්‍රයෝජනයක් ගන්නේ තාරකාය. ඇය උසස් පෙළ ලියන දවස්වල සිට ඒ නිදහස උපරිමයෙන් භුක්ති වින්ඳාය. තාරකාගේ ගමන් බිමන් ගැන ඉඳුනිල්ගේ ප්‍රසාදයක් තිබුනේ නැත. එහෙත් ඒ ගැන චෝදනා කරන හැමවිටකට මිලින්ද සිනාසුනේය.

“අනිත් දෙන්නටත් වඩා තාරු කපටියි. ඒ නිසා බයවෙන්න එපා.

ඔයා බයවෙන්නේ මේකී කොල්ලෝ එක්ක පැනලා යයි කියලා නම් බය වෙන්න ඕන මේකි එක්ක පැටලෙන කොල්ලන්ගේ අම්මා තාත්තලා මිසක් ඉන්දු අපි නෙමේ."

මිලින්ද සිනාසී කීවේය. නේත්‍රා ඔය කතාව අම්මාගෙන් අසා කෙල්ලගේ කණේද තිබ්බාය.

"තාත්තා අපිව හොඳට තේරුම් අරන් ඉන්නේ. පොඩි අක්කා ගැන කියන කතාව හරියට හරි. අපේ ගෑනිගෙන් කොල්ලෙක්ට නරකක් වුනොත් මිසක් මෙයාට කොල්ලෙක් නරකක් කරනවා බොරු. හොඳ නල්ල මලේ බඩුව මේක."

භාවනා කීවාය.

අද තාරකා ආවේ කියාගන්නට බැරි සතුටකිනි. ඇයව එම්රේට්ස්

ගුවන් සමාගමේ ගුවන් සේවිකාවක් ලෙස තෝරාගෙන තිබුණි. තාරකාට ඊමේල් පණිවිඩය ලැබුණේ ලැබුණේ අදය. ඇය එමිරේට්ස් කාර්යාලයටම ගොස් පත්වීමේ ලිපියද ගත්තාය.

"සුදූ මගේ බෝනික්කී. ඔයා දොයිද?"

තාරකා ආවේ එහෙම කෑ ගසාගෙ නමය. භාවනා උන්නේ ඉයර්ෆෝන් එක කනේ ගසාගෙන දෑස් පියාගෙ නය. වීත් පැයක් තිස්සේ වාදනය වූ එකදු ගීතයක්වත් කෙල්ල රස වින්දේ නැත. ඇයට මතකද නැත. ඇය උන්නේ වෙනම කල්පනා ලෝකයකය. 'ඔයාට අසනීපයි වගේ' කවුරු හෝ හෙට අනිද්දා එසේ කීවොත් පුදුම නැත. තාරකා පැමිණ ඇඳ මත පෙරළුනේ භාවනාව බදාගෙනය.

'දැන් ඉතින් සිංදු අහලා ඉවරයි' භාවනා සිතුවාය.

"අද ෆුල් හැපී එකේ"

"මී. දිස් ඉස් ද මෝස්ට් හැපියස්ට් ඩේ ඉන් මයි හෝල් ලයිෆ්. වා..ව් වා..ව් කියලා වැඩක් නෑ සුදූ"

තාරකා කීවේ භාවනාගේ බාහුවක් සිපගෙනය. පුංචි දවස්වල සිට අක්කලා දෙන්නා නංගිව ඕන තරම් සිපගෙන ඇත. දෙන්නාගේ බෝනික්කිය වූයේ මේ පොඩි නංගි භාවනාය.

"මොකද වුනේ අනේ කියන්නකෝ?"

"මේ"

තාරකා පෙන්වූයේ ඇගේ අතේ වූ ලිපියය. එය ඇයව ගුවන් සේවයට කැඳවා තිබූ පත්වීමේ ලිපියය.

"අනේ ඔයාගේ හීනේමයි. කන්ග්‍රැජුලේෂන්ස් සුබම සුබ පැතුම් පොඩි අක්කී. වාව්. නියම නිව්ස් එකක්නේ. සුපර්"

භාවනා කීවේ තාරකාව වැළඳගෙන නය.

"මම පළවෙනිදා ඉඳලා අහසේ සුදූ"

තාරකාගේ දිලිසෙන දෑස් දෙස භාවනා ටික වෙලාවක් බලාගෙන උන්නාය. ඇයට දැන් ජීවිතයේ සතුටුවෙන්නට දෙයක් ඇත. කෙනෙක් වඩාත්ම සතුටුවෙන්නේ ඇය ආසම කරන දේ ලැබුනොත් පමණය. මේ තාරකාගේ සිහිනය ය.

"ගොඩක් පරිස්සමින් හොඳේ. මට පොඩි අක්කලා දෙතුන් දෙනෙක් නෑ"

තාරකා භාවනාගේ අතක්

අල්ලාගෙන පසුව එය සිපගත්තාය. කෙල්ල තමාට කොතරම් ආදරේද කියා තාරකා දනී.

"මී මට ආසාව තියෙන්නේ මගේ පොඩි බෝනික්කිවයි අක්කවයි දවසක එක්කගෙන යන්න මී. මාත් ඉන්න ෆලයිට් එකේ"

"මටත් ආසයි දැන් ඔයාව එහෙම කැබින් ක්රූ එකක ඉන්නවා දකින්න"

"කලම්බු ටු ඩුබායි ෆ්ලයිට් එකට මාව දාන්නේ. ඒ ක්රූ එකට තමයි. සිංහල දන්න කෙනෙක් ෆලයිට් එකේ ඉන්න ඕන. උඹ දන්නවද ඒක ලොකු ෆලයිට් එකක්"

"ඔයා ලස්සනට සිංහලෙන් කතාකරනවනේ. එයාලා වශිවෙන්න ඇති."

"මී. ඇහුවා ටීවී ප්‍රසන්ටර්

කෙනෙක් විදිහට වැඩකරලා තියෙනවද කියලත්"

මේ රස්සාව ඇයට ලැබීමත් සමඟම අවුරුදු පහකට ඇයගේ විවාහය ජීවිතයෙන් ඈත්වේ.

"අපි ඉස්ට්වලට කලින් පොඩි පාටියක් දාමු. ම්."

"දාමු. මටත් ආසයි."

තාරකා කීවාය.

"තාත්තිටයි අම්මටයි කිව්වද?"

තාරකා සිනාසුනාය.

"ම්. තාත්තා ආසයි. එක්කෙනෙක් දැන් ඉතින් පියාඹලාම යයි කිව්වා. මොනවද ඕනේ කියලත් ඇහුවා."

"එයා එහෙමයි. වෙන තාත්තලා නම් ඕකට ටිකක් බර බරේ දානවා. අපේ තාත්තා එහෙම නෑ. වැඩි කතාවක් නෑ තමයි. ඒත් අපිව

ඕනවටත් වඩා තේරුම් අරන් ඉන්නේ"

මිලින්ද එහෙම ජීවිතය දෙස පටු විදිහට බලන කෙනෙක් නොවේ.

"අද තමයි මම නිදාගන්නේ සුදූ. උඹ කියන්නේ මම බාරෙකුත් වුණා බං"

"මේ දවස්වල මොනවත් කතන්දර නැති නිසා හොඳයි නේ. නැත්නම් කොල්ලා තමයි ඕකට ලෙඩේ අදින්නේ"

තාරකාත් එය දනී. තම පෙම්වතිය ගුවන් සේවිකාවක් වෙනවාට බොහෝ කොල්ලන් කැමති නැත. එය අසාමාන්‍ය නිදහසක් ලැබෙන කෙල්ලව සැක කරන්නට තොග පිටින් කාරණා සපයන රස්සාවකි. කෙල්ල හැමදාම

උඩය. නැත්නම් වෙන රටකය. හෝටල්වලය.

"සෑහෙන කාලයක් යනකල් අයි හේට් ලව් ස්ටෝරීස්."

තාරකා කීවාය. භාවනා ලස්සනට සිනාසුනාය.

"ඔයාට දැන් සනීපයි එහෙමයි."

කෙල්ලෝ දෙන්නාම සිනාසුනෝය.

"සුදූ"

තාරකා එවර කතාකළේ වෙනස්ම හඬකිනි.

"ම්."

"මං එනකොට කෙල්ල හිටියේ වෙන ලෝකෙක වට්ස්ද ප්‍රොබ්ලම් බබා."

තාරකාට හොඳ ඉවක් ඇත. ඇය ආදරය කරන්නට ගත්තේ අද ඊයේ නොවේ. අවුරුදු දහඅටේ සිටය.

"මම. එහෙම මොකවත් නෑ. මම මේ සෝන්ග් එකක් අහ අහ හිටියේ."

"චුට්ටක් පාළුයි. නේද?"

භාවනා මද සිනා පෑවාය.

"චුට්ටක් නෙමේ ගොඩක්"

අවංක කතාව භාවනා කීවාය. තාරකා ඇගේ අතක් අල්ලාගෙන මොහොතක් එදෙස බලාගෙන උන්නාය.

"ලයිෆ් එකේ මොනවාවත්ම වෙන්නේ නෑ බබා."

"ම්හ්. මොනවත් නෑ..නේ අනේ"

"ඒකයි මේ"

"මං ඉතින් මක්කරන්නද?"

"ලයිෆ් එකේ මොනවාවත් වෙන්නේ නැත්නම් මොකක්හරි කරන්න ඕන."

"කොහොමද?"

"දැන් මේ මම කරගන්නේ සමහරවිට මේ අවුරුදු පහ කම්ප්ලීට් කළාට පස්සේ මම තවත් මොකක්හරි කරයි. හීනයක් හදාගන්න වෙනවා. ඊට පස්සේ පාළු නෑ"

පොඩි අක්කා ඒ අතින් ජීවිතයට බය නැතැයි භාවනාට සිතෙයි. ඇය හැමදාම කළේ ඇයට ඕනා දේය.

"බලමු පොඩි අක්කා."

"ම්. අහ අහ හිටපු සෝන්ග් එක අහපං එහෙනම්. මම යනවා නිදාග න්න."

භාවනා යළිත් ඇයව සිපගත්තාය.

"ඔයාගේ හැම ඩ්‍රීම් එකක්ම සැබෑවෙන්න ඕන බුදු සරණායි."

භාවනා කිවාය.

"අනේ මගේ පිස්සී."

තාරකා ගියේ කෙල්ලගේ හිසත්

සිපගෙනය. දවසක ඇයට මේ
ලෝකයේ ඉන්නා හොඳම කොල්ලා
ලැබේවා කියා තාරකා පැතුවාය.
'කෙල්ල කොහොමත් දෙතුන් පාරක්
ලව් කරන එකක් නෑ.' ඇයට සිතුණි.

** ** ** ** ** ** ** ** **

මිහිරංග උන්නේ සර්වාංගය
දැවෙනා තරම් කේන්තියකිනි.
සීගිරි එකේ කිසිවෙක් තමා කියූ
දෙයක් තුට්ටුවකට ගණන් ගන්නේ
නැත. ඊයේ උදේ දේවක ගැන
කතාකරන්නට ගිය විට මිලින්ද
කීවේ 'මේ ගත්ත කොල්ලා ගැනනම්
කතාකරන්න යන්නේ ඒ ගැන
වචනයක්වත් කතාකරන්න එපා
මිහිරංග' කියාය. සීගිරි එකේ

කළමණාකරනයෙන් තමාව ලස්සනට විසීවී ඇතිබව දැන් මිහිරංග දනී.

"එහෙම වෙන්න බෑ"

මිහිරංග කෙන්තියෙන් සිතුවේය. ඔහුට ඉවසන්නට බැරි දේවකට පසුදාම රැකියාවට එන්න කියා කීමය. 'උඹව ගන්න එච්චර හදිස්සියක් තිබුනේ'

"දැන් මොකද කරන්නේ ඉස්සරහට මටත් වැඩකරන්න වෙන්නේ මූ කියන විදිහටද?"

වෙන්නට යන්නේ ඒකය. අදින් පසු සීගිරි එකම දුවන්නේ අලුත් ප්ලෑන් එකකටය. ඒ ප්ලෑන් එක සීගිරි එකට අරන් එන්නේ දේවකය.

"මූව එච්චරම විශ්වාස කරන්න මොකක්ද හේතුව"

මිහිරංගට තවමත් එය සිතාග

න්නට නොහැක. රඹුක්වැල්ල මහතාට පමණක් නොව මිලින්දටද නේත්‍රාටද භාවනාටද දේවකගෙන් මොකක්ද දැනෙයි. ඒ කුමක්ද කියා හරියටම දන්නේ නැතත් කොල්ලා සාමාන්‍ය කෙනෙක් නොවන බව පමණක් ඔවුන් දනී. ඔවුන් කිසිවෙක් මේ මියගිය නර්මදාගේ එකම පුතා බව දන්නේ නැත. ඔහුටද මේ සීගිරි එකේ උරුමයක් ඇත. ඒත් කොල්ලා ආවේ ඒ උරුමයේ කෑල්ල කඩාගෙන යන්න නොවේ. ජීවන් කොල්ලාව සීගිරි එකට එව්වේද ඒ බාල වැඩේට නොවේ. ඔහුට තම කොල්ලාව පෙන්වන්නට ආසය. කාටවත් නොව කොල්ලාගේම සීයාටය. නැන්දලාටය. මාමලාටය.

“උගුව පුළුවන් තරම් ස්ටාෆ් එකේ අන්පොපියුලර් කරන්න ඕන.”

මිහිරංග සිතාගත්තේය. එහෙත් එය පමණක් සෑහෙන්නේ නැත.

දැන් වෙලාව පාන්දර හතරය. මිහිරංගට ඊයේ රාත්‍රීයේම නින්ද ගියේ නැත. දැන් ඔහු ඉන්නේ අධික හිස රදයකිනි. එයට හේතුව මිහිරංග ඊයේ රාත්‍රී දොළහ පමණ වෙනතුරු ඔහුගේ මිතුරෙක් සමඟ අධිකව මත්පැන් ගත් නිසාය.

අද උදේ ස්ටාෆ් මීටින් එකක් කැඳවා ඇති බව මිහිරංග දනී. එය කරන්නේ දේවකව සීගිරි එකේ ස්ටාෆ් එකට හඳුන්වා දෙන්නටය.

"මම දවසක් දෙකක් සීගිරි එකට යන්නේ නෑ. බලමුකෝ ටිකක් ඉඳලා මූ මොකක්ද කරන්නේ කියලා"

මිහිරංගට දරාගන්නට අමාරුම දේ තමා මාසයක් සීගිරි එකට

නොගොස් උන්නද කිසිවෙක්
හෝ කතාකර තමාට එන්න කියා
නොකීමය.

"මේ වෙලාව උගේ. ඒත් මටත්
වෙලාවක් එනවා. ටිකක් බලාගෙන
ඉන්නම වෙනවා."

මිහිරංග සිතුවේය.

"භාවනාත් ඉන්නේ උඟවම ලොකු
කරගෙන. මේකී කොල්ලෝ දැකලා
නෑ වගේ උඟව උඩ දාන්නේ. අම්මා
කිව්වේ එදා වෙව්ල වෙව්ලලු උඟ
ගැන කිව්වේ"

සීගිරි එක නැතිවුවත් කමක් නැත.
ඇයව නැතිකරගන්නට නොහැක.
ඇයව හිමිවේනම් සීගිරි එකත් ඇයත්
සමඟම බෝනස් ලෙස ලැබෙන බව
මිහිරංග දනී.

# 06

අද දේවකගේ ජීවිතයේ වැදගත්ම දවසය. ඔහුගේ කුළුදුල් රැකියාවට යන්නේ අදය. දේවක මීට කලින් එක එක අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වී තිබුණද ඔහු නුවරදී රස්සාවක් කර නැත. දේවක නැඟිට්ටේ පාන්දර හතරටය. පසුව ඔහු පාන්දර අඳුරේම පැමිණි සිමෙන්ති පඩියේ වාඩිවී පාන්දර කළුවර තවමත් තිබූ

වෙල් යාය දෙස බලාගෙන උන්නේය.

මේ පුරුද්ද දේවකට ඇත. ජීවිතයේ වැදගත් ගමනක් යෙදී ඇති හැම දවසකම දේවක ඇහැරෙන්නේ පාන්දරය. එහෙම පාන්දර නැඟිටින ඔහු කොහේට හෝ වී ඔහේ බලාගෙන ඉඳියි. අමුතුවෙන් විශේෂ දෙයක් හිතන්නේ නැත. එහෙත් ඔහු ඉබේම හිත පෑදෙන්නට දෙයි. ඉස්සර උසස්පෙළ විභාගයට යන විටත් දේවක මේ දේම කළේය. ප්‍රතිඵල පුදුම සහගතය.

පාන්දර සීතල මදනල ඔහුගේ වියලී ගිය මුහුණට වදින්නේ වෙනස්ම සනීපයක් ගෙන දෙමිනි. මද අලස බවකින් යන්තමට දෑස් පියාගෙන පැයක් පමණ උන් දේවක නැඟිට්ටේ තේ ටිකක් හදාගන්නටය. හේරත්

ආවේ ඊයේ දොළහත් පසුවූ පසුය. ඔහු තාම නිදිය.

"අද උයන්න අමාරුයි. හේරත් මාමට කියනවා හෙට ඉඳලා කෑම එක ලෑස්තිකරන්න කියලා නැඟිටලා. අද කඩෙන් කනවා."

දේවක සිතුවේය. ඔහු තේ එකක් හදාගෙන යළිත් පරණ සිමෙන්ති පඩියටම ආවේය.

"අද ටිකක් හිත බරයි. කොහෙන් පටන් ගන්නද කියලා තේරෙන්නේ නෑ."

දේවක සිතුවේය. දේවකට සිහිවෙන්නේ නේත්‍රා ඊයේ කියූ කතාවය. 'නංගි හැමෝම ඉස්සරහා ඔයා වෙනුවෙන් ලොකු අභියෝගයක් බාරගත්තා.' මේ හිතට දැනෙන බර ඒක නිසාය.

"මං වෙනුවෙන් එහෙම චැලේන්ජ් එකක් ඔයා ඇයි ගත්තේ කියන එක මිස් වෙනම හිතන්න ඕන. ලේසියෙන් කෙල්ලෙක් කොල්ලෙක් වෙනුවෙන් එහෙම කරන්නේ නෑ."

හිතට මේ දැනෙන බරත් ඒකමය. මේ අද යන්නේ රස්සාවක් බාරග න්නට නොවේ. ඒ අභියෝගය බාරග න්නටය.

"මට ඒක කරන්න පුළුවන් මිස්. ඔයා බයවෙන්න එපා කොහොමත් මේ ලෝකේ මේ දේවකව විශ්වාස කරපු පළවෙනි කෙල්ල ඔයා. ලේසියෙන් ඒ විශ්වාසේ නැතිකරග න්න බෑ."

දේවක සිමෙන්ති පඩියෙන් නැඟිට්ටේ ඒ සිතිවිල්ලත් සමඟය. 'හෙට ටයි එක අඳින්න ඕන' මේ

උදේ පාන්දර සිහිවෙන්නේම ඇය කියූ දේවල්ය. දේවක ඔහුගේ සුදු අත්කොට කමිසයත් මෙරූන් පැහැගත් ටයිපටියත් රෑම ලෑස්තිකර තබා තිබුණි. ඔහු එය මදින්නට ගත්තේ කල්පනාබරවය.

"අද ඉඳලා ඉන්නේ අලුත් දේවක කෙනෙක්. පරණ දේවකට මම යන්න කියනවා අද. මෙතන ඉඳලා පිස්සු බෑ කොල්ලෝ. ෆුල් සීරියස්"

ඔහු තමාටම කියාගත්තේය.

** ** ** ** ** ** ** ** **

උදේ ජීවන් දේවකව බෙල්ලන්විල පස්සලට ටිකක් එක්කගෙන ආවේ අද කොල්ලාගේ ජීවිතයේ වැදගත් දවසක් නිසාය. අප්පච්චීත් පුතාත්

බෙල්ලන්විල පන්සලට එද්දී උදේ හතටවත් නැත.

"අපි පුංචි මහත්තයෝ පහනක් පත්තුකරලා පඬුරක් දාලම යමු."

දේවක හිස වැනුවේය. අප්පච්චීගේ මේ සරල පිරිසිදු ජීවන රටාවට දේවක ආදරය කළේය. ජීවන් පන්සල ළඟින් තෙල් පහන්තිර ටිකක් සමඟ නෙළුම් මල් පොකුරක්ම ගත්තේය.

"මී. මේකත් අරන් යමු. අපි පහනකුත් පත්තුකරලා විශ්ණු දෙවියන්ට බාරයකුත් වෙලා යමු. ඔයාට වරදින්නේ නෑ."

බොහෝ කාලයකට පසු ජීවන් මල් පූජා කර දෙයක් ඉල්ලුවේය. ඔහු එහෙම ලේසියෙන් දෙවියන් බුදුන්ගෙන් දෙයක් ඉල්ලන කෙනෙක් නොවේ.

අවසන් වරට එහෙම ඉල්ලුවේ ඔහුගේ බිරිඳ මරණාසන්නව ඉඳිද්දීය.

"කෝ එන්නකෝ පුංචි මහත්තයෝ."

පන්සලේ වූ දොළොස් මහේ පහනින් තෙල් ටිකක් ගෙන ජීවන් කොල්ලාගේ හිසේ ගැල්වූවේය.

"මී බුදු සරණයි. දළඳා සමිඳු පිහිටයි. අම්මටත් වැඳලා එහෙනම් වැඩ පටන් ගන්න. මී."

"හොඳයි අප්පච්චී."

ජීවන් දේවකව ආවාස ගෙදරටද එක්කාගෙන ගොස් පොඩි හාමුදුරුවෝ නමකට කියා දේවකගේ අතේ පිරිත් නූලක්ද බන්ඳවාගත්තේය.

"යන් මම ත්‍රී වීල් එකක් අල්ලලා දෙන්නම්. මේ වෙලාවේ බස්වල

යන්න එපා."

"ගාණක් නෑ අප්පච්චී. අප්පච්චි යන්නකෝ."

ජීවන් එහෙම යන්නේ නැත. දේවක යළිත් මල් කඩයට යද්දී ජීවන්ට පුදුම සිතුණි.

"ඇයි පුතේ?"

"න්නෑ අප්පච්චි මේ පිච්ච මල් යාරයක් ගත්තා"

දේවක කීවේය. ජීවන්ට පුදුමය.

"මොකටද පුංචි මහත්තයෝ?"

"අම්මට දාන්න."

ජීවන්ට දුකය.

"කවුරුවත් දකීද දන්නේනෑනේ?"

"එහෙම නෑ අප්පච්චි එහෙම කවුරුවත් දැනගන්නේ නෑ එයාලත් අම්මගේ පින්තූරෙට එහෙම මල් මාලයක් දාලා තියෙනවා. ඒක

ප්ලාස්ටික් එකක්."

ජීවන් කිසිවක් කීවේ නැත. දේවක ත්‍රී වීලරයට ගොඩවූයේ පිච්ච මල් යාරයත් පරිස්සමින් ඔහුගේ සයිඩ් බෑගයේ දමාගෙනය. එහි ඇත්තේ ඔහුගේ කුඩා ලැප්ටොප් පරිගණකයය.

"බයවෙන්න එපා. අම්මා ඔයාව බලාගනී. යන්න."

ජීවන් ත්‍රී වීලරයට එබී දේවකගේ හිස අතගා කීවේය. ඔහු හිස වැනුවේය.

දේවක ත්‍රී විලරය අද්දනවාත් සමඟම යළිත් දෑත් එකතුකර බෝධිය පැත්ත බලාගෙන වැන්දේය.

"ජීවිතේ පටන් ගන්නේ අද. මෙතනින්"

ඔහු තමාගේ හිතට කීවේය.

බෑගයේ ඇති පිච්ච මල් මාලයෙන් එන සුවඳ දේවකට ළංව දැනෙයි.

තමාව සීගිරි එකට ගත්තේ සෑහෙන බර අභියෝගයක් දීය. ඒ තරමටම සීගිරි එක තමාව විශ්වාස කළේය. දේවක ආසම කළේ ඒ විශ්වාසයටය. ආයතනයක් එහෙම ලේසියෙන් කෙනෙක්ව විශ්වාස කරන්නේ නැති බව ඔහු දනී. විශ්වාස කළද ඒ සෑහෙන කාලයක් ගිය පසුය. දැන් ඇත්තේ ඒ විශ්වාසය ඔප්පු කරන්නටය. සීගිරි එක මාස තුනක් ඇතුළත උඩටම ගන්නවා කියා දේවක සිතාගත්තේය. ජීවත්වෙන්නේ ඒ හීනයේ පමණයි කියා ඔහු සිතාගත්තේය.

මේ දවස්වල සීගිරි එක හරි පාළුය. පට්ට පාළුය. කොයි

වෙලාවකවත් කැෂියර්ලා ළඟ පෝලිමක් නැත. දේවකට ආස කැෂියර් පොයින්ට් හතරම බිසීවෙනවා දකින්නටය. අඩුම ගානේ එක කැෂියර් කෙනෙක් ළඟ හතර පස්දෙනෙක්වත් සිටිය යුතුය. සීගිරි සුපර් හී රාක්ක මේ බලාගෙන සිටිද්දී හිස්වෙනවා දකින්නට දේවක ආසය. සප්ලයර්ස්ලාගේ ලොරි එක පෙළට නවත්වාගෙන ඉන්න වෙන්නේ එවිටය.

හීන දකින එක ලේසිය. ඒත් ඒ හීන සැබෑකරගන්නා එක අමාරුය. දේවක මේක හොඳින් දැනගෙන උන්නේය. වැඩ පටන් ගන්නේ කොහෙන්ද කියා දේවක තවම සිතා නැත. ඒක හිතන්නේ අදය. සීගිරි එකට පය තිබ්බාට පසුය.

"සීගිරි එකට උරුමකම් කියන කොල්ලෝ තුන්දෙනෙක් ඉන්නවා. එක්කෙනෙක් මිහිරංග. අනිත් කෙනා කෝසල. මගේ පුංචිගෙයි ලොකු අම්මගෙයි පුතාලා."

දේවක සීගිරි එකට පය තියන්නේ මේ හැමදේම දැනගෙනය. ඔහු ඊයේ අප්පච්චිගෙන් සීගිරි පවුල් පහ ගැන හරියටම අහගත්තේය. ජීවන් සියල්ල කියා දුන්නේය.

"සීගිරි පවුලේ පුංචි මහත්තයෝ මම වැඩියෙන්ම ආදරේ ඔයාගේ මාමට. ඒ කියන්නේ මිලින්දට."

"ඒ කියන්නේ අප්පච්චි මේ භාවනාගේ තාත්තට."

කොල්ලා කෙල්ල ගැන විශේෂත්වයකින් හිතන බව ජීවන් දැන් දනී.

"ඔව්. හරි හොඳ මිනිහෙක්. ඒ වගේම මම හරි ආදරෙයි ඉඳුනිල්ට. ඔයාගේ නැන්දට. ඔය කියන දුවගේ අම්මා. ඔයාගේ අම්මත් ඉඳුනිල්ට හරි ආදරෙයි."

ජීවන් හැමදේම කියා දුන්නේය. ඒත් මේ යන්නේ සීගිරි පවුලට මොකක් හෝ කොක්කක් ගසන්නට නොවේ. දේවක එය හොඳින් හිතට ගත්තේය. එහෙත් සීගිරි එකේ රස්සාව කරනවානම් මේ හැමදේම දැනගන්න ඕනය. සීගිරි එක යනු පවුලේ ව්‍යාපාරයකි.

දේවක ත්‍රී වීලරය නවතාගත්තේ සීගිරි එකෙන් පිටතය. ඔහුට සීගිරි එක දෙස හොඳින් බලාගෙන එන්න ඕනය. ඒ නිසා කොල්ලා බැස්සේ පාරේය.

"සීගිරි එක දැන ඕපන් කරන්නේ නමයට. ඒත් පළවෙනි කස්ටමර් එන්නේ දහයා මාරට විතර. එහෙම වෙන්න හේතු තියෙනවා තව මාසෙකින් සීගිරි එක ඕපන් කරන්නේ අටට. නමයට නෙමේ. ඒ වෙලාවෙත් සෙනඟ උතුරන්න ඕන."

දේවක හීනයක් දැක්කේය. ඔහු ආවේ පාළු කා පාක් එක මැද්දෙනි. කිසිවෙක් තවම ඇවිත් නැත. එහෙම වූ එක හොඳය.

** ** ** ** ** ** ** **

උදේම නාගත්තද භාවනා තවම ඇඳින්න ගත්තේ නැත. ඔහු මීට ටික වෙලාවකට කලින් සීගිරි එකට ආව බව භාවනා දනී. 'වෙල්කම් ටු සීගිරි

දේවක' ඇය සිතින් කීවාය. භාවනා නාගෙන සාමාන්‍ය ඇඳුමක් දමාගෙන එහෙට මෙහෙට ගියාය. පහළටද ගියාය.

ඉඳුනිල් පහළදී කෙල්ලව අල්ලාගත්තාය.

"පොඩි අක්කා කිව්වද?"

ඉඳුනිල් ඇසුවාය.

"ම්. ෆුල් හැපී එකේ ඉන්නේ නේද අම්මා"

"ම්. එයාගේ ආසාවනේ."

ඉඳුනිල් කීවාය.

"මාත් යන්නෝන ඔය මොකක්හරි අටවගෙන. එතකොට කියයි මගෙත් ආසාවනේ කියලා.නේ."

කෙල්ල එහෙම යන්නේ නැති බව ඉඳුනිල් දනී.

"යන්නෝනනම් යන්න ඔයත්"

අම්මා ඒක කිව්වේ දුකෙන් බව භාවනා තේරුම් ගත්තාය.

"අපි ගියදවසට තමයි අපේ අගේ තේරෙන්නේ. පහේ බෝතල් වලින් කැතම බෝතලේ ලුණු බෝතලේලු. ඒත් ඒක නැතිවෙච්ච දවසට කාලා හමාරයි"

භාවනා සිනාසී කීවාය. ඇයත් කියන්නේ පුදුම කතාය. එහෙත් ඒ කතාව හරියටම හරිය.

"දැන් කියන්න යන්නේ ඔයා ලුණු බෝතලේ කියලද?"

ඉඳුනිල් ඇසුවාය.

"හිතන විදිහට හිතාගන්න එකයි ඇත්තේ."

ඇයගේත් හොඳට කටය.

"ඔයා ලුණු බෝතලේ නෙමේ. මේ ගෙදර පහන. නැතිවෙච්ච දවසට

හරිම කළුවරට තියෙයි. කාලා බීලා නෙමේ කිසිම දෙයක් කරලා හමාරයි. හරිනේ..!”

ඉඳුනිල් ලෝබකමක් නැතිවම කීවාය. භාවනාගේ දෙනෙත් තෙත්විය.

“මම එහෙම යන්නේ නෑ. කොහේ කියලා යන්නද අනේ.”

හදවතේ ඇතිවූ දුක්බර සිතිවිලි සමඟම භාවනා කීවාය.

“පොඩි අක්කට ප්‍රසන්ට් එකක් අරන් දෙන්නෝන. මොනවා අරන් දෙන්නද කියලා තේරෙන්නේ නෑ අම්මා.”

තෑගි නොදුන්නාට තාරකා මේ වෙද්දී කෙල්ලට රුපියල් හැට හැත්තෑ දහසක දඩ දමා ඇත. හැමදේටම ඇවිත් තාරකා අත පෑවේ

කෙල්ලටය. කවදාවත් භාවනා නොදී උන්නේ නැත. පොඩි අක්කලා දහයක් පහළොවක් නැත. ඇරත් කෙල්ල සල්ලිවලට ලෝබත් නැත.

"ලස්සන සිල්වර් පාට වොච් එකක් අම්මා. එහෙම හොඳයිද?"

"මී. යුනිෆෝම් එකටත් ලස්සනට තියෙයි දැන් දාන්නේ සිල්වර් වොච්නේ නේද?"

"හරි ආසයි එයා යන ෆලයිට් එකක යන්න දවසක."

භාවනා කීවාය.

"පොඩි අක්කා එක්කගෙන යයි මැණික."

"කිව්වා. අක්කවයි මාවයි එක්කගෙන යනවා කියලා."

ඉඳුනිල් දුක්ඛරව බැලුවාය.

"අක්කට අමාරුවෙයි."

භාවනාට හීල්ලින.

"පොඩි ආරංචියක් තියෙනවා උඩ පේරාදෙණියේ ඉන්න වෙද මහත්තයෙක් ගැන. ආරංචිය ලැබුන ගමන්ම ඉන්නේ අක්කව එක්කගෙන යන්න. එයාගේ ජීවිතේම රෝද පුටුවේ තියන්න බෑ."

නේත්‍රා ඉස්සර වාගේ ලස්සනට ඇඳ පැළඳ ඇවිදගෙන එනවා දකින්නට ඉඳුනිල්ටත් ආසය. ඒත් නේත්‍රා කරකවාගෙන එන රෝද පුටුවේ කිරි කිරිස් හඬ එද්දීත් ඉඳුනිල්ට නම් දුකය.

භාවනා ඇගේ තේ මග් එකත් අරගෙන උඩට ආවේ නේත්‍රා ගැනද සිතමිනි. කෙල්ල උඩට ඇවිත් ඇඳට බරවී තේ එක තොලගෑවාය. ඊටත් පසු දුරකථනය අතට ගත්තාය.

නැත. එහි කිසිම හැල හොල්මනක් නැත.

හිතන්නේ නැතිවම භාවනා ඇමතුමක් ගත්තාය. අද කිරි එක රසය. මේ හදා ඇත්තේ පිටි කිරි නොවේ. දියර කිරිය. මේ රසත් ඒක නිසායැයි භාවනාට සිතෙයි.

ඇමතුම සම්බන්ධවිය.

"ගුඩ් මෝනිං මිස්."

දේවක කතාකළේ උද්යෝගයෙනි. උදේකට කතාකළ යුත්තේ එහෙම කෙනෙක්ටය. නිදාගෙන හිටියත් ඇහැරෙන්නට සිතෙන්නේ එවිටය. මල් පුබුදුවන හිරුෑ බබලවන හඬක් විය යුතුය.

"ගුඩ් මෝනිං දේවක. දැන්ද ආවේ?"

භාවනා ඇසුවාය.

"ටිකක් වෙලා මිස්. මම මේ වටයක් දෙකක් යනවා. මේ වෙලාවට එහෙම යන්න ලේසියි."

"ම්. මම ටේබල් එකක් දම්මලා තියෙන්නේ. ආවාම කියන්නම්."

ඇය කීවාය. රඹුක්වැල්ල මහතා දේවකගේ මේසය දමන්නට කීවේ මුළු සුපර් මාර්කට් එකම පේන තැනකය.

"මේසයක් නැතත් කමක් නෑ මිස්. මම හිතන්නේ නෑ මට ටේබල් එකක ඉඳගෙන කරන්න වැඩක් ඇති කියලා."

"ඒත් තමන්ට කියලා මේසයක් තියෙන්න ඕන."

දේවක අසාගෙන උන්නේය.

"බලන්නකෝ එහෙනම්."

භාවනා ගියේ දුරකථනය

තියන්නටය

"මිස් මේ"

"ඇයි?"

ඇය ඇසුවේ පපුවට අතක්ද තබාගෙනය. 'මේ පිස්සා සමහර වෙලාවට මොනවාහරි කියන්න යනකොට මටත් බය හිතෙනවා'

"අද මිස් මායි අප්පච්චියි බෙල්ලන්විල පන්සල් ගියා."

"අද ජොබ් එකට යන ෆස්ට් දවස නිසාද පන්සල් ගියේ."

"ඔව් මිස්."

"මාත් ආසයි බෙල්ලන්විල යන්න. ටික දවසකින් ගියේ නෑ."

"උදේ පාන්දර ගියාම හරි නිවනයි මිස්."

ඒ නිවන හෙටම පන්සල් ගොස් අත් විඳින්නට ඇයට ආසය.

"ම්."

ඈය හූ මිටි තැබුවාය.

"අප්පච්චි මාව ආවස ගෙට එක්කගෙන ගිහින් ලොකු සාදුට කියලා පිරිත් නූලකුත් ගැට ගැහැව්වා."

ඔහුගේ අප්පච්චිව දකින්නට ඈයට ආසය. වැඩි වයසක් ඇති අප්පච්චි කෙනෙක් නොවිය යුතුය. මිලින්දත් දුවලා තුන්දෙනෙක්ගේ තාත්තා කෙනෙක් වුවද තාම කොල්ලා වාගේය.

"ම්."

"මම මේ මිස්ටත් පිරිත් නූලක් ගත්තා. ආවම දෙන්නම් මිස්."

භාවනාගේ පපුවේ මොනවද පෙරළෙන්නට විය. 'ඇයි එහෙම කළේ දේවක.' ඈයට අසන්නට

සිතෙයි.

"ගොඩක් පින් මාව මතක්වුණාට."

ඇය කෘතවේදීව කීවාය.

"මම එන්නම්."

ඇය දුරකථන ඇමතුම අවසාන කළේ එහෙම කියාය. ඊට පසු වම් පියයුරුව අසළ ඇදුම්කන්නාක් වැනිය.

"ඔයත් එහෙනම් චූට්ටක් මම ගැන හිතනවා."

ඇය සුසුමක් හෙළා සිතුවාය. හදවත ඇතුලාන්තයෙන් එක මොකක්ද රසබර හැඟීමකින් මන්මත්ව ඇය අඬින්නට ගත්තාය.

# 07

"සුපර් මාකට් එක සම්පූර්ණයෙන්ම රී ඕගනයිස් කරලා බේකරි සෙක්ෂන් එකයි කිචන් එකයි දාලා අපේ ඔක්කොම ප්‍රමෝෂන්ස් පටන් ගන්න පුළුවන් සර් මාර්තු විසිපස්වෙනිදා වෙනකොට. මට සර් මේ මාසේ දහවෙනිදා ඉඳලා මාර්තු විසිපස්වෙනිදා වෙනකල් සුපර් මාර්කට් එක මාස එකහමාරක් වහලා ඕන"

දේවක කීවේ රඹුක්වැල්ල මහතාටය. ඒ වෙලාවේ නේත්‍රාත් භාවනාත් උන්නෝය. 'බය නැද්ද මන්දන්නේ නෑ එහෙම කියන්න' භාවනා සිතුවාය.

"දේවකට මේ කාලය ඇත්ද? මාස එකහමාරයි"

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"ඇති සර්. අදම වැඩ පටන් ගත්තොත්. මට සර් දාන්න පුළුවන් බජට් එක කිව්වොත් ඒක තවත් ලේසියි. එතකොට යන්න පුළුවන් ටාගට් එක එඩිට් කරගන්න පුළුවන් ඒ බජට් එකට"

කොල්ලා දෙයක් කියන්නේ එසේ මෙසේ නොවන බව රඹුක්වැල්ල මහතාට වැටහිණ. කොහොමත් උදේ මිලින්ද කීවේද අලුත් සැළසුම් ටික

පුළුවන් ඉක්මනට සීගිරි එකේ පටන් ගන්න කියාය.

"අපි එහෙම කරමු. මම අද බලලා දේවකට කියන්නම් අපේ බජට් එක මොකක්ද කියලා. ම්."

ඔහු කීවේය.

"අපි සර් මේ ස්ටාෆ් යුනිෆෝම් මාරුකරන්න ඕන. ටිකක් වයිබ්‍රන්ට් කලර් එකකට යන්නෝන. දැනට කස්ටමස්ලට සුපර් මාර්කට් එකේ ස්ටාෆ් එක වෙන්කරලා අඳුනගන්න අමාරුයි."

"ඒක ඇත්ත මටත් අමාරුයි. සමහර දවස්වලට මම ස්ටාෆ් එකේ අය කියලා කස්ටර්මස්ලට කතාකරනවා"

"සුපර් මාර්කට් එක වැඩුවට සර් මට ස්ටාෆ් එක ඕන. අපි පැකින්

ඩිපාට්මන්ට් එකක් දාන්න ඕන. හැමදේම අපේම පැකින් එකකින් එන්නෝන සීනි මුං ඇට පරිප්පු ස්පයිසස් පවුඩර්ඩ් ස්පයිසස් හාල් පිටි කුරක්කන් පිටි එහෙම. ඒකට සර් සීලින් මැෂින් දෙකක් ගන්නෝන. මේ ස්ටාෆ් එක ඇති ඒකට"

අද හැම සුපර් මාර්කට් එකක්ම කරන්නේ එයය. හැමදේම එන්නේ ඔවුන්ගේම පැකින් එකකිනි.

"දැනට මේ එන කස්ටමස්ලට සර් අපි නෝටිස් එකක් දාන්න ඕන අපි මේ දවස් ටික වහලා තියෙන්නේ කියලා. අලුත් වෙන සීගිරි එක බලන්න විසිහයවෙනිදා උදේ පාන්දරම එන්න කියලා."

රඹුක්වැල්ල මහතා සිනාසුනේය. ඒ අලුත්වෙන සීගිරි එක දකින්නට

ඔහුත් ආසය.

"අපි එළියෙන් මොනවද කරන වෙනස්කම් දේවක."

ඔහු ඇසුවේය.

"අපි සර් ඉස්සරහ තාප්පේ සම්පූර්ණයෙන්ම කඩනවා"

එහෙම කියද්දීත් භාවනාගේ හිත වෙව්ලයි. 'එයාට බයක් නෑනේ' ඇය පසුව සිතුවාය.

"කා පාක් එකයි සුපර් මාර්කට් එකයි බස් එකේ යන අයට පවා පේන්න ඕන. සම්පූර්ණයෙන්ම කඩන්න වෙනවා සර්. පස්සේ තාප්පේ වෙනුවට ඒ දිගට අපි ලස්සන ගස් පේළියක් හිටවනවා. ෆොක්ස් ටේල් වගේ උස ගස් පෙළියක් සර්. යටින් ගහට ලයිට්ස් දානවා. කා පාක් එක දැනට තියෙන්නේ තාර දාලනේ සර්."

"ඕ."

"ඒක ටිකක් හරි නෑ වගේ සර්. මොකක්ද ඩිපෝ ගතියක් තියෙනවා. අපි ඒ තාර අයින් කරලා ඉස්සරහ පාක් එක සම්පූර්ණයෙන්ම පාවින්ස් අල්ලනවා. පාකින් පොයින්ට්ස් අපි ලස්සනට කහ පාටින් මාක් කරන්න ඕන සර්. අපේ ටාගට් එක සර් මේ හැම පාකින් ලොට් එකක්ම ෆිල් කරන එක. නැතුව සර් මේ පාකින් එකක් හදන එකම නෙමෙයි. ඒක අපේ ටාගට් එක මනින මෙෂමන්ට් එකක්. සර්ට මම පොරොන්දු වෙනවා දවසේ පැය හතක්වත් කොහොමහරි පාකින් ෆුල් කරනවා කියලා"

ඔහු වෙනස්කම කියන්නේ අභියෝගයක්ද සමඟය. රඹුක්වැල්ල මහතා එය සියුම්ව තේරුම්

ගත්තේය. එහෙම කියන අය ලේසියෙන් හමුවෙන්නේ නැත.

"අපි අද ඉඳලා පර්චසින් නවත්තන්න ඕන මිස්."

ඔහු කීවේ නේත්‍රා දෙස බලාය.

"එහෙම කරලා දේවක."

"අපි හෙට ඉඳලා අලුත්වෙන සීගිරි එක ගැන හිතලා ස්ටොක්ස් ගන්න ඕන මිස්. අපේ සප්ලයර්ස්ලටත් කියන්න ඕන අපේ වෙනස ගැන. හැම සප්ලය කෙනෙක්ම අපිට මොකක්හරි ප්‍රමෝෂන් එකක් දෙන්න ඕන. එයාලා ගෙන්නවලා කතාකරන්න වෙනවා මිස්. අපි විසිවෙනිදා ඉඳලා අලුත් සුපර් මාර්කට් එකට බඩු අසුරනවා. හරියට අලුත් නැකතකට අලුත් සුපර් මාර්කට් එකකට බඩු පැක් කරනවා

වගේ. පළවෙනි රාක්කෙට බඩු පැක් කරමු සර් අපි හොඳ නැකතක් බලලා. උදේ පාන්දරක."

දේවක කීවේය. රඹුක්වැල්ල මහතා බැලුවේ නේත්‍රාත් භාවනාත් දෙසය. කොල්ලා කියන ලෙස වැඩ කරන්න ආසය. 'මාවනම් වෙව්ලනවත් වගේ. ඒත් ආසයි ඔයා කියන දේවල් අහගෙන ඉන්න. කරන විදිහ කිව්වොත් මාත් බලලා කරන්නම්' ඇය සිතින් සිතුවාය.

"අපිට මේක කරන්න පුළුවන් සර්."

දේවක කීවේය.

"ඔව් පුළුවන්. දේවක වැඩ පටන් ගන්න."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මම අදම සර් මේ ඒසී එහෙම

සර්විස් කරන්න ගෙන්නන්නද? ඒවා කරන්නේ කවුද සර්. ඇතුලේ කිසිම කූල් එකක් නෑ. කස්ටම කෙනෙක් ආවාම නුවරඑළියට ආවා වගේ සීතලක් තියෙන්න ඕන."

රඹුක්වැල්ල මහතා පිළිගත්තේය.

"මේ කරන අය හරියට කරන්නේ නෑ දේවක. අපි අලුත් කම්පනි එකක කතාකරගමු."

"මම ඒක බලන්නම් දේවක"

නේත්‍රා කීවාය. අලුත් වෙන සීගිරි එකේ වැඩ බාරගන්නට හැමෝම කැමතිය.

"අද උදේ ස්ටාෆ් මීටින් එකක්. මම ඔයාව ස්ටාෆ් එකට අඳුන්නලා දෙනවා. ඒ වගේම ඔයාට බලයකුත් දෙනවා හැමදේම කරන්න. ම්."

"තැන්කියු සර්. මට මේ හැම

කෙනෙක් එක්කම වැඩකරන්න ඕන සර්. තේ හදන අනුලා එක්ක පවා. නැතුව සර් මේ ටාගට් එකට යන්න බෑ. අපි ටීම් එකක් විදිහට වැඩකරන්න වෙනවා"

දේවක වැඩ බාරගත්තේ රඹුක්වැල්ල මහතාට බුලත් අතක් දී වැඳය. ඔහුට පුදුම නැත. මේ ඇවිත් ඉන්නේ ලේසි පාසු කොල්ලෙක් නොවේ. 'සීයට පුදුමයි' භාවනා සිතුවාය.

"මී. තුණුරුවන්ගේ සරණින් ඔයා හිතන විදිහටම හැමදේම කරන්න."

"හොඳයි සර්. මම එහෙනම් වැඩ පටන් ගන්නවා සර්."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය. පසුව දේවක ගියේ නේත්‍රාගේ මේසයටය. නේත්‍රා තේ

ගෙන්නට කියා භාවනාටද එන්නට කීවාය.

"මම මිස් ඊයේ අර වෙද මහත්තයා ගැන බලන්න කියලා නුවර යාළුවෙක්ට පණිවිඩේ දුන්නා .අද හවස බලලා කියයි. වෙද මහත්තයා මිස් ෆෝන් පාවිච්චි කරන්නේ නෑ"

නේත්‍රාටත් භාවනාටත් පුදුමය. එය නිකම්ම කටට ආවාට කියූ කතාවක් නොවේ. කොල්ලෝ බොහෝ විට එහෙමය. පසුව අහද්දී අරම කතාවක් කිව්වා කියාවත් මතක නැත.

"එහෙම වුනොත් දේවක?"

"එහෙම වුනොත් මිස් අපි පෝය දවසේ යමු. ඉස්සෙල්ලා ගිහින් වෙද මහත්තයට පෙන්නමුකෝ."

නේත්‍රා බැලුවේ භාවනා දෙසය.

"මටත් ආසයි මාළිගාවට යන්න. වෙන මොකටවත් නෙමේ මගේ නංගිලා දෙන්නට බාර දෙකක් වෙන්න."

නේත්‍රා කීවාය. භාවනාගේ ඇස් තෙත්ව දිලිසුණේය. ඇය නෙත් බිමට බරකරගන්නවා දේවකද බලාගෙන උන්නේය.

"මගේ ලොකු නංගි දේවක නෙක්ස්ට් වීක් එකේ ඉඳලා එමිරේට්ස් එකේ එයා හොස්ටස් කෙනෙක් විදිහට වැඩ බාරගන්නවා."

"අනේ ෂෝක්නේ මිස්. ලොකු නංගි කිව්වේ තාරකා මිස්ද මිස්."

තමා අතින් නොකිව යුතු දෙයක් කියවුන බව දේවක දැනගත්තේය. 'දැන් අහයි තාරකා මිස් ගැන දන්නේ

කොහොමද කියලා දීපංකෝ උත්තර’

“දේවක කොහොමද දන්නේ මගේ ලොකු නංගි ගැන?”

භාවනාද පුදුමයෙන් බැලුවාය. ‘මම එයාට කිව්වෙත් නෑනේ’

“මේ මම මිස් මේ සිකියුරිටි අන්කල්ගෙන් විස්තර එහෙම ඇහුවා.”

දේවක අමාරුවෙන් කීවේය. ඒ බොරුව කටට ආ එක පුදුමය. නේත්‍රා සිනාසුනාය.

“එයා තමා. හොඳ සක ඔබරේ. තාරකා නෙමේ එයා තරු මන්දාකිණියක්”

නේත්‍රා කීවේ ආදරයෙනි.

“මට අහන්න දෙයක් තියෙනවා දේවකගෙන්.”

“හා මිස්.”

"තේක බොන්නකෝ."

දේවකගේ තේ එක ළඟට දුන්නේ භාවනාය. ඔහුට අද මග් එකක් ගෙනවිත් දිය යුතුය. ඒවා බලා කරන්නේ භාවනාය.

"දේවක අපි ළඟට එන්න මොකක්හරි විශේෂ හේතුවක් තියෙනවද?"

නේත්‍රා ඇසුවාය. ඒ අහපු විදිහට කොල්ලා බොමින් උන් තේ ටික ඔහුට ඉස්පොල්ලේ ගියේය. දේවක දෙතුන් විඩයක්ම කැස්සේය.

"හිමිහිට බොන්න එපැයි."

භාවනා කීවාය. දේවක හිස එසවූයේ ඉස්පොල්ලේ යාම නිසා ඇතිවූ තෙත් දෙනෙත්ද සමඟය.

"හරි මිස් එහෙම ඇයි ඇහුවේ?"

"එහෙම හිතෙන නිසා."

"නෑ මිස් මම සීගිරි එකේ වැඩකරන්න ආසයි."

"මි. දෙයක් තියෙනවානම් පස්සේ හරි කියන්නකෝ මට. එහෙම හිතෙනවා"

'මටත් හිතෙනවා' භාවනාගේ දෙනෙත් කීවේද ඒ කතාවය.

# 08

දැන් හිතට නිවනක් නැත්තේ තමාගේ යැයි භාවනාට සිතුණි. අද දවස පුරාම වූයේ එයය. ස්ටාෆ් මීටින් එක වෙලාවේ මේ ඇස් තිබුණේද එක මුහුණත් මත නතරවීය. 'කවුරුහරි දැක්කද දන්නෙත් නෑ.' භාවනා සිතුවාය. බොහෝ දෙනෙක් දේවකව සතුටින් පිළිගත්තෝය. එහෙත් දෙතුන් දෙනෙක්ගේ මුහුණු හොඳ නැත. ඒ මිහිරංගගේ කට්ටියය.

ඔවුන්ගේ මුහුණුවල තිබුණේ 'කරලා බලමුකෝ' වැනි කතාවකි.

දේවකට ස්ටාෆ් එකේ මුළින්ම සුබ පැතුවේ භාවනාගේ කෙල්ලෝ ටිකය. කැෂියර් එකේ කෙල්ලෝ සෙට් එකය.

"වෙල්කම් සර්."

කෙල්ලෝ ටික කීවෝය.

"තැන්කියු. ළමයි ටික මට සපෝට් එක දෙන්නෝන."

භාවනා ඔවුන් වෙත ආවේ දේවක එහෙම කියද්දීය.

"අපි දෙන සපෝට් එක ගැන අපේ මිස්ගෙන් අහන්නකෝ සර්"

කෙල්ලෝ ටික කීවෝය. කෙල්ල කිසිවක් නොකියා සිනාසුනේ 'අනේ උඹලගේ සපෝට් එක' කියන්නාක් බඳුවය. 'හැමදාම මගේ අතින් පාඩුයි' ඔය ටික ඇය කීවේ නැත.

"කස්ටමර් අන්තිමට යන්නේ ඔයාලගේ ළඟින්. කෙනෙක් අන්තිමට කියන දේ හරිම වැදගත් ඒක මෙතනට එන්නේ"

දේවක කීවේ ඔහුගේ පපුවට අතක් තියාගෙනය.

"හරියට අපි යනකොට අම්මා තුණුරුවන් සරණයි පුතේ කියනවා වගේ දොර ළඟ ඉඳන්."

මෙහෙම කියන්නේ අම්මා කෙනෙක් නැති පුතෙක් නේදැයි භාවනා සිතුවාය. තමාගේ සිතේ අවසානයට රැඳෙන්නේද එයම නොවේද? මොන වැඩේ තිබුණත් අම්මා තමා යද්දී වාහනය ළඟටම ඇවිත් හිස අතගා බුදු සරණයි කියයි. දවසම වාසනාවන්තය.

"දත් එහෙම පණුවෝ කාලා

නෑනේ අපේ. ඒනිසා ලස්සනට හිනාවෙන්න. අපි දෙනවා ලස්සන පාටක ලිප්ස්ටික් එකක්. නේද මිස්."

දේවක කීවේ භාවනා දෙසද බලාය.

"මිස් ගාණ පාට."

අනු කීවාය. භාවනා තොල්පට මුව තුළට දමාගත්තේ ඔහු බැලූ නිසාය.

"ඒ පාට ලස්සනයි තමයි."

දේවක කීවේය. 'මේ පිස්සෙක් ළමයිත් ළඟ තියාගෙන කියන්නේ' ඇය සිතින් කීවාය.

"අපි එක විදිහකට හෙයා කට් එකකුත් ගමුකෝ. මෙයා ලූස් හෙයා මෙයා පෝනි ටේල්. කවුද ඔයා අනූනේ."

"ඔව් සර්."

"අනු කොණ්ඩ දෙකට ගොතලා.

එහෙම බෑ අපි අලුත් යුනිෆෝම් එකත් එක්ක බලලා එකම හෙයා ස්ටයිල් එකක් දාමු."

භාවනාට පුදුමය. 'මේවා ඔක්කොම ඔයා දන්නේ කොහොමද'

"පියුමි මොකද නිල් පාට කියුටෙක්ස් ගාගෙන"

දේවක එකපාරම ඇසුවේය. තමාගේ නම ඔහු හොයාගත්තේ කෙසේද කියා පසුව ඇය සිතුවාය.

"මේ සර් මේ."

භාවනා තොල්පට තදකරගෙන සිනාසුනාය.

"මම පියුමිට කිව්වා ඕක."

භාවනා කීවාය.

"ඒක ලස්සන නෑ. අපි ගානවා නම් එකම පාටක් ගාමු. මි."

"හා සර්."

"ලයිට් පින්ක් එකක් වගේ. ඒක ලස්සනයි. නේද මිස්."

භාවනා හිස වැනුවාය.

"නිල් පාට කියුටෙක්ස් ගාපු අතක් කැෂියර් මැෂින් එකේ යනකොට කස්ටමර්ටත් නිකං මොකක්ද වගේ. මටත් එදා එහෙම හිතුණා."

භාවනාද එය අනුමත කළාය.

"සොරි සර්. මේ වෙඩින් එකක් තිබුනා ඒකයි. නැත්නම් මාත් ආස නෑ."

කෙල්ලෝ ටිකව ඔහු ලස්සනට බයකරගත්තා යැයි භාවනාට සිතුණි. එහෙම කළ යුතුය. ඒත් ඒක කළේ ආදරයෙනි. වටින්නේ ඒකය.

"තැන්කියු මාත් එක්ක කතාකළාට. මිස් එහෙනම් පාස් වර්ඩ් දෙන්න."

දේවක කීවේය. කෙල්ල කැෂියර්

මැෂින් වලට පාස්වර්ඩ් දෙනවා දේවක බලාගෙනය. ඇගේ නිය හැඩ වී ඇත්තේ සුදු පැහැයට හුරු රෝස පැහැයකිනි. දැන් ඇයට බය මේ පාටටත් ඔහු මොනවා හෝ කියයි කියාය. 'මගේ නේල් දිහා තමා බලාගෙන ඉන්නේ' ඇය නෙත් කොණින් දැක්කාය.

මිහිරංග අද සීගිරි එකට ආවේ නැත. කෝසල පැමිණ පැයක් දෙකක් ඉඳ ගියේය. ඒ ඇරෙන්නට දේවක අද සීගිරි එකම ඔහුට නතුකරගත්තේය. දැන් දේවක සීගිරි එකේ අවුරුද්දක් හිටපු ගාණය. ඒත් ඔහු පැමිණ තවම පැය දහයක්වත් නැත.

භාවනා උන්නේ හවස යාගන්නට බැරුවය. දේවක උන්නේ

කොන්ත්‍රාත්කරුවෙක් සමඟ එළියේ කා පාක් එකේය. ඔහු පිටත කා පාක් එකත් සීගිරි පිවිසුමත් හදන ආකාරය ගැන පහදා දෙමින් උන්නේය. භාවනා සියල්ල වීදුරුවෙන් බලාගෙනය.

"යක් පැටියෙක්ද කොහෙද? මෙච්චර වැඩ කරන්නේ කොහොමද?"

භාවනා සිතුවාය. ඔහු වැඩ කරනවා පමණක් නොව වැඩ ගන්නටද දන්නේය. අද ස්ටාෆ් එකටට වැඩය. අද දේවක භාවනාටද වැඩ දෙකක් දුන්නේය. ඒ අලුත් කම්පියුට බිලින් සිස්ටම් එකක් හොයන්නටය. මේ තියෙන සිස්ටම් එක හරි නැති බව ඇයද දනී. කිසිම වෙලාවක බා කෝඩ් එකක් රීඩ් වෙන්නේ නැත. හරියට ස්ටොක්ස්

පෙන්වන්නේද නැත. භාවනාගේ දවසින් වරුවක්ම ගියේ ඒකය.

ඔහු ඔෆිස් එකට එන තුරු ඉන්නවා කියා භාවනා සිතාගත්තාය. ඔහුට කතානොකර යන්නට බැරි ගතියක් දැනෙන්නේ ඇයිදැයි ඇයටම තේරෙන්නේ නැත. අද නේත්‍රාත් බරටම වැඩය. ඇය උන්නේ අලුත් සප්ලයර්ස්ලා සමඟ කතාකරමිනි. ඔවුන්ගෙන් ප්‍රයිස් ලිස්ට් ගෙන්වා ගනිමිනි. දේවක කිව්වා හරිය. ඕනම ප්‍රමෝෂන් එකක් කරන්නට සප්ලයර්ස්ලා සූදානම්ය. ඔවුන්ටත් ඕනා සේල්ස් වැඩිකරග න්නටය.

දේවක ආවේ හයත් පසුවීය. ඔහු කෙළින්ම ආවේ භාවනාගේ කාමරයටය. කෙල්ල උන්නේ අත්

බෑගය මේසය මත තියාගෙන යන්නට සූදානම්ය.

"අනේ මිස් යන්නද?"

ඔහු ඇසුවේය. 'යන්නෙපා කියනවා වගේනේ එහෙම කියන්නේ' කියනවානම් රෑ වෙන තුරු ඉන්නටත් කෙල්ල සූදානම්ය.

"මම වෙනදට මේ වෙලාවට යනවා."

ඇය කීවාය.

"හෙට අනිද්දට ටිකක් ඉන්න පුළුවන් නේද මිස්."

"ම්. අදත් ඕනනම් පුළුවන්."

"අද කමක් නෑ මිස්. හෙට ටිකක් ඉමු. මට පේන්නේ නැති දේවල් මිස්ට පේන්න පුළුවන්."

ඔහු කීවේය. 'මට මේ දවස්වල මොනවත් පේන්නේ නෑ අනේ' ඇයට

කියන්න හිතෙන්නේ ඒකය.

"අද මේ ලන්ච් ගන්නවා මම දැක්කෙත් නෑ."

ඇය කීවාය.

"මට අද ලන්ච් ගන්න වුනේ නෑ මිස්."

ඔහු කීවේය. කෙල්ලගේ පපුව හෝස් ගා ගියාය. 'එයා ලන්ච් ගත්තේ නෑ කිව්වම ඇයි මගේ පපුව දාලා යන්නේ'

"ඇයි බඩගින්නේ වැඩ කරන්නේ එතකොට තාම බඩගින්නේ?"

"මේ කිරි පැකට් එකක් බිව්වා මිස් ඒක ගාණක් නෑ."

ඔහු කීවේය.

"දැන් මොනවා හරි ගෙන්නන්නද කන්න?"

දේවකගේ පපුව දන්න ගත්තේ

එවිටය. 'ඔයා කොච්චර හොඳද'

"දැන් කමක් නෑ මිස්. හෙට ඉඳලා බත් එක ගේනවා."

"උයාගන්නත් ඕනද උදෙන්?"

"අප්පච්චි ගමෙන් හේරත් මාමා කියලා අපි දන්න කෙනෙක්ව ගෙන්නුවා. මිනිහා හොඳ කුක් මිස්. එයා හෙට ඉඳලා උයනවා."

ඇය බලාගෙනම උන්නාය.

"තේකක් බොමු."

ඇය තේ ගේන්නට කිව්වේ ඔහු බඩගින්නේ නිසාය. පසුව ඇය සුමනාවතීට අතින් මුදල් දී ලෙමන් පෆ් එකකුත් ගේන්න කියා කීවාය. 'ඔයා ලෙමන් පෆ් ගෙන්නන්නේ මම බඩගින්නේ නිසා. මේ උතුම් හදවතට කවදාවත් දුකක්නම් වෙන්න එපා' ද්වේක පැතුවේය. හැමෝටම එහෙම

හදවත් නැත.

ඉන්පසු ගෙවීගිය තත්පර කිහිපය ගෙවුණේ නිහඬවය.

"දේවක"

මුලින්ම කතාකළේ භාවනාය. දේවකගේ දෙනෙත් එසවිණ. පසුව දෙනෙත් හමුවිණ. භාවනා කෝළ සිනාවක් සමඟ දෙනෙත් යළිත් බරකරගත්තාය. ඇයගේ කුඩා ඇස්වලට තවම එහෙම පිරිමි ඇස්දෙකකට කෙළින් මුහුණ දී පුරුද්දක් නැත.

"මිස්."

දේවක ඇය දෙස බලාගෙනම ඇසුවේය.

"ගොඩක් රෑ වෙලාද යන්න හිතන් ඉන්නේ?"

භාවනා ඇසුවාය. ඇය ඇසුවේ

අසන්නට ගියදේමද කියා ඔහු සිතුවේය. සමහරවිට එහෙම වෙන්නට ඇත. විකාර හිතන්නේ එක්කෝ තමාය.

"අට විතර වෙයි මිස්. ඇයි?"

"ඒ වෙලාවට යද්දී පරිස්සමින්. මම අර කියපු දේවල් හිතේ තියාග න්නෝන."

මේ පරිස්සම කුමක්ද? දන්නේ නැත.

"මම පරිස්සමින් යන්නේ මිස්. ඒත් මේක ඇතුලේ වෙන කතාවකුත් යනවා කියලා මට දැනෙනවා මිස්. හතර පස් දෙනෙක් ඉන්නවා යන්නේ රෝන් සයිඩ්."

භාවනා හිස වැනුවාය.

"එහෙම වෙන්නේ අර හේතුව නිසා."

"මට අද තේරුණා මිස්. අපි ටිකක් බලමුකෝ මිස්. මගේ අරමුණ මේ සීගිරි එක ලස්සනට හදන එක. මාව සීගිරි එකට ගත්තේ ඒකට කියලා මට හිතෙනවා. මම ඒක කරනවා මිස්."

දේවක කීවේ අධිෂ්ඨානයෙනි.

"ඔයාට ඒක කරන්නත් පුළුවන් කියලා අපි දන්නවා."

"ඒකමයි කරන්නෙත් මිස්."

විශ්වාසය එහෙමය.

සුමනාවතී කිරි තේ දෙකක් සමඟ ලෙමන් පෆ් ගෙනාවාය. භාවනා ලෙමන් පෆ් පැකට් එක කඩා ඔහුට පෑවාය.

"මී. කන්න."

දේවක ලෙමන් පෆ් දෙකක්ම ගත්තේය.

"මිස් කන්නේ නෑනේ."

ඇය සිනාසුනාය.

"කනවා මේ."

"ගෙදර ගිහින්ම මොනවාහරි කන්න මිස්ගේ හිතේ ඇති."

කතාව ඇත්තය. ඇයට හවසට මොනවා හෝ කන්නට ඕනය.

"මී. දැවිල්ලට මොනවාහරි කන්නයි මම ආස."

"වඩයක් වගේ නේද මිස්. සයිවර් සම්බෝල ටිකක් එක්ක එහෙම."

"ෂෝක්. නැත්නම් කට්ලට් දෙකක්. ටොමාටෝ සෝස් එක්ක."

"අපේ අප්පච්චි ගේනවා මිස් මරුෑ එළවළු රොටියක්. නියමයි. ගම්මිරිස් සැර නියමෙට එනවා. කොහෙන්ද දන්නේ නෑ ගේන්නේ"

භාවනා සිනාසුනාය.

"පුතාටද ගේන්නේ?"

"ම්. කවදාවත් මඟින් කන්නේ නෑ. එයා එහෙමයි. ඉතින් මාත් එහෙම පුරුදුවුණා. ඉස්සර ඉස්කෝලේ කොල්ලන්ගේ බර්ත් ඩේ වලට කේක් දෙනවා. මම අප්පච්චිගේ බාගේ අරන් එනවා."

භාවනා හරි ආසාවෙන් අසාගෙන උන්නාය. ඔහුගේ මොකක්ද ඇත. ඒ මොකක්ද කියා තවම දන්නේ නැත.

"මම එහෙනම් යනවා. පරිස්සමින් යන්න."

ඇය කීවාය. දේවකද ඇයත් සමඟම නැඟිට්ටේය.

"බුදු සරණයි මිස්."

ඔහු මුමුණා මෙන් කීවේ ඇය ඔහුගේ ළඟින්ම ගොස් වීදුරු දොර වසද්දීය. භාවනාත් දේවකත්

කොරිඩෝවේ සුපර් මාර්කට් එමින් උන්නේ එකටම මෙන්ය. කොරිඩෝව අවසන් වෙන්නට පෙර මිහිරංගගේ රුව ඉන් ඇතුළු විය. මිහිරංග බලාගෙනම උන්නේය. භාවනා වෙනසක් නොමැතිව සිනාසුනාය.

"ඔයා උදේ ස්ටාෆ් මීටින් එකටත් ආවේ නෑනේ මිහිරංග අයියේ."

ඇය කීවාය. නවතිනවාද නැත්නම් යනවාද කියා මිහිරංග සිතුවේය. එහෙත් ඔහු මඳ වෙලාවක් නතරවිය.

"ඇයි. මොනවද දැනගන්න ඕන"

මිහිරංග ඇසුවේ දේවක දෙසට හැරීය.

"නතිං සර්. අයම් සොරි"

දේවක එසේ කියා ආවේය. භාවනාට දුකය. කවදා හෝ මේ කොල්ලාව සීගිරි එකෙන් ඇරියොත්

මේ මිහිරංගය. තමා කවුද කියා මිහිරංග දැනගන්නේ එදාට කියා භාවනා සිතුවාය.

"මේ ගං කබරයෝ ඉන්ට්‍රොඩියුස් කරලා දෙන්නද ස්ටාෆ් මීටින් තිබ්බෙ. ආ බබා."

මිහිරංග ඇසුවේ දේවක කොරිඩෝවෙන් පිටවෙන්නටත් පෙරය. දේවක හැරී බැලුවේය. භාවනාද එය දැක්කාය. එහෙත් ඔහු එහෙමම ගියේය. 'දවසක මම පෙන්නන්නම් ගං කබරයන්ගේ හැටි' දේවක සිතාගත්තේය.

"හැමෝම අපේ ස්ටාෆ් එකේ අය මිහිරංග අයියේ. ඒ මිනිස්සු අපේ අය එහෙම නිග්ලෙක්ට් කරන්නේ ඇයි?"

භාවනා ඇසුවාය. මිහිරංග සිනාසුණේය.

"අපි බලමුකෝ බබා මොකද වෙන්නේ කියලා."

මිහිරංග කීවේ අමුතුම හඬකිනි.

"ඇයි මොකද වෙන්නේ මිහිරංග අයියේ."

මිහිරංගගේ කට කොනක සිනාවක් මතුවිය.

"වෙන දේ වෙයි. බබා යන්නද?"

භාවනාට කතාකරන්නටවත් සිතෙන්නේ නැත.

"ඔව්. මම යනවා."

"පාටිය බබා."

"සොරි."

භාවනා එසේ කියාගෙනම ගියාය. හිතට දැනෙන තරහව මෙහෙමවත් පාලනය කරගන්නට හැකිවේයැයි ඇය සිතුවේ නැත. සීගිරි එකෙන් පාස්වෙද්දීම වාගේ ඇයට පිච්චමල්

සුවඳක් දැනුණි. ඇය හැරී බැලුවාය. ඒ පිච්චමල් සුවඳ එන්නේ පොඩි නැන්දාගේ පින්තූරයට දැමූ පිච්ච මල් මාලයකින් බව හිතාගන්නට භාවනාට වැඩි වේලාවක් ගියේ නැත. ඇයට පුදුම සිතුණි. ඇය ඒ පිච්ච මල් මාලය ඉඹ බැලුවාය. යන්තමට මැලවී තිබුණද එය තාම සුවඳය.

"කවදාවත් නැතුව නැන්දිගේ පින්තූරෙට කවුද පිච්ච මල් මාලයක් දැම්මේ."

ඇය සිතුවාය. 'සමහරවිට සීයා දාන්න ඇති.' භාවනාට සිතුණි. එය දැම්මේ දේවක බව ඇය දන්නේ නැත. උදේ ආ ගමන්ම ඔහු කාටත් හොරෙන් නිර්මලාගේ පින්තූරයට මේ පිච්ච මල් මාලය දමා වැන්දේය. 'මම සීගිරි එකට ආවා අම්මේ.' ඔහු

මුහුණා කීවේය.

භාවනා ද්වේක කොහේද කියා බැලුවාය. නැත. ඔහු පේන්නට නැත. 'එයාටත් මේවා ඇහෙන එක එක අතකට හොඳයි. තේරුම් ගනීනේ' පසුව භාවනා සිතුවාය.

මිහිරංග කෝසළට ගත්තේ සීගිරි එකේ ඉඳගෙනමය.

"උඹ කොහෙද කෝසළයා."

කෝසළත් මිහිරංගත් අක්කලා නඟාලගේ පුතාලාය. එහෙත් දෙන්නා දෙන්නාට නැත. මතුපිටින් නොපෙන්නුවාට දෙන්නාටම දෙන්නාව දිරවන්නේ නැත. රුවන්තිටත් සුරංග ටත් එහෙමය. ඒ දේ එහෙමම කෝසළටත් මිහිරංගටත් පිහිටා ඇත. එහෙත් මේ වෙලාවේ කෝසළගේත් උදව් ගතයුතුයි කියා මිහිරංගට

සිතුණි. 'හතුරගේ හතුරා මිතුරා කියනවනේ.' මිහිරංග සිතුවේය.

"ගෙදර බං. වස කම්මැලියි. මොකද කරන්නේ."

"සෙට්වෙමුද රෑට. රොක් ගාඩ්න් එකට වරෙන් එයිට් වලට. මට උඹත් එක්ක වැඩක් තියෙනවා කතාකරන්න."

"එළ. මම එනවා."

"ටිකක් රෑ ඉන්න බලාගෙන වරෙන්."

"ඕකේ. සුපිරි."

කෝසළ කීවේය. මිහිරංග සිනාසුනේ බිත්තිය දෙස බලාගෙනය.

# 09

හිත අද හඳුන්කූරු ෆැක්ටරියක ඉඳලා ආවා වගේය. භාවනාට හිතෙන්නේ එහෙමය. හරි සුවඳය. රහස මොකක්ද කියලා ඇය හිතෙන් අහන්න යන්නේ නැත. මේ සුවඳ එන්නේ කොහෙන්ද කියා ඇය දනී. හවස් වරුව පුරා මොකක්ද පාළුවක් හිත පුරාම විසිර ඇත. හිත තදකරගෙන ඉන්න හිතෙන්නේ නැත. ඔහේ පාවෙලා ගියාදෙන්

කියා ඇය සිතුවාය. හිතෙන තැනක නතරවෙන්න හිතන දුරක් පියාඹන්න. ඇය හිතට කියන්නේ එයයි.

"අනේ මන්දා"

ඇය තනිවම මිමිණුවාය. සීගිරි එකේ වැඩට ගොස් දැන් අවුරුදු දෙකක් ගෙවීයන්නට ආසන්නය. හරියටම ඇය සීගිරි එකට ආවේ උසස් පෙළ විභාගය අවසන් වූ විගසම වාගේය.

"ඉගෙන ගැනිල්ල ඉවරද සුදූ"

නේත්‍රා ඇසුවේ හැමෝම ඉස්සරහය. භාවනා සිනාසුනාය. ඒ සිනහව කීවේ මෙතනින් අවසන් බවය.

"අපි සීගිරි එකට ජොයින් වෙමු. ඒකත් හරියට කැම්පස් ගියා වගේ තමයි. පස්සේ බලලා මොනවාහරි

ඉගෙනගන්න පුළුවන්නේ.”

රඹුක්වැල්ල මහතා කීවේය.

භාවනා හිස වැනුවාය. ඊට පසුදා සිට කෙල්ල සීගිරි එකේය. මේ ඒ ආපු ගමන්ය. එහෙත් මේ වසර එකහාමාරට සීගිරි එකට ගොස් ආ පසු මෙහෙම කහඹිලියා ගොඩක සිට ආවා වගේ අමාරුවක් තිබුනේ නැත.

ඒත් දැන් වෙනස්ය.

“මොනවාහරි ජීවිතේ වෙන්නත් ඕනනේ. මේක නිකං යහපාලන ආණ්ඩුව වගේ හැමදාම තියෙන්න බෑනේ. ඇල්වතුර ජීවිතේ”

කෙල්ලට සිතෙන්නේ එහෙමය. පසුගිය කාලේ මොනවාවත් වුනේ නැත. ඒ නිසාම ගෙදර ඇවිත් හිතන්න මහ දෙයක් තිබුනේද නැත. ඇය කරන්නේ කකුලත් උඩ දාගෙන

ෆිල්ම් එකක් දාගෙන ටේස් කඩල කකා ඒක බලන එකය. හිතුවේ ඒ චරිත වෙලව වෙන අලකලංචි ගැනය. ෆිල්ම් එක ඉවරවෙද්දී දහය එකොළහ වෙලාය. ඊට පස්සේ කෙල්ල කොට්ටේ බදාගෙන නිදිය. ආයේ ඇහැරීගෙන හිතන්න දෙයක් තිබුනේ නැත.

යාළුවෝ හැමෝටම කොල්ලෝය. කතා කළොත් කියන්නේ ඉන්නේ එම් සී කියාය. නැතහොත් කොල්ලා එක්ක එක්සෙල් පාක් ආවා කියාය. ඒත් නැත්නම් ලිබර්ටි එකේය. ගොඩක් වෙලාවට කොල්ලා එක්ක මඟය. උන් කියවන්නේම ඒවා ගැනය. වෙන සිහියක් ඇත්තේ නැත.

“මුකුත් ආරංචියක් එහෙම නැද්ද භාවනෝ.”

ඔවුන් අන්තිමට අසන්නේ එයයි.

"ඔහේ නෑ බං."

කෙල්ල කියයි.

"වෙන්න බෑ."

"ඒකනේ වෙන්න බෑ තමයි. මොනවාවත් වෙන්නේ නෑ නේ ඉතින්"

"මොනවාවත් වෙන්නේ නෑ. මොනවාහරි කරගන්න ඕන"

ඇත්තම කියනවානම් එහෙම කරන්න භාවනා කැමති නැත. වෙන දෙයක් වෙනවාට ඇය ආසය. එක එක දේවල් කරගන්න ඇය ආස නැත.

ඒත් දැන් එහෙම නොවේ. හිතෙන්නේම තනිවෙන්නටය. තනිවී ඔහේ කල්පනාව දාගෙන ඉන්නටය. කල්පනා කරන්නට දෙයක් ඇත්තාක් මෙන්ය. ඒත් එහෙමට දෙයක් නැත.

ඒත් හිත බරය. 'මේක ලෙඩක් අනේ' අන්තිමට ඇයට සිතෙයි.

"මම බලාගෙන ඉන්නවා පහළට එනකල්."

ඉඳුනිල් උඩු මහලේ කෙල්ලගේ කාමරයට එමින් ඇසුවාය. ඇය අත ඇත්තේ මාළු පේස්ට්‍රියක් සහිත පීරිසියකි. එහි පැත්තකින් සෝස් ටිකක් දමා ඇත. ඉඳුනිල් එන්නේ එයත් සමඟ කෙල්ලගේ මග් එකට තේ එකක්ද හදාගෙනය.

"අනේ මට අමතක වුණා. අද ටිකක් මහන්සියි අම්මා."

මහන්සි කෙල්ලගේ හිතටය. වතට නොවේ.

"මී. අර එනවයි කිව්ව ළමයා ආවලු නේද සීගිරි එකට අද?"

භාවනා පුදුමයෙන් මෙන්

බැලුවාය.

"අම්මා දන්නේ කොහොමද?"

ඇය සිනාසුනාය.

"දවල් කෑම කන වෙලාවේ සියා මාත් එක්ක කතාකරකර හිටියා. එයා කන වෙලාවට එහෙම ඉන්න ඕනනේ. නැත්නම් කන්නේ නෑ."

සීයාට වැඩියෙන්ම ආදරේ කරන්නේ අම්මාය. ඔහුගේ දුවලා දෙන්නා නොවේ. එය ඔහු බයක් නැතිව කියයි.

"ඉතින් මොනවද සීයා කිව්වේ."

"අපිටත් එහෙම කොල්ලෙක් ඉන්න තිබුනා ලොකු දුව කියලා කිව්වේ. හරි ආදරෙන් කොල්ලා ගැන කතාකළේ."

භාවනා සිනාසුනාය. 'ඕනම නම් එහෙම කොල්ලෙක්ව එක්කගෙන

එන්නම් ගෙදරට. මගෙත් එහෙම අකමැත්තක් නෑ ඉතින්' ඇයට කියන්න හිතෙන්නේ එහෙමය. එහෙත් හොරාට කලින් කෙහෙල් කැන පනින සිරිතක් නැත.

"එයා හොඳයි තමා. අද සීගිරි එක පෙරලුවා."

"ම්. සියා කිව්වා."

ඉඳුනිල් මාළු ප්‍රේස්ට්‍රිය ඇය අතට දුන්නාය.

"තාම උණුයි. කොහෙන්ද ගෙනාවේ."

"බේක් කාට් එකෙන්. අතුලව යවලා ගෙන්නගත්තේ."

අම්මා එහෙමය. මේ දුවලා තුන්දෙනාට ඕනා දේවල් දන්නේ ඇයය.

"මරු."

ඇය සෝස් ගාගෙන ෆිෂ් ප්‍රේස්ට්‍රිය කන ගමන් කීවාය. මොකක්ද හේතුවක් නිසා ඇයට සිහිවූයේ දේවකවය. 'තාම මඟ වෙන්න ඇති. සමහරවිට සීගිරි එකේ වෙන්නත් ඇති තාම' ඇයට

දුකය. ඔහු දවල්ටවත් කා නැත.

"තාත්තා ටිකක් ලොකු වැඩක් පටන් ගන්න යන්නේ."

"මටත් කිව්වා අම්මේ."

"ඉතින් මගෙන් ඇහුවා ඔයාගේ මොනවාහරි තියෙනවානම් ඒක කරලා දාලම මේක පටන් ගන්නද කියලා."

භාවනාගේ ඇඟ සීතල විය.

"කොහෙත්ම නෑ. තාත්තට කියන්න පටන් ගන්න වැඩේ පටන් ගන්න කියලා. පොඩි දුව ඔහොම

ටික කාලයක් ඉඳී කියන්න. මේ තාම විසි එකක්වත් නෑ. දැන් කෙල්ලෝ මැරිකරන්නේ විසි හයෙන් හතෙන්."

ඉඳුනිල් බලකරන්න ගියේ නැත.

"මී. මම හිතුවා ඔය පැත්තක් අල්ලගෙන ඉන්නකොට මොකක්හරි ඇති කියලා."

භාවනාගේ පපුව පත්තුවිය. අම්මා ඉන්නේ හොඳ සෙවිල්ලෙනි.

"මම අල්ලගෙන ඉන්න පැත්තක් නෑ අනේ. කොල්ලෙක් ඉන්නවානම් පැත්තක් අල්ලගෙන ඉන්නවද? ඉස්සා වගේ පනිනවනේ."

කතාව ඇත්තය.

"ඔයා එහෙම නෑනේ. ඒකනේ."

භාවනා සිනාසුනාය. තමා එහෙම නැති බව අම්මා දන්නේ කෙසේද? එහෙත් ඇය අම්මාය.

අම්මා කෙනෙක් යනු දෙවියන්ට හැම ගෙදරකටම එන්නට වෙලාවක් නැති නිසා ඔහු වෙනුවෙන් ගෙදරට එවන දෙවියාය.

"මේ මිහිරංග ගැන මැණික."

ඉඳුනිල් එය ඇසුවේ පරිස්සමිනි.

"කතාකරන්න එපා."

භාවනා කීවේ එපමණකි. ඉඳුනිල් වෙන දෙයක් කතාකරන්න ගියේ නැත. ඇයද කතාකරන්නට කැමති නැත. මලක් වාගේ දුවක් හැදුවේ දෙබරෙකුට දෙන්නට නොවේ.

*** *** *** *** ***

මිහිරංගත් කෝසලත් 'සෙට්' වූයේ තලවතුගොඩ රොක් ගාඩ්න් එකේය. මිහිරංග වැනි කොල්ලන්ගේ

ප්‍රියතම 'පොට්' එක ඒකය. එහි ඇති ලස්සනක් නැත. එහෙත් හවස හතේ සිට සෙට් එකම ඉන්නේ එතනය. ඒ නිසාම බොහෝ විට මිහිරංගත් යන්නේ එතනටය.

මිහිරංග කෝසළ එනතුරු කා පාක් එකේ නතරවීගෙන උන්නේය. කෝසළටත් ඇත්තේ තරමක් පරණ නිසාන් කාරයකි. මිහිරංගටද එසේමය. ඒ ගැන දෙන්නාම ඉන්නේ කේන්තියෙනි.

"මොකෝ බං පරක්කුවුණේ."

"මේක ස්ටාට් වෙන්නේ නැතුව ගියා බං. ඕටනේටර් එකේ ලෙඩක්."

කෝසළ කීවේය.

මිහිරංග සිනාසුණේ සමච්චලයෙනි.

"සීගිරි සුපර් එකේ ඩිරෙක්ටර්ස්ලා.

ඒත් අපි යන්නේ පරණ ලඩරම්වල විලි ලැජ්ජයි ඩෝ."

මිහිරංග කීවේය.

"කියලා වැඩක් නෑ. භාවනාටයි නේත්‍රා අක්කටයිනම් දීලා සුපිරි බඩුවක්. මල වගේ."

කෝසළ කිවේය.

"වරෙන් වරෙන්. ඒකම තමා උඹට එන්න කිව්වේ ටෝකක් දාන්න."

"එළ එළ. මටත් ඕන ඒකයි බං. මෙහෙම ඉඳලා එපාම වෙලා කිසි ගෝ එකක් නෑනේ."

දෙදෙනාම ගියේ වටේ ඉන්නා කොල්ලන්ට තට්ටු දමමිනි.

"වරෙන් මිහිරංගයා සෙට් වෙමු."

"බෑ සනා පොඩි ස්ටෝරියක් තියෙනවා චලන්න. එන්නම්."

දෙදෙනාම බරවූයේ කොණේ

මේසයටය. එතන තරමක් අඳුරුය.

"මොනාද බොන්නේ."

කෝසළ සිනාසුනේය.

"මමනම් ගහන්නේ ස්කොච් විතරයි මචං."

"උඹ හිතුවද මම සුදුවා ගහනවා කියලා. ආ."

"කවුද එහෙම කිව්වේ."

ඒත් දෙන්නාම තනියම ආ විට ගහන්නේ සුදුවාය. ගල්ය. ඕල්ඩ්ය. ඒත් පෙන්නන්නේ නැත.

"අපට ස්කොච් හන්ඩ්‍රඩ් දෙකක් ගේන්න මයිකල් අයියා. මට සෝඩා. උඹට."

"ලෙමනේඩ්."

"අපට පෝක් ඩෙවල් එකකුත් දාන්න මයිකල්."

කතාව පටන් ගත්තේ එහෙමය.

දෙදෙනාගේම කතාවට මුල් වූයේ අද සීගිරි එකේ වූ වෙනසය.

"මූත් හෙණ ඇම්ඩා මචං. බලන්නෝන උඹ අද? අලි පොරක් වගේ. පුකට දෙකක් අණින්න හිතුණේ මට."

"එහෙම ඇණලා වැඩක් නෑ කෝසළයා. ගනිංකෝ."

මිහිරංග වීදුරුව අතට ගනිමින් කීවේය.

"චියර්ස්."

දෙදෙනාම විස්කි ගසන්නේ සෑහෙන කාලයකට පසුය. ඇත්ත ඒකය. ඒවා දෙන්නාටම රන් පොදක් වාගේය.

"මූ ලෙඩක් කෝසළයා. මාර ලෙඩක්. මූ දිගටම සීගිරි එකේ හිටියොත් අපි දෙන්නට ලෝක

ලෙඩක්. අනික මූ පොරක් වෙන්න යන්නේ. අමුතු කේස් එකක් මේක. සීයයි මාමයි භාවනායි නේත්‍රායි මූව උඩ තියාගෙන ඉන්නේ"

මිහිරංග කීවේය.

"අද සීයා ලන්ච් ගන්න ගමන් නැන්දා එක්ක කියෙව්වෙත් මූ ගැන. මම අහගෙන රූම් එකට වෙලා නිකං උඹත් මචං මේ රඹුක්වැල්ල ෆැමිලි එකේ පොරක් වගේනේ කතාව. මට මල."

කෝසළ අවසන් විස්කි උගුරද කටට හලාගත්තේය. 'මූ විස්කි බොන්නේ ප්ලේන්ටි ගහනවා වගේනේ. ගෙවපන්කෝ දැන් බිල. උඹ ගෙවන්නේ නෑනේ.'

"මේ මයිකල්."

මිහිරිංග තවත් හන්ඩ්‍රඩ් දෙකක්

ඇණවුම් කළේය. හන්ඩ්‍රඩ් දහයක් හෝ දී මේ වැඩේට කෝසළව සෙට්කරගන්නවායැයි මිහිරංග සිතාගත්තේය.

"ගේමක් දෙමු කෝසළයා. ආයේ මචං මේ සීගිරි එක ගොඩගන්න බෑ මේ නිකං සුරංගනා කතා. මේක ක්ලෝස්. සීගිරි එක ක්ලෝස්. මේක මචං ක්ලෝස් වෙන්නම ඕන. එතකොට මොකද වෙන්නේ."

මිහිරංග ඇසුවේය. ඔහුගේ වචන දැන් එන්නේ ඇදවීය.

"මොකද වෙන්නේ. ආ මචං."

කෝසළ ඇසුවේය.

"මොකද වෙන්නේ. අපේ ෂෙයා එක ඉක්මනට ලැබෙනවා. ඒකයි වෙන්නේ. සීයට ළඟදීම ටිකට් එක එනවනේ බං. ඊට කළින් සිගිරි

ප්‍රොපටීස් බෙදනවා. හරියට තුනට. හරි. උඹටයි මල් ආ."

මිහිරංග කෝසළුව චූන් කළේය. ඔහුගේ දෑස් දීප්තිමත්ව බැබලිනි.

"මරුනේ බං. සුපිරි. සීගිරි එකේ ලෑන්ඩ් වැලිව් එකම ඇතිනේ කෝටි පනහක් විතරනේ."

"නැතුව ඩෝ. එතන අක්කරයක් විතර තියෙනවනේ. කොහොමද සුපර් නේ. ඒකනේ මගේ ප්ලෑන් එක. මොකක්ද?"

"උඹේ කතාව ඇත්ත මේක ක්ලෝස් කරන්න ඕන."

"අන්න තේරුණා මස්සිනාට. ක්ලෝස්ම කරන්න ඕන. කීල්ස්ලා ෆුඩ් සිටිලා එක්ක අපි කරන සීගිරි මචං. මේ නිකං පඩ ෂෝ බං."

එසේ කියා මිහිරංග ගෑරප්පුව

බයිට් දීසියට ඇන්නේය. එහි එකදු මස් කෑල්ලක්වත් නැත. 'මූ බයිට් එක ඩයට් එකට අරන්නේ. මාර පොරක්නේ. එක්කගෙන එන්නේ නෑ අනිත් පාර හිකනලා.' මිහිරංග සිතාගත්තේය. ඔහු දීසියේ ඉතිරිව තිබූ ඌෑණු කෑල්ලක් ගෑරුප්පුවෙන් ඇණ කෑවේ සිතින් කෝසළට බනිමිනි.

"මූ වගේ උන් ඉන්නකොට මේ කතාව තව දිගට යනවා මචං. කෙළවෙන්න කල් යනවා."

"දෙමු ගේමක්."

"අන්න සිරා කතාව. දෙන්නඕන ගේමක්. ආයේ මූට සීගිරි එන්න බැරිවෙන්න"

කෝසළත් මිහිරංගත් අතට අත දමාගත්තේය. දෙදෙනාම ඒ වැඩේට

එකතුය.

"ස්ටෝරිය පිටිපස්සේ අපි නෑ ආ. ඒමයි ගේම දෙන්නේ අපි හරි අහිංෂක ළමයි ආ."

කෝසළ හිස වැනුවේය.

"මොකක්ද අපි කරන්නේ?"

"මූ ඇම්ඩා මචං. පේන්නේ නැද්ද?"

"ඔව්."

"මූව සීයටයි භාවනාටයි නේත්‍රාටයි එපාවෙන්නම දෙන්න ඕන මම ගාව තියෙනවා ප්ලෑන් එක. මාස දෙකයි. උඹ නෑ. උඹව පොලීසියෙන් ඇවිත් අල්ලගෙන යන්නේ. හූ. පොර නිකං ඔළුව පාත්කරගෙන සීගිරි එකෙන් යන්නේ."

"න්නෑ."

"ඔව් මට ඒකට උබේ සප් එක

ඕන. මේක ගේමක් ආ."

දෙදෙනාම ඒ ගැන පැයක් තිස්සේ කතාකළෝය. කෝසළ ඕන දේකට ඔට්ටුය. ඔහුත් ආස නිකං ඉඳගෙන සැපක් ගන්නටය.

# 10

දේවක අප්පච්චීත් සමඟ එක්ව රෑ කෑම ගත්තේ දහයට පමණය. කොල්ලා අද ඉන්නේ හරි සතුටින් කියා ඔහුට සිතුණි.

"මම අප්පච්චි අද මගේ ප්ලෑන් එකම සීයට එක්ස්ප්ලේන් කළා. සීයා ෆුල් සැටිස්."

දේවක කන ගමන් කීවේය. ජීවන් සිනාසුණේ ආත්ම තෘප්තියකිනි.

"ඔයාගේ සීයා එහෙම කෙනෙක්."

"මේක ලේසි නෑ අප්පච්චි ඒත්

මම කරනවා."

"ඔයාට පුළුවන් පුංචි මහත්තයෝ. මොනවාහරි හොයලා ඕනනම් කියන්න. මම කරලා දෙන්නම්."

"මට අප්පච්චි හොඳ සාමාන්‍ය කන්ට්‍රැක්ටර් කෙනෙක් හොයලා දෙන්න අප්පච්චි. ඇතුලේ වැඩවලට. මීට් සෙක්ෂන් එක අලුතෙන් හදන්න ඕන. පොඩි බුක් අවුට්ලට් එකක් දානවා. තව බේකරි සෙක්ෂන් එකයි ෆුඩ් සෙක්ෂන් එකයි දානවා. එක පැත්තකනින් සීගිරි එක ලොකු කරනවා. තව කෑල්ලක් ගන්න."

කොල්ලා අත ගසන්නේ ලේසි වැඩකට නොවේ. මෙහෙම බයක් නැතුව කරන්නේ කොහොමද කියා ජීවන් සිතුවේය.

"මම දෙන්නම්. හෙට දවල් වෙද්දී

එවන්නම් පුතේ. දයාරත්න කියලා කෙනෙක් එයි ඔයා කියන්න වැඩේ. එයා කොටේෂන් එකක් දෙයි."

"මරු අප්පච්චි."

අද කෑම හැදුවේ හේරත්ය. හේරත් මේ අප්පච්චීටත් පුතාටත් හරි ආදරේය.

"හේරත් මාමා."

හේරත් දුවගෙන ආවේය.

"පුංචි මහත්තයෝ. මේ එනවා."

ඔහු අහිංසක කෙනෙකි.

"කෑම ටිකනම් මරු හේරත් මාමා. මේ පොල් සම්බෝලේ විතරක් ඇතිනේ."

ජීවන් සිනාසුනේය.

"පුංචි මහත්තයා හෙට බත් එක ගෙනියනවනේ."

"හේරත් මාමට පුළුවන්ද?"

"ඒක ලේසියිනේ පුංචි මහත්තයා."

"හදමු මාත් නැඟිටලා උදව් කරන්නම්. පහට මාත් ඇහැරෙනවා."

"ඒක මොකක්ද? මම කෙහෙල් කොළේකම හදලා දෙන්නම්."

දේවකගේ හිතට සැනසීමක් දැනුණි. හෙට බලා හේරත් මාමාට සරමක් අරන් එනවා කියා ඔහු සිතාගත්තේය.

දේවක නිදාගන්න හිතාගෙන ආවේ දැන්ය. වේලාව රෑ දහයාමාරය. ඒත් නින්ද යන්නේ නැත. අද මහන්සි වූ දවසකි. එහෙම දවසක නින්ද යන්නේ මැරුණා වාගෙ 'ය. ඒත් නින්දක් නේන්නේ ඇයි.?

කෙනෙක් හිත උඩ සක්මන් කරයි. කාගේ හෝ අඩි පාරවල් පපුව පුරාමය. එහෙම පපුව උඩ කෙනෙක්

ඇවිදින්නට ගත්කළ නින්ද යන්නේ නැත. 'ඔයා නිකං පුළුල් තිරයේ බලපු දේදුණු වර්ණ ෆිල්ම් එකක් වගේ භාවනා. ඇස් පියාගත්තොත් පේන්නේම ඔයාව'

"දෑස පියාගත් කළ මට මැවෙන්නේ ඔබේ රුව.

ඈත කඳුකරෙන් එන නල ගෙනෙන්නේ ඔබේ හඬ.

කුමාරියේ"

දේවක පරණ සිංදුවක්ද මුමුණමින් ආවේය. සිංදුව ක්ලැරන්ස්ගේය. ක්ලැරන්ස් අප්පච්චීගේ ප්‍රියතම ගායකයාය. දේවකට හිතෙන්නේ මොකක් හෝ දමා කෙල්ලට ගන්නටය. 'පිස්සු. ඔයා දැන් ලස්සනට හිම කුමාරී වගේ නිදි ඇති.' දේවක එය මවාගත්තේය.

දේවක අප්පච්චී අරගෙන දුන් අලුත් සැම්සුන් ෆෝන් එක ගෙන කල්පනා කළේය. ඒකේ එක එක දේවල් වැහි වැහලාය. ඒකවත් තාම බලන්නට ඔහුට බැරිවිය.

මහ වෙලාවක් ගියේ නැත. ඇමතුමක් ගලාගෙන ආවේය. ඇමතුම ආවේ භාවනාගේ දුරකථන අංකයෙන්ය.

"මෙහෙම වෙන්නේ කොහොමද මිස්"

දේවක සිතුවේය. දේවක තත්පරයක් යන්නටත් පෙර ඇමතුම සම්බන්ධකරගත්තේය. මේ රැයේ මේ දුරකථන රැහැන් අතරින් ගලන්නේ වෙන මොනවද වාගේය. ඒක දෙන්නාම දැනගෙන උන්නාක් වැනිය.

"මිස්."

දේවක කතාකළේ පපුවට අතක් තියාගෙනය. ඇයත් සමඟ කතාකරනා විට ඒ හරියම ඇවිලෙන්නාක් බඳුය. මේක ලෙඩකි.

"අනේ රෑත් වෙලා. දේවක මොනවද කරකර හිටියේ."

ඔහු සිනාසුනේය. රාත්‍රිය ඕනවාටත් වඩා නිහඬය. ඒ නිසා මුවින් පිටවෙන සිහින් සුසුමක් පවා දුරකථන රැහැන් දිගේ හොඳින් ඇසෙයි. දවල්ට එහෙමම ඇසෙන්නේ නැත. මහ රෑක යුවතියක් කතාකරන එක වෙනමම ආනන්දයකි. දේවක ඒ ආනන්දනීය අත්දැකීම හරියටම විඳින්නේ දැන්ය.

"මේ දැන් කාලා ආවේ මිස්. මිස් කෑවද?"

දේවක ඇසුවේය. ඇයට පුදුමය.

කොල්ලෙක්ට එහෙම අහන්නට පුළුවන්ද කියා භාවනා සිතුවාය. සමහර දවස්වලට සීයා එහෙම නැත්නම් තාත්තා අහන්නේ එහෙමය. 'කෑවද' කියාය.

"ටිකකට කලින් කෑවා දේවක."

"මට කනකොට අද මිස්වත් මතක්වුණා."

ඔහුට මේ වචන කියන්නට බියක් එන්නේ නැත. ඇරත් ඒ කතාව අවංකය. ඇත්තටම ඔහුට කද්දි ඇයව සිහිවිය.

"මාව. ඇයි ඒ."

ඇයට ඒක දැනගන්නට හරි හදිස්සියය. ඇය පමණක් නොව හැම ගෑණු ළමයෙක්ම එහෙමය. දේවක ඒක දන්නේ නැත. ගැහැණු චරිත ඔහුගේ ජීවිත කතාවේ ඉඳලාම

නැත.

"අපේ හේරත් මාමා අද රහට කෑම ටික හදලා. නුවර කෙනෙක්නේ. ඉතින් හොඳ අත් ගුණේ. කනකොට මට මිස්වත් මතක්වුනා."

දේවක ඒත් ඇයි මටත් වුනේ කියන ප්‍රශ්නයට උත්තරයක් හරියට දුන්නේ නැත. භාවනාට ඕනේ ඒ ප්‍රශ්නයට උත්තරය. සමහර ප්‍රශ්නවලට එහෙම කෙළින්ම උත්තර නැති බව ඇයද දනී. 'ඇත්තම කියන්න දේවක මටත් කද්දි ඔයාව මතක්වුනා. ඒත් ඔයා වගේ ඒක කියන්න මට බෑ' භාවනා සිතුවාය.

"ඔය මාව කෙනෙක් මතක්වුණා කියලා කිව්වමයි හැබැයි."

ඒ ටික පමණක් ඇය කීවාය. ඒ වචන අස්සේ දාහක් දේවල් තිබුණි.

ඒත් ඇත්ත කතාවද එයයි. කාටවත් තමාව එහෙම විශේෂයෙන් මතක්වූ බවක් ඇය අසා නැත.

"මම මේ නිකං ගත්තේ දේවකට."

"එහෙම මාව මතක්වෙලා කෝල් එකක් ගත්තට මිස්ට පින් දෙන්න තමා ඕන."

"හරි වැඩක්නේ කෝල් කළාම පින්ද ඉතින්."

ඇය කතාවට පොටක් අල්ලාගත්තාය.

"සමහරුන්ට කතාකළාම එහෙමයි. ගොඩක් පින්. මේකයි මිස්. පින් කියන එක එහෙම නිකම්ම ලැබෙන්නේ නෑ. මම මිස්ට පින් දෙන්න ඕනා."

"ආ. එහෙමයි නේද?"

"මමත් මේ මගේ අප්පච්චි අරන්

දුන්න අලුත් ෆෝන් එක අල්ල අල්ල හිටියේ අනේ මේකට කවුරුහරි කෝල් එකක්වත් දෙන්නේ නෑනේ කියලා හිත හිත."

ඇත්ත කතාව දේවක ෆෝන් එක අල්ල අල්ලා හිතුවේ ඇයට කතාකරන්න පොටක් හොයාග න්නටය.

"ඉතින් හොඳ ගෑණු ළමයෙක් බලලා යාළුවුණානම් පැය ගණන් කතාකරකර ඉන්න පුළුවන්නේ. ආයේ ඕක අල්ල අල්ල ඉන්න ඕනේ නෑනේ. දැන් තියමුද බබෝ මට නිදිමතයි කියලා කියන තරමට එයා කතාකරයි"

භාවනා සිනාසී කීවාය. ඒ කතාවම ඔහුටත් කියන්නට පුළුවන්ය.

"මම එහෙම කියන්නේ නෑ මිස්.

කවදාවත් නෑ. නෙවර්."

ඔහු කීවේ හැඟීම්බරවය.

'මාත් ආස එහෙම කෙනෙක්ට. උදේ එළිවෙනකල් හරි මාත් එක්ක කියවන්න ඕන.'

"මී. ඉතින් ඇයි හොයාගන්නේ නැත්තේ"

අහුවුනේ හොඳ කතාවකි.

"ආයේ මිස් දෙතුන් දෙනෙක් එක්ක කතාකරන්න මගේ අදහසක් නෑ මිස්. එක්කෙනයි එයා ජීවිතේටමයි. එහෙම අයව හම්බවෙන්න ටිකක් වෙලා යනවලුනේ. ඉතින් මඟ බලාගෙන ඉන්නවා ඒ වාසනාවන්ති එනකල්."

භාවනා සිනාසුනාය.

"ඇයි මිස් හිනාවුනේ."

"එයා වාසනාවන්තියක්ද?"

"ආ. ඇයි එහෙම නෙමේද? මේ මං වගේ කොල්ලෙක්ට එහෙම ආදරේ කරන්න ලැබෙන එකම ඇතිනේ. ඒකයි වාසනාවන්ති කිව්වේ."

දේවක කීවේ ගඩොල් බිත්තිය හූරමිනි.

"එයාව ලැබෙන ඔයයි වාසනාවන්ත."

ඇය කීවාය. පිළිතුර පෙන්ඩින්ය.

"මම ඒක හිස් මුදුනින්ම පිළිග න්නවා මිස්. ෂුවර්."

භාවනාගේ පපුවේ පැත්තක් කකියන්නට ගත්තේය. ඒ හරියම ඇවිලෙන්නේ ඇයි?

"මි. රෑත් වෙලානේ. මම තියන්නම්."

භාවනා කීවාය. දේවක හිතාගෙන

උන්නේ තව ටිකක් අල්ලාගෙන යන්නටය. ඒත් ගෑණු ළමයෙක් සමඟ එහෙමම මහ රෑ දොඩන්නට පින් නැත.

"මිස්ට නිදිමත ඇවිත් ඔය."

දේවක කීවේය.

"මට එහෙම නිදිමත එන්නේ නෑ."

"අම්මට ඇවිත් ඔළුව ටිකක් අතගගා ඉන්න කියන්න. දන්නෙම නැතුව නින්ද යයි මිස්ට."

ඇත්තටම ඉඳුනිල් එහෙම අනන්ත දවස්වල කරයි. ඇයට ගැලවෙන්නම බැරි මේ පොඩි දූගෙන්ය. 'මොකක්ද අනේ.මට නින්ද යනකල් ඉන්නකෝ.' භාවනා බොහෝ දවස්වලට කියයි.

"අම්මා එහෙම කරනවා. මම එයාගේ කකුලක් බදාගෙන නිදාග න්නවා."

"ඒක ලොකු වාසනාවක්."

ඔහුට කවදාවත් ඒ වාසනාව ලැබී නැත.

"දේවක"

භාවනා කතාකළේ දුක්බර හඬකිනි.

"මිස්"

"අම්මව ගොඩක් මතක්වෙනවද?"

"ඔව් මිස්. හැමදාම හැමවෙලාවේම. ඉස්කෝලේ පහේ පන්තියේදී මම අම්මා ගැන රචනාවක් ලිව්වා. ඒ රචනාවට සමස්ථ ලංකා සහතිකයක් ලැබුණා. අම්මා ගැන රචනාවක් ලියලා එහෙම සම්මාන ගත්ත මගේ අම්මා මම ළඟ නෑ. කොහොම කියන්නද ඒ දුක."

දේවක කීවේය.

"සොරි"

ඇය සමාව ඉල්ලුවාය.

"එහෙම කියන්න එපා මිස්. මට ඇන්කර් අම්මාව දැක්කත් දුක හිතෙනවා. එහෙමයි අම්මලා නැතිවෙච්ච දරුවන්ට. ඒක නොලැබීම."

"ලබන ආත්මේ එහෙම වෙන්න එපා කියලා පතන්න."

"මී. මිස් නිදාගන්න. රෑ වෙලානේ."

ඔහු කරුණාවෙන් කීවේය.

"මී. බුදු සරණයි."

"බුදු සරණයි මිස්"

දේවක මෑදුව කීවේය. ඔහු දුරකථනය අල්ලාගෙන බොහෝ වෙලාවක් උන්නේය. 'මේ දැන් ඔයා දුන්න කෝල් එකේ මොකක්ද බලගතු දෙයක් තියෙනවා මිස්.' දේවකට සිතුණි.

# 11

උදේ නැඟිට්ද්දී භාවනාගේ ඇඟ ගිනි කබලක් වාගේය. හිසට කළු ගලක් තියලා බැන්ඳා වාගේය. භාවනා අමාරුවෙන් හිස ඔසවා ඔරලෝසුව දෙස බැලුවාය. තාම හයය. හත වෙද්දීවත් නැඟිටින්නට පුළුවන් වුනොත් කියා කෙල්ලට සිතුණි. ඒත් ඇයව වෙව්ලන්නට විය. භාවනා අමාරුවෙන් පොරවාගෙන උඩුපෙළි අතට ඉඳ දෑස් පියාගත්තාය.

අමාරුවට ඇයට යළිත් නින්ද

ගියාය. ඉඳුනිල් උඩට ආවේ භාවනා පහළට නාව නිසාය. වෙනදා අක්කාටත් කලින් සීගිරි එකට යන්නේ ඇයය. ඒත් අද තවම නැත.

ඇය උන් විදිහට ඉඳුනිල්ගේ හිතට අමුත්තක් දැනුණි. ඇය ඇඳෙන් ඉඳගත්තේ භාවනාගේ නළලට පිටි අත්ලද තබාගෙනය.

“අනේ දෙයියනේ කෙල්ලට උණානේ. ඒක තමයි මේ.”

ඉඳුනිල් භාවනාගේ මුහුණම අතගෑවාය.

“සුද්දී. චුට්ටක් ඇස් අරින්න මැණික.”

ඉඳුනිල් කීවේ ආදරයෙනි.

“අම්මා. ඇඟට අමාරුයිනේ. කීයද වෙලාව”

“දැන් නමයටත් කිට්ටුයි මැණික.

ඔයා මේ පහළට ආවේ නැති නිසා බලන්න ආවේ. ඔයාට මේ ගොඩක් උණනේ. හිසත් කකියනවද"

භාවනා හිස  වැනුවාය.

"ඉන්න බෑ. මම හිම්හිට ඇඳග න්නම් අම්මා."

"මේ උණ තියාගෙන යන්න බෑ. අද ඉන්න. මම සීයට කියන්නම්."

භාවනාට දුකය.

"යන්නම ඕන අම්මා."

"ඒත් පුතේ."

භාවනා අම්මාගේ ඇඟට බරවී නැඟිට්ටේ බාත් රූම් එකට යන්නටය. ඒත් මොකක්ද ඇයට දැනුණි.

"යන් මම එක්කගෙන යන්නම්."

ඒත් අම්මාගේ වතට බරවී අඩි දෙකක්වත් යන්නට භාවනාට බැරිවිය. බඩ පපුව දාගෙන ඇයට

ඔක්කාරයට ආවාය.

"අම්මා අමාරුයිනේ."

භාවනා වමනේ යනවාට ආසම නැත. ඇය පොඩි දවස්වලත් එහෙමය. ඔක්කාරයට ආවද ඇය කෑ ගසා අඬයි.

"ඔහොම දාන්නකෝ සුද්දියේ. උණට එහෙමයි. බයවෙන්න එපා."

ඉඳුනිල් කෙල්ලගේ හිසත් පපුවත් අතගාමින් කීවාය.

"මට"

"යන්කෝ. ඔයා අද ඉන්න. අපි දවල්වෙලා බෙහෙත් ටිකක් ගන්න යන්."

ඉඳුනිල් ඇයව වත්තන් කරගෙන විත් ඇඳෙන් ඇලකෙරෙව්වාය. තද ඔක්කාරයක් ආ නිසාදෝ භාවනාගේ දෙනෙත් තිබුනේ තෙත්වය.

"මම අක්කට කියන්නම්."

"එපා. එයත් දුවගෙන එනවා එතකොට. අද වැඩ ගොඩක් වැඩි දවසක්. මම ටිකක් මෙහෙම ඉඳලා දවල්වෙලා යනවා අම්මා"

"මම කෝපි ටිකක් හදාගෙන එන්නම්. කිරි බොන්න එපා."

"අප්පිරියයි අම්මා කෝපි හොඳයි"

ඉඳුනිල් ගියේ ටික වෙලාවක් කෙල්ලගේ හිසද අතගාමින් සිටය.

*** *** *** *** ***

සීගිරි එකේ එක්කෙනෙක්ට අද තොන්තුවාව වාගේය. ඔහු නමයේ සිට සීගිරි දොරකඩ දෙස බලමින් උන්නේය. ඒත් හොයන රුව සීගිරි

එකෙන් එබෙන්නේ නැත.

"අද මිස් නිවාඩුද දන්නේ නෑ. අහන්නත් බෑ."

දේවක සිතුවේය. උදේ දහයත් පැන්න පසු දේවකගේ හිතට මොකක්දත් වාගේය. දේවක උදේ සීගිරි එකට අලුතින් එකතු කරන අංශවලට තැන් නිශ්චිතව ලකුණු කරගත්තේය. ඔහු ඒවා කරන්නට බලාගෙන ඉන්නේ භාවනා එක්කය. අද අලුත් යුනිෆෝම් එක නිර්මාණය කරන කෙනාත් එන බව කීවේය. ඒවා කතාකරන්නට දේවක හිතාගෙන උන්නේ ඇයත් සමඟය. ඒත් ඇය නැත.

"නේත්‍රා මිස්ගෙන් ඇහුවානම් කියයි ඇයි භාවනා මිස් ආවේ නැත්තේ කියලා."

දේවක සිතුවේය. ඔහු ෆයිල් දෙකක්ද රැගෙන නේත්‍රාගේ මේසයට ගියේය. නේත්‍රා උන්නේ අලුත් පර්චසින් ඇණවුම් බලමිනි.

"ගුඩ් මෝනිං මිස්."

"මෝනිං දේවක උදේ ඉඳලා වැඩනේ අද කීයටද ළමයා ආවේ"

"මම හතයි මිස් එනකොට. අර ලයිට්ස් සිස්ටම් එක කරන කෙනා ආවා. මමත් ආවාඉතින්. එයා බලලා කොටේෂන් එකක් දෙයි මිස්."

"ම් තව මොනවද අද කරන්න තියෙන්නේ දේවක."

"ගොඩක් වැඩ තියෙනවා මිස්. අද අර යුනිෆෝම් ඩිසයින් කරන කෙනත් අද එනවා. එක්ස්පයර වෙන බඩුවල ලිස්ට් එකක් ගන්නත් ඕන. ඒවට ප්‍රමෝෂන් එකක් දාන්න භාවනා මිස්

එකක් කතාකරගන්නත් තියෙනවා. අපි වහනකොට ඒවා සේල්කරලා ඉවර කරන්න ඕනනේ මිස්"

ඔහුගේ වැඩ පිළිවෙලය. 'වෙන කෙනෙක්නම් මීට් අයිටම් යෝගට් ෆ්‍රිජ් අයිටම් එහෙමම කුණුවෙන්න තියලා සීගිරි එක වහන්නේ. එහෙම පාඩුවෙන්න දෙන්නේ නෑ.' නේත්‍රා සියුම්ව සිතුවාය.

"අපි හොඳ ප්‍රමෝෂන් එකක් හදමු දේවක ඔයා කියන දේ ඇත්ත තමයි. අපි මීට් කූලර්ස් හිස් කරන්නම ඕන."

"මේ බාල සොසේජස් ස්ටොක් එකක් අරන්නේ මිස්. ඒවා අදින්නේම නෑ."

නේත්‍රාද එය දනී.

"එහෙම වැරදීම් ගොඩක් වුණා දේවක. අපි ඒවා ගැන දැන්

කතානොකර ඉමුකෝ."

"ඔව් මිස්. අදාලම නෑ තමයි"

දේවක එහේ මෙහේ බැලුවේය. නේත්‍රා අමුත්තක් දැක්කාය.

"ඇයි දේවක"

"නෑ මිස් මේ"

"කියන්නකෝ ළමයෝ"

"නෑ මිස් මේ භාවනා මිස් අද නිවාඩුද?"

නේත්‍රා සිනාසුනාය. 'කෙල්ල පේන්න නෑ තමා අද? මොකද කෙල්ලවම හොයන්නේ මේකා' ඇය සිතුවාය. පසුව සිනාසුනාය.

"අපේ නංගගේ එක එක කෝළම් වැඩ තියෙනවා දේවක. උදේ හිටපු ගමන් පන්සල් යනවා. නැත්නම් අම්මා එක්ක නෑ ගේක යනවා. තාම පොඩි කෙල්ලනේ."

නේත්‍රා කීවාය.

"ඔව් මිස්. උදෙන්ම එනවත් කිව්වා ඊයේ"

දේවක අසරණව කීවේය.

"එහෙමත් කිව්වද මේ කෙල්ල."

දේවක හිස වැනුවේය. නේත්‍රා දෙතොල් මුව තුළට දමාගෙන සිනාසී ඇගේ ජංගම දුරකථන අතට ගත්තාය. එහෙම සිනාසෙද්දී නේත්‍රා හරි ලස්සනය.

"අපි කතාකරලා අහමුකෝ."

දේවකටත් ඕනා ඒකය.

"මි. බබා තාම ආවේ නැත්තේ ඇයි. මේ මෙහේ එක්කෙනෙක් හොයනවා ඔයාව."

නේත්‍රා කීවාය.

"කවුද අක්කී."

කෙල්ල කතාකලේ අමාරුවෙනි.

යළිත් වමනයට එයි කියා ඇයට බියය.

"ඇයි සුදූ අමාරුවෙන් වගේ."

නේත්‍රා ඇසුවාය. කෙල්ලට අසනීප වූ විට හැමෝම දනී. පොඩි දවස්වලත් ඇය බඩේ කැක්කුමක් ආවත් හිතන්නේ මැරෙයි කියාය.

"මට උණ අරන් අක්කී."

භාවනා අමාරුවෙන් කීවාය.

"අනේ සුද්දියේ දන්නෙත් නෑනේ. මම උදේ එහෙමම ආවා."

දේවකගේ පපුව ගිනිගෙන ඇත. 'එයාට මොකක්හරි කරදරයක්ද අසනීපයක්ද'

"උදේ ගොඩක් වමනෙත් ගියා අනේ. උණ හරියට. ඉන්න බෑ අක්කී."

කෙල්ල කීවේ අඬන්නට මෙන්ය.

"අනේ මම එන්නම් අම්මා කතාකරලා කිව්වෙත් නෑනේ."

"මම කිව්වේ කියන්න එපා කියලා. බලලා තව ටිකකින් බෙහෙත් ගන්න යනවා"

භාවනා කීවාය.

"පව්. පෙනඩෝල් බිව්වද සුද්දි."

"ම්. අම්මා දුන්නා. කවුද මාව හොයන්නේ."

ඇය අමාරුවෙන් ඇසුවාය.

"මේ දේවක ඇවිත් ඇහුවේ. තාම නෑනේ කියලා"

ඒ කතාව අසා භාවනාට හරි සතුටුය. අසනීපයත් ටිකක් සනීපවුණා වාගේය.

"කියන්න අක්කා හොඳටම සනීප නෑ කියලා."

"ම්. මම ලන්ච් එකට සැන්විචස්

අරන් එන්නද පැටියට"

නේත්‍රා ආදරණේ ඇසුවාය.

"ඔයා පව් අමාරුයිනේ."

"නිදාගන්නකෝ ටිකක්. මම අම්මට ගන්නම්."

"ම්"

නේත්‍රා දුරකථනය තැබුවේ දුක්බරවය.

"ඇයි මිස් භාවනා මිස්ට සනීප නැද්ද?"

"ඊකනේ දේවක කෙල්ලට හොඳටම උණ. අසනීපවුණාම හරි බයයි. මැරෙයි කියලා පොඩි කාලෙත් හිතන්නේ. උදේ වමනෙත් ගිහින්. පව්."

"අනේ රෑ හොඳට කතාත් කළානේ."

නේත්‍රා සිනාසුනාය. 'රෑත් දෙන්නා

කතාකරලා' ඇය නිකමට සිතුවාය.

"අසනීප වුණාම මොනවත් කන්නේ නෑ. දවල්ට මම සැන්ඩ්විච් මොනවාහරි අරන් යනවා. එහෙම ගෙනාවාම කනවා."

ඇය කීවාය.

"මම මිස්ට හොඳ තැනකින් සැන්ඩ්විච් අරන් ගෙනත් දෙන්නද?"

දේවක ඇසුවේය.

"බලලා එහෙනම් ගෙනත් දෙන්න දරුවෝ"

නේත්‍රා කීවාය. දේවක පිටතට ආවේ හිසේ බරකිනි. ඔහු සීගිරි එකෙන් පිටතට විත් ඇමතුමක් ගත්තේය. ඒ භාවනාටය. භාවනාට ඔහුගේ අංකය දැක සතුටක් දැනුණි. ඇය කොට්ටයට හිස තියාගෙ නම දුරකථනය ගත්තාය. 'ඔයා

දැන් මගේ ලෙඩ අහන්න ගන්නේ. තැන්කි.යු සෝ මච් දේවක' ඇය කීවේ සිතිනි.

"හෙ..ලෝ."

කෙල්ල නැති අමාරුවකින් කතාකළාය.

"අනේ මිස්ට ගොඩක් අමාරුයි වගේනේ"

දේවක කීවේය.

"ටි..ක..ක් දේවක. උ..දේ වොමිට් වුනත් එක්කනේ."

"මම මේ බලාගෙන ඉඳලා පස්සේ නේත්‍රා මිස්ගෙන් ඇහුවේ"

'ඇයි මම එනකල් බලාගෙන හිටියේ' භාවනාට අසන්නට සිතෙයි. එහෙත් අද එහෙම අහන්නටවත් සනීපයක් නැත.

"ම..ම දන්නේ නෑ මා..ව

හොයනවා කියලා දන්නවානම් කතාකරලා කි..ය..න..වා."

ඇය උගුරෙන් මෙන් කීවාය. ඒ වචන අමුතුය.

"ගොඩක් අමාරුද මිස්."

"මී. ගො..ඩ..ක් දේ..ව..ක. නැඟිටින්නත් බෑ ඇඟටම පණ නෑ."

"අනේ අපි බෙහෙත් ටිකක් ගමුකෝ මිස්"

"ම..ම බෙහෙත් බොන්න ආ..ස..ම නෑ. බලලා හොඳවුනේ නැත්නම් ගන්නවා."

"වොමිට් වෙනවට පෙත්තක් තියෙනවා බලලා එවන්නද නේත්‍රා මිස්ගේ අතේ."

"මො..ක..ක්..ද"

"මං දන්නවා. ඒකයි පෙනඩීනුයි."

"පුළුවන්ද"

"මම මේ නේත්‍රා මිස්ට කිව්වා හොඳ තැනකින් සැන්ඩ්විච්සුත් ගෙනත් දෙන්නම් කියලා මේ දැන් යනවා."

"අනේ වැඩත් දාලා."

"මිස් සනීපවෙන්න එපැයි."

දේවක කීවේය. භාවනා දෑස් පියාගත්තාය. ඒ වචනවල මොකක්ද සනීපයක් ඇත.

"ඇ..යි මා..ව හෙව්වේ ඔ..යා"

ඇයට අහන්නට ඕනා එයය.

"උදේ ඉඳලා හෙව්වා මිස්ව"

ඒ ඇයි කියා දේවක කිව්වේ නැත.

"ලා ඇල් වතුරෙන් ඇඟ ටිකක් හෝදගන්න මිස් උණ අඩුවෙනවා ගොඩක් පොරවගන්න එපා"

"මේ ඔළුවේ ඉඳලා පො.රවගෙන ඉන්නේ සීතලයිනේ"

"එතකොට උණ බහින්නේ නෑනේ"

දැන් උණ ටික දවසක් තියෙනවා දකින්නට ඇයට ආසය. ඒ ඇයි කියා භාවනාම දන්නේ නැත.

"මම ඉක්මනට පෙත්ත අරන් නේත්‍රා මිස් අතේ එවන්නම්. සැන්විචස් එක්ක."

"සැ..ර..ට මොනවාහරි තිබ්බොත් තමයි කන්න පුළුවන්."

ඇය කීවාය. පසුව එහෙම කියවුණ එක ගැන ඇයට පුදුමත් සිතුණි. 'හරියට තාත්තිට කියනවා වගේනේ මම එයාට ඒක කියන්නේ' එයම දේවකටත් සිතුණි. 'ඔයාව හොඳයි ඉල්ලගෙන අරන් හදාගන්න' ඔහුට එහෙමම සිතුණි.

"මම එහෙමම බලලා ගන්නම් උණ ගත්තාම එහෙමයි. කට

අප්පිරියයි.නේ මිස්. කෝපි ටිකක් එහෙම බීලා ඇලවෙලා ඉන්නකෝ මිස්."

"ම්."

දේවක දුරකථනය තබා දෑස් යන්තමට පියාගෙන නළළට අත යවා හිසකේ පිටුපසට කරගත්තේ ලොකු දෙයක් හිතාගෙන මෙන්ය. 'දැන් මටත් උණ වගේ' ඔහු සිතුවේය.

# 12

ඉඳුනිල් කෙල්ලගේ නළලට ඕඩි ක්ලෝන් පෙඟවූ පැනල් රෙදි කඩක් දමා පහළට ගියේ ඇයට රස්නෙට ඉඟුරු තේ එකක් හදාගෙන එන්නටය. මේ දූලා තුන්දෙනාගෙන් කෙනෙක්ට අසනීප වූ විට මේ අම්මාට නිවනක් නැත.

භාවනාගේ නළලට ඕඩි ක්ලෝන් පෙඟවූ රෙදි කඩ නිසා දැනුනේ සනීපයකි. ඇය යන්තමට දෑස්

පියාගෙන පොරවනය පපුවෙන් ටිකක් පහළට දමාගෙන උන්නාය. ඇයට දැනුණේ අතිශය නිසංසල බවකි. හිත එක සමාධියකින් තියෙන්නාක් වැනිය. පිටතින් ඇසෙන පංකාවේ හඬට භාවනා කන් දීගෙන උන්නාය. පහසුවෙන් හුස්ම ගන්නට ඇය උත්සාහ කළාය. ඕඩි ක්ලෝන්වල සීතල නළලතේ රුධිර නාලිකා අස්සෙන් හිසට මෘදුව ගලාගෙන එන්නාක් වැනිය.

මේකට කියන්නේ උණ සනීපය කියාය. උණක් හැදුනාම එන මේ සීතල සනීපය විඳින්නටත් ඕනාය. වෙනදා මේ වෙලාවට සීගිරි එකේ ඉන්නේ දාහක් ප්‍රශ්න මැදය. ඒ කලබලයෙන් මිදී මෙහෙම සිටිද්දී හදවතට දැනෙන සනීපය වෙනස්ය. නිසංසලය.

“දැන් හරියට මගේ ශරීරයේ කොටසක් සීගිරි එකේ තියෙනවා වගේ හිතෙන්නේ. ඒ දේවක නිසාද”

භාවනා අවකංව සිතුවාය.

“කොහොමත් සීගිරි එකට ඔයාගේ පැමිණීම මගේ ජීවිතේට මොකක්ද ගෙනාවා වගේ දේවක”

හදවතට අවංකව සිතද්දී එහෙමය.

ජීවිතය හැමදාමත් මේ වගේ යන්නේ නැත. දවසක වෙනස් වෙයි. ඒ වෙනස ජීවිතයේ වෙන්නට පෙර හදවතේ ඇතිවෙයි. මේ පපුවට දැනෙන ගැස්ම ඒකද කියා භාවනා සිතුවාය. මොකක්ද දැනෙන බව දන්නා නමුදු ඒ කුමක්දැයි දන්නේ නැත.

“මම සීගිරි එකට නෑවිත් පැයක්

දෙකක් යන්න කලින් ඇයි ඔයාට මං නැති අඩුව දැනුනේ. සීගිරි එකේ ඉන්නේ මම විතරක් නෙමේනේ දේවක."

ඒත් ඒක ඔහුගෙන් අහන්නේ කෙසේද?

මහ වෙලාවක් ගියේ නැත. භාවනාගේ දුරකථනය නාදවිය.

ගත්තේ දේවකය.

ඔහු ගත්තේ ෆාමසියේ සිටය.

"මම ජීවක ෆාමසියේ ඉන්නේ මිස්."

ඇයට පුදුමය.

"අනේ මහන්සියනේ."

"මිස්ගේ හිසත් කකියනවද මිස්."

"මි ගොඩක්."

ඇය කීවාය.

"මම ඒකටත් පෙත්තක් අරන්

එවන්නම් රැපිඩෝල් කියලා ඒකට අඩුවෙයි."

ඇයට කිසිවක් කියාගන්නට අමාරුය.

"අද වැඩත් ගො..ඩ..ක් නේද?"

"මම ඒවා බලාගන්නම් මිස්. සනීපවෙන්නකෝ"

ඔහු කීවේය.

"මම ඔරේන්ජ් බාර්ලි එකක් එක්කම එවන්නම් මිස් බෙහෙත් ටික."

දේවක කීවේය. උණ හැදුණු විට අප්පච්චී කොල්ලාට ගේන්නේ ඔරේන්ජ් බාර්ලිය. උණත් ඔරේන්ජ් බාර්ලිත් අතර සම්බන්ධයක් ඇත.

"ම්."

භාවනාගේ ඇස් අග්ගිස්සක් තෙත්විය. ඒ ඇයිදැයි අයම දන්නේ නැත.

"තේරෙන්නේ නෑ මේ ඇයි කියලා. මොනවාහරි වෙනවා දේවක."

එය එහෙමම බව භාවනාට දැනෙයි.

නේත්‍රා ගත්තේ දේවක ෆාමසියේ සිටිද්දීමය.

"මිස්."

"අනේ මහත්තයෝ මේ යුනි ලීවර්ස් එකෙන් ඇවිත්. ඒ මදිවට කොකා කෝලා ඒජන්සියෙනුත් ඇවිත් මාව හිරවෙලානේ දේවක."

ඇය කීවාය.

"මම මිස් මොකද කරන්න ඕන."

"සීගිරි එක ළඟින් තියෙන පාරේ කෙළවරටම ගියාම තට්ටු දෙකක ගෙයක් හම්බවෙනවා. සුදු පාට ගාපු. ඒ අපේ ගේ දේවක. තරහ නැත්නම් මහත්තයෝ ඕක ඔහොමම

අපේ අම්මට ගිහින් දෙන්න. මම මෙහේ බලන්නම්. මොනවත් හිතන්න එපා මහත්තයෝ”

දේවකට ඊට වඩා දෙයක් නැත. ‘අම්මගේ මහගෙදර බලාගන්න හරි ආසාවෙන් හිටියේ. එයා හැදිච්ච ගේ’ දේවක සිතුවේය.

“මම අරන් යන්නම් මිස්. මේ මිස්ට බෙහෙත් පෙති දෙකක් ගත්තා. මිස් ඕක බලාගන්න. ඒක ගාණක් නෑ. මම වැඩ ටික ප්ලෑන් කරලා ආවේ”

“අනේ බෙහෙතුත් ගත්තද ඔයා”

“ම්. අමාරුයිලුනේ”

දේවක කීවේය. නේත්‍රා සිනාසුනාය.

“එයා එහෙම තමයි. බයයි.”

“මං යන්නම් මිස්”

දේවක කීවේය.

දේවක සීගිරි නිවසට ගියේ ආසාවෙනි. එය දැවැන්ත නිවසක් විය. රඹුක්වැල්ල මහතා මේ නිවස හදා දැන් අවුරුදු තිහකට ආසන්නය. ඒත් සීගිරි නිවස ඊයේ පෙරේදා හැදූ නිවසක් වාගේ ලස්සනය. ඔහු කවදාවත් මේ නිවසට ගරා වැටෙන්නට දුන්නේ නැත. සීගිරි එකත් මේ නිවසත් හැදුවේ එකටය.

දේවක ත්‍රී වීලරයෙන් බැස ගේට්ටුවෙන් ඇතුල් වූයේ හදවතට ආ මොකක්ද දුකක්ද සමඟය. 'අම්මා හැදුනේ මේ ගෙදර. අප්පච්චී එක්ක ජීවත්වෙන්න තියෙන කැක්කුමටයි එයා මේ ගේ අත්ඇරියේ. පව්' ලස්සනට ගස් වවා තැනූ වත්තේ කෙළවර නිවස විය. ඔහු පිටතින් දැක්කේ නිවසකට වඩා කුඩා හෝටලයකි. සීගිරි එකට මුළින්ම පය

තැබුවා හදවතට දැනුන අමුත්තම අද දේවකට දැනෙයි. 'ඔයා ළඟ ඉන්නවා වගේ අම්මේ'

දේවක නිවසට එන බව භාවනා දන්නේ නැත. දන්නවානම් ඇය උඩ සිට හෝ ඔහු දෙස බලා සිටිනු ඇත. වැඩ දහසක් අතරේ නේත්‍රාටද එය අමතක විය.

කොල්ලාව මුළින්ම දැක්කේ ඉඳුනිල්ය. නේත්‍රා කතාකර කිව්වේ අම්මාටය. 'අපි අලුතෙන් ගත්තේ අම්මේ. දේවක. කෙල්ලට හරි හිතයි. ඔය දැන් බබාට සැන්ඩ්විච්ස් අරන් එන්න ගියේ එයා. අරන් එයි ගෙදරට. ආවාම තේ එකක් දීලා එහෙම යවන්න. හොඳ කොල්ලා' නේත්‍රා කීවේ එහෙමය. ලොකු දුව එහෙම ලේසියෙන් පිරිමියෙක්ව විශ්වාස

කරන කෙල්ලෙක් නොවන බව ඉඳුනිල් දනී. දෙයක් කියනවානම් ඒ හොඳට හිතා බලාය.

මේ එන්නේ මීට අවුරුදු විසි ගණනකට පෙර ඉඳුනිල්ගේ ආදරණීයම නෑනා වූ නර්මදාගේ එකම පුතා බව ඇය දන්නේ නැත. මිලින්දත් ඉඳුනිලුත් විවාහ වූ දා සිට සුරංගිටත් රුවන්තිටත් වඩා ඉඳුනිල්ට සමීප වූයේ නර්මදාය. සුරංගිත් රුවන්තිත් අලුත් නෑනා දෙස බැලුවේ කුහකකමිනි. එහෙත් ඇයව අක්කා කෙනෙක් සේ බාරගත්තේ නර්මදා පමණි. ඒ ආදරයත් මනුස්සකමක් තවමත් ඉඳුනිල්ගේ හදවතේ රැඳී ඇත.

අද මේ එන්නේ නර්මදාගේ කොල්ලාය. එකම පුතාය. ඇය

මේ ලෝකයේ තනිකර ගිය ඇගේ ලේ කැටියාය. කොල්ලාව දකිද්දීම ඉඳුනිල්ට මොකක්ද දැනුණි. එය කුමක්ද කියා තේරෙන්නේ නැත.

ඉඳුනිල් සිනාසුනාය. 'ඔයාගේ අම්මා වෙන්න ඕන හරි කරුණාවන්ත අම්මා කෙනෙක් වගේ. ඔයාගෙයි නේත්‍රා මිස්ගෙයි මූණමයි' දේවකට සිතුණි.

"මේ පුතා"

ඉඳුනිල් ඇසුවාය. දේවක මුව පුරා සිනාසුනේය. ඒ සිනහවත් ඉඳුනිල්ට මතකයි වාගේය. පුදුමය.

"මම මැඩම් දේවක. සීගිරි එකේ ප්‍රමෝෂන් මැනේජර්. මේ භාවනා මිස්ට මේ."

ඉඳුනිල්ට දුකය. කොල්ලා එහෙම මෝරපු කොල්ලෙක් නොවේ. එහෙම

කොල්ලෙක් ඇය මේ දැක්කාමය.

"මට ලොකු දූ කතාකරලා කිව්වා පුතේ. එන්න."

දේවකට හරි ආසය. ඔහු සීගිරි නිවසට පය තිබ්බේ ඉඳුනිල්ගේ පසුපසින් ගොස්ය. සීගිරි නිවසට කෙනෙක් ආ හැටියේම දකින්නේ ලස්සන සුදු බිත්තියේ ගසා ඇති සීගිරි පවුලේ පින්තූර පෙළය. එහි එක් කොණක සුදු මල් මාලයක් දමා ඇති පින්තූරය අම්මාගේය. දේවකට එදෙස බලාගෙනම ඉන්නට සිතුණි. මේ අම්මාගේ තමා දැක නැති පින්තූරයකි. කොල්ලාගේ පපුව හෝස් ගා ගියේය.

"ඉඳගන්න පුතා."

දේවක ඇස් පාදා ගත්තේය. ඉඳුනිල් බලා උන්නේ ඒ දැස් දෙසය.

එහෙත් ඔහු බලා සිටියේ නර්මදාගේ පින්තූරය දෙස බව ඇය දැක්කේ නැත.

"මේ මැඩම් මම භාවනා මිස්ට සැන්ච්විචස් එකක් දාගෙන ආවා. මේකේ මේ බෙහෙත්"

ඉඳුනිල්ට පුදුමය. සීගිරි එකට අනන්තවත් අය ඇවිත් ඇත. එහෙත් මේ වාගේ කෙනෙක් මේ ආවා ඇය දැක්කාමය.

"අනේ පුතා බෙහෙතුත් ගෙනාවද?"

"මේක මැඩම් මේ මිස්ට වොමිට් වෙනවට"

"ම්. උදේ වොමිට් වෙලා බයවෙලා තමා ඉන්නේ."

දේවක සිනාසුනේය. මේ අම්මා ඇගේ බාල  දුවට හරි ආදරේ යැයි

ඔහුට සිතුණි.

"මේක මැඩම් මිස්ගේ හෙඩෙක් එකට. මම මිස්ට ෆාමසි එකේ ඉඳලා කතාකළා. කිව්වා හෙඩෙක් එකක් තියෙනවා කියලා."

ඉඳුනිල් සිනාසුනාය.

"මේක නේද පුතේ."

"ඔව් මැඩම්. මේක උණට මැඩම්. දෙකක් දෙන්න පැය හයකට පස්සේ තව දෙකක්. අඩුවෙලා යයි."

ඇයට පුදුම හිතුණේ කොල්ලා ගෙන ආ ඔරේන්ජ් බාර්ලි එක දකිද්දිය.

"මේක මේ."

"මම මැඩම් මේ නිකං ගෙනාවේ. මට අසනීප වුනාම අප්පච්චිත් ඔරේන්ජ් බාර්ලි ගේනවා ඒකයි."

ඇයගේ පපුවේ ඇතුළු බිත්ති

හැකිලීයන තරම්ය.

"අනේ."

දේවක සිනාසුනේය.

"මේකේ සැන්ඩ්විචස් මැඩම්. ටිකක් සැරට හදලා ගෙනාවේ. ඉඳලා කියලා දාගෙනම ආවා"

කෙල්ලට පිරිමි සහෝදරයෝ දෙන්නෙක් ඇත. එක්කෙනෙක් කෝසලය. අනිත් කෙනා මිහිරංගය. ඒත් ඉන්නට තිබුනේ මෙහෙම සහෝදරයෙකි. එහෙම වුවානම් කතාව මීටවඩා පහසු යැයි ඇයට සිතුණි.

"ඉන්න පුතේ මම තේ ටිකක් හදාගෙන එන්නම්. නැත්නම් කූල් එකක්."

දේවක සිනාසුනේය.

"තේ එකක් හොඳයි මැඩම්."

එහෙම කියූ එකම කොල්ලා මේය.

"මිස් නිදි නැත්නම් මම කතාකරනවා."

"එපා මැඩම්. නිදාගන්න දෙන්න මිස්ට"

ඉඳුනිල් යාබද පැන්ට්‍රියට යද්දීත් හැරී බැලුවාය. 'කෙල්ල මේකා වෙනුවෙන් අර කට්ටිය ඉස්සරහා කතාකරපු එක හරි. ඉන්ටර්වීව් කරලා ඇවිත් මිලින්දත් කිව්වේ ඒකමනේ.' ඉඳුනිල් සිතුවාය.

ඉදුනිල් එද්දි දේවක උන්නේ නැඟිට ගොස් පින්තූර යාය දෙස බලමිනි. ඔහුගේ දෑස් තිබුනේ අම්මාගේ පින්තූරයේමය. ඉඳුනිල් එද්දී දේවක බිමට නෙත් බරකර ගත්තේය.

"බොන්න පුතේ"

දේවක තේ එක ගත්තේ ආදරබර ලෙස සිනාසීය. මොකක්දෝ හේතුවක් නිසා ඉඳුනිල්ට පිරිමි පුතෙක් නැති වුනානේ වැනි හැඟීමක් ඇතිවිය. මේ අවුරුදු තිහට ඇයට කවදාවත් එහෙම සිතී නැත. එහෙත් අද සිතුනි. ඒ දේවකව දැකය.

"මං යන්නම් මැඩම්."

දේවක තේ කෝප්පය තබා ඉඳුනිල්ට පහත් වී වැන්දාය. ඉඳුනිල්ගේ පපුවම දැවී ගියාය.

"අනේ. බුදු සරණයි ඔයාට."

ඇයට කියවුනේ ගොරෝද ලෙසිනි.

"කෑවට පස්සෙම බෙහෙත් ටික දෙන්න මැඩම්. නැත්නම් ගෑස් වගේ එයි"

"හොඳයි පුතේ. පයින්ද ඔය

යන්නේ"

"මේ ටිකනේ මැඩම්. යන්නම්."

දේවක යන දෙස ඇය බලාගෙ නම උන්නාය. 'දැකලත් පුරුදුයි වගේ කොල්ලව.' ඇය සුසුමක් හෙළා සිතුවාය.

# 13

ඉඳුනිල් බෙහෙත් ටිකත් සැන්ඩ්විචස් ටිකත් දේවක ගෙනා ඔරේන්ජ් බාර්ලි එකත් සියල්ලම ට්‍රේ එකක තබාගෙන උඩට ආවාය. මේ ටික දැක කෙල්ල දැන් තමාට බණින බව ඉඳුනිල් දනී. ඒ ඇයට කතාකළේ නැති එක ගැනය. 'හරි ආසයි එයා අසනීප වුණාම බලන්න එනවට කවුරුහරි' ඇය මේ පොඩි දුවගේ ගතිගුණ ගැන හොඳටම දනී.

භාවනා උන්නේ නින්දත් නොනින්දත් අතරය. අද ඇයව කොහොමත් හාමත් වී ඇත.

"සුද්දී. නැඟිටින්න මැණික."

ඉඳුනිල් කතාකළේ ආදරයෙනි. පැයක් අසනීප වූ විට ඇතිය. මාසයක් වූවාක් සේ ඇයව පරවෙයි. ඉස්සරත් එහෙමය.

"අම්මා"

භාවනා යන්තමට දෑස් ඇර බැලුවාය.

"නැඟිටලා මේ සැන්විචස් එකක් කාලා බෙහෙත් ටික බොමු පුතේ."

ඇය කීවාය. භාවනා ගැස්සී බැලුවේ එවිටය. ලෙඩ ඇස් දෙක පැලෙන්නට මෙන් විය.

"අ.ණේ අක්කා ඇවිල්ලත් ගියාද?"

ඉදුනිල් ලස්සනට සිනාසුනාය.

"අක්කා ආවේ නැහැ සුද්දි"

"එහෙනම් මේ..වා මේ"

ඇයට දුකය. 'එයාටත් වැඩ විතරයි. පොඩ්ඩක් එන්න බැරිද මං බලන්න. කවුද දන්නේ අන්තිම වතාවට බලනවද කියලා' භාවනා සිතින් නේත්‍රාට බැන්නාය.

"අර දරුවා ඇවිත් දීලා ගියේ."

භාවනා අම්මාගේ සිනාබර මුහුණ දෙස බැලුවාය. මොකක් හෝ වී ඇත.

"මොන දරුවද?"

"අර මේ දේවක කියන්නේ. ඒ ළමයා ආවේ."

කෙල්ලගේ උණ එහෙමම බැස්සේය.

"මේ දේ..ව..ක ආ..වා මෙ..හේ. මේ අපේ ගෙ..ද..ර අම්මා"

ඉඳුනිල් හිස වැනුවාය.

"ම්. දැන් පැය කාලයක් ඇති. ඔයා නිදිනේ පුතේ."

කෙල්ල එහෙමම ඇඳ මත ඉඳගත්තාය. 'කොල්ලා ගැන කිව්වා කියලා මෙච්චර පරල වෙන්නේ මොකද' ඉඳුනිල්ද සිතුවාය. මේ පොඩි බඩ්ඩ එහෙමම කොල්ලෝ හිසේ තියාගන්නා කෙල්ලෙක් නොවේ. එය ඉඳුනිල් හොඳාකාරව දනී.

"අනේ ඇයි මට කතාකළේ නැත්තේ. එක්කෝ එයාව එක්කං එන්න තිබ්බනේ අ..නේ. පිස්සුනේ."

අම්මා කියාවත් බලන්නේ නැතුව කෙල්ල බැණ්නාය. ඇය ට්‍රේ එක මත තිබූ සැන්ඩ්විච් පීරිසියත් ඔරේන්ජ් බාර්ලි බෝතලයත් බෙහෙත් ටිකත් දෙස බැලුවාය. 'ඔයා ඇවිත්.'

"ඉතින් එයා මේක දීලා ගි..යා."

නිකමට හෝ කියන්නට තිබුණි. 'පිස්සෙක්නේ. එනවා කියලා කියන්න එපැයි පොල් බූරුවා.' කෙල්ල දැන් දේවකටත් ලුණු ඇඹුල් සහිතවම බණියි.

"අනේ එහෙම කරනවද? මාත් එක්ක කතාකරකර ඉඳලා තේ එකක් එහෙම බීලා ගියේ. යනකොට මට මේ පොඩි එකෙක් වගේ දණගහලා වැඳලත් ගියේ."

භාවනා අම්මාගේ මුහුණ දෙසම බලාගෙන උන්නාය.

"මේ ඔ..යා..ට වැ..න්...දා එ..යා"

"ම්. කවුරුහරි කොල්ලව හදපු අම්මා ලස්සනට හදලා තියෙනවා."

අම්මා දේවක ගැන කතාකරන්නේ ආදරයෙනි. කෙල්ලට ඒ ඇතිය.

"එයාගේ අම්මා පුංචි කාලෙම නැතිවෙලා අම්මා. අප්පච්චි එක්ක හැදෙන්නේ. ඒ දෙන්නා තමා ඔය තනියෙන් ජීවත්වෙන්නේ. අප්පච්චියි පුතයි දෙන්නා උයාගෙන කනවා."

ඕනවටත් වඩා විස්තර ඇය කීවාය.

"අනේ. එහෙමත් වෙලාද ඒකට."

"ම්."

"කිව්වත් තමයි අප්පච්චී අසනීප වුණාම ඔරේන්ජ් බාර්ලි ගේනවා කියලා. ඒනිසා ඔයාටත් ගෙනාවලු."

කෙල්ලගේ දෑස් තෙමීගියේය. ඉඳුනිල් එය නොදැක්කා සේ උන්නාය.

"ප..ච්"

හදවත ඇතුළාන්තයම දවාගෙන ආ කැක්කුමකින් ඇයගේ ළය

දැවෙයි.

"ගෙ..ද..ර..ට..ම ආ..ව..ද?"

"ම්. මං තේ එකකුත් හදලා දුන්නා. අනේ බිව්වා පොඩි එකා වගේ."

අම්මාට දේවකව හිතට අල්ලා ඇති බව දැන් භාවනා දනී. ඇය එහෙමම පිරිමි දරුවන්ට ආදරේ නැත. 'ඔය ඉන්නේ පිරිමි මරුවෝ දෙන්නෙක්. නිකමට කියන්නේ නෑනේ ඒ දෙන්නා ගැන'

"ඔයාට පිස්සුනේ. චුට්ටක් කතාකළානං ගවුමක් දාගෙන මම එනවා අනේ"

"හරි හරි. ඒ දරුවමයි කිව්වේ මිස්ට නිදාගන්න දෙන්න කියලා"

"පිස්සෙක්නේ."

ඉඳුනිල් අහක බලාගෙන

සිනාසුනාය.

"අ..ම්..මා"

"ම්."

"හරි අහිංසක පාටයි නේ."

කෙල්ලට දැන් ඕනා පේක්ෂක ප්‍රතිචාරය.

"ම්. දැක්ක ගමන් මටත් හිතුණා දැකලා තියෙනවාත් වගේ. අවුරුදු ගාණක් මාව දන්න විදිහට මාත් එක්ක හිනාවුනේ. මැඩම් මැඩම් කියනකොට දුකත් හිතුණා."

'මටත් එයා මිස් කියනකොට දුකයි තමා' භාවනා සිතුවාය.

"ම්. දැන් කන්නකෝ සැරට දාගෙන ආවා කිව්වේ. මං කාලා බැලුවා රහයි තමයි."

භාවනා බාත්රූම් එකට දුවගෙ ාස් ආවාය. වෙච්ච දේට ඇගේ බඩත්

කොරවූවා සේය.

"රහයි තමා. අම්මා සෝස්."

සැන්ඩ්විච්වස් කද්දී සෝස් ඕනාය.

"අද සෝස් කන්න එපා. ඊකට ආයේ වොමිටින් එයි."

"ම්"

අම්මා දේවක ගැන තව මොනවා හෝ කියනවානම් හොඳයි කියා භාවනාට සිතෙයි.

"ඔය ළමයට ඉතිත් හරියට වැඩ ටික කරගෙන යන්න මිහිරංගයි කෝසළයි ඉඩදෙයිද සුද්දි."

ඉඳුනිල් ඇසුවාය. මොනවා හෝ කියෙව්වොත් මේ සැන්ඩ්විච්වස් ටික කෙල්ල කන බව ඇය දනී.

"ඔහොම අහිංසක පාටට හිටියට එයා බය නෑ මෙයාලට. හරි හිතේ ධෛර්යක් තියෙන්නේ.

මීටින් එකේදී කියන ඒවට මගෙත් ඇඟ හිරිවැටෙනවා අම්මා. එහෙමම කෙසෙල් බඩයක් නෙමේ."

භාවනා කීවාය. කෙනෙක් ගැන ඇය මෙහෙම කියනවාමය.

"මී ඉගෙන ගත්ත පාටයි තමයි."

"කොල්ලෙක් වුණාම ටිකක් ඉගෙන ගෙන තියෙන්න ඕන. ඒකට මනුස්සකමත් ටිකක් එකතුවුණාම හරි ලස්සනයි"

භාවනා කීවාය. ඒ කතාව සාමාන්‍ය කතාවක් කියා බැහැර කරන්නට ඉඳුනිල්ට අමාරුය. මෙහෙම කියන්නේ ඇගේ බාල දුවය.

"එයි සීගිරි එක ලස්සනට හදයි. සීයත් කියන්නේ ඒක අක්කා කියන්නෙත් ඒක එදා තාත්ති කිව්වෙත් ඒකම තමයි."

භාවනා කතාවෙන් කතාව තවත් සැන්ඩ්විච් පෙත්තක් ගත්තාය. සනීප වූ පසුව තවත් දවසක මේ සැන්ඩ්විච් ටිකක් ගෙනවිත් කෑ යුතුය. හවසකට රත්තරන්ය.

# 14

භාවනාගේ ඇඟට පොඩි පණක් ආවේ සැන්ච්චස් ප්ලේට් එකම කා ඔරේන්ජ් බාර්ලිත් බී බෙහෙත් ටිකත් බිව්ව පසුය. හිතේ තිබූ තෝන්තු ගතිය දැන් නැත. උණනම් තිබ්බත් කමක් නැත. රැපිඩෝල් පෙත්තට හිස රදය අඩුවිය. භාවනා යළිත් ඇඳට ආවේ යන්තමට ඇඟත් ටිකක් සෝදාගෙනය. කොණ්ඩයත් බැඳගෙන සැහැල්ලු ගවුමක් දාගෙන

ඇය ඇඳටම ආවාය. උණ නිසා ඇතිවන සනීපයත් හොඳය. ඇඟ උණ හදාගන්නේ මේ විවේකය ඇඟට ඕනා නිසාය. බොහෝ විට කාරණායක් නැතවම එය බැස යයි.

ඇය දුරකථනය අතට ගත්තාය. දැන් අත කසන්නාක් වැනිය. මෝරපු ගෑනු කතාවට 'කැසිල්ල' කියන්නේ මේකටදැයි ඇය සිතුවාය. පසුව භාවනාටම සිනාය.

අත කසන්නේ ඔහුට ගන්න කියාය. නොගෙන අමාරුය.

වෙලාවකට හිත උඩ තෙත රෙදි දැම්මාක් මෙන් බරය. ඒ තෙත යන්නේ අර කරණාව හිතෙන් ගිය විටය. සමහර කාරණා එහෙමම හිතෙන් පහවී යන්නේ නැත. කොහොමත් ටික දවසක සිට හිතේ

මීදුමය. වැස්සක් ළඟක වාගේය. හිත් අහස බරය.

ඇය ගත්තාය.

දුරකථනය දෙවරක් නාද වෙන්නටත් පෙර දේවක එසවූවේය. ‘බලාගෙන හිටියා වගේනේ මං කතාකරනල්’ ඇය සිතුවාය.

“මිස්. දැන් කොහොමද මිස්ට”

ඔහු තමා හෙලෝ කියන්නටත් පෙර ඇසුවේය. භාවනා යන්තමට දෑස් තදකරගත්තාය. ඕනානම් අඬන්නට පුළුවනි.

“ටි..ක..ක් අ..ඩු..යි දේවක අ..යි..යේ”

භාවනා ප්‍රථම වතාවට කටපුරා කීවාය. අලි පොරක් සේ ඔහුට දේවක දේවක කියන්නට දැන් කෙල්ලගේ දිව නැවෙන්නේ නැත. ඒ

කතාවට ඇවිලී පිච්චී අළුවී ගියේ සීගිරි එකේ උන් කොල්ලාගේ පපුවය.

"අනේ. මම මේ බයෙන් හිටියේ. මේ දවස්වල ඩෙංගුත් තියෙනවනේ මිස්. බෙහෙත් බිව්වද?"

"ම්. සැන්ඩ්විච්ස් ප්ලේට් එකම කෑවා. ඔරේන්ජ් බාර්ලිත් බිව්වා. බෙහෙත් ටිකත් බිව්වා. ඇඟත් හේදුවා. දැන් සනීපයි"

ඇය කියාගෙන ගියාය. ඒ වචන ටික ඇතිය.

"සැන්ඩ්විච්ස් රහයි නේ"

"ම්. ගොඩක් කොහෙන්ද ගත්තේ දේවක අයියේ."

ඇය ඇසුවාය. ඔහු විනාඩියක් පමණ කතානොකර උන්නේය.

"මේ ළඟ තැනකින්. එයාලට කියලා හදවගත්තා. මාත් ස්ලයිස්

එකක් කාලා බලලා ගෙනාවේ."

ඔහු කීවේය.

"කෑවද?"

ඇය ඇසුවාය. එහෙම ඇසෙන්නේ ඇයිදැයි ඇයම දන්නේ නැත. ඒ වචනවලට දුරකථනය පවා පිච්චී යතැයි ඔහුට සිතෙයි.

"තාම නෑ."

"දැන් එකත් පහුවෙලානේ. ඇයි කෑවේ නැත්තේ."

"කනවා මිස්."

යමක් කියන්නට ගොස් පසුව ඇය කිවේ නැත.

"කන්න දැන්"

එය අණකි. එහෙම අණ කරන්නට කෙනෙක් සොයමින් සිටි පාළු කතරක් වැනි වූ හදවතට දැන් මොකක්ද දැනෙයි.

"හිස රදේ් අඩුවුණා නේද?"

"ඒකනේ පැලෙන්න වගේ තිබුනේ මම කොට්ටයක් ඔළුවේ හිරකරගෙන උන්නේ."

"රෑට කන්න නේත්‍රා මිස් අතේ ආප්ප චවන්නද? කට්ට සම්බෝල එක්ක."

කකියන ඇස්වල දැවිල්ලය. ඇවිලෙන පපුවේ දැවිල්ලය.

"අනේ දේවක අයියට වෙන වැඩක් කරගන්න නෑ."

ඇය කීවාය. එහෙම කියන කට දිහා ටිකක් ඔහුට බලන්නට ආසය. 'නෑකමටත් ඔයා මගේ නංගිනේ.' ඔහු සිතුවාය.

"මෙතන දියවන්නා හට් එකේ ආප්ප රසයි. මං නේත්‍රා මිස් අතේ චවන්නම්."

"අපේ අම්මා මොනවද ඉතින් කිව්වේ. මී. එනවා කියලා මට කිව්වෙත් නෑ"

ඇය කීවාය.

"දුවලා ඇවිත් දුන්නා. මැඩම් මිස්යු නේත්‍රා මිසුයි වගේමයි. මට මතක්වුනේ වසන්ති චතුරාණිව."

ඔහු කීවේය. ඇය සිනාසුනාය.

"මං කියන්නම්."

ඇය කීවාය.

"මට තේත් දුන්නා."

"මං දන්නේ නෑනේ. ඇයි කිව්වේ නැත්තේ."

ඔහු සිනාසුනා පමණිය.

"අම්මා කියනවා මේ නෑ ඕන නෑ. මං පස්සේ කියන්නම්"

භාවනා ඔහුව අවුස්සා තැබුවාය.

"ඇයි මිස්."

"පස්සේ කියන්නම්"

පස්සෙත් කියන්න දෙයක් තිබිය යුතුය. සමහරවිට අද රෑට.

"දැන් ආයෙත් නිදාගන්න එපා. රෑට නින්ද යන එකක් නෑ."

"රෑ ඇහැරලා ඉන්නවා. එහෙම මට නින්ද යන්නේ නෑ තමා"

හිත පෙරළෙයි.

"ආප්පයි කට්ට සම්බෝලයි ඇත්ද?"

"ඇතිවෙන දෙයක් කන්නත් බෑ. අප්පිරියයි."

"මං එවන්නම්."

"දැන් කාලා ඉන්නකෝ. ආප්ප ගේන්න කලින්."

මෙහෙම කියවෙන කට ගැන ඇයටත් පුදුමය.

"දැන් කනවා."

ඇයි දැන් කන්නේ කියා අසන්නට ඇයට සිතෙයි. හරියට කන්න තමා කතාකරන තෙක් බලාගෙන උන්නා වාගේය.

# 15

"කවුද මේ නෝටිස් එක දැම්මේ."

මිහිරංග ඇසුවේ සුපවයිසර් වරයෙක්ගෙන්ය. දේවක උන්නේ රාක්ක අතරය.

"මමයි දැම්මේ සර්"

දේවක කීවේ ගරු සරු ඇතිවය. මේ සීගිරි සුපර් හි අනාගත උරුමකරුවන් බව ඔහු දනී

මිහිරංග බැලුවේ කන්නට මෙන්ය.

"ෆිෆ්ටි ප්‍රසන්ට් ඩිඩක්ට් කලාම ඒ

ලොස් එක කවුද දාන්නේ. තමුසෙද?"

මිහිරංග ඇසුවේය. දේවක ඒ කතාව එච්චර ගණන් ගත්තේ නැත. යාල ආවේ එහි මුවන් මොණරුන් මෙන්ම නරිද ඉන්නා බව දැනගෙනය.

"අපි සතියකින් මේක වහනවා සර්"

දේවක කීවේය. මිහිරංගව දැවෙන්නට විය.

"එහෙම වහනකොට මේ කූලර්ස් අපි ඕෆ් කරන්න ඕන. ඒ නිසා ෆොසන් අයිටම් ඉක්මනට යවන්න ඕන. අනික මේවල එක්ස්පය ඩේට් ළඟයි. සී දිස්"

දේවක පහදා දුන්නේය.

"සේල්ස් සෙක්ෂන් එකේ ඩිසිෂන් ගන්නේ මම."

දේවක හිස වැනුවේය.

"මම මේක සර්ට කියලා දැම්මේ. නේත්‍රා මිස්ගෙන් ඇප්රෑ එක ගත්තා."

දේවක කීවේය.

"අනිත් දවසේ ප්‍රමෝෂන් කරනවානම් මගේ සයින් එකක් ඕන හරි. ඒක මස්ට්. ආ යූ අන්ඩර්ස්ටෑන්ඩ්."

"යර්ස් සර්. බට් අයි වොස් ගිවන් ද ඔතෝරිටි රිගාඩින්ද සේල්ස්. සෝ අයි ඩෝන්ට් හැව් ටු වේට්."

දේවක කීවේ නිවුන හඬින්ය. මේ සතා සමඟ වැඩකළ යුත්තේ එහෙම බව ඔහු දැනගෙන උන්නේය. කෙසෙල් කඳවල් කපන්නට පොරව ඕනා නැත. මන්නා කෑල්ලක් ඇතිය.

මිහිරංග ගියේ දේවකට රවාගෙ නය. දේවක ඔහුගේ පාඩුවේ වැඩ ටික කරන්නට විය. කවුරුත් නිසාවත්

මේ කරන දේවල් නවත්වන්නේ නැත.

"වික්‍රම."

ඔහු සුපවයිසර්වරයෙක්ට කතාකළේය.

"සර්."

වික්‍රම දේවක සමීපයට ආවේය.

"මේ තුනපහේ පැකට් ටික ගන්න. මේ ලොකු සැමන් ටින් ටිකත් ගන්න. හැම සැමන් එකකටම මේ තුනපහ පැකට් එක ගානේ ටැග් කරලා අලවන්න. මං ස්ටිකර් එකක් දෙන්නම් ඒක අලවන්න."

මේ තුනපහේ පැකට් මූව් වෙන්නේ නැති බව දේවක දනී. ඒවා ටික ඉවරකරගන්න වෙන්නේ මෙහෙම ප්‍රමෝෂන් එකක් කරය. එවිට සැමන් ටිකත් ඉවරවෙන බව ඔහු දනී.

"මං දාන්නම් සර්."

"හතරට කලින් පනහක්වත් දාන්න ඕන රැක් එකට දැන්ම ස්ටෝර්ස් දාන්න."

දේවක උපදෙස් දුන්නේය. අද දවස පුරාම දේවක එහෙම බලා ප්‍රමෝෂන් හතළිහක් පමණ කළේය. ඔහු එසේ කළ බඩු ටිකෙන් ටික යනවා සුපවයිසර්ලා පවා බලාගෙ නය. දක්ෂයින්ට හැමෝම බයය.

"ඔයාට ආප්ප ටිකක් ගන්නත් ඕන."

දේවක සිතුවේය. මේ පපුව භාරාගෙන එන කැක්කුමට නමක් නැත. නමක් නැති දේවල් ඕනාතරම් ලෝකයේ ඇත. බබා නිරෝගීනම් නම් දාන්න හදිස්සිවෙන්න ඕන නැත.

** *** ** ** ** ** ** ** **

උදේ සිට මොර සූරන වැස්සය. වෙලාව පාන්දර පහයි හතළිස් පහය. පාන්දරට වහින විට මොකක්ද මිහිරක් දේවකට දැනෙයි. ඉස්කෝලේ යන දවස්වල සිට කොල්ලා මෙහෙම පාන්දර වහිනවා බලන්නට ආසය. දවාලකට වහිනවා වාගේ නොවේ. පාන්දරක වහිද්දී හිතට මොකක්ද දෙයක් දැනෙයි. නිදිබර සුවයෙන් වැස්ස දෙස බලාගෙන සිටිද්දී හදවතම එකම පාළු අරණකදී භාවනා කරන්නාක් මෙන්ය.

දේවක ගඩොල් බිත්ති බාගේ අතරින් වහින වැස්ස දෙස බලාගෙ නම උන්නේය. පාන්දර ඇඳිරිය මැදින් වහිනවා බලාගෙන සිටින විට දැනෙන්නේ වෙනස්ම සුවයකි.

මේ මහා වැස්සේ අවදිවී උයන්නට ගෙන ඇති හේරත් මාමා ගැන දේවකට එන්නේ දුකකි. මෙහෙම වැස්සක ඇහැරී උයනවා කියන්නේ කොහොමටවත් සැපක් නොවේ.

ඔහු නොවන්නට මේ දුක විඳින්නේ තමා හෝ අප්පච්චීය. බැඳුමක් සමඟ හේරත් හදන සුදු කැකුළු බත හවස දෙකට තුනට කද්දීත් පුදුම සුවඳය. රසය.

"හේරත් මාමේ."

කොල්ලා කට පුරා මාමේ කියා කතාකරද්දී හේරත්ට උහුලාගෙන ඉන්නට අමාරුය. මේ අප්පච්චීලා පුතාලා කොතරම් හොඳද කියා හේරත් හොඳින්ම දනී. දෙන්නා ළඟ වැටී ඉඳීමම සැනසීමකි.

"අනේ පුංචි මහත්තයා උදෙන්ම ඇහැරලාණේ. මං හිතුවා මේ වැස්සේ හොඳට නිදි ඇති කියලා."

"මට පාන්දර නැඟිට්ටෙනවා හේරත් මාමේ."

"හිටින්න මං කෝපි ටිකක් වක්කරන්නම්."

කෝපි කියා ඇහෙද්දීත් සුවයකි.

"අද උයන්න ගන්න එපා හේරත් මාමේ. කෝපි ටිකක් හදලා ටිකක් ඇලවෙන්න."

"අනේ. මං හිතුවේ පුංචි මහත්තයෝ මේ සැමන් ටික තෙල්දාලා පරිප්පු හින්ඳවන්න."

දේවකට දුකය. මේ වැස්සේ දුකක් දෙන්න අමාරුය.

"අද සමහරවිට ඔෆිස් එකෙන් පිට යන්නත් පුළුවන් හේරත් මාමා. උදේට

එහෙනම් සැමන් බැඳුමක් විතරක් හදන්න. පාන් කාලා යන්න."

හේරත් හිස වැනුවේය. දේවක ඔහු හදා දුන් කෝපි කෝප්පය රැගෙන යළිත් ආවේ මිහිරි කෝපි සුවඳ විඳිමින්මය. කොට්ටය ගඩොල් බිත්තියට තබාගත් දේවක ඊට හිස තබාගත්තේය.

"ඔයාට සනීපවෙලාද දන්නේ නෑ."

හිත කොහේද දුවයි. වැස්සේ සීතල අතරින් පපුවට මොකක්ද රස්නයක් දැනෙයි. අදත් ඇය සීගිරි එකට එන්නේ නැත්නම් යන්නටත් මොකක්ද වාගේය. ඇය නැති සීගිරිය පාළුය. කතරක් වාගේය.

"මේ වැහි සීතලේ ඔයා සැපට නිදි ඇති. උණ සනීපෙත් ඇතිනේ."

උණ සනීපය ගැන දේවක

හොඳින්ම දනී. උණු ආ විට දැනෙන සීතලත් සමඟ ඔහේ දෑස් පියාගෙන ඒ සුවය විඳිය හැක. එය ගතට සුවයකි.

එහෙත් මේ මහා වැස්සේ භාවනා උන්නේද ඇහැරීගෙන වැස්සේ හඬ අසාගෙනය. පපුව දක්වාම පොරවාගෙන දෑස් යන්තමට පියවාගෙන ඇය ඇහැරීගෙන එන්නේ හතරේ සිටය.

මේ මහා පාන්දර කෙනෙක් ඇහැරී තමා ගැන සිතනා බවක් භාවනාට දැනෙයි. ඒ දැනෙන හැඟීම පුදුමාකාරය. කවදාවත් හිතට නොආ මිහිරකින් හිතම පිරී ඇත. අද හිරු නොපායන අඳුරු මන්දාරම් දවසක් බව භාවනාට සිතෙයි. එහෙම අඳුරු දවසකත් හිතට හීන් එළියක්

පෙනෙයි. ඒ එළිය එන්නේ කාගේ ඇසක ඇති පහනකින්ද??

කෙල්ල ජංගම දුරකථනය අතේ තියාගෙන දැන් පැය බාගයකටත් වැඩිය. ඇය ටික වෙලාවකට කලින් පොරවනය අතරින් හතු ගොබයක් සේ මුහුණ එළියට දමාගෙන සිතන්නේ එක දෙයකි. දේවකට කතාකරන්නේ කොහොමද කියාය.

මේ මහා පට්ට පාන්දර සීගිරි එකේ දෙයක් ගැන ඇසිය හැකිද? එවිට තමාට පිස්සු කියා ඔහු සිතනු ඇත. හිත අද අමුතුය. හරියට මේ වැස්සේ පුංචි මල් කුඩයක් ඉහලාගෙන යන කෙනෙක් වාගේය.

අවසානයට භාවනා ඇමතුම ගත්තාය. හිත එකඟ කරගන්නටම බැරිවිය. හිතට වහල් වෙනවා

කියන්නේ මෙහෙම වෙලාවට විය යුතුය. මිහිරක් සතුටක් දැනෙනවානම් හිතට වහල් වෙන එකේ වරද මොකක්ද කියා භාවනා සිතුවාය. 'හැම වෙලාවේම ඉතින් එකම අච්චුවට පාන් පුච්චන්න ඕනයෑ.' ඇය සිතුවාය.

දුරකථන රැහැන් සම්බන්ධ වෙන්නට මහ වෙලාවක් ගියේ නැත. ධාරානිපාත වැස්සේ පවා දුරකථන සම්බන්ධය හොඳින් සිදුවෙයි. සිග්නල් යන්නේ රේන් කෝට් දමාගෙන විය යුතුය.

"ගුඩ් මෝනිං මිස්."

තත්පරයක් තුළ දේවක ඇමතුම සම්බන්ධ කර ගත්තේය. මේ තරම් පාන්දර ඇය කතා කරාවී කියා දේවක සිහිනෙන්වත් සිතුවේ නැත.

එහෙත් බෝනස් වාසනා ලැබෙන්නේ හිතාගන්න බැරි ලෙසය. ඒ ඇමතුම හරියට වැස්සේ ආ පහනක් සේය.

"හැපී රේනින් දේවක අයියේ."

භාවනා කීවාය. කෙල්ලත් ඉන්නේ වැස්සේ ඇහැරීගෙනය. මේ වැහි සීතලේ යුවතියක් ඇහැරී සිටීම ගැන වෙනමම සිතිය යුතුය. විශේෂ කාරණාවක් නොවේනම් එහෙම කවදාවත් කෙල්ලෙක් ඇහැරෙන්නේ නැත. උනුසුම් ඇතිරිලි අස්සේ ගුලිවෙන්නට කෙල්ලෙක් තරම් ආස කෙනෙක් නැත.

"සේම් ටු යූ මිස්. තුනේ ඉඳලා වැස්ස මිස්."

"මි. කීයේ ඉඳන්ද ඇහැරිලා ඉන්නේ"

එහෙම අසන්නේ ඔහුගේ හිත

කියවන්නට ඕනා නිසාය.

"ඒ වෙලාවේ ඉඳලා වගේ ඇහැරලා මිස්."

පුදුමය. භාවනාට ඇහැරුණේද ඒ වෙලාවේ සිට වාගේය.

"ඉතින් මෙච්චර උදේ පාන්දර ඇහැරලා මොකද කරන්නේ ආ දේවක අයියේ."

දැන් උත්තර දිය යුතුය. දේවක සිනාසුණේය.

"මම මේ කෝපි එකක් බිබී ඔහේ හිටියා මිස්. මගේ කාමරේ ජනේල නෑ. ගඩොල් බිත්ති බාග විතරයි තියෙන්නේ. යන්තමට වැහි තුවානත් එනවා. සීතලත් වැඩියි."

දේවක කීවේය. භාවනා මවා ගත්තාය. මේ සීතල පාන්දර ඔහුත් සමඟ ගඩොල් කාමරයේ කුඩා

ඇඳකට බරව ඉන්නවාක් වැනි හැඟීමකින් කෙල්ලගේ සිත පිරුණි. එයින්ම ඇය හිරිවැටී ගියාය.

"එහෙම ෂෝක්නේ. වැස්ස ලයිව් පේනවා නේ."

"ඒකනම් ඇත්ත. මීදුම් පාටයි. මේ ගෙට ආපු දවසේ අප්පච්චි ඇහුවා ඕනනම් මේ ජනේල්වලට ප්ලයිවුඩ් ගහන්න පුළුවන් කියලා ජනේල් නැති නිසා. ඒත් මම එපා කිව්වා. ඒකේ වටිනාකම අදයි තේරුණේ."

දේවක කීවේය.

"ඉතින් වැස්ස දිහා බලාගෙන ඉන්නවා."

"මී. කල්පනා කරකර."

"මොනාද?"

ඇය උගුරෙන් මෙන් ඇසුවාය.

"ඒත් මං හිතුවා මිස්ට සනීප

වෙලාද කියලත්. සමහර වෙලාවට ඔය උණ දවස් තුනක් අල්ලනවනේ."

ඔහු නොකියා කීවේ මේ පාන්දර සිතමින් සිටියේ තමා ගැන කියාද? භාවනාගේ වියලී ගිය දෙතොලතරට සිනාවක් වැටිණ.

"දැන් සනීපයි. චුට්ටක් ඇඟට පණ නෑ."

"බිත්තර ආප්ප කෑවනේ රෑට. නේ."

"ම්. පොඩි අක්කත් එක්ක කෑවා. දේවක අයියව බලන්න ආසයි කිව්වා"

ඇය අවංකව කීවාය. ඇත්තටම තාරකා එහෙම කතාවක් කීවාය. 'උඹට ආප්ප ගෙනත් දෙන කොල්ලව බලන්නම ඕන පැටියෝ. උඹනම් ලේසි පාසු කොල්ලෙක් වෙන්න බෑ' ඇය

කිවාය.

"කීයටද එන්නේ."

ඇය රහසින් මෙන් ඇසුවාය. ගෑණු ළමයෙක් හැමෝගෙන්ම ඒ ස්වරයෙන් යමක් අසන්නේ නැත. කොල්ලෙක් එය තේරුම් ගතයුතුය. ස්වර පනින තැන වැදගත්ය. සමහර දේවල් කියන්නේ වචනවලින් නොවේ. ස්වර වලිනි. මන්ද්‍ර ස්වරයෙනි.

"උදෙන්ම එනවා මිස්."

ඔහු කීවේය.

"උදේම එන්න. මාත් තව ටිකකන් ඇඳගන්න ඉන්නේ. අද සාරි පටලග න්නත් බෑ."

මේවා කියන්නේ ඇයි? කියවෙන්නේ ඇයි.? දන්නේ නැත.

"වැස්සේ කොහොමද එන්නේ. බස්වල මි."

ඇය ඇසුවාය. කෙල්ල නොකියා කියන්නේ වැස්ස කියා බලන්නේ නැතුව එන්න කියාය.

“අප්පච්චී රෑ ආවේ වෑන් එකේ. අප්පච්චි දාගෙන යයි මිස්.”

දේවක කීවේය. උදේ පාන්දරට සීගිරි එක පාළුය. ස්ටාෆ් එක පැමිණෙන්නේ අටෙන් පසුය.

# 16

භාවනා ඇඳගත්තේ අත් නැති කොළ පාට ගවුමය. එය මේ වැනි දවසකට ලස්සනය. ඇරත් පහසුය. චිෆෝන් ගවුම්වලට ඇය කොහොමත් ආසය. එය නිදහස්ය. ගොඩක් සුකුරුත්තම් ඕනා නැත. සාමාන්‍ය සෙරප්පු දෙකක් දැම්මද එයට ගැලපෙයි.

"මේ පාන්දර යන්නේ සුද්දි. තාම උණ හරියට බැහැලත් නෑනේ

මැණික."

ඉඳුනිල් ඇසුවේ කෙල්ල අත් බෑගයද දමාගෙන පහළට එද්දීය. පොඩි දුවට වෙන අසනීපයක් හැදී ඇති බව අම්මා දන්නේ නැත. ඒ අසනීපය හැදුණු විට උණ ගත්තා වාගේ නොවේ.

"වැඩ ගොඩයි අම්මා. යනවා."

"යනවා කිව්වානම් මොනවාහරි හදනවා සැරට. මං දන්නේ නෑ යනවා කියලා."

"ම්හ්. කන්න බෑ. පස්සේ මොනවාහරි කන්නම්. තාම කට අප්පිරියයි."

භාවනා යන්තමට පහත් වී අම්මාට වැන්ඳාය.

"තෙරුවන් සරණයි. තාම වැහි අන්ධකාරේ."

ඇය කීවාය.

“ආසත් ඒකට තමයි.”

ඉඳුනිල් සිනාසුනාය. කෙල්ලට මොනවා හෝ වී ඇත. නැත්නම් වෙන්නට යනවාය. මොක වුනත් ඉඳුනිල්ට බයක් නැත. ඇය වාහනයට නඟින භාවනා දෙස බලාගෙනම උන්නාය. වීදුරුව අතරින් කෙල්ල අත වැනුවාය.

සීගිරි සුපර් හී ඉදිරිපය ඇති වීදුරුවට වේගයෙන් වැහි දිය ගසයි. එවිට ඇඳෙන වැහි දිය සිතුවම අතරින් එක් රුවක් යන්තමට භාවනා දැක්කාය. එක්කෝ ලා දම් පැහැය විය යුතුය. නොවේනම් ලා නිල් පැහැය විය යුතුය. දිය බේරෙන ග්ලාස් වෝල් එක අතරින් පෙනෙන ඔහුගේ රුව යළි කිසිදිනයක අමතක

නොවෙන ලෙස භාවනාගේ හිත මත සටහන් විය.

මුළු හදවතම එක ආලෝක පුංජයක ඇමිනී අහසට යන්නාක් වාගේය. කෙල්ල බැස්සේ ඒ රුව දෙස බලාගෙනමය. කුඩය යටින් එන දැඟකාර යුවතිය දෙස දේවක හොඳින් බලාගෙනය. කොල පැහැගත් ගවුම් අත අතරින් එළියට ආ සිහින් අත්ගෙ ාබ මේ උදෑසනේ හදවතට ගෙන එන මෘදු අනුරාගී රසය ඔහු වින්දේය. හිතෙන්නේ ඒ අත්ගොබ දෙකට දෑත් තබාගෙන ඒ මුහුණට බරවෙන්නය.

භාවනා ඇතුළට ආවේ ආරක්ෂකයාට තෙත කුඩය පාමින්ය.

"වේලලා වාහනේට දාන්න අන්කල්."

"හොඳමයි මිස්"

ඇසට ඇසක් ගැටුනේ එතනදීය. රැයක් නිදි වැරූ ලෙඩ දෑස්වල මේතරම් කාන්තියක් කොහෙන් ආවද කියා දන්නේ නැත. ඔහුගේ කමිසය ලා දම් පාටය. 'අද එයත් ෂෝට් ස්ලීව්ස් ඇඳන් ඇවිත්. එහෙමත් ලස්සනයි' ඇය සිතුවාය.

සිංහරාජය වනයේ සදාහරිත ඕකිඩ් ප්‍රභේදයක් ඇත. එය කොළ පැහැයය. නිතරම වැසි ලැබෙන සිංහරාජයේ ඒ වැස්සට ඔරොත්තුදෙන ලෙස පිපෙන මේ ඕකිඩ් ප්‍රභේදය දේවක දැක්කේ පේරාදෙණිය සරසවියේ පැවති ප්‍රදර්ශනයකදීය. ඒ ඕකීඩ් මල මේ තෙත උදෑසනේ සිහිවූයේ කොළ පැහැයෙන් යුතු වූ ගවුමක් ඇඳගෙන ආ ඇයව දැකීමෙන්ද? දන්නේ නැත.

"මං හිතුවේ මිස් තව පරක්කුවෙයි කියලා."

ඔහු යන අතරවාරයේ කීවේය. සීගිරි කාර්යාල කාමර පාළුය. දේවක ඇයත් සමඟ ආවේ විදුලි පහන් දල්වාගෙනමය. ඇයගේ වතින් එන මොකක්ද සුවඳක් මේ පාන්දර ඕනවටත් වඩා දැනෙයි.

"ගෙදර ඉන්න කම්මැලියි. ඉතින් ආවා."

ඇය කීවාය.

"තාම උණත් ඇති ඇඟේ මිස්."

"ම්. බැලුවේ නෑ."

ඇය කීවාය. හිතාගන්නවත් බැරි මොහොතක දේවක ඇය දෙස බැලුවේය. භාවනා ඒ බැල්මෙන් ඇවිලී ගියාය. 'බයවෙනවනේ මෝඩයෝ ඔහොම බැලුවාම. මේ සීතල පාන්දර'

ඇය සිතින් කීවාය.

ඊටත් පසු දේවක ඔහුගේ පිටි අත්ල කිසිඳු බියක් නොමැතිය ඇගේ නළලතට තැබුවේය. මොකක්ද හේතුවක් නිසා තත්පර කිහිපයකට ඇයගේ දෑස් පියවිණ. ඔහුගේ පිටි අත්ලේ රස්නය යළි අමතක නොවන ලෙස ඇගේ හදවතේ තැන්පත් විය.

"යන්තමට රස්නෙයි. උණ බැහැලම නෑ"

ඔහු කීවේය. ඇය දෑස් විවර කර බැලුවේ එවිටය. පසුව කෙල්ල සිනාසුනාය. 'අම්මටයි තාත්තටයි පස්සේ ඔය කෙනෙක් මගේ උණක් බැලුවමයි' ඇයට කියන්නට සිතෙයි. ඒත් ඒ දෙබස් බර වැඩිය.

"අද එහෙම මහන්සිවෙන්න එපා මේ උණ එහෙමයි. දවස් දෙක තුනක්

ඇගේ තියෙනවා. ටිකක් විවේකයෙන් ඉන්න මිස්."

භාවනා හිස වැනුවාය. එහෙම ඇය හිස වැනුවේ ඔහු කියූ දේ හරියට හිතට ගෙන නොවේ. ඒතරමටම කෙල්ලගේ සිහිය අවතැන්ව තිබූ නිසාය.

"ඉතින් මොනවද ඊයේ කළේ දේවක අයියේ."

ඔහුට අයියා කියාම අමතන්නට ඇය සිතාගෙන උන්නාය. ඒ ආමන්ත්‍රණය කොල්ලාගේ ළයට ගෙන එන්නේ වෙනස්ම හැඟීමකි. කිලෝ මීටර් ගණනක් ඇය සෙන්ටිමීටර්වලට පෙරලා ඇත.

"ඉන්න මම සමරි එකක් කියන්නම්."

දේවක භාවනාගේ මේසය

ඉදිරියෙන් වාඩිවීගෙන කීවේය. පසුව ඔහු ඊයේ සිදුවූ සියල්ලම එකින් එක කීවේය. බේකරි සෙක්ෂන් එකට ගන්නා බේකරි වෙෆ්ලා සමඟ කළ කතාවද පලා සප්ලයර් සමඟ වූ කතාවද බුක් සෙක්ෂන් එකේ රාක්ක හදන්න දුන් හැටිද සියල්ලම ඔහු කීවේය. මීට් සෙක්ෂන් එක උඩින් හදන ලී ලීස්තර වහළ ගැනද ඔහු පහදා දුන්නේය.

"මට ඊයේ අලුත් අයිඩියා එකකුත් ආවා මිස්."

ඔහු කීවේය.

"කොහෙන්ද ඔච්චර අයිඩියා එන්නේ."

භාවනා පෑන කටේ ගසාගෙන ඇසුවාය. දැල්වෙන දෑස් හමුවෙන්නේ බලාපොරොත්තු නොවූ ලෙසිනි.

"දේකට ආදරේ කරද්දී මිස් කප්පරක් අදහස් එනවා."

ඇත්තම කතාවත් එයමය.

"එහෙමද?"

"මී. දැන් මිස්, කෙනෙක් ගෑණු ළමේක්ට පැලෙන්න ආදරෙයි."

"කවුද?"

භාවනා අමාරුවෙන් ඇසුවාය.

"නෑ මම මේ කිව්වේ මිස් අපි හිතමුකෝ කෙනෙක් ආදරෙයි කියලා."

"ආ මේ වෙන කෙනෙක්."

'ඔයා හිතුවද දන්නේ නෑ මම කියලා' දේවක සිතුවේය. ඔහු ඇස් එසවූයේ සිනාවක්ද සමඟය. 'පිස්සෙක්නේ වෙලාවකට' ඇය සිතින් කීවාය.

"ඉතින්."

"නෑ ඉතින් ආදරේ කරන අයට

එක එක කවි කල්පනා එන්නේ. සිංදු ලියනවා කවි ලියනවා කෙළවරක් නෑ. එහෙමයි දේකට ආදරේ කරද්දී."

දේවක කීවේය.

"කරලම බලන්න ඕන. අපිටත් කවි සිංදු එයිද කියලා."

ඇය අහක බලාගෙන සිනාබරව කීවාය. දැන් ලෙඩ පාටක් ඇත්තේම නැත.

"ඉතින් මොකක්ද ආව අයිඩියා එක."

ඇය ඇසුවාය.

"අපි මිස් ටී සෙක්ෂන් එකක් දාන්න ඕන. එක එක වර්ගයේ ටී තියෙනවනේ. ටී බෑග් එහෙමත් දැන් තියෙනවනේ ලිප්ටන් යෙලෝ ලේබල් තියෙනවා. ඩිල්මා තියෙනවා ලාඕජී තියෙනවා. වටවල කහට තියෙනවා.

බොගවන්තලාව කහට තියෙනවා. අපි මේ හැම තේ එකක්ම එක තැනකට අරන් එතන හොට් වෝටර් ජග් එකකුත් තියලා එතනම තේ හදලා චූටි කප්වලට දාලා කස්ටමස්ලට රහ බලන්න දෙන්න ඕන. ටී කම්පනී අපට ඒකට ෆ්‍රී ටී බෑග්ස් දෙනවා. අපිට තියෙන්නේ ෂුගර් ටිකක් දාන්න විතරයි. එතකොට කස්ටමර්ට පුළුවන් තේ එකක් බීලම ටී පැකට් එක ගන්න. හිතන්නකෝ මිස් මේ සීතල ඒ සී එකේ යද්දී හොට් ටී එකක් බොන්න දෙනවා කිව්වාම. නේද? අපි ඒක කරන්නේ හවස තුනේ ඉඳලා හවස හත වෙනකල්. ටී වෙලාවට.”

ඇය බලාගෙනම උන්නාය. යමක් කියන්නට මෙන් බලාගෙන උන්නාය.

“ඇයි මිස්.”

“නෑ මේ උණ නිසාද දන්නේ නෑ මගේ උගුර එහෙමත් වේලිලා. රස තේ මතක් කරද්දී රස්නෙට ප්ලේන්ටී එකක් බොන්න හිතුණා.”

ඇය කීවාය.

“අපි අනුලට කියමු මිස්. ඉන්නකෝ. අනුලා ඇවිත් හිටියා.”

ඇයට දුකය.

“මං කියන්නම්.”

එහෙත් දේවක ගොස් තේ දෙකක් හදාගෙන එන්න කියා අනුලාට කීවේය.

“මතක ඇතිව අනුලා ඉඟුරු කෑල්ලක් දාන්න තලලා හොඳද? මිස්ට උණනේ.”

අනුලා සිනාසී හිස වැනුවාය. ‘අනුලාත් බලනවා ඇති මොකක්ද මේ සර්ගේ කරුණාව කියලා මිස්ට

තියෙන.' භාවනා එය අසාගෙන ඉඳ සිතුවාය. 'ඔයා ගැන කොහොමත් දවසක් දෙකක් නිවාඩු දාලා හිතන්නම වෙනවා රජෝ' භාවනා සිතුවේ පෑනෙන් මේසය මත හිස් ඉරි අඳිමිනි.

"අපි ඒක දාමු දේවක අයියේ. මං හැමදාම හවස තුනට ඒක බලන්න බාරගන්නම්. මම ආසයි ඒකට. මිල්ක්මේඩ් ඒජන්සිය එකක් කතාකරලා පුළුවන් වුනොත් මිල්ක් මේඩ් ටිකකුත් ෆ්‍රී ගන්න බලන්නම්."

ඈය කීවාය. දේවක හිස වැනුවේය.

"මාත් එහෙමම හිතුවා."

ඈයට ඒ කතාව විශ්වාසය. දෙන්නෙක්ට එකම දේ සිතෙන්නට පුළුවන.

# 17

"මොකක්ද ප්ලෑන් එක මචං."

කෝසළ ඇසුවේ මිහිරංගගෙනි. ඔවුන් මේ උද්‍යෑසනේ හමුවූයේ දේවකව සීගිරි එකෙන් ඉවත් කිරීමේ පළමු සැළසුම ගැන කතාකරන්නටය.

"මේකයි මචං."

"කියපන්"

"හෙට අනිද්දට මචං මූ එක දිගට නයිට් අඳින්න ඉන්නේ සීගිරි එකේ. හරි."

"පොර බැහැලා වැඩනේ."

"ඔව් මූ මෙගා වැඩක්නේ දෙන්න යන්නේ. මුළු සීගිරි එකම මූ අනිත් පැත්තට හරවනවා. හරි. ඒකට මූට නයිට් දහයක්වත් අඳින්න වෙනවා."

"ඔව් එහෙම නයිට් එකක් බලලා මූට ගේමක් දෙනවා."

කෝසළ කීවේය.

"එහෙම ගේමක් දීලා වැඩක් නෑ බං. අපිව මාට්ටු වෙන්නේ. දෙන්න ඕන මොළෙන් ගේමක්."

"හරි මොකක්ද ගේම."

"ඒ දවස්වලම ස්ටොක් රූම් එකෙන් බඩු ලොට් එකක් යනවා පිටට. ලක්ෂ පහක විතර. මං ස්ටොක් එක චෙක් කළා. ගණන් වැඩිම ෂැම්පූ පර්ෆියුම් ස්ටොක් එකක් තියෙනවා. ලක්ෂ පහ

පනිනවා. තාම පැකින් කඩලාවත් නෑ."

"එළ. ඉතින්."

"මේක මං සික්කාව අල්ලගෙන පන්නනවා ඒක පිටට දාලා අපි ගාණක් කපමු. ඒක වෙනම කතාවක්. පොඩී ආතල් එකක් ගන්න පුළුවන්නේ."

කෝසලගේ මුව මත සිනාවක් පතිත විය. 'මූත් මහ සල්ලි කෑදරයා. හැටි හිනාව.' මිහිරංග සිතුවේය.

"පස්සේ මම අපේ මලීෂාව දාලා ස්ටොක් එකක් ගන්නවා. බඩු නෑ කියලා කේස් එක අඳිනවා හරි."

"හරි."

"සික්කාවනේ ගෙන්නන්නේ. උඹ කියනවා දවල්නම් එහෙම දෙයක් වුනේ නෑ කියලා රෑට ඉන්නේ වෙන

සික්කෙක්නේ. උඟ මචං රෑට නිදි. අපි වේලාසන උඟට බාගයක් දීලා තමයි රෑක මේවා පන්නන්නේ අපේ සික්කා ලව්වා."

"මට තේරෙනවා."

"රෑට බුවා අපි නෑනේ හිටියේ මූනේ. අපි කෙළින්ම අහනවා මුගෙ න්. සීයා භාවනා නේත්‍රා අක්කා ඉස්සරහම. හරි."

"පොරට කට උත්තර නෑ."

"ඒත් අපි අතාරින්නෙම නෑ. මේකට ආන්සරබල් එයානේ රෑ නයිට් වැඩ කළානම් ස්ටොක් එකට වග කියන්නම වෙනවා."

"මට තේරෙනවා. ඒත් මූව ඉස්සුවා කියලා අපි ඔප්පු කරන්නේ කොහොමද මචං."

"බඩු වලින් ටිකක් ටික දවසකින්

අපි ළඟ ෂොප් එකකින් මාට්ටු කරනවා අපේ පොරක් දාලා අපි අඩුගාණට ඒවා ෂොප් එකට දානවා නිකං වගේ දෙන්නේ. ෂොප් ගන්නවා. බඩු දාන්න අපි යවන්නේ අපේ පොරක්ව. නම දෙන්නේ ද්‍රේවක කියලා මුගේ නම්බර් එකත් දෙනවා ආයේ බඩු ඕන වුනොත් ගන්න කියලා හරි."

"එළනේ බුවා මාර ප්ලෑනක්නේ ඩෝ."

"මාස්ටර් මයින්ඩ්නේ මචං. මං අපේ උන්ගෙන් එකෙක්ව මේකට දාගන්නවා. බඩු පන්නන දවසට උඹ එන්න ඕන. අපි වෑන් එකක් රෙන්ට් කරලා බඩු ගන්නේ. ඒකත් ගන්නේ මුගේ නමින්මයි."

මිහිරංග කීවේය. මේ සැළසුම

කොහෙත්ම වරදින්නට කාරණාවක් නැතැයි කෝසලටද සිතුණි. දවසින් දවස දේවක සීගිරි සුපර් හී දිලිසෙන තරුවක් වීම ගැන කෝසල උන්නේද කියාගන්නට බැරි තරහකිනි.

"මම බලලා ඩේට් එක කියන්නම්. මොනවා වුණත් මූ සීගිරි එක වහන්න කලින් අපි මේක කරන්න ඕන. තව සති දෙකයි තියෙන්නේ මූ මේක වහලා මේවා වෙනස් කරන්න ගියොත් මූ දවසකට හරි පොරක් වෙනවා. ඒවට ඉඩදෙන්න බෑ පරණ බර බාගේ හොඳයි."

"නියමයි. කරමු."

මිහිරංගත් කෝසලත් අතට අත දී ගත්තෝය.

"ප්ලෑන් එක ගැන පුංචි එක්කවත් කියන්න එපා හරිද මචං."

"පිස්සු බං. එහෙම කියනවද?"

කෝසලගේ හිතට සැනසීමක් දැනුණි. ටික දවසක සිට හිතේ හිරවී තිබූ ලොකු කරදරයක් තව සති දෙකකින් නැත.

"ඊට පස්සේ ගේම දෙන්න ඕන සීගිරි එක ක්ලෝස්ම කරලා දාන්න මේක යන්න බෑ ඉස්සරහට මේක බෙදන්න ඕන. එදාට අපි වෙන ගේමක් දෙමු."

කෝසල සිනාසුනේය. 'එදාට මම මගේ ෂෙයා එක ලස්සනට ගන්නම්.' ඔහු සිතුවේය.

*** *** *** *** ***

එහෙත් දේවක සීගිරි එක වෙනුවෙන් කැපවී උන්නේ කාටවත්

ඒ ගමන නතරකරන්නට බැරි තරම් වේගයකිනි. ඔහු පිටුපස යම්කිසි අදෘශ්‍යමාන බලවේගයක් තිබෙන්නාක් වැනිය. ඒ සමහරවිට දේවකගේ අම්මාගේ අත්මය වෙන්නටද පුළුවන. ජීවන්ට වරින් වර සිහිනයෙන් පෙනී සිටිමින් නර්මදා කීවේම කොල්ලාව සීගිරි එකට යවන්න කියාය. ජීවන් දේවකට අලෙවිකරණය ගැනම ඉගැන්වූයේද ඒ නිසාමය. අද දේවක මේ හැමදේම කරන්නේ ඒ අත්දැකීම් සමඟය.

පසුගිය දවස් දෙකක් පුරාම හවසට හවසට දේවක පොළේ රවුමක් දෙකක් ගැසුවේය. පාරිභෝග යකයෝ වැඩියෙන්ම නතරවෙන්නේ කොහේද කියා ඔහු බැලුවේය. සමහරවිට අපි හිතන්නේවත් නැති තැන්වල පාරිභෝගියකයෝ

පොරකති. වෙලාවකට කොස් කපන කෙනා ළඟය. නැත්නම් අත් මාළුකාරයා ළඟය. ඒත් නැත්නම් කීර පලා ලෑල්ල ළඟය. දේවක මේ හැමදේම දැක්කේය. බැලුවේය. සමහර දේවල් ඔහු ලියාගත්තේය. මිනිස්සු කූරි මාළු කන්න ආසම නැත. ඒත් කන්නේ අතේ මිටේ සල්ලි නැති නිසාය. තලපත් කෙලවල්ලෝ පරා ගිනි ගනන්ය. සාලයෝ හුරුල්ලෝ බෝල්ලෝ ගන්නේ කෑලි මාළු ගන්නට බැරි නිසාය. ඒත් මිනිස්සු කිරි ඉස්සෝ කන්න ආසය. හාල් මැස්සෝ කන්න ආසය.

කුකුල්මස්නම් නැතුවම බැරිය. ඒත් ඒ අලුත් මස් විය යුතුය. සීත කළ පරණ මස් ගැන මොකක්ද සැකයක් ඇත. මේ සියල්ලම දේවක දැක්කේය. හාල් ගන්නට ඇත්තේද

තදබදයකි. හොඳම සහල් වර්ග එන්නේ පොළොන්නරුවෙන් සහ තිස්සෙනි. අරලියා සම්බා එකට හොඳ ඉල්ලුමක් ඇත. නිපුන සම්බා එකටද එහෙමය. තිස්ස රෝස කැකුළු එකටද එවැන්ම ඉල්ලුමක් ඇත. සුදු කීර එකද දැන් ජනප්‍රියය. සූදුරු සම්බානම් යන්නේ අවුරුදු කාලයට විතරය.

දේවක සීගිරි එක අලුතින් හදන්නේ මේ දැණුමද එකට එකතුකරගෙනය. ඔහු සීගිරි එකට පය තියන්නට පෙර උන්නේ මේ තරම් සටනක් දෙන්නට නොවේ. එහෙත් එක ඇස් දෙකක් ඔහුගේ හැමදේම වෙනස් කළේය.

දැන් හැරීමක් නැත. කොල්ලාට ආස සීගිරි එකෙන් කෑල්ලක් ගන්නට

නොවේ. අයිතියක් ඇති නමුදු එහෙම තණ්හාවක් නැත. එහෙත් සීගිරි එකේ එක දෙයක් දවසක ඉල්ලාගන්නට ඔහුට දැන් සිතෙයි. හදවත පුරා ඒ අප්‍රමාණ පැතුම ඇත.

"කොහෙද බලන් ඉන්නේ."

ඒ හඬ ඇසෙද්දීම දේවක ගැස්සී බැලුවේය. දේවක සීගිරි එකේ දොරකඩට වී කා පාක් එකට එහායින් වූ ප්‍රධාන මාර්ගය දෙසම බලාගෙන උන්නේය. භාවනා ටික වෙලාවක සිට එදෙස බලාගෙන උන්නාය. ඇය ආවේ ඉන් පසුය. 'කවුරුහරි එනකල් බලාගෙන ඉන්නවා වගේනේ' ඇයගේ සිත කීවේය.

"නෑ මිස් මේ මම"

"කවුරුහරි අද එනවා කිව්වද?"

ඇය ඇසුවාය. 'කවුද දන්නේ පරණ කෙල්ලෙක්ට එහෙම එන්න කියලද කියලා' ඇයට එහෙමත් සිතෙයි. කොල්ලෝ ගැන විශ්වාස කරන්න අමාරුය.

"කියන්න කමක් නෑ. අපිට කියන්න බැරි කෙනෙක් වෙන්න ඇති එන්නේ."

භාවනා හදිස්සියෙන් මෙන් කීවාය. කෙල්ලට ඇත්තටම හදිස්සියය. ඒ එන්නේ කවුද කියා දැනගන්නටය.

"ඔය කිව්වේ මිස්. මම මේ බලාගෙන හිටියේ කවුරුවත් එනකල් නෙමේ මිස්."

"එහෙනම්."

"මේ ඉස්සරහ මේන් රෝඩ් එකෙන් යන සෙනඟ දිහා බලන්න මිස්."

භාවනා ටික වෙලාවක් බලාගෙන

උන්නාය. ගෑණු මිනිස්සු එක හැල්මේ යති.

"ඔව් කට්ටිය යනවා. ඇයි. මොකක්ද විශේෂත්වය."

"සාමාන්‍යයෙන් මිස් විනාඩියකට අඩුම ගානේ දෙසීයක්වත් යනවා."

ඇය යළිත් ගණන් කරම බැලුවාය.

"දෙසිය එකොළහක් ගියා තමයි."

දේවක හිස වැනුවේය.

"ඒ යන අයගෙන් කීදෙනෙක් මේ සීගිරි එක දිහා බලනවද කියලා බලන්න මිස්."

ඇය ඊළඟ විනාඩියද බලාගෙන උන්නාය. කෙනෙක් දෙන්නෙක් යන්තමට මෙන් මේ පැත්ත බලනවා විනා ඕනාකමින් බලන කෙනෙක් නැත.

"එහෙම ස්පෙෂල් කවුරුවත් බලන්නේ නෑනේ දේවක අයියේ."

ඇය කීවාය.

"ඒකම තමා මිස් අපේ පරාජයත්. ඇහැක් මේ පැත්තට හරවගන්න බැරි අපි කොහොමද කකුල් දෙක මේ පැත්තට හරවගන්නේ හිතක් අපේ පැත්තට හරවගන්නේ. නේ."

දේවක කීවේය. ඇය අසරණාව බැලුවාය.

"ඒකනේ."

"අපි මිස් මේ ඇස් අපේ පැත්තට හරවගන්න ඕන. කකුල් මේ පැත්තට හරවන්න ඕන. කන් මේ පැත්තට හරවන්න ඕන. අන්තිමට හිතත් අපේ පැත්තට හරවගන්න ඕන. ඒක තමා චැලේන්ජ් එක. අපි දිනන මාකටින් ප්ලෑන් එක ඒකයි"

ඇය පුදුමයෙන් බලාගෙන උන්නාය.

"ඒකද මෙතන වෙලා බලාගෙන හිතුවේ."

දේවක හිස වැනුවේය. මේ කතාව දෙන්නා පිටුපස සිට රඹුක්වැල්ල මහතාද අසාගෙනය. කොල්ලාව සීගිරි එකට ගන්නට ගත් තීරණය ගැන ඔහුට අද ආඩම්බරය.

"ඔයාට ඒක කරන්න පුළුවන් පුතේ. ඔයා ඒක කරනවා."

රඹුක්වැල්ල මහතා පිටුපස සිට කියද්දී දේවකත් භාවනාත් ගැස්සිණ. 'වෙන දෙයක් නිකමට හරි කිව්වානම් ඉවරයි සීයා පිටිපස්සේ' භාවනා පපුවට අතක් තියාගෙන සිතුවාය.

"සර්"

රඹුක්වැල්ල මහතා හිස

වැනුවේය.

"මගේ ලොකු ආසාවක් තියෙනවා දේවක මේ සීගිරි එක දවසක සම්පූර්ණයෙන්ම කඩලා මෙතන තට්ටු හතරක පහක ලොකු ෂොපින් මෝල් එකක් දාන්න. යට සුපර් මාර්කට් එක උඩ වෙන වෙන සාප්පු. පිටරටවල එහෙමයි."

ඔහු කීවේය.

"පහුගිය දවස්වල මම ඒ හීනේ අයින්කරගෙන උන්නේ හිතෙන්. ඔයා ඇවිත් ඒ හීනේ ආයෙත් පාට කරනවා."

"අපිට ඒක කරන්න පුළුවන් සර්"

දේවක කීවේය. භාවනා අත් බැඳගෙන සිනාසුනාය.

"අර ටී කෝනර් එකේ ප්‍රපෝසල් එක මම කියෙව්වා ඒක ෂෝක්."

රඹුක්වැල්ල මහතා කීවේය. ඔහු ගියේ දේවකගේ පිටට තට්ටුවක්ද දමාය. කොල්ලාට ඒ ඇතිය.

භාවනා ඔහු දෙස බලාගෙන උන්නේ ඊර්ෂියාවකින් නොවේ. වෙනස් ආඩම්බරයකිනි. එහෙත් ඔහුට හොඳක් කියද්දී තමාට ආඩම්බරවෙන්නට හේතුවක් ඇත්තටම නැත.

"මේ. අද ලන්ච් ගෙනාවද?"

භාවනා ඇසුවාය. දේවක හැරී සිනාසුනේය.

"මම අද ලන්ච් ගෙනාවේ නෑ මිස්. දෙකට විතර පොඩ්ඩක් එළියට යන්න තියෙනවා අර පොල් සප්ලයර් ගැන බලන්න. මේ දැනට පොල් ගේන මිනිහා මට අල්ලන්නේ නෑ. වේලිච්ච පොල් කෑලි ගේන්නේ."

ඔහු කියනා කතාව ඇත්තය. සීගිරි එකේ ඇත්තේ පොල් නොවේ. කොප්පරාය.

"අලුත් පොල් තියෙන්න ඕන නේ."

"එතකොට ලස්සනයි මිස්."

"දෙකට ගිහින් කන්න තැනක් නෑනේ. මම මටත් එක්ක අද ලන්ච් ගෙන්නනවා. ගේන්නන්නම් ලන්ච් මෙතන අරලිය එකෙන්. එතන ලන්ච් රසයි."

ද්ේවකගේ පපුවේ පැත්තක් ඇවිලෙයි. 'ඔන්න ඉතින් බලනවා.' ඇය සිතින් කීවාය.

"මිස්ට කරදරයක්නේ."

"දැන් අනිත් අය අපිට මේ සැන්ච්චස් ගෙනත් දෙද්දී ආප්ප අදිද්දී අපි කිව්වද එහෙම."

මේ බැඳීමට නමක් දෙන්නේ

නැත්ද? ඇසිය යුත්තේ එයය.

"ශේනවා හොඳේ. කාලම යන්. අද මම අම්මට කිව්වා මට ලන්ච් එපා කියලා ගෙදර කෑම කන්න අප්පිරියයි."

කොල්ලා සිනාසුනේය.

"ඒ වැඩේ එච්චර හොඳ නෑ"

ඔහු ගත් කටටම කීවේය.

"මං දන්නවා. මං කිව්වේ කෑම ගැන වෙන දෙයක් ගැන නෙමේ."

ඔහු සිනාසුනේය.

"දවසක මිස් මැරිකරපු දවසක මහත්තයත් ඕකම හිතුවොත් ෆැමිලි ලයිෆ් එක අනාථයි. ඒ නිසා අපි සුදෝ අද බිත්තර බුල්සයි දාලා පාන් කමුකෝ කියලා හරි ලව් එකක් දාලා ගෙදරම කන්න දෙන්න."

ඔහු කොහොම කෙනෙක්ද කියා ඒ

වචන ටිකෙන්ම ඇය සිතාගත්තාය.

"මම හොයන්නේ එහෙම මහත්තයෙක් නෙමේ."

ඇය තොල් පට තදකරගෙන කීවාය.

"එහෙනම්."

"අද උයන්න කම්මැලියි කිව්වාම ඔයා ඉන්න සුද්දෝ මම ඔයාට අද රසට උයලා දෙන්නම් කියලා මාව පැන්ට්‍රියේ වාඩිකරවලා එයා උයන්නෝන."

ඔහුගේ සිනාව දිගටම ආවේය.

"එහෙමත් මහත්තයලා ඉන්නවා මිස්. ඉඳි ආප්පත් හදලා කිරි හොදිත් හදලා කූනිස්සොත් තෙල් දාලා පොල් මැල්ලුමකුත් හදලා අන්තිමට ළඟට කරගෙන කවන මහත්තයලත් ඉන්නවා."

ඔහු කියාගෙන ගියේය. දැන් කෙල්ලගේ බඩ පපුව දාගෙන යයි.

"මොකක්ද ඒ කියපු මෙනු එක අයියේ."

භාවනා ඇසුවාය.

"ඉඳි ආප්පයි කිරි හොදියි කුනිස්සෝ බැඳුමයි පොල් මැල්ලුමයි. මං ආසම කෑම."

දේවක කීවේය.

"අද රෑට කන්න ආස දෙයක් අම්මා ඇහුවා ඒක කියන්නෝන."

ඇය කීවාය.

"දැන් කොහෙද ඔය මහත්තයලා ඉන්නේ."

"හොයන එක ලේසි නෑ මිස්."

ඇය බැලුවාය. දෑස් හමුවිය. භාවනාගේ පපුවට මොකක්ද දැනෙයි.

"මහත්තයා ඉතින් එහෙමත් හදලා පස්සේ තව කවනවත් එක්කනම් ඉතින් එයා කියන ඕන දෙයක් කරන්නත් පුළුවන් හැබැයි"

භාවනා ප්‍රධාන මාවත දෙස බලාගෙනය. දේවකට සිනා ආවේය.

"එහෙමම අමාරු දෙයක් කියන දෙයක් නැතිවෙයි ඉතින්. ඔය ඉතින් ළඟින් ඉඳගෙන මේ."

"ඇති"

දේවක කියන්නට ගිය දේ නවතා භාවනා කීවාය. භාවනා තොල් පට තදකරගෙන ඔහුට පෑනෙන් ඇණ එතනින් යන්නට ගියාය. මඟදීත් ඇයට සිනාව නතරකරගන්නට නොහැකි විය. මේ රසබර බව ඔහු එන්නට පෙර හදවතේ තිබුනේද නැත.

භාවනා කාමරයට ආවේ සිනාබරවමය. නේත්‍රා ඒ සිනහව ලස්සනට දැක්කාය. මේ දවස්වල කෙල්ලගේ මුහුණට මොකක්ද රෝස ලයිට් එකක් වැටී ඇත. මූණ ඒ තරමටම පාටය. තමාට ඉන්නේ කොච්චර ලස්සන නංගී කෙනෙක්ද කියා ඇය සිතුවාය. එහෙත් මේ හිනාවේ රහසක් ඇත. සීගිරි එකේ වෙන සමහර දේවල් ගැන ඉවක් නේත්‍රාට ඇත.

"හිනාව මහරගම ඉඳලා කතරගමට යනවනේ."

නේත්‍රා ඇසුවාය. භාවනා ඇවිත් ඉඳගත්තේ ඒ සිනහවත් සමඟම වාගේය.

"මේ පිස්සෙක් පිස්සු කියවනවා අනේ."

ඇය කීවාය. නේත්‍රා ලියමින් උන් පෑන දෙකොණින් අල්ලාගෙන නැගණිය දෙස බැලුවාය. ඇයගේ දෑස් බැබලෙන අයුරු බලා ඉන්නට ආසය.

"කවුද ඉතින් පිස්සා."

නේත්‍රා ඇසුවාය.

"ඔය ඉන්නේ අලුතෙන් ආව පිස්සෙක්. දේවක කියලා."

කෙල්ලෝ සමහරවිට කොල්ලන්ට බණින්නේ දයාබරවය. මේකත් එහෙම කතාවකි.

"ඒකා පිස්සෙක් නෙමේ. හැබැයි ඔහොම ගිහින් පිස්සෙක් වෙනවා."

නේත්‍රාගේ කතාවට භාවනා රැව් වූවාය.

"ඇති දැන්. ලන්ච් ඕන චිකන්ද ෆිෂ්ද එග්ද?"

භාවනා ඇසුවාය. නේත්‍රා සිනාසුනාය. ඇයටද අද දවල් කෑම නැත.

"අරලිය එකෙන්ද සුදු ගේන්නේ."

"ම්."

"මට වෙජිටබල් එකක් පැටියෝ."

නේත්‍රා එහෙමය.

"අන්නේ. මටනම් මේ චිකන් කෑල්ලක් ඕනමයිනේ."

පොඩි කාලේ සිට කෙල්ලට එහෙමය. චිකන් නැත්නම් සොසේජස් කරලක් හෝ බැදලා ඕනමය. මේ ඉන්නේ පවුලේ බඩ පිස්සීය.

භාවනා ඉන්ටර්කොම් එකෙන් කතාකර සිරිදාසව ගෙන්වා ගත්තේය.

"පොඩි බේබි."

භාවනා ඇගේ පර්ස් එකෙන් සල්ලි

ගත්තාය.

"මෙතන අරලිය එකෙන් චිකන් කෑම දෙකයි වෙජිටබල් කෑම එකයි ගේන්න සිරිදාස අන්කල්. බඩී කෝක් තුනකුත් ගේන්න හොඳද?"

නේත්‍රා බැලුවාය.

"චිකන් දෙකක් බබා කාටද?"

භාවනාගේ හොරය අසුවිය. එහෙම කියා ඇයට බියක් නැත. මේ අක්කලාගෙන් හංඟන්න දෙයක් මේ නංගීට නැත. ඇත්තටම නැත.

"ආ බබා."

නේත්‍රා යළිත් ඇසුවාය. අනෙක් චිකන් බත් එක කාටද කියා ඇය හොඳින්ම දනියි.

"මේ අර පිස්සට අනේ."

භාවනා දෙනෙත් සඟවමින් කීවාය. නේත්‍රාගේ මුව මත වූයේ

පැහැදිලි සිනාවකි.

"පව් තමයි. කොල්ලත් අද කෑම ගෙනත් නැද්ද?"

"ම්. අර මටත් ඊයේ මේ සැන්විචස් එහෙම ගෙනාවනේ අක්කේ."

කෙල්ල කතාකරන්නේ ඇස් සඟවාගෙනය. ඇය අහිංසකයි කියා නේත්‍රාට සිතුණි.

"ම්."

රෑප දෙකක් එක ළඟ තබා නේත්‍රා බැලුවාය. මොකක්ද සැනසීමක් ඇයට දැනුණි. ඒ සැනසීම ලේසියෙන් එන දෙයක් නොවේ. දවසක තමාට වූ දේ නංගිලා දෙන්නාගේ ජීවිතයට වෙනවා දකින්නට නේත්‍රා කැමති නැත. 'ලොකු නංගිනම් කොල්ලෝ ගැන හොඳට දන්නවා. මේකි

එහෙම නෑ. ආදරේ කරන පළවෙනි කොල්ලම හස්බන්ඩ් වෙනවානම් හොඳයි. දුක් විඳින්න මේකිට බෑ.'

"ඇයි අක්කේ."

"නෑ සුදූ මොනවත් නෑ."

අක්කා එහෙම කිව්වාට මොනවා හෝ සිතුව බව භාවනා දනී.

'හිතපුදෙන් අනේ'

# 18

තාරකා භාවනාට කතාකළේ ඩුබායි හී සිටය. අද ඇයගේ ප්‍රථම ගුවන් ගමනය. තාරකා වැටුනේ කොළඹ ඩුබායි අතර වූ එමිරේට්ස් ගුවන් සේවයට අයත් යානයටය. අද උදෑසන දහයයි පහට කොළඹ කටුනායකින් ඇය ප්‍රථම ගුවන් ගමනට යන්නට පෙර භාවනා ඇයට කතාකර සුබ පැතුවාය.

"පරිස්සමින් සුදූ"

භාවනා කීවාය.

"ම්. මම ඩුබායිවලින් බැහැලා උඹට ගන්නම් පැටියෝ හොඳද?"

ඇය කීවාය. භාවනාට අද දෙතුන් වතාවක්ම තාරකාව සිහිවිය. දවසක ඇය ගුවන් සේවිකාවක් ලෙස සේවය කරන යානයක යන්නට භාවනා සිහින දැක්කාය.

තාරකා අද ඩුබායි ජත්‍යන්තර ගුවන් තොටුපළෙන් බැස්සේ පහකුත් ගණනකටය. යළිත් ඇය මේ යානයට එකතුවෙන්නේ හෙටය. එතෙක් ඇය ඉන්නේ ඩුබායි හෝටලයකය. මේවා තාරකාට හොඳට පුරුදුය. ඇයගේ සිහින වලට කවදාවත් මිලින්ද බාධාකරන්නට ගියේ නැත. ඒ නිසාම තාරකා කවදාවත් තමාගේ අම්මාටත්

තාත්තාටත් දුකක් වෙන දෙයක් ගෙදරට ආරංචිවෙන්නට දුන්නේද නැත.

තාරකා කෙල්ලට ගත්තේ ඩුබායි එයාපෝට් එකේ සිටය. ඒ වෙලාවේ භාවනා උන්නේ දේවක සමඟ අලුතෙන් අලුත්වෙන සීගිරි හී ෆ්ලෝ ප්ලෑන් එක හදමිනි. හැම රාක්කයක්ම තැබිය යුතු තැන් වේලාසන සටහන් කර තැබිය යුතුය.

තාරකාගේ ඇමතුම ආවේ එවිටය.

"කෝල් එකක් මිස්ට."

දුරකථනය ඇයට අරගෙන දුන්නේ දේවකය. මෙහෙම ඔහු ළඟින් ඉඳගෙන වැඩ කරද්දී හිත තියෙන්නේ වෙන ආකාසයකය. සිහියත් ඇත්තේම නැත.

"අමුතු නම්බර් එකක් වගේ."

"පිටරට ඉඳලා ගන්නේ මිස්."

"අනේ මගේ පොඩි අක්කා වෙන්න ඇති."

භාවනා සැනෙකින් ඇමතුම සම්බන්ධකරගත්තා.

"හෙලෝ."

"සුද්දි මං."

භාවනා පුටුවේ පිටුපසට බරවූවාය. දේවක ටිකකට ඇය දෙස බැලුවාය. එහෙම සැහැල්ලුවෙන් සිනාසී සිටිද්දි ඇයගෙන් පෙනෙනේනේ වෙනස් ලස්සනකි. අද දවල් ඇයත් සමඟ ලන්ච් ගනිද්දීත් දේවකගේ පපුව සිරවිය. කරවිල සම්බෝල කන්නට ආසයි කියූ පසු ඇය ඇයගේ බත් එකේ තිබූ කරවිල

සම්බෝල ටිකක්වත් කෑවේ නැත.

"මේක දේවක අයියට."

කෙල්ල කරවිල සම්බෝල ටික දේවකගේ බත් එකට දැම්මාය. දේවක සියල්ල දැක්කේය. 'ඔයා පුදුම කෙනෙක්' ඔහුට සිතුණේ එපමණය.

"සුදූ ඔයා ඩුබායිද?"

"ඔව් පැටියෝ. මේ ඩුබායි ඉන්ටර්නැෂන් එයාපෝට් එකේ ඉඳලා ගන්නේ. සෝ ස්වීට් සුදූ. අනේ උඹ ඉන්න තිබුනේ."

ලස්සන එයාපෝට් එකේ ඇවිදගෙන එද්දි ඇත්තටම තාරකාට සිහිවූයේ ඇයගේ පොඩි නංගීවය. කෙල්ල මේ වාගේ තැන්වල ඇවිදින්නට ආසය.

"උඹව කොහොම හරි මම එක්කගෙන එන්නම්. මී."

"හා. ඉතින් කොහොමද පළවෙනි ෆ්ලයිට් එක."

"ෂෝක් බං. කිසිම අවුලක් නෑ. හිතුවටත් වඩා හොඳට මම කළා. කැප්ටන් මට විෂුත් කළා"

"එහෙනම් ඇති. දැන්."

"දැන් ඩුබායි මැරියට් එකට යනවා අපේ හොටෙල් එකට. ආයේ හෙට මේ වෙලාවට එනවා මේ ෆ්ලයිට් එකටම"

"හෙටද එන්නේ?"

"මී උඹට මොනවද ගේන්න ඕන."

තාරකා ඇසුවාය. ඇය නෙත් කොණකින් දේවක දෙස බැලුවාය.

"ඔයාට හිතෙන දෙයක්. දැන්

හැමදාම යනවනේ. හිමිහිට ගමු අනේ”

“එහෙම බෑ .ඔක්කොටම මොනවා හරි ගන්න ඉන්නේ මගේ පළවෙනි ඔන්බෝඩ් ගමනනේ. කියපන්කෝ.”

“මී අර වයිට් රින්ග් එකක් සුදූ. චූටි ස්ටෝන් එකක් තියෙන.”

භාවනා කියද්දී දේවක එවැනි කුඩා සුදු ගලක් ඇල්ලූ මුදුවක් සිහියට නඟාගත්තේය. පසුව ඔහු මේසය මත වැටී තිබූ ඇයගේ සුරත දෙස බැලුවාය. ඒ අතට එහෙම මුදුවක් ලස්සනය.

“මං ගේන්නම්.”

“මී පරිස්සමින් හොඳේ.”

“බායි සුද්දියේ. ලව් යූ සෝ මච්.”

“මී ටූ.”

භාවනා දුරකථනය තැබුවේ සිනාබරවය.

"එයා ඩුබායි එයාපෝට් එකේ. පොඩි අක්කා මං කිව්වේ එමිරේට්ස් ෆ්ලයිට් එකේ අද පළවෙනි දවස ඔන්බෝඩ්."

භාවනා කීවාය.

"දවසක අක්කා නංගිවත් එක්කගෙන යයි."

"මි කිව්වා. යන්න ආසයි"

'කතාකළොත් එනවද' කියා අසන්නට හිතෙනා තරම්ය. තමාට සිතෙන දේවල් පුදුමය. භාවනා සිතට තරවටු කරගත්තාය. 'පිස්සු කියලා මෙහෙමම පිස්සු හිතෙන්නේ ඇයි අනේ'

"මාත් දවසක යන්න ඉන්නේ.

එහේ සුපර් මාර්කට් එකක් එහෙම බලන්න ආසයි.”

භාවනා නෙත් අගකින් බැලුවාය.

“මී. දවසක යමු ඉතින්.”

කෙල්ල කිව්වේ එපමණකි. පසුව දෙදෙනාම කතානොකර කරගෙන ආ වැඩේ කරගෙන ගියෝය. භාවනාගේ මුව මත තුනී හසරැල්ලක් විය. ඒ ඇයිදැයි ඔහු සිතුවේ නැත. ඔහුගේද දෙතොලතට එවැනිම සිනාවක් විය.

# 19

සීගිරි එක ලබන සඳුදා සිට වසා ඇත. විවෘතව කර තිබෙන අවසාන දිනය වන්නේ මේ ඉරිදාය. ඉරිදා රාත්‍රී දහයෙන් පසුව සීගිරි එක යළිත් විවෘතකරන්නේ මාස එකහමාරකිනි. ඒ කාලය දේවකට අභියෝගකි. සති හයක් කියන්නේ දින හතළිස් දෙකකි. දින හතළිස් දෙකකින් සුපර් මාර්කට් එකක සම්පූර්ණයෙන්ම පෙරලා අලුත් එකක් හදනවා කියන්නේ ලේසි

වැඩක් නොවේ. එහෙත් දේවක ඒ අභියෝගයට මුහුණ දෙන්නට දැන් සූදානම්ය.

ඒ දවස් ටිකේ ගෙදර යන්නට වෙන්නේ රෑ එකට දෙකට බව දේවක දැනගෙන උන්නේය. ඇතැම් දවසක සම්පූර්ණ රාත්‍රියම වැඩකරන්නට සිදුවෙයි. මේ දවස්වල වැස්ස නැති එක වාසනාවක් කියා ඔහුට සිතුණි. මහ වැසි වැටෙද්දී කිසිවක් කරගන්නට නොහැක. සීගිරි එක ඇතුලේ පමණක් නොව එළියේද වෙනස්කම් රැසක් සිදුකරන්නට නියමිතය.

භාවනා උන්නේ ඔහුත් සමඟ රෑ වෙනතුරු සීගිරි එකේ ඉන්නටය. සාමාන්‍ය ඇඳුමක් ඇඳගෙන ඔහුත් සමඟ රාත්‍රිය පුරා වැඩකරන්නට

ඇයට ආසය. 'අපට ආප්ප ටිකක් එහෙම ගෙනත් කන්න පුළුවන්. කෝපි ටිකක් හදාගෙන' ඇය සිහින දැක්කාය. සීගිරි එකේ ගෙවුණු ජීවිතය කම්මැලිය. කිසිම වෙනසක් වූයේ නැත. එහෙත් මේ උදාවෙන්නේ සුන්දර දවස් කිහිපයකි. සීගිරි එක අලුත් කිරීමේ සියළු වගකීම් ඇත්තේ දේවකගේ හිස මතය. එහෙම ඔහුටම පමණක් දුක් විඳින්නට දෙන්නට ඇයට අමාරුය. ඇරත් ඔහුට මේ දේ කරන්නට පුළුවන් කියා අභියෝගය කළේද තමාය. 'ඔයාට ඒක කරන්න පුළුවන්. හැම විනාඩියකම ඔයා ළඟ මම ඉන්නවා. ඔයාට වැටෙන්න දෙන්නේ නෑ මම' එහෙම හිතෙන්නේ ඇයිද කියා ඇයම දන්නේ නැත.

දේවක මේ දවස්වල පැය දෙකකට වඩා නිදාගන්නේ නැත.

එහෙම නිදාගන්නට ගියද ඔහුට නින්දක් යන්නේද නැත. පාන්දර තුනට හතරට පහට නැඟිට කොල්ලා වැඩය. ඔහු දැන් අලුතින් හදන සීගිරි එක මවාගෙන අවසානය. සේවකයන්ගේ යුනිෆෝම් එකේ සිට රාක්කයෙන් රාක්කය පවා දේවක මවාගෙන අවසානය. දැන් ඇත්තේ ඒ හිතින් මවාගත් දේ ඇත්තට මවන්නටය.

"මේ දවස්වල නින්දක් නෑනේ පුංචි මහත්තයෝ."

ජීවන් කිවේ දුකිනි. පොඩි කොල්ලාව තමා දරාගන්නට බැරි වගකීම් ගොඩකට දැම්මාද කියා ජීවන් සිතුවේය. එහෙත් කොල්ලාව සිගිරි එකට යැව්වේ මේ තරම් වගකීමක් සීගිරි එක කොල්ලාට

දෙයි කියලා සිතාගෙන නොවේ. ඒ විශ්වාසය දිනාගත්තේ කොල්ලාය.

"ජීවිතේ එක කාලයක් එනවා අප්පච්චි. එහෙම නින්ද යන්නේ නෑ."

ජීවන් සිනාසුනේය. කොල්ලෙක් එහෙම හිතනවානම් ඒ කොල්ලා ඉක්මනින්ම ජීවිතය ජයගන්නා බව ජීවන් දනී. තමා හැදුවේ ඇල්බීසියා ගහක් නොව පොඩි බුරුත ගහක් බව දැන් ජීවන් දනී.

"ම්. දැන් මේ දවස් ටික ඇතිවෙයිද පුංචි මහත්තයෝ ඔය හාස්කම කරන්න."

දේවක සිනාසුනේය.

"ඒක පොඩි චැලේන්ජ් එකක් තමා අප්පච්චි ලේසිවෙන්නේ නෑ. මට ටිකක් රෑ වෙනකල් වැඩකරන්න වෙනවා. එයාලා මාව ඕනවටත් වඩා

විශ්වාස කරලා තියෙන්නේ. මට බෑ ඒ විශ්වාසේ කඩන්න."

අමාරුම දේ ඒකය. විශ්වාසයක් රකින එකය.

"ඔයාට පුළුවන්. මම ලබන සතියේ නුවර යනවා පොඩි වැඩකට. ගියාම මම මාළිගාවට බාරයකුත් වෙන්නම්කෝ."

දේවක හිස වැනුවේය. ජීවන් කොල්ලාට කෝපි එකක්ද හදාගෙන ආවේය.

"මේ එළියේ තා පාක් එකේ ප්ලෑන් එකද?"

"ඔව් අප්පච්චි මේ තියෙන්නේ ෆුඩ් අවුට්ලට් එක මෙතන බාබකියු කෝනර් එක. මෙතන මේ පොඩි අයිස් ක්‍රීම් පාලර් එකක්."

ජීවන් හිස වැනුවේය.

"කා පාක් එක හදද්දී පුතේ කිසිම වෙලාවක මේ එක ගහක්වත් කපන්න එපා. ඒ ගස්වල තියෙනවා මොකක්ද දෙයක්. දේශීය බවක් ගේනවා."

ජීවන් කීවේය. දේවක හිස වැනුවේය.

"මාත් මේ පිනිමාර ගස් දෙකට හරි ආසයි අප්පච්චි. ඒකේ අත්තක්වත් කපන්නේ නෑ. ඒක යට තමා මම අවුරුදු කාලෙට වළං කඩයක් දාන්න යන්නේ."

ජීවන් එක දෙයක් තේරුම් ගත්තේය. දවසක රඹුක්වැල්ලලාව කොල්ලා පුදුම කරනු ඇත. මේකා කොහෙන් ආව කොල්ලෙක්ද කියා හොයන්නේ එවිටය.

වෙලාව රෑ එකොළහය. කෝපි එකක් බිව්වද හිතට උණුසුමක් නැත.

ද්වෙක දුරකථනය දෙස බැලුවේය. නැත. එහි කිසිම හැල හොල්මනක් නැත. කෙටි පණිවිඩයක්වත් නැත. කතාකරනවානම් කතාකළ යුත්තේ ඇයය. තමාට එහෙමම ඇයට කතාකරන්නට නොහැක.

ද්වෙක කෝපි එකත් ගෙන ගොස් එළිමහන පෙනෙන පඩියේ ඉඳගත්තේය. අතුරුගිරිය වෙල්යාය සිපගෙන එන සුළඟ අද සීතලය. හිතට පාළුය. සාංකාවය. ඒත් ඇයව නොදැක ගෙවුනේ පැයකිහිපයක් පමණි. අද භාවනා සීගිරි එකෙන් ගියේ හවස හතත් පසුවූ පසුය. වෙනදාට ඇය මේතරම් හවස්වෙනතුරු ඉන්නේ නැත. ඉන්න කම්මැලියි. කෙල්ල පහ වෙද්දී ගෙදරය.

ගෙදර යන වෙලාවේත් භාවනා ඔහු ළඟට පැමිණ ගියාය. දේවක උන්නේ ලයිට් සිස්ටම් එක හදන ඉලෙක්ට්‍රීෂියන් සමඟ කතාකරමිනි.

"සුදු ලයිට් එකම නෙමේ මිස් මම හිතුවේ දාන්න. පොඩි කහ පාටක් එක්ක මිශ්‍ර වෙච්ච ලයිට් එකක්. වෝම් ලයිට් කියන්නේ."

කෙල්ල දන්නා වෝම් ලයිට් එකක් නැත. පපුවනම් මේ දවස්වල වෝම් බව ඇය දනී.

"මං යනවා එහෙනම් දේවක අයියේ"

දේවකගේ පපුව ඒ වෙලාවේ පිච්චීගෙන ගියේය.

"අද රෑත් වුණා නේද මිස්?"

"ටිකක්"

"බුදු සරණයි මිස්ට"

ඇයද තොල් පිට පෙරළුවාය. සුපර් මාර්කට් එකේ ස්ටාෆ් එක බලාගෙන ඉන්න නිසා මිසක භාවනා හිතාගෙන උන්නේ යළිත් වතාවක් හැරී ඔහු දෙස බලන්නටය. එහෙත් එය බැරිවිය.

භාවනා කාමරයට ආවේ දැන් ටිකකට කලිනි. අද අම්මාත් තාත්තාත් අක්කාත් සමඟ රෑ කෑම කන්නට ඇයද ඉඳගත්තාය. රඹුක්වැල්ල මහතාද කෑම මේසයට ආවේය. කතාවට මාතෘකා වූයේ තාරකාගේ පළවෙනි ගුවන් ගමනය.

"මැලේසියන් ප්ලේන් එකකුත් වැටිලා. මටනම් පුදුම බයයි"

ඉඳුනිල් කීවාය.

"ඒවා මේ බාල ෆලයිට් ඉඳුනිල්. එමිරේට්ස්ලා ළඟ තියෙන්නේ අලුත්ම

ෆ්ලයිට්ස්."

මිලින්ද කීවේය. ඔහු හැමදාම සිතුවේ සුබවාදීවය.

"ඒක ඇත්ත. මේ පවුලේ කාටවත් කරදරයක් වෙන්නේ නෑ. කෙල්ල පරිස්සමින් එයි."

රඹුක්වැල්ල මහතාද කීවේය.

"අක්කා ඩුබායි එයාපෝට් එකේ ඉඳලා ගත්තා. එයා ෆුල් හැපී එකේ ඉන්නේ. හැමෝටම හෙට ප්‍රසන්ට් ගන්නවලු. එයාගේ පළවෙනි ඔන්බෝඩ් ගමන සිහිවෙන්න කියලා"

භාවනා කීවාය.

"එයාගෙත් ආසවනේ"

මිලින්ද කීවේ ආදරයෙනි.

"අපේ ආසාවල් බලන්න තමා කවුරුවත් නැත්තේ මෙතන."

භාවනා කීවාය. කෙල්ල කිව්වේ

ඊරිසියාවට නොවේ. තාම පොඩි කෙල්ල නිසාය. කෙල්ලගේ කතාවට රඹුක්වැල්ල මහතාත් මිලින්දත් පමණක් නොව නේත්‍රාද සිනාසුනාය. 'ඇහුවානම් කියයි ඒකී ආස මොකටද කියලා' නේත්‍රා සිතින් කීවාය. අක්කාගේ මුහුණ මත වූ අලුත් හැඟීම් දැක භාවනා රැව්වාය.

"ඉතින් ඔයත් කියන එකනේ තියෙන්නේ. අක්කා එයා හොස්ටස් කෙනෙක් වෙන්න ආසාවෙන් උන්නා මම ඉඩදුන්නා. හැමදේම දුන්නා. ගිය මාසෙත් මගෙන් හතළිස් දාහක් ඉල්ලගෙන ගියේ. ඔයාට කවුද වෙන්න ඕන කොහෙද යන්න ඕන කියන්න. නොකියා ඉතින් මට දිවැස් නෑනේ සුද්දි"

මිලින්ද කීවේය.

"කොහේ කියලා යන්නද ඉතින්"

ඇත්ත කතාව ඒකය. යන්න තැනක් නැත. එක්කාගෙන යන්න කෙනෙක් නැත.

"ම්. ඉතින් යන්න තැනක් හදාගන්න එපැයි."

භාවනා කතාකළේ නැත.

"පව්. කෙල්ල හරියට මහන්සිවෙනවා සීගිරි එකට. මහන්සිත් ඇති."

රඹුක්වැල්ල කීවේය. මෙච්චර මහන්සිවෙන්න ගත්තේ මේ ළඟක සිටය.

"එහෙම මහන්සියක් නෑ සීයා."

භාවනා කීවාය. මහන්සියක් නැත්තේ මේ ළඟක සිටය. ඇය උඩට ආවේ මේ වාගේ විසිරී ගිය සිතිවිලි වලිනි. ඇවිල්ලාත් ඇය

ඇඟ සෝදාගෙන විත් පැය බාගයක් පමණ ඇඳේ පෙරළී පෙරළී සිටියාය. තාරකාට ඇමතුමක් ගත්තාය. ඇය උන්නේ හෝටලයේය. 'මම චයිනිස් කෙල්ලෙක් එක්ක බං රූම් එකේ ඉන්නේ. මේකී ෂෝක් කෙල්ල' තාරකා කීවාය.

පසුවත් සෑහෙන වෙලාවක් ඔහේ බලාගෙන උන්නාය.

ඇය දුරකථනය ගත්තේ අවසානයටය.

"අද කතාකළේ නැත්තේ ඇයි කියලත් හිතනවා ඇති. එහෙමත් කරන්න ඕන. එයාට බැරිද ගන්න මෙතන"

භාවනා සිතුවාය. තමා ඔහුට ගන්නේ ඇයි? ඔහු ගත යුතුයි කියා තමා සිතන්නේ ඇයි? එහෙම ගන්නම

කියා සිතෙන සිතිවිල්ලේ කෙළවර කුමක්ද?

අන්තිමට ගත්තේ දේවකය. භාවනාගේ පපුව කැඩිණ. 'මොකක්ද මේ වෙන්නේ දේවක අයියේ.' ඇය සිතින් ඇසුවාය. 'එක්කෝ මම හිතන දේවල් තරංගවෙලා ඔයාට යනවා' ඇය සිතුවාය.

"මම ගන්න ගියේ මේ"

භාවනා සමාව ඉල්ලන ස්වරයෙන් කීවාය. එහෙම කියවුනේ ඇයි? තමා ගන්න ගියා කියලා කියවුනේ ඇයි.?

"නෑ මිස් මේ මම හිතුවා අද ආයෙත් මේ උණ ඇවිත් කියලා."

ඔහු ගොතගසමින් කීවේය. කෙල්ලගේ දෑස් තෙත්විය.

"ලාවට වගේ සීතලක් එනවා."

"ඒකනේ. දවලුත් චුට්ටක් රස්නේ

වගේ තිබ්බනේ නේද?"

ඇය තෙත දෑස් පොරවනයෙන් පිසදාගත්තාය.

"පහළ උන්නේ. අම්මයි තාත්තයි අක්කයි එක්ක කෑම කන ගමන්. අද මේ පොඩි අක්කා රටනේ. ඉතින් අපිට පාළුයි. ඒ ගැන කතාකළා"

භාවනා විස්තර කළාය. එහෙම විස්තර කරන්නේ ඇයි? හැමදේකටම හිතට කරුණු දැක්විය යුතුමද?

"මිස් කෑවද?"

"ම්. ඉඳි ආප්ප. අර කිව්වේ කිරි හොදියි කූනිස්සෝ තෙල්දාලයි පොල් මැල්ලුණුයි"

"ඒකද හැදුවේ."

"ම් හරිම රසයි. තාත්තත් රසයි කිය කිය කෑවා. මට කනකොට මතක් වුණා."

මතක් වුයේ කාවද කියලා ඇය කියන්නේ නැත. එහෙත් හද කකියයි.

"මිස්."

ඔහු මොනවද කියන්න හැදුවේය. කෙල්ල පපුවට අතක් තියාගත්තාය. 'බය හිතෙන දෙයක්නම් දැන්මම කියන්න එපා දේවකයියේ. දැනටමත් මගේ හාට් රේට් එක ගොඩක් වැඩිවෙලා තියෙන්නේ' භාවනා සිතින් කීවාය.

"මි. කියන්ඩ"

ඇය අමාරුවෙන් මෙන් කීවාය.

"හෙට උදේට මේ කිරිබත් හදනවා අපි. මිස්ටත් එක්ක ගේන්නද? ඇඹුල් තියල් එක්ක."

ඔහු කීවේ කියන්නට ගිය දේමද කියා භාවනා සිතුවාය. 'ඇයි වෙන දෙයක් කියයි කියලද හිතාගෙන

උන්නේ. මටයි පිස්සු'

"හා. කැකුළු කිරිබත්ද?"

"ඔව් මිස් හෙට අප්පච්චිගේ බර්ත් ඩේ එක. ඒකයි. පාන්දර නැඟිටලා කිරිබත් පාරක් හදන්න යන්නේ මායි හේරත් මාමයි."

දේවක කීවේය. කොල්ලා අප්පච්චීගේ උපන් දිනයට කිරිබත් හදන්නට ගත්තේ අට වසරේ සිටය. ඒක තමාගේ යුතුකම කියා දේවක සිතුවේය.

"අප්පච්චිගේ උපන් දිනේට හැමදාම කිරිබත් හදනවද ඉතින්."

"මට උයන්න පුළුවන් කාලේ ඉඳලා මම හදනවා මිස්. එයාට ඉතින් ඉන්නේ මම විතරනේ."

'ආදරය ගැන අපි මොනවද දන්නේ. අම්මගේ තාත්තගේ උපන්

දිනේට අපි කිරිබත් කටක් හදලා දීලා තියෙනවද? දූලා තුන්දෙනක් හැදුවා තේ එකක් හදලා දුන්න කාලයක් මතක නෑ' භාවනා සිතුවාය.

"පව්. හොඳ පුතෙක් ඉතින්."

ඇය මුව පුරා කීවාය.

"කේක් නෑ ඉතින්"

"අම්මා නැතිවෙච්ච දවසේ ඉඳලා එයා කේක් කන්නේ නෑ. අම්මා හරි ආසලු චොකලට් කේක් කන්න. චොකලට් අයිසින් දාපු. ඉතින් කේක් කනකොට අප්පච්චිට අම්මව මතක් වෙනවලු."

ඇත්ත කතාවත් එයයි. ජීවන් ඔෆිස් එකේදී කාගේ හෝ උපන් දිනයකට කේක් ගෙන ආවද කන්නේ නැත. එය ඔතාගෙන කොල්ලාට අරගෙන එයි. ආදර මතක හද

පාරන්ගේ ඒ දැවිල්ලද සමඟය.

“අම්මට අප්පච්චි ගොඩක් ආදරේ ඇති.”

“එයාලා දෙන්නා හරි ආදරෙන් ඉඳලා තියෙන්නේ මිස්. මම පච්කරලනේ එයාව නැතිවුනේ. ඒකයි ඉතින්.”

දේවක එහෙම කියද්දී භාවනාට ඔහු ගැන දුකය. ‘අපිට අම්මගේ අගේ නෑ’ ඇයට හිතෙන එකම දේ එච්චරය. මේ රෑ ටිකක් පහළට ගොස් ඒ දෙන්නාට වැඳ එන්නට භාවනාට සිතෙයි.

“මම කිරිබත් අරන් එන්නම්. තව දෙයක්.”

“ම්.”

“අර පේරාදෙණියේ වෙද මහත්තයා ගැනත් ආරංචියක් ආවා.

ඒකත් හෙට නේත්‍රා මිස් එක්ක කතාකරන්න ඕන. එහෙම වුනොත් අපිට මේ වීක්එන්ඩ් එකේ යන්න වෙනවා මිස්."

ඔහු පොරොන්දු කඩන්නේ නැත.

"ඒක ලොකු දෙයක් දේවක අයියේ. මේ වැඩ අස්සේ අපිට යන්න පුළුවන් වෙයිද?"

"රෑ ගිහින් උදෙන්ම වෙද මහත්තයා හම්බවෙලා උදේ දහයට විතර කැන්ඩිවලින් එමු මිස්. එතකොට ගාණක් නෑ."

ඒ වාගේ ගමනක් යන්නටත් ආසය.

"මං දැන්මම අක්කට කියන්නම්. එයාට ආස හිතෙයි."

අමාරුම දේ මෙහෙම කතාකර දුරකථනය තියන එකය. 'එහෙම

කියලා එයා එක්ක පාන්දර වෙනකල් කතාකරකර ඉන්නයෑ හොඳට හිටී.'

"මං තියන්නම් දේවක අයියේ."

වචන ආවේ උගුරෙන් මෙන්ය. මේ ගොරෝද බව එන්නේ ඇයිදැයි ඇයම දන්නේ නැත.

"එහෙනම් මිස් උදේට කාලා එන්න එපා හොඳේ"

"හා. බුදු සරණයි."

"බුදු සරණයි."

දුරකථනය තබා පැය කාලක් පමණ යනතුරු භාවනා දෑස් පියාගෙ නම උන්නාය. මොකක්ද මත්වෙන දෙයක් බිව්වාක් මෙන්ය. දවසක් එහෙම වූවා ඇයට මතකය. ඒ පොඩි අක්කා සමඟ වයිට් වයින් වීදුරු දෙකක් බිව්ව දවසේය. බිව්වේ ඇයගේ යෙහෙළියකගේ උපන් දින

පාටියකට ගිය දවසේය.

"මේකිට පිස්සුනේ. වයින් ග්ලාස් දෙකක් බිව්වා කියලා ඩෝප් වෙන්නේ."

තාරකා එදා කීවාය. භාවනා ආවේ ඇයගේ ඔඩොක්කුවේ නිදාගෙනය. අදත් ඇවිත් ඇත්තේ එවැන්ම මත් බවකි. ඒත් මේ මත්බවේ මොකක්ද මන්මත් බවක් ඇත.

භාවනා එහෙමම ගියේ නේත්‍රාගේ කාමරයටය. නේත්‍රා උන්නේ ඇඳට වී ඇගේ පරිගණකය උකුලේ තියාගෙනය. බොහෝ විට රෑ එක දෙක වනතුරු ඇය එහිම රැය ගෙවයි. ඒකත් නැත්නම් නින්දක් යන්නේ නැත. ජීවිතය පාළුය.

"මොනවද බලන්නේ."

භාවනා අක්කාව බදාගෙන මෙන්

ඇසුවාය. නේත්‍රා ඇගේ රීඩින් ග්ලාස් දෙක ගලවා කෙල්ල දෙස බැලුවාය.

"නිකං සුද්දි. මේ සිංදුවක් බල බල හිටියා."

"ඕක දුක හිතෙන සෝන්ග් එකක්නේ අනේ."

නේත්‍රා සිනාසුනාය.

"ටිකක් දුකයි තමයි."

එය සෝනු නිගම් ගයන හින්දි ගීතයකි.

"දුක හිතෙන ඒවම අහන්න එපා. අපි ජොලියේ ඉන්නත් බලමු"

"ම් බලමු. දුක  සින්දු අහන්නේ රසයට සුද්දි. එහෙම දුකක් නෑ"

නේත්‍රා කීවාය. ඇය කවදාවත් ඇයගේ දුක මේ නංගිලා දෙන්නට කියන්නේ නැත. එය නේත්‍රාගේ ප්‍රතිපත්තියකි. එහෙම කර තාම

ජීවිතේ පටන් ගත්තේවත් වැනි කෙල්ලෝ දෙන්නාට ජීවිතය ගැන කරුමක්කාර හැඟීමක් දෙන්නට ඇය කැමති නැත.

"දැන් මේ දේවක අයියා කතාකළා"

'දැන් අයියත් වෙලා' නේත්‍රා සිනින් කීවාය.

"මොකද කට හදන්නේ ඔයා."

භාවනා නේත්‍රාගේ ඇලපතට ඇණ ඇසුවාය.

"මොකුත් නෑ. දැන් වෙලාව රෑ එකොළහයිනේ සුද්දි."

භාවනාට කට උත්තර නැත.

"මම මක්කරන්නද? මේ ගල් ඉබ්බා මේ රෑ කතාකළා කියලා. මනුස්සකමට ආන්සර් කළේ."

භාවනා කියන්නේ නිදහසටම

නොවේ.

"හරි හරි කොල්ලා මොකද කියන්නේ."

"හෙට අප්පච්චිගේ බර්ත් ඩේ එකලු."

"අනේ ඉතින් ඒවත් උඹට කියනවද?"

"කියනවා අනේ. මමත් ඔහේ අහගෙන ඉන්නවා. මටත් ඉතින් ඕපදුව නිව්ස් හරි අගේනේ"

'මමත් සෑහෙන දේවල් කියනවා' භාවනා එසේ කීවේ නැත.

"ම්."

"ඉතින් අප්පච්චිගේ උපන් දිනේට එයා කිරිබත් හදනවලු. අපිටත් ගේනවා කියන්න කතාකළේ."

"පව්. එහෙම කොල්ලෝ අද කාලේ නෑ. මේ ඉන්නේ දෙන්නෙක්

අපිට."

"මටත් හිතුණා."

භාවනා මොකක්ද හැඟීමකින් කීවාය.

"අපේ අම්මයි තාත්තයි කෙල්ලෝම තුන්දෙනෙක් හැදුවා. ආසාවට එක බත් කටක් හදලා දීලා නෑනේ. තේ චුට්ටක් නේද ලොකු අක්කා."

භාවනා කීවාය. නේත්‍රා දුක්බරව හිස වැනුවාය.

"ඒක ඇත්ත බබා. අපි එහෙම කරන්න ඕන."

"ඔයාට මෙහෙම බෑනේ මමවත් කරන්න ඕන කියලා අද හිතුණා. එයා අරම කිව්වට පස්සේ. පොඩි අක්කව ඉතින් අල්ලන්න බෑනේ."

භාවනා කීවේ වේදනාවෙනි.

කෙල්ල ළඟ මොනවා නැතත් මනුස්සකම ඇති බව නේත්‍රා දනී.

"අපි කරමු අම්මයි තාත්තයි අපි වෙනුවෙන් සෑහෙන දුකක් විඳලා තියෙනවා. කෙල්ලොම තුනක්නේ."

"ඒකනේ මෙච්චර පරිස්සම් කරලා හදපු එකම ඇතිනේ."

භාවනා කීවාය. නේත්‍රා හිස වැනුවාය.

"ඉතින් කොල්ලා හෙට කිරිබත් ගේනවලු"

"ඔව් ඇඹුල් තියල් එක්ක පාන්දර නැගිටලා හදනවලු. මම ඇහුවා කේක් කපන්නේ නැද්ද කියලා. නෑලු අප්පච්චිට කේක් කද්දී අම්මව මතක්වෙනවලු. එයාගේ අම්මා චොකලට් කේක් කන්න හරි ආසලු. ඒ නිසා කේක් ගේන්නේ නෑලු."

නේත්‍රාට දුක්ඛරව බලාගෙන උන්නාය.

"පව්. කොල්ලට කවදාහරි හරියන්න ඕන"

නේත්‍රා පැතුවේ හදවතින්මය. එහෙම කොල්ලෙක්ට හරියන්නේ නැත්නම් කාටවත් හරියන්නේ නැත.

"එයා පේරාදෙණියේ වෙද මහත්තයවත් බලලා. මේ වීක් එන්ඩ් එකේ යන්න දාගත්තලු. හවස් වෙලා යන්ලු. රෑ ඉඳලා උදේ වෙද මහත්තයට පෙන්නලා එමුලු"

"අනේ මේ වැඩ මැද්දේ ඒකා ඒකත් බලලද?"

"ම්. මාත් හිතුවා අමතක වෙලා ඇති කියලා එහෙම නෑ. අපි යන්. ම්."

"මේ සුපර් මාර්කට් එකේ වැඩත්

ගොඩගැහිලා තියෙන වෙලේ බබා."

"එහෙම බෑ. අපි යන්නම ඕන ෆරයිඩේ යන්. සුපර් මාර්කට් එක වහන්න තව දවස් තියෙනවනේ අනේ. මේ දවස් ඔහේ යනවනේ. එයා වැඩකරන අයට වැඩ බෙදලා දීලා තියෙන්නේ. ෆරයිඩේ යන්. මාළිග ාවටත් ගිහින් ආ."

නේත්‍රා සිනාසුනාය.

"මි ආවම දේවක එක්ක කතාකරගමුකෝ බබා."

"මි මං යනවා දොයියන්න හරිම නිදිමතයි"

නැත. මේ කෙල්ල යන්නේ නිදාග න්නට නොවේ. හොඳට පොරවාගෙන හිතන්නටය. ඇත්ත කතාව ඒකය.

"ලව් යූ."

භාවනා නේත්‍රාගේ ගෙල සිපගෙන

කීවාය.

"මී ටූ බබා. බුදු සරණායි."

උඩ පැන පැන යන නංගී දෙස නේත්‍රා බලාගෙන උන්නේ මෘදු සිනාවක් සහිතවය. මේ සතුට පිටුපස ඉන්නේ දේවක බව ඇය නොදන්නවා නොවේ. 'කොල්ලා හොඳයි' ඇයට සිතුණි.

# 20

අද සීගිරි සුපර් මාර්ට් වෙත ගෙන ආ බේකරි මැෂින් ටෙස්ට් කරනා දවසය. ඒවා නියමිත තැන්වල තවම තබා නැත්තේ බේකරි සෙක්ෂන් එක තවමත් හදන්නට ගත්තේ නැති නිසාය. ඒත් දේවකගේ ඉල්ලීම නිසාම බේකරි මැෂින් ටිකත් බේකරි වෙෆ්වත් වේලාසන ගත්තේය. දේවක උදෙන්ම නියම කළේ අද ටෙස්ට් රන් එකක් දිවිය යුතු බවය. බේකරි

සෙක්ෂන් එකට ගත් බේකරි චෙෆ් ඊට එකඟ විය.

"අපි මොනවද සර් හදන්නේ."

බේකරි චෙෆ් දේවකගෙන් ඇසුවේය. ඒ වෙලාවේ භාවනාද ඔහුත් සමඟ විය. 'මේ ඔක්කොම කොහොම හිතනවද කියන එක තමයි ප්‍රශ්නේ. ඕවා හිතන ඔළුවට ආයේ කෙල්ලෙක් ගැන හිතන්න වෙලාවක් ඉඩක් තියෙයිද මන්දා' ඇය සිතුවාය. එහෙත් කොල්ලා වැඩිපුරම හිතන්නේ ඇය ගැන බව කෙල්ල දන්නේ නැත. දේවක ඇය ගැන හිතන්නේ ඔවර් ටයිම් දමාය.

"අපි මහින්ද මෙහෙම කරමු. දැන්මම බ්‍රෙඩ් හදන්න ගන්න එපා. අපි ඒක හොඳම විදිහට හදමු. ආයේ බලාපොරොත්තු කඩකරගන්න මම

ආස නෑ. හරි"

දේවක කීවේය.

"මාත් ඒකට එකඟයි සර් තැටි සීසන් වෙන්නත් ඕන. අවන් එකේ හීට් එක කොහොමද යන්නේ කියලා බලන්නත් ඕන."

මේ තාම උදේය. දේවක ආවා විතරය. ඔහු වෙෆ්ට එන්න කියා තිබුනේ උදේ හතටය. ඔහුගේ වැඩ එහෙමය.

"අපි මහින්ද මෙහෙම කරමු. ටෙස්ට් කරන්නත් එක්ක අපි හොඳ බටර් කේක් එකකුයි සීනි සම්බෝල පාන් වගේ දේකුයි හදමුද? මම පේස්ට් එක ගෙනත් දෙන්නම්."

මහින්ද සිනාසුනේය. භාවනා බැලුවාය.

"එහෙම කරමු සර්. කිලෝ දෙකක

විතර බටර් කේක් එකක්"

"මදි. අපි දාමු කිලෝ පහක විතර කේක් දෙකක්. අද ස්ටාෆ් එකටත් බෙදන්න පුළුවන්නේ. පස්සේ ඕකේ සුවඳ ඇවිත් මේ ළමයි ටිකට දුක හිතෙනවා. මිස්ටත් ගෙදර ගෙනියන්න දෙන්න පුළුවන්නේ රෑට කන්න."

කොල්ලා කීවේය. භාවනාට පුදුම නැත. පුදුම මේ හදවතය.

"මම උදේම වැඩේ පටන් ගන්නම් සර්"

"ගුඩ් ලක්. අවන්වල මොනවා හරි ප්‍රශ්න තියෙනවානම් බලාගන්න. අපිට ඒවා හදාගන්න පුළුවන්."

බේකරි චෙෆ් අවුරුදු පනහක් පමණ වයස පළපුරුදු කෙනෙකි. එහෙත් ඔහුව මෙහෙයවන්නේ මේ

අවුරුදු විසි පහේ කොල්ලාය. වෙෆ් කටපුරා කොල්ලාට සර් කියන්නේ ඒකය. එහෙම කිව යුත්තේ එහෙම කියන්නට සුදුසු කෙනෙක්ටය.

"මටත් සීනි සම්බෝල පාන් ඕන."

ඇය නිකමට කීවාය.

"මිස්ට තමයි මුළින්ම දෙන්නේ. උණු උණුවේ අවන් එකෙන් බාපු ගමන් කමු ප්ලේන්ටියක් එක්ක."

දේවක කීවේය. භාවනා සිනාසුනාය. අද ඇය ඇඳගෙන විත් තිබුනේ ලා කොළ පැහැගත් සාරියකි. එහි සාරි ජැකට් එක කළු පැහැයට හුරු කොළ පාටය. මොකක්ද පුංචි අනුරාගී බවක් කෙල්ලගේ වතට අද වැටී ඇත. 'අපිටත් එක එක දේවල් හිතෙනවනේ මෙහෙම ලස්සනට ආවාම' කියන්නට හිතෙන්නේ

එහෙමය.

"මං කිරිබත් ගෙනාවා මිස්"

ඔහු කීවේය.

"අප්පච්චිට ඉතින් මොනවද අද දුන්නේ."

ඔහු සිනාසුණේය.

"මගේ අතේ එහෙම ලොකු සල්ලියක් නෑ. බතික් සරමක් අරන් තිබුනා දෙන්න"

තාත්තාගේ උපන් දිනයටත් එහෙම බතික් සරමක් සමඟ සුදු කමිසයක් අරන් දෙනවා කියා ඇය සිතාගත්තාය.

"මගේ තාත්තගේ උපන් දිනේටත් ලස්සන බතික් සරමක් තෝරලා දෙන්න හොඳේ"

"ගමු ඔඩෙල් එකේ තියෙනවා ලස්සන බතික් සරම් මිස්."

"ම්"

ඔහු කෙසෙල් කොළයක ලස්සනට කිරිබත් ඔතාගෙන විත් තිබුණි. ස්ටාෆ් එක මෙතන පිරෙන්නට පෙර මේක කන්නට ඕනාය.

"අනේ මේ සීනි සම්බෝලත් ගෙනත්නේ"

"උම්බලකඩ සම්බෝල මිස්. කමු. මේක නේත්‍රා මිස්ට"

ඔහු අක්කාට වෙනම මුලක් ගෙනාවේ ඇයි? 'අපි දෙන්නටම එක මුලක් ගෙනත්'

"මං කිව්වා උදේ ගේනවා කියලා"

දෙදෙනාගේ දෑස් දිලිසෙයි.

"සිකුරාදා නුවර යන්න දාගත්තා දේවක අයියේ. කමක් නැද්ද?"

"එහෙම හොඳයි. කවුද යන්නේ මිසුයි මායි නේත්‍රා මිසුයි නේද"

"ම්. මේ වෙහිකල් ලයිසන් තියේද?"

ඇය ඇසුවාය.

"මට පුළුවන් මිස්. වෑන් එකක් පැද්දා එහේ ඉන්නකොට. සේල්ස් කළේ ඒකෙන් ඩයලොග් එකේ."

එහෙම හොඳය.

"මෙහෙන් හවස තුනට විතර යන් මිස්. කැන්ඩිවලට හයට යන්න පුළුවන්. රෑ ඉඳලා මාළිගාවටත් ගිහින් උදේ වෙද මහත්තයාව හම්බවෙමු මං කියන්නම් සෙනසුරාදා උදේ එනවා කියලා."

කිරිබත් මුල දෙපැත්තේ දෙන්නා උන්නේය.

"දෙන්නම කමු"

එහෙම කන්න ආසා නැත්තේ කවුද?

"මං ටිකක් කන්නම්"

"ඇයි ටිකක්. ගෙදරින් කෑවේ නෑනේ."

දේවක සිනාසුනේය.

"අප්පච්චි එක්ක පොඩි කෑල්ලක් කෑවා"

'මාත් එක්ක කන්නද ආවේ ඉතින්' අහන්නට සිතෙන්නේ එය නමුදු ඇසෙන්නේ නැත.

"මේ ඇඹුල් තියල් රහයි මිස්."

"ඒක තමයි. අපි දැන් හදන්නේ මේ වගේ රස ඇඹුල් තියල්ද?"

දේවක හිස වැනුවේය.

"මීට වඩා රසයි. මේ මාළු පන්සීයකින් හදපු ඇඹුල් තියලක්නේ මිස්. එහෙම නෙමේ මාළු කිලෝ විස්සකින් තිහකින් හදද්දී මාළු රස ගොඩක් එනවා."

ඔහුගේ දැණුම ගැන හිතාග න්නට අමාරුය. එක මුලක කද්දී ඇයගේ සිහින් ඇතැඟිලි අපූරුව ඔහුට දිස්වෙයි. දේවකට එදෙස නිකමට මෙන් බැලෙයි. ඒ බැව් භාවනා දැක්කාය. කෙල්ල තොල් පට තදකරගෙන සිනාසුනාය.

"කිරිබත් මෙච්චර කාලා නිදිමතත් එයි"

"අපි කෝපි එකක් බොමුකෝ මිස්."

"ම්."

මේ උදෑසන කාමරය පුරාම ඇත්තේ මොකක්ද නිසංසල අහිංසක බවකි. ඇය එක මොහොතක දෙනෙත් ඔසවා ඔහු දෙස බැලුවාය. අද ඔහු ඇඳගෙන ආ නිල් පැහැයට හුරු සුදු කමිසයෙන් පරාවර්තනය

වූ ආලෝකය එහෙමම මුහුණට වැටී ඇත. අද රැවුළ නොකැපුවේ ඇයිදැයි අසන්නට ඇයට සිතෙයි. ඉතාම සිහින් රැවුල් කොළ තට්ටුවක් මුහුණ පුරා ඇත. එහෙමත් ලස්සනයැයි ඇයට සිතෙයි. 'දැන් ඒකත් ඇහෙන්න යන්නේ මට. මේ පිස්සා හිතයි මගේ රැවුල ගැනත් මේකී හිත හිතනේ ඉන්නේ කියලා. විලි ලැජ්ජාවයි එතකොට.'

"කැන්ඩි ගිහින් ඉන්නේ දේවක අයියේ."

"හෝටලක් එක නයිට් එකකට බුක් කරගෙන යන් මිස්."

"මි මං බලන්නම් ඉන්ටර්නෙට් එකේ."

"අමොයා එක ෂෝක්. ටිකක් ගණන්."

"කමක් නෑ. මගේ පඩිය ඉතුරුනේ. ඒකේ සල්ලි තියෙනවා"

කෙල්ල කීවාය. දේවක සිනාසුනේය.

"ඒක මිස් කියපු එක හොඳයි"

"ඇයි"

"නෑ ඉතින්. අතේ සතේ නැති වෙලාවක පොඩි ලෝන් එකක ගහගන්න පුළුවන්නේ"

දේවක කීවේය. 'ඉල්ලලා බලන්නකෝ මගෙන් මම ලෝබ නෑනේ'

"දෙන්නද අද කීයක් හරි. සල්ලිත් නෑ කිව්වේ"

කෙල්ල හිම්හිට ඇසුවාය. අප්පච්චී තෑගි දෙන්නවත් අතේ සල්ලියක් තිබුනේ නැතැයි ඔහු කීවා ඇයට මතකය. දේවකට පුදුමය. ඒක

අහපු විදිහය. 'ඔයා හරි අහිංසකයි හිත හරිම හොඳයි' ඔහුට සිතෙයි.

"අනේ එහෙම ඇහුවටත් පින් මිස් අප්පච්චී ඇරෙන්න කවුරුවත් අහලා නෑ. එහෙමට කියලා වියදමක් නෑනේ මිස්."

ඔහු කීවේය.

"ඕනවුනොත් මගෙන් ඉල්ලන්න මී"

ඔහු ඇය දෙස බලාගෙනම හිස වැනුවේය. කිරිබත් දැන් ඉවරවෙන්නටත් ළඟය. එක පතක කද්දි මෙපමණ සතුටක් එනවාදැයි ඇයම සිතුවාය. 'එකට කනවා රෑට කෝල් කරනවා මතක් වෙනවා. අනේ මන්දා. මල් කඩනවා කියන්නේ මේකටද?' ඇය තනිවම සිතුවාය.

# 21

කෝසලත් මිහිරංගත් සීගිරි එකට ආවේ දවල් දොළහට පමණය. දේවක උන්නේ බේකරි මැෂින් සෙට් කරනා දෙස බලාගෙනය. මේක ඔහුගේ සැළසුමේ විශේෂ දෙයකි. වැරදෙන්නට නොහැක.

මිහිරංග ආවේ ටයි පටිය අතින් සකසමින් ජංගම දුරකථනයත් ඔබමිනි. කෝසලත් ආවේ ඔහු සමඟමය. දෙදෙනාම නැවතුනේ

බේකරි මැෂින් සකස් කරන තැනටය.

"ගුඩ් ආෆ්ටර්නූන් සර්. මේ බේකරි මැෂින්ස් ටික ඉන්ස්ටෝල් කරනවා අපි."

දේවක කීවේ මනුස්සකමටය. මේ සීගිරි එකේ හිමිකරුවන්ය. කිරුළ හිමි කුමාරවරුන්ය. ඇත්ත කතාව ඒකය.

"දැන් මේවා මෙතන මේ තියාගෙ නද පාන් හදන්න යන්නේ."

මිහිරංග ඇසුවේය.

දේවක සිනාසුනේය.

"කොහෙත්ම නෑ සර්. මේ අපි අද ටෙස්ට් රන් එකක් යන්න හදන්නේ."

මිහිරංග බැලුවේ කෝසළ දෙසය.

"සුපර් මාර්කට් එකේ සේල්ස් ෆ්ලෝ එක මේ වගේ මැෂිනරීස් දාලා ලෝඩ් කරන්න හදන්න එපා හරිද?

අපි මේ පාන් හදන්න සුපර් මාර්කට් දැම්මා නෙමේ. රිටේල් බිස්නස් එක පුළුවන්නම් ස්මජ් කරනවා.”

කෝසළ කීවේය. මිහිරංගද හිස වැනුවේය. දේවකට මේ කතා හොඳට පුරුදුය. ‘ආවා දෙන්නත් එක්ක බකට් එකක් ඇදලා යන්න’ ඔහු තනිවම සිතුවේය.

“මේත් රිටේල් බිස්නස් එකක් තමයි සර්. වෙනසකට තියෙන්නේ අපි පිටින් බඩු ගන්නේ නෑ අපේම ප්‍රඩක්ට් දාන්නේ පොෆිට් මාජින් වැඩියි.”

මිහිරංග කට ඇද කරමින් කීවේ ‘රෙද්ද තමයි’ කියාය. එහෙත් ඒ වදන් ඔහුගේ මුවින් පිටවූයේ නැත.

“මේ පැත්තට එහෙම මැෂින්ස් දාන්න එපා. පාන් පුච්චන්න ඕනනම්

අර පැත්තට ගන්නවා.”

මිහිරංග කීවේය. භාවනාද ආවේ රාක්ක අතර සිටය. අද ඇය දවස පුරාම කරන්නේ සීගිරි එක වසන්නට නියමිත නිසා එක්ස්පයර් වෙන බඩු බලා ඒවාට ප්‍රමෝෂන් එකක් දැමීමය. එය දේවකගේ අදහසකි.

“ඒ පැත්ත අපි වෙන්කරලා තියෙන්න් බුක් ෂොප් එකට සර්. පොතුයි පානුයි එකට දාන්න බෑ. මේ පැත්තටම තමා අපි බේකරි සෙක්ෂන් එක ප්ලෑන් කරලා තියෙන්නේ. මීට් සෙක්ෂන් එකට මෙයාහින්. ඉඩ තියෙනවා.”

දේවක කීවේය. මිහිරංග අඩියක් ඉදිරියට ආවේය. දේවක අත් බැඳගත්තේය.

“අපියි මෙතන මැනේජ්මන්ට් එක

කරන්නේ. ඒක හොඳට මතක තියාග න්නවා හරිද? මේ පැත්තට අත තියන්න බෑ."

දේවක සිනාසුනේය.

"ඒක කරන්න බෑ සර්. මම ෆ්ලෝ ප්ලෑන් එක ඩිසයින් කරලා ඒක ලොකු සර්ට දීලා අප්රෑ කරගෙන ඉන්නේ. වෙනස් කරන්න දැන් බෑ. සොරි."

දේවක කීවේය. භාවනා ආවාය. 'මේකිත් නැති තැනක් නෑ' මිහිරංග සිතුවේය.

"සීයා ඒක අප්රෑ කරලා තියෙන්නේ මිහිරංග අයියේ. ඒ නිසා ඒක කරන්න දෙන්න."

භාවනා කීවාය.

"බබාට පිස්සුද මේ මීට් සෙක්ෂන් එක අස්සේ පාන් ගහන්න."

භාවනා සිනාසුනාය.

"ඉන්නකෝ ටිකක්. දීපා"

ඇය කතාකළේ සේවිකාවකටය.

"මිස්"

"මගේ මේසේ උඩ තියෙන ලැප්ටොප් එක අරන් එන්න කෙල්ලේ."

භාවනා කීවාය. ඉතිරි ටික කෙල්ල බලාගනී කියා දේවක සිතුවේය. ඇයත් හොඳ නල්ල මලේ කෙල්ල බව දේවක දනී.

"මහින්ද මේකට අපි ටෙම්පරි ගෑස් ලයින් එකක් දැනට දෙමු. ෆික්ස්ඩ් ලයින් එක පස්සේ දාමු. ඉලෙක්ට්‍රිසිටි ලයින් එක තර්ටි ඇම්පියර් නිසා මෙතනට ගහන්න"

දේවක බේකරි සූපවේදියාට උපදෙස් දුන්නේය. 'මූ අපිට ගණන්

ගත්තේ නෑ පරයා”

සේවිකාව ගෙන ආ ලැප්ටොප් එකෙන් භාවනා ටිකකට කලින් දේවකත් සමඟ බැලූ ඩුබායි හී කෙයා ෆෝ සුපර් මාර්කට් එකේ ඡායාරූපයක් පරිගණක මුහුණතට ගත්තාය.

“මේ තියෙන්නේ ලෝකේ නම්බර් වන් සුපර් මාර්කට් එකක් කෙයාෆෝ. ඩුබායිවල තියෙන ලොකුම සුපර් මාර්කට් එක. සී දිස්. බේකරි සෙක්ෂන් එක තියෙන්නේ මීට් සෙක්ෂන් එකත් එක්කමයි. බලන්න ලස්සන. මේ ලස්සන අපිත් හදනවා ඒක එහෙමම හදනවා බලන්නකෝ.”

භාවනා පරිගණක තිරය කෝසලළටත් මිහිරංගටත් පෙනෙන සේ ඇල්ලුවාය. දෙන්නාම එදෙස

බැලුවේ ඇස් කොණකින් පමණි. දේවක තනිවම සිනාසුනේය. දැන් මිහිරංගටත් කෝසලටත් ඇති ප්‍රශ්නය මෙතනින් මාරුවෙන්නේ කෙසේද යන්නය.

"එහේ සුපර් මාර්කට් කරන විදිහට මෙහේ කරන්න බෑ බබා. අපිට මාකටින් උගන්නන්න එන්න එපා."

මිහිරංග කිවේය. භාවනා සිනාසුනාය.

"මෙතන තීරණ ගන්නේ සීයා මිහිරංග අයියේ. ඒවා සුපවයිස් කරන්න දීලා තියෙන්නේ මට. ඒවල ෆයිනෑන්ස් සයිඩ් එක බලන්නේ අක්කා. එහෙමයි වෙන්නේ. මේක හැදුවට පස්සේ සීයා බලලා ඔයාලා දෙන්නට දෙන පෝස්ට් තීරණය

කරයි. ඒ නිසා දැනට මේවා මෙහෙම කරගෙන යන්න දෙන්න. ඒවට මොනවත් කියන්න එපා. දේවක ප්ලෑනක් හදලනේ අප්රෑ කරගත්තේ. නිකං මේ අවාට ගියාට පාන් පුච්චන්න හදනවා නෙමෙයි"

භාවනා හිම්හිට කීවාය. ඇය නොකියා කිව්වේ වැඩක් බලාගෙන යන්න කියාය.

"අපි සීයා එක්ක ඒ ගැන කතාකරන්නම්. වරෙන් යන්"

මිහිරංග කෝසළුවත් ඇදගෙ නම ගියේය. භාවනා අත් බැඳගෙන දේවක උන් තැනකට වී උන්නේ දෙන්නාටත් පේන්න එක්කය. 'ඔයා මං නිසා ප්‍රශ්නයක් දාගනීද කියලයි මට බය' දේවක සිතුවේය.

"සොරි මිස්"

දේවක මෘදුව හිම්හිට කීවේය.

"මොකටද?"

දේවක කිසිවක් කීවේ නැත.

"ඕක බලලා ටිකක් එන්නකෝ."

භාවනා ගියේ එසේ කියාගෙ නමය. දේවක හිස වැනුවේය. සීගිරි එක පිටුපස ඇති පවුල් කතාව ගැන දේවක දැන් හොඳින්ම දනියි. එහෙම බලනවානම් මේ සීගිරි එකට තමාටද අයිතියක් ඇත. එහෙත් කොල්ලා ආවේ ඒ අයිතිය ගන්නට නොවේ. ඒත් දවසක මේ රහස් සියල්ලම එළිකරන්නට වෙන බව ඔහු දනී. 'දවසක මම කවුද කියලා කියන්න වෙන්නෙත් ඔයාටම තමයි. එහෙම බොරුවක් කරන්න බෑ මට. හිම්හිට කියනවා මම කවුද කියලා. ඔයා කාටවත් කියන එකක් නෑ.' දේවක

සිතුවේය.

දේවක කාර්යාලය පැත්තට යද්දී කෝසලත් මිහිරංගත් කැෂියර් එක ළඟ ඉන්නවා ඔහු දුටුවේය. හිතාගත් විදිහටම මේ සැළසුම ක්‍රියාත්මක කළ යුත්තේ මේ නිසාය. කිසිම දෙයක් වරදින්නට නොහැක.

භාවනා ඇගේ මේසයේ බලාගෙන උන්නේ දේවක එනතුරුය.

“ඉඳගන්නකෝ.”

ඇය කීවාය. දේවක ඉඳගත්තේ ඇය දෙස බලාගෙනමය.

“මිස්.”

“මේක මෙහෙම වෙයි කියලා මම දැනගෙන හිටියා. මම ඔයාටත් ඒක කිව්වා.”

“මතකයි මිස්. මම ඒවා එහෙම”

භාවනා යමක් කියන්නට ගියනිසා

දේවක කියාගෙන ආ දේ නතර කළේය.

"සීගිරි එකට එයාලා දෙන්නටත් ලොකු අයිතියක් තියෙනවා. සීයා මේවා තාම කාටවත් බෙදලා දීලා නෑ. ඒ නිසා එයාලා අතඅරී කියලා හිතන්න බෑ."

"මම දන්නවා මිස්."

"එයාලට දවසක උත්තර දෙන්න ඕන. ඒත් කටින් නෙමේ. අපි අපේ වැඩවලින් උත්තර දෙමු. ඒ ඇති"

භාවනා කීවේ කරුණාවෙනි.

"මම මගේ උපරිමයෙන් කැපවෙනවා මිස්. මට හීනයක් දැකලා තියෙන්නේ. ඒක මම සැබෑ කරනවා."

භාවනා සිනාසුනාය. එහෙම සිනාසුනේ ඇයිදැයි ඇයම දන්නේ

නැත.

"මාත් ඒ හීනෙම දකිනවා."

එකම හීනය දෙන්නෙක් දකින්නේ කෙසේද කියා දන්නේ නැත.

"එයාලා මොනවාහරි කරන්න පුළුවන්. මමත් පරිස්සමින් බලාගෙන ඉන්නේ. දේවක අයියත් ටිකක් පරිස්සමින් ඉන්න වෙයි. මට මොකක්ද දැනෙනවා. ඒකයි කියන්නේ. මට හිතෙන දෙයක් සාමාන්‍යයෙන් වැරදෙන්නේ නෑ. ඒකමයි බයත්"

භාවනාට ඇත්තටම එහෙම දෙයක් දැනෙයි. ඒ මොකක්ද කියා ඇයටම තේරෙන්නේ නැත.

"මට එක පොරොන්දුවක් ඕන. අද? මේ දැන්මම."

කෙල්ල කීවාය. දේවකගේ පපුවත්

එක්ක ගැහෙන්නට විය.

"ඇයි බයවුණේ. ම්."

"න්..නැහැ මිස්."

'මේකා හිතන්න ඇති මම වෙන පොරොන්දුවක් ඉල්ලනවා කියලා' ඇය යටි සිතින් සිතුවාය.

"මොන දේ වුනත් සීගිරි එක දාලායන්න බෑ. අමාරුම අවස්ථාවක් ඇතිවුණත් ඉන්නෝන. හරි. අඩුම ගානේ මම නිසාහරි."

ඇය එහෙමම කීවාය. එහෙම කියූ විට ඔහු මොනවත් කියන්නේ නැතිබව ඇය දනී.

"කවදාවත් දාලායන්නේ නෑ මිස්."

ඔහු විශේෂයෙන් සීගිරි එක ගැන කිව්වේ නැත. ඔහුගේ සිංහල වචනවලට ඇගේ පපුවද ගැස්සිණ. 'හරියට මාව දාලායන්නේ නෑ කිව්වා

වගේනේ ඒක කිව්වේ. මූණ දිහාත් බලාගෙන'

"මට ඒ ඇති."

"එයාලා නිකං ඉන්නේ නෑ දේවක අයියේ."

"මං දන්නවා මිස්"

"එයාලා කෙළ හලාගෙන ඉන්නේ මේ සීගිරි සුපර් එකට නෙමේ. මේ ප්‍රොපටි එකට. මේක කෝටි ගාණක එකක්නේ කම්පනි විස්සකින් විතර ඇවිත් මේ ලෑන්ඩ් එක ඉල්ලලා තියෙන්නේ. සීයා එයාලා එක්ක කතාකරන්නේවත් නෑ. ළඟදි අබාන්ස් එකෙන් ඇවිත් ඉල්ලුවා. එයාලගේ ෂෝ රූම් එකයි මැක්ඩොනල්ඩ් එකයි දාන්න. සීයා බෑ කිව්වා. ලොකු ඔෆර් එකක් දුන්නේ. මේවා එයාලා දන්නවා එයාලාට ඕන මේක එහෙම විකුණලා

එයාලගේ කොටස රෙඩි කෑෂ් වලින් ගන්න."

භාවනා පැහැදිලිව කීවාය.

"මේක රඹුක්වැල්ල ෆැමිලි එකේ හදවත මිස්. මේක කවදාවත් විකුණන්න දෙන්න එපා. මිස්ගේ පුතත් මේ සීගිරි එක කරන්න ඕන."

දේවක කීවේය. භාවනාව ගැස්සිණ. 'පුතෙක්ව ලැබෙන්න කලින් පුතාගේ තාත්තව ලැබෙන්න එපැයි' ඇයට කියන්නට සිතෙන්නේ එහෙමය.

"මම එහෙම දේපොළවලට ආස නෑ. ඕනත් නෑ. ඒත් මම සීගිරි එකට ආදරෙයි."

"මේක නැතිවෙච්ච දවසක ඒ පාළුව දැනෙයි මිස්. පොඩි තේ කඩයක් කරන කෙනාටත් එහෙමයි.

ඒක එයාගේ ජීවිතේ වගේ.”

“ම්. ගිහින් එහෙනම් බේකරි මැෂින්ස් ගැන බලන්න. මේවා මොනවත් හිතන්න එපා. ඔයා ඔයාගේ ගමන යන්න. මම කැමති නෑ ඔයා වැටෙනවට. ඒකයි මේ වෙලාවේම මේවා කිව්වේ.”

දේවකට පුදුම නැත. මේ ඉන්නේ ලේසි පාසු කෙල්ලෙක් නොවන බව ඔහු දනී.

“හොඳයි මිස්. ඒ සී එක දාගෙන යන්නද මිස්. මිස්ට දාඩිය දාලා.”

කොල්ලා කීවේය. ඒකත් ඇයට සිහිවූයේ දැන්ය. ‘මට එහෙමයි තරහ ගියාම දාඩිය දානවා’

“හා.”

දේවක ගියේ මෘදු සිනාවක් මුවමත තබාගෙනය. භාවනා

මොහොතක් දැස් පියාගෙන වායු සමීකරණයෙන් ආ සීතල විඳගත්තාය. 'මොකක්හරි වෙලා ඔයා යයි කියලා නිතරම හිත කියනවා. එහෙම වෙන්න බෑ. ඔයා හැමදාම සීගිරි එකේ ඉන්නෝන.' අර ටික ඔහුට මේ හදිස්සියේම කිව්වේ ඒ නිසාය. එහෙම කියන්නටත් පුළුවන් ඔහුට පමණය.

# 22

මලීෂා උන්නේ ඇගේ මේසයට වී ඇය අත තිබූ ස්මාට් දුරකථනයෙන් ෆේස් බුක් එකේ සරමිනි. දවස පුරාම ඇය කරන්නේ මේකය. වෙන කරන වැඩක් ඇත්තටම නැත. තමාට දී ඇත්තේ කරවල ගඳ ගහන ස්ටෝරුව කියා ඇය කැෂියර් අංශය ගත්තාය. දැන් ඇය ස්ටෝරුව බලන්නේද නැත. කැෂියර් එක බලන්නේද නැත. දෙකම බලන්නේ

භාවනාය. කැෂියර් එකේ කෙල්ලෝ මොන දේ වුනත් දුවගෙන එන්නේ කෙල්ල ළඟටය.

"මම නෙමේ දැන් කැෂියර් එක බලන්නේ කෙල්ලේ. මලීෂා මිස්ගෙන් අහන්නකෝ."

භාවනා ඔවුන්ට කියයි.

"මලීෂා මිස් මොනවත් දන්නේ නෑ මිස්. ඇහුවාම කියන්නේ භාවනා මිස්ගෙන් අහන්න කියලා. එසෙඩ් රිපෝට් එක ගන්නවත් දන්නේ නෑ. පාස්වර්ඩ් ඉල්ලුවාම අහනවා ෆේස්බුක් එකේ පාස්වර්ඩ් එකද කියලා"

භාවනා සුසුමක් හෙළුවාය.

"ම්. මං එන්නම්."

කෙල්ලට වැඩකරන්නට ආසය. ඒනිසා ගාණක් නැත. දවසක මේ

කවුරුවත් නැති වුවද ඇයට මේ සීගිරි එක බලාගන්නට පුළුවන. ඕනාවෙන්නේ අක්කාවත් දේවකවත් පමණි.

දේවක මලීෂා වෙත ආවේ එක දෙයක් දැනගන්නට ඕනා නිසාය. මලීෂා උන්නේ තනිවම සිනාසෙමින් ෆේස් බුක් එකේය. 'සීගිරි එක පාඩුවෙන ලොකුම හේතුවක් මෙයා.' දේවක සිතුවේය.

"මිස්."

කොල්ලට දුක මේ වාගේ අයටත් මිස් කියන්නට වූ එකගැනය. ඒත් ඔහු ඒවා හිතන්නේ නැත.

"ඇයි. මොකද?"

මලීෂා කතාකළේ ඔහු දෙස බලන්නේවත් නැතුවය. ඒ තරමට ඇයගේ ඔළුවය. විධායක රැකියාවක්

කරන කෙනෙක් එහෙම කරන්නේ නැත. තමාගේ මේසයට එන කෙනෙක් දෙස කෙළින් එක එල්ලේ බලයි.

"ගිය මාසේ ස්ටෝස් රෙකෝඩ් ටික මට ගන්න පුළුවන්ද?"

දේවක ඇසුවේ දැනට සීගිරි එකේ ඇති බඩු තොගය ගැන නිසි අගය කිරීමක් ගන්නටය.

"ඇයි මොකටද?"

මලීෂා එහෙම ස්ටෝරුවේ වාර්තා තියාගෙන නැත. උසස් පෙළත් අසමත් වූ ඇය දන්නා තොග වාර්තාවක් නැත. දන්නා එකම දේ ෆේස් බුක් එකට යන්නට පමණි.

"මට ඕන. ෆයිනල් කොස්ට් එකක් හදන්න. රිපෝට් එක දුන්නානම් ලේසියි."

දේවක කීවේය.

"තියෙන රෙකෝඩ්ස් මම භාවනාට දීලා තියෙන්නේ."

ඇය කීවාය.

"නෑ මිස්. භාවනා මිස්ගෙන් මම ඇහුවා. මිස්ට මොනවත්ම බාරදීලා නෑ. කීස් ටික විතරයි මිස්ට දීලා තියෙන්නේ. ඉන්වොයිස් ටිකත් මිස් ගිහින් ලාච්චු ඇදලා හොයාගෙන තියෙන්නේ."

දේවක එහෙමම කීවේය. මලීෂා කේන්තියෙන් මෙන් බැලුවාය.

"මම එහෙම ඔයාට රෙකෝඩ් දෙන්න බැඳිලා නෑනේ. ඔයා කවදද මැනේජ්මින්ට් එකට ආවේ."

දේවක සිනාසුනේය.

"මේක මැනේජ්මන්ට් එකේ ප්‍රශ්නයක් නෙමේ මිස්. මට ස්ටොක්

එකක් ගන්නෝන. ඒකට පාස්ට් මන්ත්වල ස්ටොක් එක ඕන. මට ඒක දැන් දෙන්න."

මලීෂා කිසිවක් කීවේ නැත

"මට දෙන්න විදිහක් නෑ මම මිහිරංග සර්ට ඒවා කියන්නම්. ඒවා බලන්නේ මගේ අයියා. දැන් යන්ඩ."

මලීෂා දෙස මොහොතක් දේවක බලාගෙන උන්නේය.

"රෙකෝඩ්ස් තියාගත්තේ නැත්ද මිස්. ආ?"

දේවක ඇඟට පතට නොදැනී ඇසුවේය.

"ඔයා කවුද මගෙන් එහෙම අහන්න"

දේවක සිනාසුනේය.

"මම මෙතන ප්‍රමෝෂන් මැනේජර් මිස්. මට ස්ටොක් එක

ඕන. මිස් මට ඒක දෙන්නේ නැත්නම් මම ඒක සර් එක්ක කතාකරගන්නම්. මොකද මට ඒක ඕනමයි"

දේවක පැහැදිළිව කීවේය.

"අනිත් එක මිස් දැන් කැෂියර් එක බලන්නේ නැද්ද?"

දේවක ඇසුවේ ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කතාකරන්නේ කාත් සමඟද කියා සිතාගන්නය. භාවනා මේ සියල්ල දන්නා බව දේවක දනී.

"මං බලන්නේ මොකක්ද කියලා මම බලාගන්නම් දැන් ප්ලීස් ගෝ අවුට්."

"ඕකේ මිස්. මට ස්ටොක් රෙකෝඩ්ස් ඕන."

දේවක අවසාව වරටත් කියාගෙන ගියේය. මලීෂා උන්නේ භූමිතෙල් ගෑවුන ගැරඬියෙක් මෙන් කිපීය.

ඇය එහෙමම මිහිරංගට කතාකර මේ කතාව කීවාය.

"උඹට ළඟදීම වැඩක් දෙනවා බබා. ටිකක් ඉන්නවකෝ."

"මූ මගෙන් මේක ඉල්ලනවා අයියේ. බලන්න ඕන උගේ පඩ ෂෝ එක මෙතන."

"ඉන්නවකෝ ටිකක්. තමුසේ කියනවා අනිත් දවසේ ඒවා මට බාරදීලා තියෙන්නේ මගෙන් අහන්න කියලා. මම දෙන්නම් උඹට රෙකෝඩ්ස්. බල්ලා."

මිහිරංග කීවේය. මලීෂාගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ දැන්ය. ඇය ආයෙත් කිට් කැට් එකක් කඩාගෙන ෆේස් බුක් එක දිගහැරගත්තාය.

දේවක සුපර් මාර්කට් එකට යද්දී

ඔහුගේ මියගිය අම්මාගේ පින්තූරය දැක නතරවූවේය.

"ඔයත් එක්ක ටිකක් කතාකරන්නත් බැරිවුනා මේ කලබලේ. මේ දාගෙන ඉන්න මාලේ හරි ලස්සනයිනේ. දැන් කෙල්ලෝ දාන්නෙත් මේ වගේ චූටි මාල තමයි. මේ තියෙන පර්ල් පෙන්ඩන්ට් එකත් මාරම ලස්සනයි අම්මේ. ඒක දැන් කොහෙද? අප්පච්චි ළඟ ඇති මම හිතන්නේ."

දේවක සිතින් අම්මා හා කතාකළේය. පිටුපසින් නේත්‍රා රෝද පුටුව කරකවාගෙන එනවා ඔහු දැක්කේ නැත. සීගිරි පවුලේ පින්තූර දෙසම බලාගෙන ඉන්නා කොල්ලාව දැක නේත්‍රාට පුදුමත් සිතුණි. ඔහුගේ දෑස් තියෙන්නේ කොහේදැයි නේත්‍රා

විමසිල්ලෙන් බැලුවාය. 'පොඩි නැන්දි දිහා බලාගෙන ඉන්නේ. ඇයි ඒ' නේත්‍රා සිතුවේ නිකමටය.

දේවකගේ අතක් ඉහළට එසවුනේ අම්මාගේ මුහුණ ටිකක් අතගාන්නටය. එහෙත් උඩට ගත් අත දේවක පහළට දැම්මේ නේත්‍රාව දැකය. කොල්ලා අමාරුවෙන් සිනාසුනේය. 'මම අම්මා දිහා බලාගෙන ඉන්නවා මිස් දකින්නත් ඇති'

"මිස්."

"මේ අපේ ෆැමිලි පොටෝස් දේවක."

නේත්‍රා කිවාය.

"ඒක තමා මිස් මම මේ නිකං බලාගෙන හිටියේ."

නේත්‍රා සිනාසුනාය.

"මේ අපේ තාත්ති. මේ අම්මා. මේ ලොකු නැන්දා මේ ඉන්න මිහිරංග සර්ගේ අම්මා. එතකොට මේ අපේ පොඩි නැන්දි. එයා මීට අවුරුදු විස්සකට විතර කලින් නැතිවුණා දේවක."

කොල්ලාගේ දෑස් බරවිය.

"පව් නේද මිස්."

නේත්‍රා ඒ ඇස් දෙස යන්තමට බැලුවාය.

"ම්. මට හරිම ආදරෙයි මේ සීගිරි එක හැදුවේ පොඩි නැන්දියි අපේ සීයයි තාත්තයි. ගොඩක් අදහස් පොඩි නැන්දිගේ. මේ සීගිරි කියන නම දැම්මෙත් එයා."

දේවක අමාරුවෙන් බැලුවේය.

"අපි සිකුරාදා යන් මිස් වෙද මහත්තයට පෙන්නන්න."

"මී. මල්ලිට කරදරයක්ද දන්නේ නෑ?"

ඇය ඇසුවාය. දේවක ලස්සනට සිනාසුණේය.

"එහෙම හිතන්නවත් එපා මිස්. භාවනා මිස් කිව්වා හොටෙල් එකකුත් බුක් කරනවා කියලා."

දේවක කීවේය.

"එයාට එහෙම තමයි. කළුතර ගියත් ට්‍රිප් එකක් කෙල්ල හරි ආසයි තාම පොඩියිනේ"

දේවක හිස වැනුවේය.

"මිස් දවසක ඇවිදිනවා. ලස්සනට සාරියක් ඇඳගෙන."

දේවක කීවේය. නේත්‍රාගේ දෑස් තෙමිගියේය.

"මී එදාට මම ඉස්සෙල්ලාම එන්නේ ඔයා ළඟට. හරි."

දේවක හිස වැනුවේය. කොල්ලා යන තුරුම නේත්‍රා බලාගෙන උන්නාය. ඇය ඒ ළඟින් යද්දි නිකමට මෙන් නර්මදා පොඩි නැන්දාගේ පින්තූරය දෙසද බලාගෙන ගියාය. මොකක්ද හිතෙන්නට මෙන් ආ නමුද පසුව එය යටපත් විය.

*** *** *** *** ***

සීගිරි හී අලුත් බේකරි අංශයේ ටෙස්ට් රන් එකෙන් හැදූ පළමු සීනි සම්බෝල පාන් ටික දේවක අතට ගත්තේ මේ දැන්ය. මුළු සීගිරි එකම සුවඳය. දේවකගේ මුහුණ පුරා තිබුනේ ජයග්‍රාහී ආඩම්බරයකි. ඔහු අද හිතාගෙන ඉන්නේ සීගිරි එකටම ටී ටයිම් එකට සීනි සම්බෝල පාන්

දෙන්නටය. ඒ බව ඔහු බේකරි චෙෆ් වූ මහින්දටත් කියා තිබුණි. පළමු සීනී සම්බෝල ටික ට්‍රේ එකක තබාගෙන ටිෂූ ටිකක්ද සමඟ කොල්ලා ආවේ භාවනාගේ කාමරයටය. භාවනා උන්නේ මාස තුනක සේල්ස් පිළිබඳ වාර්තාවක් හදමින්ය. එය බැංකුව විසින් ඉල්ලා තිබුණේ අලුතෙන් ගන්නා ණය මුදල අනුමත කිරීමටය.

ඔහු එනවා ඇය බලාගෙනය. ලස්සනට බලාගෙනය.

"මේ මිස් අපේ ෆස්ට් ප්‍රඩක්ට් එක. දැන් අවන් එකෙන් ගත්තේ."

ඔහු දෝතින්ම එය ඇයට පිළිග ැන්වූවේය. භාවනා එය ගත්තේද එවැනිම භක්තියකිනි.

"හරිම සුවඳට පාටට ඇවිත්නේ."

"අපි මේවා සීයක් දෙසීයක්

දවසකට දානවා මිස් සීගිරි එක ඇතුලෙයි එළියේ ප්‍රේස්ට්‍රි කවුන්ටර් එකෙයි.”

“එළියෙත් ප්‍රේස්ට්‍රි කවුන්ටර් එකක් දාන්නද යන්නේ.”

දේවක හිස වැනුවේය.

“රහ බලන්න මිස්”

“දේවක අයියා කෑවද?”

ඔහු නැතැයි කියන්නට මෙන් හිස දෙපසට වැනුවේය.

“මිස්ට ෆස්ට් එක ගෙනාවේ.”

“මි කමු එහෙනම් දෙන්නත් එක්කම.”

ඇය සීනි සම්බල් බන් එකක් ගෙන එය දෙකට කැඩුවාය.

“මේක ඔයාට.”

එහෙම කන්නම හිතුනේ ඇයිදැයි ඇය දන්නේ නැත.

"ඒකේ රස."

"නියමයි නේද මිස්. මේ රස තවත් ඉම්ප්‍රෑ වෙනවා. මේ ෆස්ට් එකනේ."

භාවනා දෙනෙත් එසවූවාය.

"සීයත් ඉන්නවා රූම් එකේ. අපි අරන් යන්."

"යමු මිස්."

දෙන්නාම රඹුක්වැල්ල මහතාගේ කාමරයට ආවේ එකටමය. රඹුක්වැල්ල මහතාට දෙදෙනා දෙසම බැලුණි. දෙන්නෙක් එකට එද්දි නිකමට සිතින් ගලපා බලන සිරිතක් හැමෝටම ඇත. රඹුක්වැල්ල මහතාගේ වියපත් ඇස්වලටත් එයම සිදුවිය.

"සීයා මේ අපේ බේකරි සෙක්ෂන් එකේ ෆස්ට් බන් එක. දේවක සීයටත් ගෙනත්."

රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"මට සුවඳ ආවා පුතේ. කෝ බලමු."

දේවක සීනි සම්බෝල පාන් ට්‍රේ එකම රඹුක්වැල්ල මහතාට පෑවේය.

"හිතනකොටත් පුදුමයි අපි හදපු බන් එකක් කියලා. ෂෝක් එකට ඇවිත්නේ පුතේ."

"අපි සර් බේකරි ප්‍රඩක්ට් අසූවක් විතර දාන්න ප්ලෑන් කරලා තියෙන්නේ. අද මේ ටෙස්ට් රන් එක."

කොල්ලා ලස්සනට මේ වැඩ ටික කරගෙන යන බව දැන් රඹුක්වැල්ල මහතා දනී. ඔහුට තවමත් පුදුම කොල්ලා තමා ළඟටම ආපු එක ගැනය.

"ෂෝක්නේ පුතේ."

රඹුක්වැල්ල මහතා තවත් කටක්

කම්න්ම කීවේය.

"ඇතුලේ සේල් එකයි එළියේ ප්‍රේස්ට් කවුන්ටර් එකේ සේල් එකයි දෙකෙන්ම අපිට හොඳ ප්‍රොෆිට් එකක් ගන්න පුළුවන් සර්. අපි සර් එළියේ ප්‍රේස්ට්‍රි කවුන්ටර් එකට සීගිරි බේකරි ෂොප් කියලා දාමුද? නිකමට වගේ."

රඹුක්වැල්ල මහතා දීප්තිමත් දෙනෙතින් බැලුවේ කෙල්ල දෙසය. 'සීගිරි බේකරි ෂොප්' ලස්සන නමක්නේ. ඇයද සිතුවාය.

"ඒක ෂෝක් නමනේ පුතේ. අපි දාමු."

"මම සර් එහෙනම් පොඩි නේම් බෝඩ් එකක් හදන්න කොටේෂන් ගන්නද? ඒකට."

රඹුක්වැල්ල මහතා හිස

වැනුවේය. කොල්ලාගේ ඔහු දුටු ලස්සනම දේ හැමදෙයක්ම කියා කරන එකය.

"අපි සර් එළියේ කවුන්ටර් එකට ඇතුලේ ළමයෙක්ව දාමු. යුනිෆෝම් එක චුට්ටක් වෙනස් කරලා. කොෆි බ්‍රවුන් කලර් එකයි ලා බේජ් කලර් එකයි මික්ස් කරලා ඇඳුමක්. බේකරි කලර් එකට යනවනේ සර්."

සීයාට දැන් කොතරම් සතුටුද කියා භාවනාට හිතාගන්නට පුළුවන.

"ඒක ලස්සනයි තමා. මාත් පිටරටදී දැකලා තියෙනවා බේකරි ෂොප්වල එහෙම."

"අපි උදේ ඉන්ටර්නෙට් එකෙන් බැලුවානේද මිස්."

ඔහු හැමදේම කියන්නේ 'අපි' කියාය. 'මම' කියා නොවේ. හොඳ

කළමණාකරුවන් එහෙමය. හොඳ දේවල් කරන්නේ අපිය. වැරැද්දක් වුවහොත් ඒ මමය.

"මම බලාගෙන ඉන්නේ ඔයා අලුතෙන් හදන සීගිරි එක බලන්න. ඒක මගේ හීනයක් දේවක පුතා."

රඹුක්වැල්ල මහතා බරකර කීවේය.

"ඒ ඩ්‍රීම් එක අපි සැබෑ කරනවා සර්. මොකද ඒක අපෙත් හීනේ නිසා. නේද මිස්."

දේවක ලස්සනට කීවේය. රඹුක්වැල්ල මහතා සිනාසුනේ දෙදෙනා දෙසම බලාගෙනය.

කාමරයෙන් යද්දී භාවනා දේවක දෙස බැලුවාය.

"මොකක්ද කියන්න ගියේ."

ඇය ඇසුවාය.

"මේ බන් දෙකක් අපි යවමුකෝ මිස් මැඩම්ට. මේ වෙලාවට එයත් කයිනේ තේ එකක් හදාගෙන."

භාවනාට පුදුමය. 'මට මගේ අම්මව මතක් වුනේ නෑ ඒත් ඔයාට මතක් වෙනවා. කොහෙන්ද මේ මනුස්සකම් ඉගෙනගත්තේ.'

"එයා හරි ආසයි එහෙම කන්න. මටත් පුරුදු වුනේ එයාගෙන්."

"මං ලස්සනට බ්‍රවුන් පේපර්වලින් රැප් කරලා දෙන්නද දෙකක් තුනක් මිස්."

"හා. මං ඩ්‍රයිවර් අන්කල් අතේ යවන්නම්."

හද පලාගෙන එන්නාවූ මොකක්ද ප්‍රසාදජනක සිතිවිලි මාලාවකින් කෙල්ලගේ හිතම පිරී ගියේය.

"මාත් දෙකක් අප්පච්චිට අරන්

යන්න ඉන්නේ.”

“ඒක හොඳයි. මටත් එකක් ඕන හොඳේ.”

“මං වෙනම දෙනවා.”

භාවනා කාමරයට පැමිණි ලොකු හුස්මක් ගත්තාය. ‘මොකකින් හරි හිත පුරවලා එයා යනවා.’ ඇයට එහෙම හිතෙන්නේ දවස් කිහිපයක සිටය. ‘නුවර යද්දී ඔයා එක්ක කයියක් දාගෙන යන්න පුළුවන්.’ ඒ ගමන යනතුරු ඇය ඉන්නේ ආසාවෙනි. අඳින්නේ මොනවාද කියා දැන්මම ඇය සිතුවාය.

දේවක ඔහුගේ අතින්ම ස්ටාෆ් එකට සීනි සම්බෝල පාන් බෙදන අයුරු නේත්‍රාත් භාවනාටත් එක ළඟට වී බලාගෙන උන්නෝය. අද හවස සෙනඟ ගොඩක්ම අඩුය. මේ

දවස්වල කලෙක්ෂන් එකක් ඇත්තේම නැත. ඇත්තටම මෙහෙමම තිබ්බානම් වෙන්නේ හෙට අනිද්දාට සීගිරි එක වහන්නටය. එහෙත් දැන් බලාපොරොත්තුවක් ඇත.

"බබා"

නේත්‍රා කතාකළාය.

"අක්කා"

"හැම කොල්ලෙක්ටම බෑ මේ අසිරිය මවන්න."

නේත්‍රා කීවාය. භාවනා සීනි සම්බෝල බෙදන දේවක දෙස බලාගෙනම උන්නාය.

"එයා ඇත්ත කෙනෙක්ද කියලත් හිතෙනවා."

භාවනා කීවාය. නේත්‍රාට පුදුම නැත. සමහර අය ගැන සමහර අවස්ථාවල එහෙම සිතෙයි.

"මොනවාහරි හිතනවද සුද්දි."

නේත්‍රා මෘදුව ඇසුවාය.

"හිතන්නේ නෑ අක්කා හිතෙනවා."

කෙල්ල ඇත්තම කීවාය. අක්කාට බොරුවක් කියන්නට කෙල්ලගේ දිව නැමෙන්නේ නැත. නේත්‍රා මේ අවංකකමට ප්‍රිය කළාය. බාල සහෝදරියන් දෙන්නාම එහෙමය. කවදාවත් තමාට බොරුවක් කියන්නේ නැත. තාරකාද එහෙමය. කොල්ලෙක් සමඟ ගියද ඇවිත් සියල්ල කියයි.

"මී. හැමදේම කල්පනාවෙන් හොඳේ."

ඇය කීවාය. ඊට වඩා කියන්නට දෙයක් නැත.

"වෙලාවකට නැතිම වෙලා යන්නේ ඒක තමා නේද?"

භාවනා හැඟීම්බරව සිනාසී කිවාය. කතාව ඇත්ත. නැතිමවෙන්නේ කල්පනාවය. සිහි කල්පනාවය. ආදරයේදී එහෙමය. ඉන්නේ මේ ලෝකයේ නොවේ.

"ඔයාට දුකක් වෙන්නේ නෑ. එහෙම වෙන්න දෙන්නෙත් නෑ. පවුලටම හරියන්න මම දුක් විඳලා තියෙන්නේ."

නේත්‍රා කීවාය. අක්කා ඇගේ ජීවිතයේ කියූ දුකට වඩා වින්ඳ දුක වැඩි බව භාවනා දැනගෙන උන්නාය. බොහෝ දේවල් ආරංචිවෙද්දී බොහෝ දේ සිදුවී අවසානය.

"ඉස්සෙල්ලා කොල්ලට හැදෙන්න දෙන්න එච්චරයි."

ඇය කීවාය.

"ඉතින් මම එයාව

අවුල්කරනවයෑ. එයා ඇවිත් මේ.”

කියන්නට ගිය දේ ඇය ගිලගත්තාය. නේත්‍රා සිනාසුනාය.

*** *** *** *** ***

මිහිරංග සීගිරි එකට ආවේ දේවක සීගිරි එකෙන් පිටවී ගියාට පසුය. ඒ මොහොතේ භාවනාද උන්නේ නිවසට ගොස්ය. මිහිරංග කෙළින්ම ගියේ ස්ටොක් රූම් එකටය. ඔහු බැලුවේ ලක්ෂ පහක් පමණ වටිනාකමකින් යුතුවූ ෂැම්පු සහ පර්ෆියුම් තොගය එලෙසම තියෙනවාද කියාය. මිහිරංග ඒවා තබා තිබුනේ කිසිවෙකුට හසුවෙන තැනකින් නොවේ. ස්ටොක් රූම් එකට යාබඩව තිබූ වෙනත්

කාමරයකය. ඒ කාමරයේ තිබූ යතුරු දෙකම තිබුණේ මිහිරංග සතුවය.

බඩු තොගය එලෙසම තිබුණි. දේවක සීගිරි එක ගොඩනග නඟන්නට රෑ වැඩකරන දිනයකට ආසන්න දිනයක මේ බඩු තොගය සීගිරි එකෙන් අතුරුදහන් වෙයි. සීගිරි හී ආරක්ෂක නිළධාරියෙක් අල්ලාගෙන මේ සියල්ල කරන්නට මිහිරංග සැළසුම් කර තිබුණි. ලක්ෂ පහකට ආසන්න වටිනාකමකින් යුතුවූ මේ බඩු තොගය පැන්නීම සම්බන්ධයෙන් කෙළින්ම චෝදනාවට ලක්වෙන්නේ දේවකවය.

ඔහුව සීගිරි සුපර් වෙතින් ඉවත්කරගන්නට එය ප්‍රමාණවත්ය. ඒවා දේවක විසින්ම පැන්නූ බවට සාක්ෂිද මිහිරංග සූදානම් කර

අවසානය. දැන් ඇත්තේ දේවක පුරා රැයක් වැඩකරන දිනයක් එනතුරු බලා සිටීමය.

එදා රෑ රාත්‍රී අටට පමණ යළිත් වරක් මිහිරංගත් කෝසළත් නගරයට නුදුරු අවන්හලකදී හමුවිය. ඔවුන් කොකා කෝලා සමඟ වොඩ්කා බොමින් කතාකළේ දේවකව හිරකරන මෙහෙයුම ගැනය.

"අන්තිම දවස් ටික තමා උඹ ඉන්න. ඊට පස්සේ උඹට කළිසමක් ඇඳගෙන සීගිරි එකේ ඉන්න බෑ."

"උඹ නියම ප්ලෑනක් ගැහුවේ. කවදද මූ නයිටක් අඳින්නේ මචං."

"මම හිතන විදිහට ලබන මන්ඩේ. අපි අඟහරුවාදා විතර ගේම දෙමු. ෆරයිඩේ විතර මම ස්ටොක් එකක් ගන්න ඉන්නේ අලුත් සේල්ස් ෂෙඩූල්

එක හදන්න. එදාට බඩු මාට්ටු. එදාම මම ස්ටාෆ් මීටින් එකක් කෝල් කරනවා. ස්ටාෆ් එකේ දෙන්නෙක්වත් මම දාලා තියෙන්නේ උන් ලස්සනට කියයි එදා රෑ දේවක තමයි ඇතුලේ හිටියේ කියලා කියන්න. බඩුම තමයි උඹට. කට උත්තර නැතිවෙනවා."

"එළ මචං. මුගේ ඔළුව වැඩිවෙලා තියෙන්නේ භාවනා නිසා තමයි."

මිහිරංග දුම්වැටියක් දල්වාගත්තේය.

"මට ඒකිට මොනවත් කියන්න බෑ මචං. මගේ මලනේ."

මිහිරංග කීවේ කෑදර ලෙසිනි.

"කෝ උඹ එහෙම කිව්වට එක දවසක් ඒකීව ඉස්සුවද? බැරිනම් කියපන් මම කෙල්ලව උස්සනවා හරි."

මිහිරංග රවා බැලුවේය. 'හිතන් ඇති අලි පොර කියලා. බලපං මම උඹට තමා ඊට පස්සේ ගේම දෙන්නේ.' මිහිරංග සිතින් කීවේය. 'භාවනා මූව ගණන් ගන්නේ නෑ. නිකං පච වෙනවා' කෝසලද සිතුවේය. නොකිව්වාට කෝසලගේද හිතේ කොණක භාවනා ගැන ඇත. ඊයේ පෙරේදා දවසක කෙල්ල පහළට ආවේ රෑ ඇඳුම පිටිනි. එදා කෝසලද කිවන් එකට ආවේ අයිස් වෝටර් එකක් ගන්නටය. කෙල්ලව දැක කෝසලගේ දෑස් විසාල විය. 'මාරයි. දැක්කත් ඇති මේකීව' ඔහු සිතින් කීවේය.

"මොකද ඩෝ."

"නෑ මචං මුකුත් නෑ."

'මූ භාවනා ගැන මොනවාහරි හිතුවා. ඒකීව එහෙම අතාරින්න

බෑ. හෙට අනිද්දාම එයාටත් ගේමක් දෙනවා. එක පාරක් ඉස්සුවානම් ඇති මෑන්ස්ව.' මිහිරංග සිතුවේය.

"මේ ගේම දෙන දවස් දෙකේ මම හිතන් ඉන්නේ ලෙඩක් අරන් ගෙදරටම වෙලා ඉන්න උඹත් මොකක්හරි කරපන්. සීගිරි එක පැත්ත පළාතේ යන්න එපා."

"ඒක මොකක්ද මචං මාත් ගෙදරටම වෙලා ඉන්නම්."

"නිකං ඇටි කෙහෙල් කාලා වගේ ඒ දවස් ටිකේ ඉන්නත් එපා. ඒ පාර අපිව සැක කරන්නේ නිකං නෝමල් හිටියාම ඇති."

මිහිරංග කියා දුන්නේය.

"ඒක නෙමේ මචං උඹ කැෂියර් එකේ කෑල්ලක් ඉස්සුවා කියලා ආරංචියක් ආවා."

'මූත් දන්නේ නැති දෙයක් නෑනේ වස නොන්ඩිය' මිහිරංග සිතුවේය.

"ඒක වැඩක් නෑ බං හාල් කෑල්ලක්"

"එහෙම දෙයක් කරනකොට කියලා කරපන්කෝ ඩෝ. අපිත් මොනවාහරි කරගන්නවනේ."

කෝසළ කීවේ පෙරේත ලෙසිනි. සීගිරි එකට ආ ලස්සන කෙල්ලෝ කීදෙනෙක්ව මිහිරංග ඉස්සුවාද කියා දන්නේ ඔහුම පමණි.

"උඹ ඇඹලයා වගේ ටෝක දාන්න යන්න එපා. භාවනා ඔක්කොම බලාගෙන ඉන්නේ කෙල්ලෝ ටික ඒකිට පණ."

මිහිරංග කීවේය.

"ඇරත් දැන් උස්සන්න තරම් බඩුවක් සීගිරි එකේ නෑ බං. හිටපු

උන් ඔක්කොම ගියා.”

‘මූ කැමති නෑ මාත් එනවට’ කෝසළ සිතුවේය. ඒත් මේ සිගිරි එක මිහිරංගගේ පමණක් නොවේ. තමාටද ඒ හා සමානම අයිතියක් ඇත. ‘ඉස්සෙල්ලා මේ දේවකයව අයින්කරලා ඉන්නෝන. ඒකට මූ ඕන ඊට පස්සේ බලමුකෝ මූට දෙන ගේමක් ගැන’ කෝසල සිතුවේය.

# 23

"මං අප්පච්චි එහෙනම් නුවරට ටිකක් දුවලා එන්නම්. අක්කට වෙද මහත්තයට පෙන්නලා උදේම එනවා."

දේවක කීවේ දවල් නුවර යන්නට සූදානම් වීය. ජීවන් කොල්ලාගේ මිනිස්කම් ගැන සතුටු විය. නේත්‍රා ගැන ජීවන්ටද දුකය. ඇයට මේ කරදර වෙද්දී ජීවන් උන්නේ නුවරය. ඒ පණිවිඩය ඔහුට කීවේ අර්ජුනය. ඒ වෙලාවේ නේත්‍රාට කතාකර ඇගේ

හිත හදන්නට යමක් කියන්නට ජීවන්ට ඕනා විය. ඒ හැඟිම ඔහු මැඬගත්තේ අමාරුවෙනි.

"ගිහින් එන්න පුංචි මහත්තයෝ එහෙනම්. කොහෙද නවතින්නේ රෑට?"

"මේ භාවනා නංගි අමායා එක බුක්කළා කියලා කතාවක් කිව්වා අප්පච්චි."

ජීවන් සිනාසුනේය. මොනවා හෝ නොවුනොත් පුදුමය.

"ම්. මාළිගාවටත් එයාලව එක්කගෙන යන්න."

"හොඳයි අප්පච්චි. එහෙනම් වේලාසන එන්න. මම රෑට ගන්නම් අප්පච්චිට."

"ම් බුදු සරණයි. පරිස්සමින් ඩ්‍රයිව් කරන්නේ. කාළෙකින් ඩ්‍රයිව් කළේ

නෑනේ”

දේවක ගෙදරට ගොස් නාගෙන ඇඳුම්ද මාරුකරගෙන ආවේය. භාවනාත් නේත්‍රාත් බලාගෙන උන්නේ සීගිරි එකට වීය.

“මං එළියේ මිස් එනවද එහෙනම්.”

කොල්ලා කිව්වේ ඩෙනිමක් ඇඳගෙන සීගිරි එකට ඇතුල්වෙන්නට හොඳ නැති නිසාය.

“මං එන්නම් අක්කිවත් එක්කගෙන”

නේත්‍රා ආවේ කාර් එකේ යතුරද අරගෙනය. පාක් එකේ ඔහු උන්නේ පැහැය ගිය ඩෙනිම් කළිසමට සුදු ටී ෂර්ට් එක ඇඳගෙනය. භාවනා නේත්‍රාගේ රෝද පුටුව තල්ලුකරගෙන එන ගමන් ඔහු දෙස නෙත් පුරා

බැලුවාය. 'අද එක්කෙනෙක්ගේ ලස්සන.' ඇය සිතින් කීවාය. හැමදාම ඔහුව දැක්කේ සුදු අත් දිග කමිසයට ටයි පටිය ඇඳගෙන ඉන්නවාය. ඒත් අද මෙහෙම දකිද්දී වෙනස්ය.

"බබා"

නේත්‍රා කතාකළාය.

"ම්"

"කොල්ලා හරි ලස්සනයිනේ බබා"

නේත්‍රා කීවාය. භාවනා තොල්පට තදකරගත්තාය. අක්කා තමා මෙන් නොවේ. අවංකය.

"කියන්නෙහෙම නෑ මේ පිස්සට. ඒ පාර ඔළුව ගන්නවා."

කෙල්ල කියන්නේ ඒකය. නේත්‍රා සිනාසුනාය. දේවක ආවේ කිට් බෑගය කරේ දමාගෙනමය. සරළ කළු

සෙරප්පු දෙකක් දමාගෙන පුදුමාකාර සැහැල්ලුවකින් ඔහු උන්නේය. දුර ගමනක් යා යුත්තේ මෙහෙමය. නිදහස්වය. කෙල්ල උන්නේද ඩෙනිම් ජීන්ස් එකට සුදුත් කළුත් ටී ෂර්ට් එක ඇඳගෙන පෝනි ටේල් එකක්ද දමාගෙනය. 'හරිම ස්වීට්නේ' දේවක සිතින් කීවේය.

"ඉන්න මිස්. මම හිමිහිට ගන්නම්."

"මට පුළුවන් මහත්තයෝ."

රෝද පුටුවෙන් වාහනයේ පිටුපස අසුනට ආ නේත්‍රා දෙස දේවක බලාගෙන උන්නේ දුක්බරවය. ඇයව කෙසේ හෝ සනීපකළ යුතුමය.

"බබා ඉස්සරහින් නඟින්න"

නේත්‍රා කීවාය. කෙල්ලවත් කොල්ලාවත් එහෙම යවන එක හොඳය. තමා කිව්වත් නොකිව්වත්

කෙල්ල නඟින්නේ ඉස්සර සීට් එකෙන් බව නේත්‍රා දනී. දේවක ආවේ නේත්‍රාගේ රෝද පුටුව ඩිකියෙන් දමාය.

භාවනා ඉදිරිපස අසුනට බරවී ඇගේ කුඩා අත් බෑගය උකුලට ගත්තාය. දේවක රියදුරු අසුනට බරවී බැලුවේ භාවනා දෙසය. 'ඉතින් බලනවා. අක්කත් පිටිපස්සේ.' භාවනා දෙනෙත් බරකරගෙන සිනාබරව සිතුවාය.

"එහෙනම් යන් නේද මිස්"

ඔහු පිටුපස හැරී ඇසුවේය.

"යන් මල්ලියේ"

ඔහු වාහනය ලස්සනට රිවස් කර සීගිරි එකෙන් පිටතට ගත්තේය. භාවනා බලාගෙන උන්නේ මොකක්ද ආශාවකිනි. 'මං හිතුවා එච්චර

හොඳට ඩ්‍රයිව් කරන්න බෑ කියලා’

උදාවී තිබුණේ සුවරබ පැහැබර හවස් යාමයකි. වේලාව හතර පසුවූවා පමණි. මේ වාගේ හවසට නුවර යද්දී ලස්සනය. සුවදායකය. කොල්ලාට තිබූ එකම දුක ඇයව නිදහසේ ටිකක් බලාගන්නට නැති එක විතරය.

“අප්පච්චිට කිව්වද යනවා කියලා.”

භාවනා ඇසුවාය. දේවක හිස වැනුවේය.

“මිස්ලව මාළිගාවටත් එක්කගෙන යන්න කියලා කිව්වා.”

දේවක කීවේය. මේ ළඟින් ළඟින් එන මල් සුවඳ එන්නේ කෙල්ල ළඟින් බව දේවක තේරුම් ගත්තේ ටික දුරක් ගියපසුවය. ‘අපි දෙන්නා

මෙහෙම ෆරන්ට් සීට් එකේ යද්දීත් මොකක්ද වගේ. එයත් මොනවද හිත හිත හිනාවෙනවා තනියම' භාවනා හොරැහින් දේවක දෙස බලා සිතුවාය.

"මෙඩිකල් රිපෝට් ටිකයි එක්ස්රේ ටිකයි ගත්තා නේද මිස්"

දේවක ඇසුවේය.

"මං ඔක්කොම ගත්තා දේවක අයියේ."

ඒ ෆයිල් සියල්ලම අද භාවනා තෝරාගත්තාය.

"අපිට මිස් මෙහෙම විසි තිස් පාරක් එන්න වෙයි හැබැයි. එහෙමනේ ආයුර්වේද ට්‍රීට්මන්ට් කරද්දී."

දේවක කීවේය.

"මං දන්නවා මල්ලි"

"නුවර නතරවෙලාහරි කමක්නෑ මේක කරගන්නෝන."

භාවනා කීවාය.

"ඒකත් මරු වැඩේ ඉතින්."

"මොකක්ද?"

"නෑ මිස් මම කිව්වේ නුවර නතරවෙලා ට්‍රීට්මන්ට් කරන එක."

භාවනා තොල්පට තදකරගෙන පිටුපස හැරී සිනාසුනාය.

"අක්කගේ එහෙම ලොකු විශ්වාසයක් නෑ දේවක අයියේ. මගේ අපි දෙන්නා බලකරන නිසා එන්නේ."

භාවනා කීවාය.

"සනීපවෙනවා කියලා හිතලම ට්‍රීට්මන්ට් ටික කරමු මිස්."

නේත්‍රා හිස වැනුවාය.

"ගෙදරට දුවපු ඉක්මනට නෑවා නේ"

භාවනා ඇසුවාය. නේත්‍රා පිටුපස සිට තොල්පට තදකරගත්තාය. කෙල්ල කොල්ලාගේ ජීවිතය අස්සටම යනවා කියා ඇයට සිතුණි. එහෙම යන්න ආසා නැත්තේ මොන කෙල්ලද?

"අපේ පොඩි ගේ තියෙන්නේ මිස් අතුරුගිරිය වෙල්යාය කෙළවරේ. මෙහෙම පාර මෙහෙම ගේ මෙහෙම කුඹුරු යාය."

"ම්."

"ගේ පිටිපස්සේ තියෙනවා ෂෝක් ළිඳක්. කූඹුර අයිනෙම වගේ. අලුත්ම වතුර තියෙන්නේ. ගොඩක් වෙලාවට මිස් වතුර උතුරනවා. එච්චර ගැඹුරු නෑ. ඒත් නිල් කැටේට වතුර."

"හා ෂෝක්නේ"

"ඉතින් ඇඟ හෝදගන්න ගියත්

නාන්නමයි හිත. දැණුත් එහෙමයි."

දේවක කීවේය.

"දවසක යන්නෝන නේද අක්කේ."

භාවනා කීවාය.

"ඒකනේ සුද්දි"

"මං මිස්ලට කියන්නම්. ළිඳෙන් නාලා බත් ටිකක් කාලා එහෙම එන්න පුළුවන්"

'ඒත් දැන්මම බෑ. එහෙම ආවාම ඔයාලා මගේ අප්පච්චිව දකිනවා මගේ රහස් ඔක්කොම එළිවෙනවා' දේවක සිතුවේය.

"එන්න ඉතින් ආරාධනා කරන්න එපැයි. බලමුකෝ අපිට කියයිද කියලා"

දේවක සිනාසුනේය. එහෙම කියූ විට ඔහු ආරාධනා කරන බව භාවනා දනී.

"මං කියනවා මිස්"

"ළිඳෙන් නානවානම් සුද්දිට ඉතින් දිය රෙද්දක් අඳින්න වෙනවා. නේද මල්ලි."

කොල්ලා තත්පරයක් තුළ මවාගත්තේය. හිතට නිකං සීතල සුළං පාරක් වැදුනා සේය. 'එයා මම දිය රෙද්දක් ඇඳන් ඉන්නවා මවාග න්නත් ඇති' ඇයට සිතුණි.

"මිස්ට පුරුදුත් නැතුව ඇති මිස්."

"මං ඔයාගේ ෂෝට්ක් ඇඳන් නානවා. එහෙමත් පුළුවන්නේ."

දේවක හිස වැනුවේය. මේ හැන්දෑවේ සිතට දැනෙන සැනසීම කුමක්ද කියා භාවනාම දන්නේ නැත. හරියට අෑත ආකාසයේ පාවෙන්නාක් වැනිය.

"අක්කේ."

"සුද්දි"

"මේ සීට් එකේ යනකොට ජොලිනේ අනේ හොඳට හැමදේම පේනවත් එක්ක. ඔතන යද්දී හිරවෙලා වගේනේ."

භාවනා කීවාය.

"මේ තාත්ති එක්ක ගියාට පස්සේ ගියාමයි"

කෙල්ල කියන්නේ ඇත්තය. රියදුරු සමඟ ගමනක් යද්දි භාවනා යන්නේ පිටුපස අසුනේය.

"ඔය සීට් එකේ ඉතින් මහත්තයා එක්ක යද්දී යන්න පුළුවන්නේ."

නේත්‍රා කීවාය. භාවනාට බැලුනේ දේවක දෙසය. 'මහත්තයා එක්ක යන්න පුළුවන් කිව්වාම ඔයා ඇයි මගේ දිහා බලන්නේ' දේවක සිතුවේය.

"ඒකට ඉතින් තව ඉන්න එපැයි අනේ"

"එහෙනම් කොල්ලෙක් එක්ක යන්න නේද මල්ලි"

නේත්‍රා කීවාය.

"කොල්ලා හප්පගන්නවා මිස්"

දේවක එහෙමම කීවේය. භාවනා පමණක් නොව නේත්‍රාද පුදුමයෙන් බැලුවෝය.

"ඇයි ඒ. ඇක්සිඩන්ට් කරගන්නේ"

භාවනා ඇසුවාය.

"ඩ්‍රයිවින් කරන එක සන්සුන් මනසකින් භාවනාවක් වගේ කරන්න ඕන දෙයක්නේ මිස්"

"ඉතින් මම මෙතන හිටියාම මොකෝ"

කෙල්ල ඇසුවාය.

"මිස් මෙතන රෝසමල වගේ

හිටියාම කොල්ලා කොහොමද මිස් සන්සුන් මනසකින් මේක එළවන්නේ. ඉතින් ෂුවර් එකටම හප්පගන්නවා. බලන්නකෝ මං කියන්නේ බොරුද කියලා. අපිත් ඉන්නවනේ සීගිරි එකේ"

භාවනා අත මිට මොළවා ගියරය මත තිබූ දේවකගේ වමතට ගැසුවාය. දේවක සිනාසුනේ ඉදිරිය බලාගෙනය. 'නොම්මර එකේ පිස්සෙක් මේ' ඇය සිනාබරව මොකක්ද විළිමින් සිතුවාය.

නේත්‍රා කතාවට තනිවම සිනාසුනාය. මේ සුන්දරත්වයට ඇය ආශාකළාය. යොවුන් විය කියන්නේ ඒකටය.

"ඉස්සරහින් නවත්තන්නකෝ. මම යනවා පිටිපස්සට. කියන කෙනාටත්

සන්සුන් මනසකින් ඩ්‍රයිව්කරන්න බැරුව ඇතිනේ නේද?"

භාවනා කීවාය.

"නෑ මේ මම කිව්වේ මිස්ගේ බෝයි ෆ්‍රෙන්ඩ්ට."

කොල්ලා කීවේය. 'මාව කොටුවුණා' ඇය සිතින් කීවාය.

"එච්චරම පිස්සෙක්ව මම බඳින්නේ නෑ. ඒ පාර පාරේ යන කෙල්ලොත් දැකලා මෙයා පිස්සු වැටෙයි."

ඇය කීවාය.

"කොල්ලෙක් මිස්"

"ම්"

"හරියටම කෙල්ලෙක්ට පිස්සු වැටුනොත්. ආයේ ගෑනු ළමයෙක් දිහා නෙමේ. ගෑණු ඇඳුමක් දිහාවත් බලන්නේ නෑ"

දේවක කීවේය. භාවනාගේ පපුවත් එක්ක හිරවිය.

"එහෙම කොල්ලෝ අද නෑනේද අක්කා"

භාවනා නේත්‍රාගෙන් උදව් ඉල්ලුවාය. 'එයත් හිනාවෙන්නේ මෙයාගේ පැත්තට'

"ඉන්නවත් ඇති සුදූ"

නේත්‍රා කීවාය. හොඳ කෙනෙක් තමාට හමුනොවූ පළිවට එහෙම අය නෑ කියා සිතන්නට නේත්‍රාගේ සිත ඇයට ඉඩදෙන්නේ නැත.

"අන්න දැක්කද මිස්ට තේරෙනවා. බයවෙන්න එපා මිස්ට එහෙම කෙනෙක් ලැබෙයි. අපි එදාට සතියක් සීගිරි එකෙන් නිවාඩු අරන් වෙඩින් එකේ වැඩ කරනවා."

දේවක කීවේය. මොකක්ද

හේතුවක් නිසා භාවනාගේ මුව ගොළුවිය. ඉන්පසු සෑහෙන දුරක් යනතෙක් කෙල්ල කතාකළේ නැත. එක් මොහොතක ඇය යටැසින් මෙන් දේවක දෙස බැලුවේය. 'මොකද මට වුනේ මේ' ඇයම දන්නේ නැත.

"මිස්ලා හවස තේ බිව්වද?"

දේවක ඇසුවේ බැලුම්මහරින් නුවර පාරට දමද්දීය.

"නෑ දේවක මේ කෙල්ල කිව්නේ මඟින් බොමු කියලා."

ඇය යන්තමට සිනාසුනාය. දේවක සමාව ඉල්ලන බැල්මක් හෙළුවේය.

"අපි තව ටිකක් ඉස්සරට ගිහින්ම තේ බොමු නේද මිස්."

දේවක කරුණාවෙන් ඇසුවේය.

"ම්. මොනවාහරි කන්නත් ඕන.

කෑවෙත් නෑ හරියට දවල්ට.”

භාවනා කීවාය.

“කමු. මඟ දිගට කකා යන්නත් මොනවාහරි ගන්න පුළුවන්නේ.”

ඇය සිනාසුනේ මිහිරි ලෙසය. ‘ඔහොම හිනාවෙනකොට තමයි හිතේ සමාධිය නැතිවෙන්නේ. මේ දැන් හාට් ඇටෑක් එකක් එන්න වගේ’ දේවක සිතුවේය. එකවරම නුවර පාර අයිනේ නවත්වා තිබූ බයිසිකලයක් හදිස්සියේම පාරට දැම්මේය.

“ඔන්න”

දේවක අමාරුවෙන් මේ පැත්තට කැපුවේය. එහෙම හිතෙන හිතෙන හැටියට කපන්න ඉඩක් නුවර පාරේ නැත. ඒත් කොල්ලා අමාරුවෙන් බයිසිකලයත් වාහනයත් දෙකම බේරාගත්තේය.

"පිස්සෙක් කොහෙද යන. හැප්පුනානම්. මෙතන අපිටත් නිට්ටඹුව පොලීසියේ ඉන්න වෙනවා."

දේවක බැන්නේය. භාවනා අතකින් මුව තදකරගෙන සිනාසුනාය. නේත්‍රාද සිනාසුනාය. ඒත් ඇයි කියා කිව්වේ නැත. 'ඔයාගේ සිහිය දැන්මම නොසන්සුන්වෙලාද කියලා තමයි අහන්න ඕන' භාවනා කට හැදුවාය. නමුත් ඇසුවේ නැත. 'අහන්න යන දේ මම දන්නවා' දේවක සුසුමක් හෙලා ළය සැහැල්ලු කරගෙන සිතුවේය.

"අපි හිම්හිට යන්. හදිස්සියක් නෑනේ"

"මගේ වරද නෙමේනේ මිස් ඒ පිස්සනේ දැම්මේ"

දේවක අසරණව කීවේය.

"හරි ඉතින්. යන කෙනත් සිහියෙන් යන්නෝනනේ"

කෙල්ල ඇඟට පතට නොදැනී කීවාය. නේත්‍රා උඩුතොළ හපාගෙන පාර දෙස බලාගෙන ගියාය. දේවකගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආවේය. එය තිබුනේ කාර් එකේ ගියරය අසළ මැද කොටසේය.

"ඩ්‍රයිව් කරන ගමන් ආන්සර් කරන්න එපා. මම බලන්නම්."

'අප්පච්චිද දන්නෙත් නෑ' කොල්ලා අසරණව සිතුවේය. භාවනා දේවකගේ දුරකථනය අතට ගත්තාය.

"අප්පච්චි කතාකරන්නේ. මම ගන්නද?"

භාවනා ඇසුවාය. දේවකට කියන්නට දෙයක් නැත.

"මං ඩ්‍රයිව් කරනවා කියන්න

මිස්. ඉස්සරහින් ගනී කියන්නකෝ එහෙනම්."

කෙල්ල ඇමතුම සම්බන්ධකරගත්තේ ආසාවෙනි. ඒ ආසාව කුමක්ද කියා ඇයම දන්නේ නැත.

"හෙලෝ."

භාවනා කතාකළාය. මේ තමාගේ ඇමතුමට කතාකළේ කවුදැයි ජීවන් නිකමට මෙන් අනුමාන කළාය. 'මිලින්දගේ පොඩි කෙල්ල. පව්' ඔහු සිතුවේ දරුැ සෙනෙහසින් පිරීගිය සිතිනි.

"දූ අපේ පුතා ළඟ ඉන්නවද?"

ජීවන් ඇසුවේ ආදරයෙනි. 'ඔයාගේ අප්පච්චි හරි කරුණාවයි.' භාවනා සිතුවාය.

"ආ ඔව් අප්පච්චි මේ දේවක

අයියා ඩ්‍රයිව් කරනවා. මායි කිව්වේ ඩ්‍රයිව් කරන ගමන් ආන්සර් කරන්න එපා කියලා.”

භාවනා කීවාය. දේවක සිනාසුනේය. ‘අප්පච්චිටත් ආස ඇති මේක කතාකරන විදිහට’ දේවක සිතුවේය.

“ඒක හොඳයි පොඩි දූ. ඔය වාහනයන් අතට ගත්තේ සෑහෙන කාලෙකින්. වෙලාවකට කිසිම පරිස්සමක් නෑ.”

ජීවන් කීවේය.

“සහතික ඇත්ත අප්පච්චි. මේ දැනුත් හප්පගන්න ගියා.”

භාවනා කීවාය. දේවක පසුපස හැරී නේත්‍රා සමඟ සිනාසුනාය. මේ කතාකරන්නේ කවුද කියා නේත්‍රා දන්නවානම් ඇය පුදුම වෙනු ඇත.

"ඒකනේ. මං නිකං ගත්තේ පොඩි දූ. නැවත්තුවාම ගන්න කියන්නකෝ. ඔය දැන් කොයි හරියෙද?"

ඔහු ඇසුවේය.

"මේ අප්පච්චි නිට්ටඹුව පහුවුණා විතරයි. මං දේවක අයියට කියන්නම් ගන්න කියලා."

"එහෙනම් පරිස්සමින් යන්න පොඩි දූ. මං තියන්නම්. තෙරුවන් සරණයි."

ජීවන් කීවේය.

"හා අප්පච්චි. බුදු සරණයි."

භාවනා දුරකථනය තබා දේවක දෙස බැලුවේ මහා හපන්කමක් කළ දැරිවියක් ලෙසිනි.

"දේවක අයියගේ අප්පච්චි හරිම හොඳයි. හරි කරුණාවයි."

ඇය කීවාය. 'අප්පච්චි ඔයාව

අඳුනගෙන කතාකළේ’ දේවක ඒ බව දනී.

“මං මිස්ලා දෙන්නා ගැන කියලනේ තියෙන්නේ.”

“අප්පච්චි කියන්නේ ඇත්ත වෙලාවකට කිසි පරිස්සමක් නෑලු,”

“අප්පච්චි මං ගැන දන්නවා.”

ඔහු කීවේ දැඟකාර ලෙසිනි. ඇය රැව්වාය.

“අප්පච්චියි පුතයි ඉතින් තනියම උයාගෙන පිහාගෙන ජීවත්වෙනවා. හරි පව්.”

භාවනා කීවාය. නේත්‍රාටද දුකය.

“ඒකේ දුකක් කියලත් නෑ මිස්. එහෙමට කියලා සැපකුත් නෑ. ජීවිතේ අල්ලගෙන යනවා.”

දේවක කීවේය.

“දවසක ඉතින් දේවක මැරිකරපු

කාළෙකට අප්පච්චිට සැනසීමක් දැනෙයි. එයාවත් ළඟම තියාගන්න."

නේත්‍රා කීවාය. දේවක හිස වැනුවේ මොකක්ද දුකක් පපුවේ සඟවාගෙන මෙන්ය. ඔහුගේ දෙතොල් යන්තමට මෑත්වී යළිත් දෙපසට බරවිය. භාවනා ඔහු දෙස බලා පසුව පසුපස හැරී අක්කා දෙස බලාගෙන උන්නාය.

"ජීවිතේ ගොඩක් ලොකූ බලාපොරොත්තු කියලා නෑ මිස්. මේක අල්ලගෙන යනවා. මට ලොකු ලැබීමක් තියෙනවා කියලා මම විශ්වාස කරන්නේ නෑ. ගොඩක් දේවල් මේ ලැබෙන්න ගිහින් මේ නොලැබී ගිහින් තියෙනවා. ඩයලොග් එකේ ඒරියා මැනේජර් පෝස්ට් එකක් මේ අතට ඇවිත් මේ

නැතිවෙලා ගියා. කැන්ඩිවල ගාමන්ට් ෆැක්ටරියක මාකටින් මැනේජර් පෝස්ට් එකක් ඇවිත් අපොයිමන්ට් ලෙටර් එකත් දුන්නට පස්සේ එයාලා කිව්වා ඒක කැන්සල් කරන්න වෙනවා කියලා. එහෙමයි."

දේවකගේ හඬේ තිබුනේ මොකක්ද දුක්බර ස්වභාවයකි. කුඩා වියේදීම අම්මා නැතිවූ දරුවන් ජීවිතය ගැන සිතන්නේ මොකක්ද තෙතබරිත හැඟීමකිනි. දරුවෙක්ගේ ආත්ම ශක්තියේ පහන අම්මාය.

"එහෙම හිතන්න එපා. කවදාවත් සීගිරි එකෙන් එහෙම දෙයක් වෙන්නේ නෑ."

භාවනා සංවේගයෙන් කීවාය.

"අලුතෙන් හුස්මක් ගත්තේ සීගිරි එකට ඇවිත් මිස්."

"ඒ ගත්ත හුස්ම අල්ලගෙනම ඉන්ඩ. නේද අක්කා."

"මල්ලිට වරදින්නේ නෑ. ජීවිතේ ගැන නරකටම හිතන්න ඔයාට තාම වයසක් නෑ."

දේවක හිස වැනුවේය.

නුවර පාරට බැසයන හිරුගේ අවසන් රැස් දහරාව යන්තමට වැටී තිබුණි. භාවනා මොකක්දෝ සෝබර හැඟීමකින් දේවක දෙස බැලුවාය. ඊටත් පසු ඇය ඒ හැඟීමෙන්ම තමා ගැනද සිතුවාය.

"තේ ටිකක් බීලා යන්."

භාවනා මෘදුව කීවාය.

# 24

කඩුගන්නාවේදී දේවක වාහනය නතරකළේ භාවනාගේ ඉල්ලීමටය. එකක් මේ හරියේ පරිසරය වෙනස්ය. මොකක්ද වැහිබර මන්දාරමක් සමඟ මුසුවූ කඳුකර හැන්දෑවක අසිරියක් අවට තිබුණි. අනික දේවක එක දිගටම පදවාගෙන ආ නිසාය.

"මහන්සියිනේ."

ඈය ඇසුවාය. බැසයන ඉරේ තද රතු කාරයේ පැති

වීදුරුවෙන් එබී යුවතියගේ මුහුණ මත අමුතුම අසිරිමත් සිතුවමක් ඇඳ තිබුණි. රාස්සියේ අව්වේ ඒ රන් පැහැගත් බව ඇයගේ ගැහැණුකම කපා පෙන්වූවාට සැකයක් නැත. අවුල්ව ගිය කෙටි වරළසින් මිදුණු කෙහෙරැලි පොදක් මුහුණට කරදර කරමින් උන්නේය. බලා ඉන්නා කෙනෙක්ට බලාගෙ නම ඉන්නට හිතෙනවා විනා දෑස් ගන්නට හිතෙන්නේ නැත. ඒ නිසාම දේවක නොබලා ඉන්නට හැදුවේය. ඇස්වලට මේ ලෝබකම ඇබ්බැහිව ඇත.

"මේ හරිය ෂෝක්."

ඇය කීවාය. දේවක කාරය නැවැත්වීය. කඩුගන්නාව මංසන්ධිය දෙපස වූ කඩ කෑලිවල විදුලි පහන්

දල්වා තිබුණේ කළුවර නිසාම නොවේ. එහෙම දැල්වූ විට එන වෙනස්ම කඩ අසිරිය මේ පාරේ යන ගනුදෙනුකරුවෙන් අද්දාගන්නා සැරසිල්ලක් ලෙසින්ය.

"බහිමු මිස් මම අල්ලන්නම්."

දේවක පසුපස දොර ඇර නේත්‍රාගෙන් ඇසුවේය.

"අනේ මම මෙහෙම ඉන්නම් මල්ලියේ පාරේ බෑවුම."

නේත්‍රා කීවාය. මොකක්ද දුකක් නිසා දේවක වාහනයේ දොර වැසුවේ නැත. නේත්‍රාට දුකය.

"ඔහොම කයියක් දාගෙන ඉන්න අක්කත් එක්ක මම තේ ටිකකුයි තල ගුලි ටිකකුයි අරන් එන්නම්."

දේවක කීවේය.

"බබත් යන්න කමක් නෑ. මම මේ

කඳු දිහා බලාගෙන ඉන්න ආසයි.”

නේත්‍රා කඳු පැත්තට රෑටමින් පැමිණ කීවාය.

“යන් එහෙනම් මිස්.”

“වාහන යනවා සුද්දි පරිස්සමින්.”

ඇය බැලුවාය. දේවකද බැලුවේය. කඩුගන්නාව පාස්කරමින් යන වාහන වැඩිය. ඇරත් මේ සිකුරාදා හවසය. අද කට්ටිය කොළඹ සිට නුවර එනවා වැඩිය.

“එන්න.”

දේවක අත පෑවේය. භාවනාට බැලුනේ අත දෙසය. පසුව ඇගේ දෑස් එසවිණ. ‘ලේසියෙන් මම අත දෙන්න හිතාගෙන ඉන්න කෙල්ලෙක් නෙමේ හරිද?’ ඇගේ ඇස්වල වූයේ එවන් කතාවකි.

භාවනා අත පෑවාය. දේවකගේ

දකුණතට ඇගේ වමත පැටලිණ. ඒ පැත්තම හිරිවැටී ගියාක් මෙන්ය. ‘ඉඳලා ඉඳලා කොල්ලෙක් අතින් ඇල්ලුවේ කඩුගන්නාවේදී. ඒක මතක තියාගන්න වෙයි’ භාවනා ඇගේ දුප්පත් ජීවන සමරු පොත මත මේ හැන්දෑව ගැන ලියාගත්තාය. එය විශේෂ සැන්දෑවක් විය. කෙනෙක් අතින් අල්ලාගැනීම එකකි. එහෙම අල්ලාගත් අත හිතාමතාම අල්ලාග ැනීම තවත් එකකි. එහි තේරුම ඒ රැකවරණය අනුමත කිරීමකි. එසේ වන්නටනම් පැටලුණ අත ඇඟිලිවලින් තදකරගත යුතුය. නොවේනම් ඇඟිලිකරු අතර ලොක්කර ගතයුතුය.

කඩුගන්නාව පාර පැන්න පසුත් ටික වෙලාවක් දෑත් එකට පැටලී තිබුණි. දේවක ඇගේ වමත

මුද්‍රාහැරියේ මෘදුවය. ඇය බිම බලාගත්වනම උන්නාය. ඇස්වල හොර පැහැයක් විය. තලගුලි ටික ගෙන දේවක තේ ගෙනෙන ලෙස පැවසුවේය. එහෙම කර හරි ඉක්මනින් යළිත් කාරය වෙත එන්නට පාර පනින්නට ආවේ ඇගේ අත අල්ලාගැනීමේ හදිස්සිය නිසාද? දේවක තමාගේම සිතට සිනාසුනේය.

නේත්‍රා දෙන්නා අත් අල්ලාගෙන එන හැටි දැක්කාය. මේ අපූරු හැන්දෑවේ සිත පුරා එක් පැහැදිළි සිතුවමත් ඇඳිණ. නේත්‍රා ඒ සිතුවම රස වින්ඳාය.

"අහසම ලා රෝස පාට වෙලා."

භාවනා නේත්‍රා ඉඳගෙන උන් පසුපස ආසනයේ කොණක ඉඳගෙ නම කීවාය. වාහනයේ දොර

ඇරගෙන මෙහෙම කඩුගන්නාවේ කඳු දෙස බලාගෙන ඉන්නා එකත් වෙනම භාවනාවකි. දේවකද එදෙස බලාගෙන උන්නේය. භාවනා ඇගේ ජංගම දුරකථනයේ කැමරාව ඔන් කරගත්තාය. මේ ඇඳිරි වැටුණ හැන්දෑවේ ඡායාරූපයක් ගන්නට තරම් ආලෝකයක් නැත. එහෙත් යන්තම් ඡායාවක් සටහන් වෙයි.

"ලයිට් එක මදි."

"අපි හෙට ගමු මිස්."

"ම්. ගන්නෝන."

ඔහුත් සමඟ එකට ඉඳ ෆොටෝ එකක් ගෙන බලන්නට ඇයට ආසය. 'දවසක් මම වීදුරුවෙන් අපි දෙන්නව දැක්කා.'

දේවක තල ගුලිය එතූ සව් කොළය ගලවා භාවනාට දුන්නේය.

පසුව තේ එකක්ද දුන්නාය. මේ වගේ තරමක් සීතලක් ඇති හැන්දෑවක මෙහෙම තේ එකක් රසය.

"මේ වගේ තේ දෙකක් බොන්න පුළුවන්."

භාවනා කීවාය.

"මං තව තේ එකක් ගේන්නම්."

"එප්පා. මම නිකමට කිව්වේ. රස නිසා."

තලගුලිය මැද හැපෙන හකුරු කෑලි මෙන් මොකක්ද මිහිරක් සිතට දැනෙයි. ඒ මිහිර හිතේ සඟවාගෙන යන්නට ඇත්නම් කියා ඇයට සිතෙයි. ඒ ආගන්තුක මිහිර කුමක්ද?? හදවත විසින් මෙකෙක් හඳුනාගොගන්නා ලද ඒ මිහිර විසින් මේ හැන්දෑවේ මුවද ගොළුකර ඇත.

"අද ඔන්න රෑ වෙනකල් ඇහැරලා

ඉන්නෝන. මහන්සියි කියලා කට්ටියම නිදාගනීද දන්නේ නෑ. එහෙම බෑ."

භාවනා වේලාසනම කීවාය. දේවක වාහනය යළිත් පණ ගැන්වූයේ සිනාබරවය.

"කෝපි හතර පහක් බිබී ඉමු මිස්."

ඔහුද කීවේය. දැන් නුවර පාරට හොඳටම අඳුර වැටී ඇත. මේ වාගේ ඇඳිරි වැටුණ හවසක නුවර පාරේ යාම වෙනස්ම අත්දැකීමකි. නුවර පාරේ පමණක් නොව ඕනම ආගන්තුක මාවතක රෑක යද්දී දැනෙන්නේ වෙනස් අසිරියකි. භාවනා ඒ අසිරිය හදවතින්ම වින්ඳාය. එයට යටින් මොකක්ද රහසිගත සතුටක්ද තබාගෙන රස වින්ඳාය. ජීවිතයේ අත්විඳින බොහෝ දේ මෙන් මේ

දැනෙන හැඟීමද පහදාගන්නට ඇයට තේරුමක් නැත. එහෙත් වෙනස් අසිරි සිරියක් ළයට දැනෙයි. ඒ හැඟීම් හදවතට දරාගෙන ඉන්නට බැරිම තැනකදී ඇයගේ දෑස් එසවෙයි. ඒවා ගොස් නතරවෙන්නේ දේවකගේ මුහුණ මතය.

"මේ දේවක අයියේ."

ඇය අසන්නේ මේ පසුවෙන නගරය කුමක්ද කියා දැනගන්නටය.

"මේ පිළිමතලාව. තව පැය කාලකින් අපි පේරාදෙණියේ."

ඔහු කීවේය. දැන් ඇයගේ මුහුණ පෙනෙන්නේ නුවර පාරේ යන වාහනවල පහන් එළිය අතරිනි. යන්තම් ෆ්ලෝරසන්ට් පැහැ ගැන්වී ගිය ඒ මුහුණ මත ලියවී ඇත්තේ සැනසුම් සහගත සතුටක්යැයි දේවක

සිතුවේය.

"අමායා එක තියෙන්නේ පේරාදෙණියෙද කැන්ඩිවලද?"

භාවනා ඇසුවාය. අද රෑ නවතින්නට සිතුවේ එහිය.

"අමායා එක තියෙන්නේ හීරස්සගල පාරේ මිස්. පේරාදෙණියෙන් හැරිලා යන්න ඕන ටිකක්. ලස්සන පාර හන්තානෙන් කෙළවර වෙන්නේ."

"අපි අද රෑ කැන්ඩි යන්නේ නෑ එතකොට."

"ඕනනම් යන්න පුළුවන් මම හිතුවේ උදේ යන්න පාන්දරම."

"එහෙම කරමු නඩේ ගුරා කියන විදිහට ඉන්නෝනනේ."

ඇය මිහිරි ලෙස සිනාසී කීවාය.

"අද යන ගමන් ගැටඹේ පන්සලට

පඬුරක් දාගෙන යන්."

"ම්."

කොහොමත් ආවේ මාළිගාවට බාරයක් වෙන්නත් හිතාගෙනය. බාරේ මොකක්ද කියා තවම තමාවත් සිතාගෙන නැතැයි භාවනා සිතුවාය. සමහර බාර එහෙමය. එහෙම වචනයෙන් මේ යැයි කියන්නට බැරි හේතුවලටත් බාරවෙන අවස්ථා ඇත. මේත් එහෙම අවස්ථාවකි.

නුවරට ටික ටික කිට්ටු වෙද්දි නේත්‍රාට සිහිවූයේ නර්මදා නැන්දාවය. නැන්දාගේ මරණයෙන් පසු ජීවන් මාමා ඔහුගේ පුතාවද රැගෙන ආවේ මේ මහනුවරටය. ඒ ගැන යන්තම් මතකයක් නේත්‍රාගේ සිතේ ඇත. 'ජීවන් මාමයි කොල්ලයි හැංගිලාම ගියා සීයා අදටත්

ඒ ගැන හිතලා දුක්වෙනවා. කොල්ලත් අපිත් එක්ක හැදුණානම් අද වෙද්දී මිහිරංගලාගේ වයසේ. පව් කොහේ ඉන්නවද මොනවා කරනවද කියලා දන්නේ නෑ.' නේත්‍රාගේ සිතට මොකක්ද අමිහිරි දුකක් දැනුණි. 'අපි හැමෝම සීගිරි එකේ ප්‍රතිලාභ ගන්නවා. ඒ අයිතිය කොල්ලටත් තියෙනවා. ඒත් ජීවන් මාමයි කොල්ලයි මොන දුකක් විඳිනවා ඇත්ද? දකින්නවත් නෑ. නර්මදා නැන්දාගේ පින්තූරේ දකින හැම වෙලාවකම මට ජීවන් මාමව මතක්වෙනවා. යන්තමට වගේ මගේ හිතේ එයාගේ රූපේ ඇඳිලා තියෙන්නේ.'

"ඇයි අක්කා."

නේත්‍රාගේ සුසුම් හඬක් ඇසී

පසුපස හැරී භාවනා ඇසුවාය.

"න්නෑ බබා."

"කියන්නකෝ. ඇයි කියලා."

නේත්‍රා සිනාසුනාය.

"මට අපේ නෑ කෙනෙක්ව මතක්වුණා බබා."

ඇය කීවාය.

"කවුද?"

"ජීවන් මාමාව"

නේත්‍රා කීවාය. දේවකව ගැස්සිණ. 'දෙයියනේ නේත්‍රා අක්කා මේ කියන්නේ අප්පච්චි ගැන එයාට මේ වෙලාවේ ඇයි අප්පච්චිව මතක්වුනේ' දේවක සිතුවේ වෙව්ලන සිතිනි.

"ජීවන් මාමා. මේ නර්මදා නැන්දගේ."

භාවනා ඒ නම අසා ඇත්තේ

යන්තමටය.

"මී. නැන්දා නැතිවුණාට පස්සේ ජීවන් මාමයි ඒ මල්ලිවයි අරගෙන නුවර ආවා ඊට පස්සේ එයාලා දෙන්නා ගැන ආරංචියක් නෑ බබා. පව්. ඒ මල්ලි දැන් ලොකුත් ඇති. මං වඩාගෙනත් තියෙනවා කොල්ලව."

දේවකගේ දෑස් තෙත්විය. ඔහු අමාරුවෙන් දෑස් පාදාගත්තේය. 'අනේ දෙයියනේ මේ මොකද වෙන්නේ.'

"පව් තමයි. හිටියනම් අපිත් එක්ක සීගිරි එකේ වැඩකරනවානේ."

"මී.එයාටත් මේවා අයිතියි. කාටවත් ඒ අයිතිය නැතිකරන්න බෑ. මේ සීගිරි එකට වැඩියෙන්ම මහන්සිවුනේ නර්මදා නැන්දයි තාත්තයි. එහෙම නැන්දගේ

කොල්ලට සීගිරි එකේ අයිතියක් නෑ. ඒ වෙනුවෙන් කිසිම ඉල්ලීමක් කළේ නැති නැන්දලා දෙන්නගේ කොල්ලෝ දෙන්නා මෙතන මේකේ තනි අයිතිකාරයෝ වගේ වැඩ."

නේත්‍රා කතාකළේ වේදනාවෙනි. 'ඔයා හරි හොඳ කෙනෙක් අක්කේ. දුප්පත් මගේ අයිතිය වෙනුවෙන් ඔයා මේ කතාකරන්නේ ඒ නර්මදා නැන්දාගේ එකම පුතා මම කියලා ඔයා දන්නවානම්' දේවක සිතුවේය.

"හිටියනම් අපිත් එක්ක වැඩකරයි. එයාලා තාම නුවරද අක්කේ."

"දෙයියෝ තමා දන්නේ බබා. ජීවන් මාමා ගියේ නුවරට එයාගේ ගම නුවර. එයා කවදාවත් ආවේ නෑ අපි ගාවට. ඇවිත් පිළිගන්නේ නෑ කියලා දන්න නිසා වෙන්න ඇති. මේ

පවුල එයාට ලොකු ආසාධාරණයක් කළා."

දේවක යටිතොල හපාගත්තේ දැන් දැන් තමාට යමක් කියවෙතැයි සිතාගෙන මෙන්ය.

"අපි පේරාදෙණියට ආවා මිස්."

පේරාදෙණිය හන්දියේදී දේවක කීවේ ගොරෝද හඬකිනි. භාවනා දේවක දෙස බැලුවේ ඔහුගේ හඬේ වූ අමුත්ත දැනීය.

"ඒ සී ෆුල්නේ. නහය බරවෙලා නේද? අඩුකරන්නකෝ."

ඇය කීවාය.

"එළියෙත් සීතලයි තමා මිස්"

දේවක වායු සමීකරණය අඩුකරමින් කීවේය. භාවනාගේ ඇස් දේවකගේ මුහුණ මතම නතරවිය. 'ඇයි එකපාරම අමුතුවෙලා ඔයා.'

එය සිතන්නට වෙලාවක් නොවූවේ ගැටඹේ පන්සල ළඟ දේවක වාහනය නතරකළ නිසාය.

"අපි පඬුරක් දාලා යන්. මිසුත් බහිමු. එන්න. ඔයාගේ අත්දෙකින්ම පඬුරක් දාන්නෝන."

දේවක කීවේය. නේත්‍රා සිනාසුනාය.

# 25

එය නුවර පේරාදෙණියට තරමක් සීතලක් ගෙන ආ රැයක් විය. වාහනය අමායා හිල්ස් හෝටලයේ නතරකරද්දීම හවස හතහමාරය. එහෙම රෑ වෙන එක හොඳයි කියා භාවනාටනම් සිතුණි. ප්‍රියයන් සමඟ සිටිද්දී වෙලාව ප්‍රශ්නයක් නොවේ.

දේවක නේත්‍රාව ඔසවා මෙන් රෝද පුටුව මත තැබුවාය. ඇය ඔහුගේ බාහුවක් අල්ලාගෙනම

බැලුවාය. 'තව මල්ලිලා දෙන්නෙක් ඉන්නවා. ආසාවට රෝද පුටුවවත් කරකවලා නෑ. ඒකට මේකා' ඇය සිතුවාය. භාවනා සිතුවේද එයමය.

"තාත්ති දවසක් එහෙම අක්කව වඩාගෙන වීල් චෙයාර් එකේ තිබ්බා මේ ඊට පස්සේ එහෙම තිබ්බමයි නේද අක්කේ."

භාවනා කීවාය.

"ඒකනේ සුද්දි. ඔයා ලබන ආත්මේ මගේම මල්ලි කෙනෙක් වෙන්නෝන එහෙම දවසකට මම ණය ගෙවන්නම්."

නේත්‍රා හදවතින්ම කීවාය. දේවකගේ පපුව උණු විය.

"අපි යන්."

බෑග් දෙකම ගත්තේ දේවකය. භාවනා රෝද පුටුව ගත්තාය.

"එක ළමයෙක් මිස් මේ දවස් හතක් විතර ඉන්න ඇඳුම් ගෙනත් වගේනේ."

දේවක කීවේය. භාවනා ඔහුට අත මිට මොළවා ගැසුවාය.

"කිට් හතරයි ගත්තේ. රෑට එකයි නිදාගන්කොට එකයි හෙට උදේ මාළිගාවට එකයි වෙද මහත්තයා ළඟට යන්න එකයි එන්න එකයි."

ඇය පැහැදුවාය. දේවක මුව තදකරගෙන සිනාසුනේය. භාවනා රැව්වාය.

"නෑ මේ මං හිතුවේ දවස් හතක විතර ට්‍රිප් එකක් ගියොත් වෙනම වාහනේක අපි ඇඳුම් ටික ගේන්න වෙයි කියලා."

ඇය 'ෂටප්' කියන්නට මෙන් යටිතොල හපාගෙන රැව්වාය. 'දැන්

මාව විහිළුවටත් අරන් මෙතන. මුලින් හිටියේ මිස් කියාගෙන හරි බයෙන්' ඒත් මේ දැනෙන සමීප බවට භාවනා ප්‍රිය කළාය. කෙනෙක් මෙහෙම පපුවේ බිත්තිත් කඩාගෙන ආවාමය. ඇයත් මේ ඉන්නේ ඔන්න ඔහේ ආවදෙන් කියන්නාක් මෙන්ය.

"මම රිසවේෂන් එකක් දැම්මා දේවක අයියේ. මගේ නමින් දැම්මේ."

"මාව මෙහෙම තියලා දෙන්නත් එක්ක ගිහින් කරන්නකෝ."

අමායා හිල්ස් හී ලොබී එක ලස්සනය. එය තනා ඇත්තේ හන්තානයම පෙනෙන සේ විවෘත ආලින්දයක් ලෙසය. එයට එන ඕනම කෙනෙක්ට හන්තානය දෙසින් එන සීත සුළඟ මෙන්ම හන්තාන කන්දේ

අසිරියද නිස්කලංකයේ ඉඳගෙන විඳගන්නට පුළුවන. භාවනා වශීවී ගිය දෑසින් බලාගෙන උන්නාය. මේ වගේ සුන්දර රැයක් ගතකරන්නට මෙතන තෝරාගත් එක ගැන ඇයට වෙනම සතුටක් දැනුණි. ද්වේක මේ ලොබියට අනන්ත වතාවක් පැමිණ ඇත. මේ ලස්සන ඔහු ඕනාතරම් දැක ඇත. එහෙත් වෙනදා නොදුටු ලස්සනක් අද පෙනෙන්නාක් වැනිය. ඔහු ඒ ලස්සන දැක්කේ අයට පසුබිම්නි. හදවත ඇතුළාන්තය කළඹවාගෙන එන්නාවූ වෙනස්ම රසබර මිහිරකින් ඔහු ගොළුව උන්නේය.

"හරිම ලස්සනයි නේ."

ඇය කීවාය. පසුව දෑස් පුරා ඔහුව දැකගත්තාය. ලොබියේ දැල්වූ

කහ පැහැගත් විදුලි පහන්වල එළියෙන් ඒ මුහුණේ මොකක්ද එළියක් ඇය දැක්කාය.

“රූම්ස්වලටත් මෙහෙමම හන්තානය පේනවා මිස්.”

“ම්. මම දැක්කා නෙට් එකෙන්. යන්.”

ඔහු මෘදුව කීවේය. භාවනා ඔහු අසළින්ම පිළිගැනීමේ කවුන්ටරයට ගියාය. ඇයට හිතෙන්නේ දවස් දෙක තුනක් මෙහි නැවතී යන්නටය.

“අපේ රිසවේෂන් එකක් තියෙනවා.”

“මොන නමින්ද සර් තියෙන්නේ.”

“භාවනා රඹුක්වැල්ල”

දේවක කීවේය. භාවනා සිනාසුනාය.

“ට්‍රිපල් රූම් එකක් නේද මිස්

බුක්කරලා තියෙන්නේ."

දේවකට පුදුමය. ඔහු බැලුවේ ඒ පුදුමයත් සමඟින්මය.

"ඔව්."

"ටුවින් බෙඩ් අපි දාලා තියෙනවා මිස්. බෙඩ් දෙකක්."

"හා."

දේවක හිතුවේ වෙන වෙනම කාමර දෙකක් ගෙන ඇතැයි කියාය.

"කමක් නැද්ද අපේ රූම් එකේම ඉන්න වෙන්නේ."

ඇය ඇසුවාය.

"අනේ මම නේ ඒක අහන්නෝන මිස්. මේ කෙල්ලෝ දෙන්නෙක් එක්ක"

ඔහු රහසින් මෙන් ඇසුවේය.

"අපි එක්ක ඉමු. මී."

ඇය කීවේ එපමණය. දේවක

බලාගෙනම උන්නේය.

"මේක ෆිල් කරන්න දැන්."

ඇය කීවාය. දේවක සිනාසී චෙක් ඉන් පෝරමය පුරවන්නට ගත්තේය.

"මං රෑට ගොරවනවා මිස්."

ඔහු කීවේය.

"ඇත්තද මම රෑට හීනෙන් ඇවිදිනවා."

භාවනා සිනාව තද කරගෙන කීවාය. දෙදෙනාගේම සිනාබර දෑස් එකට හමුවූයේ අමායා ලොබියේ වූ පියකරු පොකුරු පහන් එළිය මැදිනි. දෙදෙනාම බලාගෙන උන්නේ එකිනෙකාගේ ඇස්වල අමුත්තක් ඇත්දැයි සොයන්නට මෙන්ය.

අමායා හිල්ස් හී කාමරය හිතුවාටත් වඩා සුන්දරය. එය හදවතට ගෙන ආවේ වෙනස්ම

නිස්කලංක සුවදායක හැඟීමකි. කාමරය තනා තිබුනේ සම්ප්‍රදායික මහනුවර ගෘහ නිර්මාණ ශිල්පයට අනුවය. එකිනෙකට ළංව පිහිටි ටුවින් ඇඳන් දෙකට උඩින් නුවර නැට්ටුවෙකුගේ සුන්දර රූපයක් ගසා තිබුණි. ඉතාම සිසිල් සුවදායක හැන්දෑවක අසිරිය කාමරය පුරා ඕනවාටත් වඩා තිබුණි.

"හරිම ස්වීට් නේද අක්කා"

"ම්."

"මේක හනිමූන් කපල් එකකට ෂෝක්"

නේත්‍රා කීවාය. භාවනාට බැලුනේ දේවක දෙසය. 'රූම් එක හනිමූන් කපල් එකකට හොඳයි කිව්වාම එයාට ලැජ්ජ හිතෙන්නේ මොකද?' ඇය මෘදු සිනාවක් සහිතව බිම

බලාගනිමින් සිතුවාය.

"අපි බලමුකෝ වීව් එක කොහොමද කියලා දේවක අයියේ."

"බලමු මිස්."

දේවක ගොස් කාමරයේ දිග ජනේල තිර විවර කළේය. ඉන් ඔබ්බේ පෙනුනේ හන්තාන කඳු පන්තියේ සුන්දරම දසුනකි. ඉර බැසගොස් තිබුණද බටහිර අහස් කුස පුරා තුනී රෝස පැහැයක ආලෝක පද්‍යාසයන් ඉතිරිව තිබුණි. හන්තානය දෙසින් ආ සුළඟේ වූයේ වෙනස්ම නැවුම් සිසිලසකි.

"හරිම ලස්සනයි නේ."

භාවනා බැල්කනියට පිවිස දේවල අද්දරම වාගේ සිටගෙන කීවාය. යුවතිය ළඟින් එන සුවඳ හැන්දෑ සුළඟේ මුසුව දේවකට දැනෙන්නට

විය. සන්සුන්කරගන්නට හදන සිතම ඒ සුවඳින් නොසන්සුන් වෙයි.

"මේ හන්තාන මවුන්ටන් රේන්ජ් එක මිස්. අර පැත්තේ පේරා කැම්පස් එක. මේ පහළ මහවැලි නිම්නය."

ඔහු පැහැදුවේය.

"එච්චරම දන්නේ කොහොමද?"

දැන් තමා නුවර යැයි කියන්නට දේවකට බයය. ඒ මඟදී වූ කතාබහ නිසාය.

"මං දන්නවා මිස්."

"ගෑණු ළමයා එක්ක එන්න ඇති නේ."

ඇය කීවාය. දේවක සිනාසුණේය.

"නේද?"

ඇයට උත්තරයක් ඕනමය.

"එහෙම මිස් හිතනවනේ."

"එහෙනම් කියන්නෝන එහෙම නෑ කියලා."

"කවදාවත් නෑ."

දේවක කීවේය. ඔහුගේ වචන විශ්වාස කළ බවක් ඇයගේ දෑස්වල විය.

දේවක ගොස් නේත්‍රා ඉඳගෙන උන් රෝද පුටුවද බැල්කනියට තල්ලුකරගෙන ආවේය. නේත්‍රා කෘතවේදීව ඔහු දෙස බැලුවාය.

"මටනම් මෙතනට වෙලා දවස් දෙක තුනක් හරි ඉන්න පුළුවන් මල්ලී."

නේත්‍රා කීවාය.

"ලස්සන පරිසරයක් දිහා බලාගෙන අතීතේ වමාරලා තේරුමක් නෑ මිස්. නිස්කලංකෙයේ තනිවෙන්න ඕන ඒක නිසාද?"

දේවක ඇසුවේය. ඒ වචන ටික නේත්‍රා රඹුක්වැල්ල බලාපොරොත්තු වූවක් නොවේ. ඔහුගේ වචනයක් වචනයක් පාසා තිබුනේ ඇගේ ජීවිත කතාවේ කෙටි සාරාංශයකි.

නේත්‍රා ගැස්සී මෙන් බැලුවේද ඒ නිසාය.

"ඒක නේද කරන්නෝන."

භාවනාද බැලුවාය.

"මතක් කරන්න තරම්වත් අතීතයක් මට නෑ දරුවෝ."

ඇය කිවේ බිඳුණු හඬකිනි.

"ඉස්සර අප්පච්චියි මමයි හැටින්වල අවුරුද්දක් විතර හිටියා මිස්. මී. අප්පච්චි එහේ හෝටලේක කන්ස්ට්‍රක්ෂන් වැඩක් කළා. ඉතින් අපිට ක්වාටස් ලැබුණා"

දේවක කතාවක් කියන්නට

ගියේය. භාවනාද දෑත් බැඳගත්තාය.

"ඕ."

"මාත් ඒ දවස්වල ඒ ලෙවල්කරලා ඉවරවෙච්ච කාලේ. ඉතින් ආසාවට පොඩි ප්ලාන්ට් නර්සරියක් කළා."

"හානේ ෂෝක්නේ."

"පොඩි ආදායකමකුත් ලැබුණා. ගොඩක් පැළ මම හැදුවා."

"ඕ."

"පස්සේ අපි එන්න යද්දී මම ගොඩක් පැළ වික්කා. අන්තිමට ඉතුරු වෙච්ච මැරිලා ගිහින් වගේ තිබ්බ පැළ වගයක් එහා පැත්තේ කැලෑවට විසිකරලා දැම්මා. ක්වාටස් එක අස්කරලා දීලා එන්න වෙච්ච නිසා."

"හා."

"ඔය විසිකරපු පැළ අතරේ පොඩි සමන් පිච්ච වැළකුත් තිබුණා. ඒක කණ්ණාටුවෙලා තිබුනේ. පැළ ගන්න කෙනත් කිව්වා එපා කියලා. මම ඉතින් ඕක විසිකරලා දැම්මා කැලෑවට. එහෙම කරලා අස්කරලා දීලා ආවා."

"ම්."

"ඊට මාස හතකට විතර පස්සේ අප්පච්චීත් එක්ක මම ආයෙත් හැටින් ගියා. අර හදපු හොටෙල් එකේ ෆයිනල් වැඩ බලන්න. එදා අපි හිටපු ක්වාටස් එකේ අපි රෑ හිටියේ."

"ම්."

"හවස්වෙලා අපි ගියේ. ඉතින් මම රෑ සීතල වතුරෙන් වොෂ් එකක් එහෙම දාලා වත්තේ ඇවිද්දා. අනේ

මම ප්ලාන්ට් නර්සරිය කරපු ලෑන්ඩ් එක නේද මේ කියලා බල බල. වත්ත වල් වැදිලා ගිහින්. දුකත් හිතුණා."

"ඉතින්."

"වත්තේ ඇවිද ඇවිද ඉන්නකොට මිස් එකපාරම මට ආවා ඉවසගන්න බැරිතරම් සුවඳක්. පුදුම සුවඳක්."

"හා."

නේත්‍රා නොව භාවනාද උන්නේ දෑස් ලොකු කරගෙනය.

"මම බැලුවා මේ සුවඳ එන්නේ කොහෙන්ද කියලා. හොයාගෙ නම ගියා. ටෝච් එකකුත් අරන්. හොයාගෙන හොයාගෙන යද්දි අර ඉවසගන්න බැරි සුවඳ එන්නේ කෙහෙන්ද දන්නවද මිස්."

"මොකෙන්ද?"

"අර මම ක්වාටස් එකෙන් එද්දී විසිකරලා ආපු සමන් පිච්ච වැලෙන්. ඒක දැන් මිස් ලස්සනට වැවිලා. ළඟ තිබ්බ ගස් වල එතිලා උඩටම ගිහින්. අර කණ්ණාටු වෙච්ච සමන් වැළ. මම බැලුවා ඒ මගේම වැලද කියලා ඔව්. මම විසිකරපු මැටි පෝච්චිය බිඳගෙන සමන් වැළ ලොකුවෙලා. ඒකම තමයි. රෑට මල් දාස් ගාණක් පිපෙනවා. වොචර් අන්කල් කියනවා ඒ පැත්ත පලාතේ ඉන්න බෑලු සුවඳ. මම ටෝච් ගගහ බැලුවා මල් දිහා. හරි ලෝබ හිතුණා ඒත් ඒ මම විසිකරලා දාපු සමන් වැල. කණ්ණාටුවෙච්ච කොළ කරවෙච්ච කඳ ඇඹරිච්ච සමන් වැල. ඒක දැන් මෙහෙම වෙලා. එදා මම තේරුම් ගත්තා

එක දෙයක් අතෑරලා දාපු සමන් වැලෙත් මල් පිපෙනවානම් මැරිච්ච ජීවිතයකත් මල් පිපෙන්න පුළුවන් කියලා"

දේවක ආදරයෙන් කීවේය. නේත්‍රාගේ දෑස්වල කඳුළු පිරුණි. භාවනා දේවක දෙස පුදුමයෙන් මෙන් බලාගෙන උන්නාය. 'ඔයා හරි පුදුම කෙනෙක් දේවක'

"මල්ලිට පින් ඒක කියලා දුන්නට."

"හිනාවෙන්න ටිකක් කල් යයි මිස්. ඒත් අඬන්නේ නැතුව ඉන්න පුළුවන් අපිට."

ඔහු කීවේය. නේත්‍රා දේවකගේ අතක් ගෙන පිරිමැද්දාය. භාවනා මෘදුව සිනාසුනාය.

"ඔයා මගේ මල්ලි කෙනෙක්

වෙන්න තිබුණේ.”

‘මම ඔයාගේ මල්ලි කෙනෙක් තමා සුදු අක්කේ’ එහෙම කියන්නට දේවකට සිතුණි.

“ඉතින් එහෙම කියලා හිතන්නකෝ මිස්”

ඔහු කීවේය.

“අක්කට මිස් කියන මල්ලි කෙනෙක් මට ඕන නෑ.”

දේවක සිනාසුණේය.

“එහෙනම් අක්කා කියන්නම්කෝ”

දේවක සිනාසී කීවේය.

# 26

දේවක බැල්කනියයට වී බලාගෙන උන්නේ ඈත හන්තානය දෙසය. අද හඳ ලස්සනට පෑයූ රාත්‍රියකි. සමහරවිට එය පොහොය ළඟ නිසා වන්නට ඇත. අහසින් වට සඳ රැස් හන්තායට වැටී තිබුනේ ලෝබකමක් නොමැතිවමය. උස් කඳු මුදුන් අරා සිටින රූස්ස ගස්වල මුදුන් සඳ රැස් තවරාගෙන උන්නේ රෑ මඟුල් ගෙදරක යන්නට

මෙන්ය. අතරින් පතර වූ තරු කැට ඊර්ෂ්‍යාවෙන් මෙන් සඳ දෙස බලමින් උන්නේ සඳක් දිලෙන රැයක තමන්ගෙන් ඇති වැඩක් නැති බව සිතන්නාක් මෙන්ය.

දේවක නාගෙන ආවේ දැන් ටිකකට පෙරය. ඔහු නාගෙන ඇඳගත්තේ අප්පච්චීගේ ලොවි පැහැගත් බතික් සරමය. මේ බතික් සරම ජීවන්ට තෑගි ලැබුණු එකකි. ඒ ඔහුගේ හිතවත් මහනුවර ව්‍යාපාරිකයෙක්ගෙනි. ජීවන් එය නෑඳ උන්නේ දවසක කොල්ලාට අඳින්නට දෙන්නටය. ඊයේ රෑ දේවක නුවර යන්නට ඇඳුම් මදිද්දී ජීවන් මේ සරම ගෙනවිත් දුන්නේය.

"රෑකට අඳින්න පුංචි මහත්තයා. සුදු ෂර්ට් එකක් එක්ක."

ජීවන් එය දුන්නේ එසේ කියාය. දැන් දේවක ඇඳගෙන ඉන්නේද එහෙමය. සුදු අත් කොට කමිසයට ඒ බතික් සරම ලස්සනය. ඔහු ඇඟ සෝදාගෙන එද්දී ඇඳට වී උන් භාවනාගේ දෙනෙත් වේගයෙන් ඔහු වෙත ගියේය. දේවකගේ කඩවසම් සිරුරට ඒ බතික් සරමින් ලැබුණේ වෙනස් සිංහල ලස්සනකි.

"පාටියකට යන්නත් හොඳයිනේ."

ඇය කීවාය. දේවක ලැජ්ජාවෙන් සිනාසුණේය.

"මේ අප්පච්චි දුන්නේ මිස්."

හදවත කළඹන හැඟීම් මතුපිටට නොපෙන්වා ඉන්නට භාවනා දැඩි වෙහෙසක් ගත්තාය. දේවක ඒ මොහොතේ ඔහුගේ නෙත කොණ්ඩය ඇඟිලිතුඩින් ගැසුවේය.

"මේ බලන්න අක්කා. මේ රෑ නාලනේ. එනකොටත් නාලා හිටියේ."

නේත්‍රා සිනාසුනාය. කෙනෙක්ගේ ජීවිතය අස්සට යන තම බාල නංගීගේ හදවත ගැන ඇයට පුදුමත් නැත.

"සනීප වතුරටික මිස්. ඒකයි නෑවේ."

දේවක කීවේය.

"ඉන්නකෝ. මාත් නාන්නෝන එහෙනම්."

ඇය කීවාය. ඔහුගේ දෑස් කිව්වේ එපා කියාය. ඇය දෙතොලින් මොකක්ද කළාය. දේවක බැල්කනියට ආවේ ඇයට ඇඟ සෝදාගන්නට ඇඳුම් මාරුකරග න්නට ඉඩදීය. එක කාමරයක ඉන්නවානම් ඒවා තේරුම් ගතයුතුය.

"දේවක අයියේ."

භාවනා ආවේ තුවා පට පමණක් වත දවටාගෙනය. බැල්කනියේ උන් කොල්ලාගේ හදවත හන්තානයට විසිවිය. යුවතිය කතාකළේ තිර රෙද්දෙන් ගත වසාගෙනය.

"මිස්."

'මොකද මිස් කියන්නේ. වෙච්චලා වගේ.' භාවනා මුවතදකරගෙන සිතුවාය.

"ඇතුළට වෙලා ඉන්ඩ. එන්න."

"කමක් නෑ මිස්."

හත්දින්නත් තරු පොකුර ඇත්තේ කොහේදැයි දේවක බැලුවේය. එහි තරු හත හරියටම කළහොත් මැරෙනවා යැයි කතාවක් ඔහු අසා ඇත. අහසම පීරා බැලුවද හත්දින්නත් තරු පොකුරක් ඔහුට

සොයාගන්නට නොහැකි විය. අද අහස පුරා තරු ඇත්තේ විසිරීය. තරු ලස්සනටම පේන්නේ ගිම්හානයේ රාත්‍රීන්හිදීය. මේ ගිම්හානය නොවේ. වස්සාන කාලයේ ඇරඹුමය.

නුවර අහස පරණ යාළුවෙක් දෙස බලන්නාක් මෙන් දේවක දෙස බලාගෙන උන්නේය. මේ දැන් නුවරට ඇවිත් ඉන්නේ මීට මාස කිහිපයකට පෙර මහනුවරින් ගිය කොල්ලාමදැයි අහස සිතන්නට ඇත. නැත. කොළඹදී බොහෝ දේවල් සිදුවිය. මේ ඉන්නේ නුවරින් ගිය තරුණයා නොවේ.

භාවනා ආවේ ඉදුණු මිදි ගෙඩියක පැහැයේ ගවුම ඇඳගෙ නය. අත් නැති ඒ ගවුමින් පිටතට

ආ යුවතියගේ උරහිස් මුදුන් හෝටල් කාමරයේ දැල්වෙන රන්පැහැගත් විදුලි පහනේ ආලෝකයෙන් දිලිසෙමින් තිබුණි. සියළු කෘතිම පැහැයන්ගෙන් ආලේපනයන්ගෙන් මිදුණු ඇගේ ප්ලේන් මුහුණින් මේ රෑ යේ එන්නේ තරුණයෙකුගේ හදවත දෙදරවන ආකාරයේ සුන්දර ගැහැණු ලස්සනකි. අතරින් පතර තෙමුණු හිසකේ දෙකන් පෙති අද්දර ඇලවී තිබුණි.

කුඩා ඉන්ග්ලිෂ් රෝසස් විලවුන් කුප්පියෙන් බිඳක් පමණක් ගෙල දෙපස ගල්වාගත් යුවතිය බැල්කනියට ආවේ අක්කාවද නාන කාමරයට එක්කාගෙන ගොස්ය.

“මම කතාකරන්නම් බබා. මී.”

“ඔයාට බෑ.”

"මට දෙන්නකෝ සුද්දියේ. මෙහෙම නිදහස්. මං කතාකරන්නම් මී."

නේත්‍රා ඇයව යැව්වේ මේ ලස්සන හැන්දෑව කෙල්ලට විඳින්නට දීය.

භාවනා බැල්කනියට එන්නටත් පෙර ඇය ගැල්වූ ඉන්ග්ලිෂ් රෝසස් සුවඳ බැල්කනියට ආවේය. දේවක හැරී බැලුවේ මන්දගාමී නොවේනම් ස්ලෝ මෝෂන් කැමරාවක් ලෙසිනි. ඇය ඇය සැරසෙන්නේ අනිත් අයට හදවතක් නෑ කියා සිතන්නාක් මෙන්යැයි දේවකට සිතුණි.

"මොනවද කියන්න ගියේ. මී"

ඇය ඇසුවාය. ඔහු දෙයක් කියන්නට කට හැදූ බව ඇය දනී. නොවේනම් මොනවාහෝ ඔහුගේ මුහුණ මත ලියැවී තිබුණි.

"නෑ මිස් මම මේ"

ඇය බැල්කනිය වටා වූ යකඩ වැඩ ආසන්නයටම ආවාය. පසුව එයට බරවූවාය.

"කියන්න"

භාවනා තොල්පට පමණක් පිටපෙරළා කීවාය.

"නෑ මට මේ අඳුනගන්නත් බැරිවුණා මිස්ව."

ඔහු කීවේ කියන්නට ගියදේ නොවන බව ඇය දනී.

"බොරුනේ"

ඇය පිළිතුරක් බලාපොරොත්තු වූයේ නැත. භාවනාගේ දෑස් කෙළින්ම යොමුව තිබුනේ හන්තානයට ඉහළ අහසේ පායා තිබූ සඳ වෙතය. ඒ දීප්තිමත් සඳ එළියේ පදාසයක් එහෙමම ඇයගේ මුහුණ මතට වැටී

තිබුණි.

"මෙතනට වෙලා මොනවද හිත හිත හිටියේ. ආ දේවකයියේ."

"මං මිස් මේ හත් දින්නත් තරු පොකුර හෙව්වා."

"ඒක ගැන්නාම මැරෙනවලුනේ."

"ම්."

"ඉතින් හෙව්වේ. මැරෙන්න ඕනවෙලාද?"

දේවක සිනාසුනේය.

"අද අහස හරි ලස්සනයි මිස්."

"ම් කාළෙකට පස්සේ මාත් හඳ දැක්කේ."

"මමනම් හැමදාම දකිනවා."

"කොහෙදිද? අතුරුගිරියේ ගෙදරදිද?"

"නෑ මේ."

ඔහු තැතනුවේය.

"ආ දේවකයියේ. කොහෙදිද?"

"සීගිරි එකේදී."

ඔහු කීවේය. සිනාබර දෙතොල් තදවී මුවතුළට ගියේ ඉබේටමය. දේවක ඇය දෙස බලා පසුව සඳ දෙස බැලුවේය.

"කියන තරම් අපි හැඩයෑ"

ඇය ඇසුවාය. නොවේනම් මිමිණුවාය.

"මං එද්දිත් කිව්වේ මිස්."

"මොකක්ද?"

"මහත්තයට සිහිය නැතිවෙනවා දැකලා. පව් අසරණයා."

දේවක ඇය දෙස නොබලාම කීවේය.

"ඇයි අර."

"සාමාන්‍ය පපුවක් තියෙන මනුස්ස

පැටියෙක්නේ ඉතින්. ඒ පාර හාට් ඇටෑක් එකක් එනවා මෙහෙම ලස්සනට ආවාම."

ඇය යටිතොල හපාගෙන ඔහුට අත මිට මොළවා ගැසුවාය.

"මායි අසරණ"

එහෙම කීවේ ඇයැද කියාවත් ඇය දන්නේ නැත.

"අපි මිස් ඩිනර් එකට පහළට යනවද? මෙහේ රෙස්ටොරන්ට් එක රසවාසළ. හොඳ සිංහල කෑම එහෙම තියෙනවා."

"මොකක්ද නම කිව්වේ."

"රස වාසළ."

"ම්. ෂෝක් නමක් නේ."

දේවක හන්තානයට පිටුපා ගරාදි වැටට බරවූවේය. එහෙම බරවූ විට යුවතියගේ ලස්සන හොඳින්

පෙනෙයි. ඇස්වලටත් සැනසීමක් දිය යුතුය. භාවනා ගෙළ පැළඳගෙන උන් සුදු රත්තරන් සිහින් චේන්පටේ සුන්දරත්වය හොඳින්ම පේන්නේ සඳ එළියත් ඒ පැහැයේම නිසාද??

“අක්කත් ආවාම අහලා බලමු.”

“අක්කා කැමති නංගි කැමති විදිහට.”

“ඔයා.”

“මාත් මිස් කියන දෙයක්. පොඩි ළමයනේ”

ඔහු කීවේය. භාවනා දෑස් ඔහු දෙසට බරකළේ මොකක්ද කෘතවේදීබවකින් යුතුවය.

“මං ආසයි රූම් එකේ ඉඳන් කන්න. අක්කිටත් අමාරුයිනේ රෙස්ටොරන්ට් එකට යනකොට.”

“මාත් ආසයි එහෙම. අපි

ඕඩරයක් දාමු. ශ්‍රී ලන්කන් ඩිනර් එකක්නේ කැමති නේද?"

ඇය සිනාසුනාය.

"චුට්ටක් සීතල එනවා තමයි."

දේවක කීවේ ඇය දෙවුර හකුළුවාගෙන සිටිද්දීය.

"ඒ වුණාට මං ආසයි."

"දන්නවානම් මගේ ජැකට් එක අරන් එනවා."

"කමක් නෑ. අනිත් පාර එද්දී අරන් එමු. එහෙම සනීපයි."

ඇස් හමුවූයේ බලාපොරොත්තු නොවූ ලෙසිනි. භාවනා සුන්දර ලෙස සිනාසුනාය. ඒ සිනහව කැපුම් පාරක් සේ ඔහුගේ හදවතේ සටහන් විය. වේදනාවක්ද සමඟය.

"දේවකයියේ"

වචන ආවේ ගොරෝද හඬකිනි.

"මිස්"

"අර සමන් වැලේ කතාව."

"ඔව්."

"නෑ ඒක අක්කිට කිව්ව එක හොඳයි. මමත් හැමදාම කියනවා ඒත් එච්චර ලස්සනට කියන්න මට දන්නේ නෑ."

භාවනා කීවාය.

"දවසක අක්කා ලස්සනට ජීවත්වෙයි. ඒක මට ස්ථිරවම කියන්න පුළුවන්. හොඳ කෙනෙක්ට වරදින්න හේතුවක් ඇත්තටම නෑ දෙවියෝ එහෙම කරයිද?"

ඔහු දෙසම ඇය බලාගෙන උන්නාය.

"සාස්තර කියන්න දන්නවා නේ."

ඇය ඇසුවාය.

"මිස්ටත් සාස්තරයක් අහගන්නද?

මම ජෝතිෂය ටිකක් ඉගෙනගෙන තියෙනවා මූණ බලලා කියන්න දේහ ලක්ෂණ විද්‍යාවෙන්.”

දේවක කීවේය.

“හා මට කියන්න එකක්.”

ඔහු බලාගෙනම උන්නේය. එය ඇස්වලට ලැබුණු හොඳ අවස්ථාවකි. ‘එහෙම බලාගෙන ඉන්නකොට පපුවත් එක්ක පිච්චෙනවනේ’ ඇය අමාරුවෙන් හුස්ම තදකරගෙන සිතුවාය.

“පුංචි නෝනාගේ හිත අරී අමුතුයි තමා. වෙලාවකට කාටහරි පලු යන්න බණිනවා. ආයේ මූණ බලාන්ඩ බැරිවෙන්ඩ තමා බණිනවා. ඒ වෙලාවට ආයේ ඉතින් පාර්වති වගේ තමා. ඒත් ඒම බැණලා හෝරාවයි යන්නේ පුංචි නෝනටම දුකායි.

පස්සේ පුංචි නෝනාම යනවා එයාව හොයාගෙන. ගිහින් අහනවා කෑවද ඔයා. බිව්වද ඔයා ඇයි දුකේන් වගේ තමා ඉන්නේ. අෂනීපද? පෙනඩෝල් ගෙනාල්ලා දෙන්නද? ගෙනල්ලත් දෙනවා වතුරත් දෙනවා. පස්සේ ඔළුවත් අතගාලා තමා යන්නේ. යනකොට කීනවා මාත් එක්ක තරහාවෙන්න එපා හොඳේ කියලා. ෂරිනම් ෂරි කියන්ඩ.”

දේවක අවසාන ටික කීවේ තරමක් තදිනි. සාස්තර කියන අය එහෙමය.

“ෂරි”

භාවනා අමාරුවෙන් කීවාය.

“වෙලාවට හිත මේ තිබ්බා මේ නෑ. හරියට සුළාං වැදිච්ච වරා මල වගේ තමා. ඒ යනවා මේ යනවා

අකාසේ පියාඹනවා. නින්ද යන්නේ නෑ. කන්න හිතෙන්නේ නෑ. බොන්න බෑ. කතාකළාට කතාකරන්නේ නෑ. පුංචි නෝනට නිකාං පිස්සු වගේ. ෂරිද?"

"ෂරි."

"ෂරි. පුංචි නෝනගේ අකාසේ ඉරයි හඳයි අම්මයි තාත්තයි. එතකොට තරු තමා අක්කලා දෙන්නා. ෂීයා. තමන්ගේ අයට පපුව මේම දෙන්නේ. ආයේ කවදාවත් බොරුවක් කරන්නේ නෑ. එයාලා අෂනීප වුණාම පුංචි නෝනට තමා උණ ගන්නවා. ෂරිද?"

"ෂරි"

මේ සියල්ල නේත්‍රාත් අසාගෙ නය. ඇය අමාරුවෙන් අද්ද අද්දා නාන කාමරයෙන් පිටතට ආවේ දැන්

ටිකකට පෙරය. කෙල්ලට කරදර කරන්නට නොගියේ ඈයට මේ හැන්දෑවේ රිසි ලෙස විඳගන්නට දීය. 'කොල්ලා කෙල්ලව අල්ලගෙන සාස්තරයක් කියනවා වගේ' නේත්‍රා සද්ද නොකර අසාගෙන උන්නාය.

"කඩුප්පුලි ෂල්ලි තියෙන්නේ අම්මා. මේ ෂල්ලි ෂල්ලි."

දේවක ලස්සනට එය කියයි. නේත්‍රාට සිනායන්නත් එයි.

"ඔව්"

"ඒවා පුංචි නෝනට ලොකු නෑ. කොළ කෑලි විතරයි. ෂල්ලිද අම්මා ජීවිතේ. ඒම තමා කියනවා. අතේ ගුලිකරගෙන ගිහින් ගෙදර වැඩකරන කෙනාටත් දෙනවා. අම්මා ඒමයි. හිත හරි හොඳයි. ෂත්තරනින් තමා හදලා තියෙනවා. දවසින් දවස ගාන

වැඩිවෙනවා.”

භාවනාට පුදුමය. තමා සල්ලි කීයක් හෝ අතේ ගුලිකරගෙන ගොස් ගෙදර වැඩකරන අයට දෙන බව ඔහු දන්නේ කෙසේද? භාවනාටත් වඩා පුදුම හිතුණේ නේත්‍රාටය. නංගිගේ මේ වැඩේ ඇයද දැනගෙන උන්නාය. ‘පද්මා පව් අක්කා. මං යද්දි අඬනවා. දුව කරදරයිලු. මං තුන්දාහක් දුන්නා’ කෙල්ල මෙහෙම කියා ඇත්තේ වරක් දෙවරක් නොවේ.

“ෂරි”

ඔහු මේ සියල්ල කියන්නේ ඇයගේ මුහුණ දෙසම බලාගෙනය. භාවනා උන්නේ වෙනස්ම දැහැනකට සමවැදීය. සාස්තරකාරයා කියන සියල්ල ඇත්තය. දැන් ඇයට බයත්

එක්කය.

"පුංචි නෝනගේ හිත තමා හිත. මෙන්න නෝනා මල කියලා පෙන්නුවාම නෝනා බලන්නේ මල දිහා නෙමේ."

"එහෙනම්."

"මල දාලා තියෙන වාස් එක දිහාව. කන්න කුකුලා රෝස්ට් කරලා දුන්නට නෝනා කන්නේ ලුණු මිරිස් එක්ක."

"ෂරි"

"ඒත් ඒම තියෙන සත්තරන් හදවත තමා තාම කාටවත් දුන්නේ නැත්තේ ඇයි ඒ."

"ඇයි ඒ"

"උරුමක්කාරයා එනකල් බලාගෙන තමා ඉන්නවා. තාම එයා නෑ. කුමාරයා එනකල් නෝනා නෙමේ

පූජාව තියන්නේ. කන්ද කපාගෙන එයා එනකල් ඉන්නවා. ගිරිහෙල් බිඳගෙන එනකල් පුංචි නෝනා බලාගෙන ඉන්නවා. ඒම එන කෙනා ලේසි පාසු පුතෙක් වෙන්ඩ බෑ"

"ඇයි ඒ."

"එයා ඉරයි හඳයි තරුයි කඩාගෙන එන්නෝන. ඇවිත් මේ සුදු දෙපා ළඟ තියාන්ඩ ඕන. තියලා මේම පාත්වෙලා මේම අත අල්ලගෙන තමා පුංචි නෝනගෙන් අත ඉල්ලන්ඩ ඕන. ඒම එනකල් තමා නෝනා බලාගෙන ඉන්නවා. දෛවය ලියලා තියෙන්නේ එක්කෙනයි. ජීවත්වෙන්නත් මැරෙන්නත් එක්කෙනයි තමා එනවා. දෙකක් නෑ. එක්කෙනයි එනවා."

"කෝ එයා."

කෙල්ලට මෝහනයට පත්වූ අයෙකු මෙන් ඇසුවේය. ඔහුට ඇත්තටම සාස්තර කියන්නට පුළුවන. කෙල්ලට දැන් එය හොඳින්ම විශ්වාසය.

"එයයි මේ ළඟ එනවා අම්මා. හිතාන්ඩ එපා. එයයි එනවා. නෑවිත් බෑනේ. පුංචි නෝනා සෝස මල වගේ නිස්කාංසුවේ ඉන්න අම්මා. එයා එයි. එයාටත් හරී දුක තමා"

දේවක මෑදුව කීවේය. භාවනා දෙනෙත් අයාගෙන උන්නාය.

"ෂාස්තරේ ෂරියට කියවුණාද පුංචි නෝනා."

දේවක ඇසුවේය. භාවනා මොකක්ද කම්පනයකින් මෙන් සිනාසුනාය.

"හරියටම කිව්වනේ. කෝමද ඒ"

දේවක දන්නා සාස්තරයක් නැත. එහෙම මුහුණ බලාගෙන සාස්තර කියන්නට බැරිය. ඔහු සාස්තරය කිව්වේ ඇය ගැන දන්නා දේවල් අනුවය. 'ඔයා කොහොම කෙනෙක්ද කියලා මට හිතාගන්න පුළුවන්'

"එහෙම පුළුවන් මිස්"

භාවනා ටික වෙලාවක් යනතුරු කතාකළේ නැත. ඊටත් පසු භාවනා ඔහු දෙසට හැරී සිනාසුනාය.

"ඇත්ත කියන්න. එහෙම සාස්තර කියන්න දන්නේ නෑ නේද?"

ඔහු තමා ගැන සමහර දේවල් කිව්වේ එහෙම සාස්තර කීමේ දැණුමකින් නොවේ යැයි භාවනාට ටිකකට කලින් සිතුණි. 'ඔයා මාව ගොඩක් තේරුම් අරන් ඉන්නේ කියලා මට හිතෙනවා. ඒ අනුවයි

අරම කිව්වේ. ඇත්ත වගේ'

භාවනාගේ ප්‍රශ්නයට දේවක සිනාසුනා පමණය. උත්තර බඳින්නට ගියේ නැත. ඇය උත්තරයක් බලාපොරොත්තු වූයේද නැත. 'මොකක් නමුත් මධුවැලක් වගේ හයියෙන් අපි දෙන්නා අතර දුවනවා' ඇය සිතුවාය.

හන්තානයට පෙරට වඩා දැන් සීතලය. ඒ සීතල පරයාගෙන මොකක්ද උණුසුමක් හිත පුරා සරතැයි භාවනාට සිතෙයි. පෙර විඳ හුරු නැති යමකින් ඇය උණුසුම්ව උන්නාය.

"අප්පච්චි ඉතින් කියන්නේ නෑ දේවකයියට මේ."

ඇය අසන්නට ගිය දේ ගිලගත්තාය.

"මොකක්ද මිස්."

"නෑ මේ අප්පච්චිත් ආස ඇතිනේ පොඩි ලේලි කෙනෙක් එනවට. නේ."

දේවක සිනාසුනේය.

"එයා දන්නවා මං ගැන."

"මොනවද දන්නේ"

"දවසක ඇවිත් කියයි කියලා"

"මොකක්ද?"

"එයාලේ පොඩි ලේලි ගැන"

භාවනා තොල්පට පෙරළුවාය.

"අප්පච්චි කියලා නෑ මේ වගේ ලේලි කෙනෙක් තමා ඕන කියලා."

ඇය කතාකරන්නේ ආකාසය දෙස බලාගෙනය. ඔහුගේ මුහුණ දෙස බලාගෙන එහෙම දේවල් අසන්නට ඇයට ලැජ්ජය.

"එයාගේ හිතෙත් ඇති. මගේ හිතෙත් ඇති."

ඔහු කීවේය.

"කොහොම කෙනෙක්ද?"

ඇය ඇසුවාය.

"ඒක පොඩි පිළිමයක්නේ මිස්."

"පිළිමයක් කිව්වේ."

"ස්ටැචු එකක්. හැමෝගෙම හිතේ තියෙනවා එහෙම ස්ටැචු එකක්. නේද මිස්."

ඇය දෙනෙත් සැඟවූවාය.

"ම්."

"මිස්ගේ හිතේ තියෙන්නේ කොහොම ස්ටැචු එකක්ද?"

ඇයගේ සිහින් තොල් සඟල දෙපසට විය.

"ඒම කියන්න බෑනේ."

කෝල කොමළ බවක් ඒ වචනවල විය. යුවතියක් රහසේ ඇළඳගන්නා ආදර සිතුවමක් ගැන ඇය කියන්නේ

කළාතුරකිනි.

"ජීවිතයක් එක්ක තමා ඒ ස්වැටූ එක පෑදෙන්නේ. මුළින්ම නිකං චායාවක් විතරයි. එහෙම අඳුනගන්ඩ බෑ. පස්සේ තමා මූණ කට නහය කොණ්ඩේ එහෙම පේන්නගන්නේ."

"ඉතින් දැන් එහෙම ඕක පෑදෙන්න වෙලා ඇතිනේ."

සිනාව පමණය.

"දවසක ඔහු මීදුම් පාටින් වැහිච්ච මූණ පෙනෙයි තමා. හරියට වීදුරුවකින් බලනවා වගේ. එදාට ඉතින් ඒ පිළිමේ ළඟින් හෙලවෙනවා බොරු මිස්."

ලොකු හුස්මක් ඇත. එය පිටකරගැනිමේ අමාරුවකින් ඇය පෙළුනාය.

පසුව යුවතිය ටික ටික එය

පිටකළාය.

"එයාව ලැබුනේ නැත්නම් ඉතින්."

ඇය ඇසුවාය.

"පිළිමයක් වුණාට ඉතින් දිවැස් නෑනේ. එයා වෙන කෙනෙක් අරන් යයි. පිළිම නිකං තියෙන්නේ නෑනේ. නේ."

ඇය කීවාය. මේ අහසමේ රාත්‍රීය. මේ සඳ එළියමේ තරු මල් යාය. අර සීත කඳු යාය ඒසියල්ලම යුවතියගේ සිත මන්මත් කර තිබුණි.

"හිතෙන් පිළිම හදාගත්තට පස්සේ ඒ පිළිම ළඟින් හෙලවෙනවා බොරු මිස්. කඩෙන් ගන්න මැටි පිළිම වගේ නෙමෙයි. ඒවා එහෙම බිඳෙන්නේ නෑ."

ඔහු කීවේය. පුදුමය. සීගිරි එකට ආ ප්‍රමෝෂන් මැනේජර් මේ කියන

කතා පුදුමය. භාවනා කතානොකර කල්පනාබරව උන්නාය.

"අපි මොනවාහරි බොන්න ඕඩරයක් දාමු නේද මිස්."

"ම් තිබහයි."

ඇය අහස දෙස බලාගෙනම කීවාය. අද රෑ නිදාගන්න හිතෙන්නේ නැත. මේ අහස දෙසම බලාගෙන මේ බැල්කනියට වී ඉන්නට ආසය. බැල්කනියට දමා ඇති ලී පුටුවට කොට්ටයක් දමාගෙන රෙද්දක් පොරවාගෙන ඉන්නට ඇත්නම් ඊට වඩා දෙයක් නැත.

# 27

දේවකත් භාවනාත් නේත්‍රාත් නුවර ගොස් සිටියදී සීගිරි එකේ රහසිගත සැළසුමක් ක්‍රියාත්මක වෙමින් තිබුණි. ඒ දේවක ඉවත්කිරීමේ මෙහෙයුමය. මිහිරංග සියල්ල සැළසුම් කර තිබුණි. දැන් ඇත්තේ ක්‍රියාත්මක කරන්නට පමණි.

නේත්‍රාත් භාවනාත් නුවර ගිය බව මිහිරංග දැනගත්තේ හවසය. ඔවුන් ගියේ දේවක සමඟ යැයි සීගිරි එකේ

ආරක්ෂක නිළධාරියා මිහිරංගට කීවේය.

"මෑන් එන්නේ අමුතුම කතාවකට සර්. එයාව ඉක්මනට අයින්කරන්න වෙයි."

ඔහු කීවේය. මිහිරංග හිස වැනුවේය. අවංක නිළධාරීන් සේවයට ආ පසුව වෙන්නේ වංචාකරන අයගේ කැපිලි නැතිවීමය. ඒ නිසාම ඉක්මනින් එවැනි අවංක නිළධාරීන්ට එරෙහිව කුමන්ත්‍රණ දියත්වෙයි. දේවකට එරෙහිවද එවැනි දැවැන්ත කුමන්ත්‍රණයක් මේ වෙද්දි ක්‍රියාත්මක වෙමින් තිබුණි.

ලක්ෂ පහකට ආසන්න සුවඳ විලවුන් තොගය මිහිරංග යළිත් වතාවක් පරීක්ෂා කළේය. ඔහුගේ මුවේ ඇඳුනේ ජයග්‍රාහී සිනාවකි. තව

ඕනානම් සති දෙකකි. දේවක මේ සීගිරි එකෙන් ඉවත්කරන්නේ පොලිස් පරීක්ෂනද සමඟය. මිහිරංග ඒ සියල්ලටම අවශ්‍ය හැමදේම සූදානම් කළේය.

"එහෙම කේස් එකකට එක රෑකට රිමාන්ඩ් කරන්න පුළුවන් නේද?"

ඔහු ඔහුගේ මිතුරු පොලිස් පරීක්ෂකවරයා සමඟ සාකච්ඡා කළේ අද දහවල් චයිනීස් ඩ්‍රැගන් එකේදීය. පොලිස් පරීක්ෂකවරයා බිව්වේම හැනපියර් බ්‍රැන්ඩිය. කෑවේම ඉස්සෝය. මිහිරංග බිල හාරදාස් ගාණක් ගෙව්වේය. ඒත් කමක් නැත.

"මොකටද මූ කෙල්ලෝ දෙන්නවත් පන්නගෙන කැන්ඩි ගියේ."

මිහිරංග සෙව්වේය.

"අක්කගේ ට්‍රීට්මන්ට් එකකට ගියේ

පුතා"

ඉඳුනිල් කීවේ එච්චර ගණන් ගන්නේ නැතිවය.

"බබාව මේ සීගිරි එකේ රස්තියාදුකාරයෝ එක්ක යවනවනේ නැන්දා. පිස්සුනේ."

මිහිරංග කීවේය. ඉඳුනිල් සිනාසුණේය. ඇය දේවකව දැක්කේ එක වතාවක් පමණි. ඒ කෙල්ල අසනීප වූදා සැන්ච්වස් අරගෙන ආ දවසේය. පොඩි එකා රස්තියාදුකාරයෙක් නොවන බව ඇයට විශ්වාසය. එදා ඔහු තමාට දණගසා වැන්දේ මේ මිදුලේදීය. සාමාන්‍ය කොල්ලෙක්ට එහෙම කරන්නට හිතෙන්නේ නැත. ඒවා දෙමව්පියන් ඉගැන්වූ ගතිගුණය.

ඒත් ඉඳුනිල් කිසිවක් කියන්නට

ගියේ නැත.

මිහිරංග භාවනාගේ මොබයිල් එකට ඇමතුමක් ගත්තේ දැන් ටිකකට පෙරය.

"ආ කියන්න මිහිරංග අයියේ."

භාවනා ඇඳ මතටම වී කතාකළාය. භාවනාත් නේත්‍රාත් දේවකත් උන්නේ ඇඳන් දෙකට වී කයියක් දාගෙනය. ඒ කතා සරිත් සාගරයට භාවනා හරි ලෝබකමින් උන්නාය. මදි පාඩුව පිරෙව්වේ පොටේටෝ චිප්ස් ප්ලේට් එකත් කොකා කෝලාත්ය.

"බබා කොහෙද?"

"මි. අපි නේද අපි දැන් ඉන්නේ කැන්ඩි. මහනුවර."

භාවනා එය අද්ද පද්දා කීවාය.

"මොකෝ එහේ. ආ බබා."

භාවනා මේ කතාවට කැමති නැත. ඒත් ඇය කිසිවක් කියන්නට ගියේ නැත.

"පොඩී චේන්ජ් එකකටත් එක්ක ආවා. ෂෝක් හොටෙල් එකක ඉන්නේ හන්තානේ. එන්ටය හන්තාන මවුන්ටන් රේන්ජ් එකම අපිට පේනවා."

ඇය කීවාය. වර්ණනාව වැඩිකර කෙල්ල කියන්නේ මිහිරංගව කුප්පවන්න බව නේත්‍රා දැනගෙන උන්නාය.

"කෝ අක්කා ඔතන ඉන්නවද?"

"ම්. මේ ඉන්නවා. අපි මේ පොඩි කයියක් ගහනවා. ෆ්‍රෙන්ච් ෆරයිස් කකා. ඇයි ගත්තේ"

නේත්‍රා දේවක දෙස බලා සිනාසුනාය. කෙල්ලගේ වැඩ

වෙලාවකට ඕනවට වැඩිය.

"අර බූරුවත් ආවද ඔයාලත් එක්ක ආ බබා."

ඔහු ඇසුවේය.

"ම්. එහෙම කෙනෙක් ආවේ නෑනේ."

ඇය කීවාය.

"ආවේ නැහැ. අර දේවක කියන බූරුවා."

භාවනා ඇස් කොණකින් ඔහු දෙස බැලුවාය.

"ම්. ඇයි අහන්නේ?"

භාවනා කීවාය.

"මොකක්ද බබා මේ කරන වැඩ."

මිහිරංග ඇසුවේය.

"දැන් මිහිරංග අයියා ගත්තේ ඕක අහන්නද? ප්ලීස්. ඔයා ඔයාගේ වැඩක් බලාගන්නකෝ අයියේ

හොඳේ. මම එහෙනම් තියනවා. බායි."

භාවනා ඇමතුම වේගයෙන් විසන්ධිකර පසුව දුරකථනය වසා දැමුවාය.

"පිස්සු."

ඇය තමාටම කියාගත්තාය.

"ෆ්‍රෙන්ච් ෆරයිස් එකත් නිවිලා. මට අයිස් කැටයක් දේවකයියේ"

ඔහු උන්නේ හන්තානය දෙස බලාගෙනය. 'එයා කතාකළා කියලා මෙයා මොකද අමුතුවෙලා. අපි මොකෝ එල්ලීගෙන ගියායෑ' භාවනා සිතින් ඇසුවාය.

"එහෙම අයිස් දැම්මාම කෝක් එක දිය රහයිනේ මිස්."

ඇය තොල්පට තදකර සිනාසුනාය.

"ඒක තමයි."

නොසන්සුන්වූ සිතිවිලි සමඟ ඇය වීදුරුවේ පිටත දාරය දිගේ ඇඟිලිතුඩු ගෙනගියාය.

"රෑට අපි සිංදු කියමු දේවකයියේ."

ඇය ඇසුවාය.

"මේ හන්තානේ කිට්ටුව නිසා කමක් නැද්ද මිස්."

"ඇයි?"

"නෑ ඉතින් මේ ගැරඬි සර්පයි එහෙම ඇති."

කෙල්ල කෝක් එකේ වූ අයිස් කියුබ් එකකින් ඔහුට ගැසුවාය.

"ඔයා කියනකොට එහෙම එයි. අපිට සිංදු කියන්න පුළුවන්. නේද අක්කා."

නේත්‍රා සිනාසුනාය

"සුද්දි ලස්සනට හින්දි සිංදු කියනවා මල්ලි."

ඇය කීවාය.

"අපි කියමුකෝ මිස් එහෙනම් ශ්‍රියා ගොෂාල්ගේ සෝන්ග් එකක්."

දේවක කීවේය. ඇයගේ දෑස් කෝමළ බවකින් බරවිය.

"අපි රෑට කියමු දැන් ලැප්ජයි ලයිට් ඕෆ් කරලා එහෙම."

දෙවක බලාගෙනම උන්නේය. නුහුරු නුපුරුදු සිතිවිලි මාලාවකින් මේ රාත්‍රියේ හදවත ගොළුව ඇත. මෙවන් රැයක් කොහොම උදාවුනිදැයි ඔහුම සිතුවේය.

"අක්කත් අද සිංදුවක් කියන්නෝන."

"අක්කා ඉස්සර ලස්සනට නිරංජලාගේ සින්දු කියනවා."

"එහෙනම් කියමු ඔබ දැක ගැනීමේ."

දේවක කීවේය.

"මොකක්ද ඔබ දැක ගැනිමේ."

"ඔබ දැක ගැනීමේ අරමුණ දිවා රැයේ. දෙඇසේ කැවේ කැවේ වැළි ලූ විලාසේ."

භාවනා දෙනෙත් එසෙව්වාය.

"ඒක හරිම ලස්සනයි තමා. මාත් හරිම ආසයි"

"මාත් ආසයි අක්කේ."

"කවුරුද දකිනකල්ද දැන් ඔය ඇස්වල වැළි ගෑවා වගේ දැනෙන්නේ."

කෙල්ලට ඕනා ඔහුගේ පපුව අදින්නටය. උත්තර නැත.

"කෙනෙක් ඇතිනේ සුද්දි එහෙම පුද්ගලික දේවල් තියෙනවනේ

කියන්න බෑනේ"

නේත්‍රා කීවාය.

"දුප්පත් ඇස්දෙකනේ අක්කා"

ඔහු කීවේය. භාවනා එහෙමම සිටියදී දෑස් පමණක් එසෙව්වාය. එය ඇයට පමණක් කළ හැකි ලස්සන වැඩකි.

"ඇස් කැවෙන කතාව ඇත්තද?"

ඇය ඇසුවාය.

"ඇයි මිස්ගෙත් ඇස් කැවෙනවද"

භාවනා සිනාසුනාය.

"ම්."

"ඇස් කැවෙනකොට ඇස් පියාගන්න ඒක තමයි කරන්න තියෙන හොඳම දේ."

"එතකොට."

"දෑස පියාගත් කළ මට මැවෙන්නේ ඔබේ රුව. එච්චරයි"

ඔහු කීවේය. භාවනා පුදුමයෙන් මෙන් බලාගෙන උන්නාය. පසුව ඇල්දිය වූ කොකා කෝලා එක බීගෙන බීගෙන ගියාය.

"මේක බොන්න. මේක අලුත්."

ඔහු අලුත් කොකා කෝලා එකක් දමා දුන්නේය.

# 28

වෙලාව රෑ දොළහටත් කිට්ටුය. රෑ කෑම ගෙන නිමාකළේ දැන් ටිකකට පෙරය.

දේවක බැල්කනියට වී උන්නේ කෙල්ලෝ දෙන්නට ඇඟ සෝදාගෙන රෑ ඇඳුම් දාගෙන ඇඳට එන්නට වෙලාවත් නිදහසත් දීය.

රාත්‍රිය සුවදායක සීතලකින් පෙහෙවත්ව උන්නේය. මේ හන්තානයේ ඇවිදගෙන යන්නට

තරම් හිතක් ඇතිවෙයි. පේරා කැම්පස් එකේ අලුත් බැච්වල කොල්ලෝ කෙල්ලෝ මහ රෑට හන්තානයේ ඇවිදින්නට යන බව දේවක දනී. එහෙම ගොස් වෙන දේවල්ද ඔහු දැනගෙන උන්නේය.

මේ යොවුන් විය කොතරම් රසබරද? එහෙත් මෙතුවකට ඒ රසබර බව මේ යැයි අතගා බලන්නට ඔහුටද වරමක් ලැබී නැත. ජීවිතය හැමදාමත් මේ වාලුකා කතරේම තනිවී තිබේවිද? දන්නේ නැත.

තරු කැට එහෙට මෙහෙට දෛවයේ තරු පොඩි පට්ටම් කරන්නට දේවකට සිතෙයි.

කාමරය ඇතුළෙන් ඔහුට එක එක සුවඳවල් එයි. වෙලාවකට හිතෙන්නේ

මේ කාමරය ඇතුලේ පොඩි දුවෙක් ඉන්නවා ඇතැයි කියාය.

"දේවකයියේ එන්න"

ඇය තිරයට මුවාවී කීවාය. දේවක හැරී බැලුවේය. ඔහු දැක්කේ අත් නැති රෑ ඇඳුමක් ඇඳගෙන වුන් යුවතියවය.

"එන්න ඇතුලට."

එහෙම කියා ඇය දුව ගොස් ඇඳට පැන පොරවනය පොරවාගත්තාය. දේවක සිනාසුනේය. දැන් යුවතියගේ පේන්නේ උරහිසත් මුහුණත් පමනි. 'මං ඔක්කොම දැක්කා' ඔහුට කියන්නට සිතෙයි. හදවත පුරා රසබර ගැහැණු රුවක කෝමළ රූපය ඇඳුනේ සදාකල් නොමැකෙන ලෙසය. ඇය දුව යද්දී ඇයගේ

සුන්දර වටොර ඔහු කාමරයේ වූ කහ පැහැ ආලෝක රේඛාවන්ගෙන් පැහැදිළිව දැකගත්තේය.

ටුවින් කාමරයක් යනු එක ළඟ දැමූ සිංගල් ඇඳවල් දෙකකි. ඇඳවල් දෙක අතර අඩි දෙක තුනක දුරක්වත් නැත. මොකක්ද හේතුවක් නිසා භාවනා ගත්තේ දේවකගේ ඇඳ පැත්තේ කොණය. නේත්‍රා කිසිවක් කීවේ නැත. දේවක සීතල වතුර ටිකකින් ඇඟ සෝදාගෙන ආවේය.

"අපි ලයිට් එක ඩිම් කරමු නේද මිස්."

ඔහු ස්විචයට අතක් තබාගෙන ඇසුවේය.

"හා"

ඇය ඩිම් වූ ලා කහ ආලෝකයෙන් ඔහුගේ රුව දෙස

බලාගෙන උන්නේය. හදවතේ ඇඳී තිබූ පිළිමයත් ඔහුත් අතර පුංචි සංසන්ධනයක් කරන්නට හිත උත්සහා කළා නොවේද කියා ඇය සිතුවාය.

"බැල්කනියේ වින්ඩෝ ඇරලා තියමු."

"එහෙම ෂෝක්. අහසත් පේනවා."

නේත්‍රා උන්නේද කවුළුව අතරින් පෙනෙන අහස දෙස බලාගෙනය. ඇය සොයුරියගේ පපුවට අතක්ද දමාගෙන උන්නාය. නොවේනම් නැගණිය අක්කාගේ අත ගෙන කිහිල්ල අස්සේ ගහගෙන උන්නාය.

"අර හින්දි ෂෝ එක පටන් ගන්න මෙන්න වෙලාව නේද අක්කා"

දේවක ඇඳ මත ඇලයට ඉඳගෙන කීවේය. භාවනා උන්නේද

ඔහුගේ පැත්තට නොවේනම්
හන්තානයට මුහුණ ලාය.

"රෑවෙලා."

"දැන් දොළහයි මිස්"

"අපි නිදාගන්නේ නෑ"

"එහෙනම් කෝපි බොමු"

"ඕඩර් කරමුකෝ"

දේවක කෝපි ඇණවුම් කළේය.
තද නිල් පැහැයේ බ්ලැන්කට්
එකින් ඇයගේ සඳක් වන් මුහුණ
ඔහුට පෙනෙයි. ඒ ඇලයට හැරී
උන් නිසාදෝ යුවතියගේ ළැම
තරමක් විවරව තිබුණි. ඇස් කීකරු
කරගැනිමේ දැවැන්ත උත්සාහයක
ඔහු නියැලෙමින් උන්නේය. තමාට
ඇත්තේ එහෙම අකීකරු දෑසක් බව
දේවකෙ දන්නේ අදය. 'නැහැදිච්ච
කමනේ' ඔහු තමාටම කියාගත්තේය.

"අක්කා ඉතින් කල්පනාව"

දේවක කීවේය. නේත්‍රා සිනාසුනාය.

"නිකං අහස දිහා බලාගෙන හිටියේ මල්ලී."

"මේ අහස යට ඔයාට කියන්න පුංචි ලෝකයක් දවසක හැදෙයි අක්කා"

කොල්ලාගේ කතාවට නේත්‍රාගේ පපුව ඇවිලිණ.

"ඔය කිව්වේ"

"අපි හෙට දැන් යමුකෝ අපේ වෙද මහත්තයා ළඟට. මාළිගාවටත් ගිහින් නේද මිස්."

"ම් අපි බාරයක් වෙලානේ යන්නේ අක්කේ"

"අක්කගේ ජීවිතේට මොනවද උනේ කියලා මම හරියට දන්නේ

නෑ. ඒත් ඔයාට එහෙම දුකක් දුන්න කෙනාට දවසක පසුතැවෙන්න වෙයි.”

දේවක කීවේය. ඒ කතාව ඇයගේ සමස්ථ කතාවවේම සාරංශයක් බඳුය.

“එයාට දවසක වෙන්නේ පසුතැවෙන්න නෙමේ දේවකයියේ විඳවන්නමගේ අක්කට දුන්න දුකට.”

භාවනා කීවාය.

“ඇති සුද්දි දැන්.”

ඒවා සිහිකරන්නට නේත්‍රා කැමති නැත.

“අපි දුකටත් එක්ක සිංදුවක් කියමු.”

“නිදාගෙන සිංදු කියන්න බෑනේ”

“එහෙනම් ඔතන ඉඳගන්න. මම කෝපි හදලා දෙන්නම්. හන්තානටම

හඳ පායපු මේ සීතල රාත්‍රියේ මහවැලි නිම්නයේ මල් පුබුදුවන්නට ඇය කටහඬ අවදි කරන්නට දැන් සූදානම් පිළිගන්න. අද මහනුවරට ආ අපගේ සුන්දර ගායන ශිල්පිණිය. ටැලන්ටඩ්. බියුටිෆුල්. ගෝජස්. ස්වීට්. ස්වීටස්ට්. භාවනා රඹුක්වැල්ල"

දේවක අනවුන්ස් කළේය. භාවනා නේත්‍රා දෙස බලා මුව වසාගෙන සිනාසුනාය. ඒත් කෙල්ල ඇඳ මත ඉඳගත්තාය. ඇය ඇඳගෙන උන් අතැනැති රෑ ඇඳුමින් ඇයට ලැබී තිබුනේ අනුරාගී අහිංසක ලස්සනකි. දේවක එදෙස බලද්දී භාවනා රැව්වාය. දේවක සිනාසී දැස් පහළට ගත්තේය.

"එකයි හොඳේ."

ඇය කීවාය. දේවක හිස

වැනුවේය. පසුව ඔහු බලාගෙ නම උන්නේය. ඔහුගේ දෑස්වල වූ කාන්තිමත් බැබලෙන කැල්ම ඇයට දරාගන්නට බැරි තරම්ය.

"හන්තානේ පැත්ත බලාගන්ඩ."

ඔහු ඇය වෙනුවෙන් හැදූ කෝපි එක ඇය අතටම දුන්නාය. නේත්‍රාගේ කෝපි එකද ඇයගේ පැත්තේ බෙඩ් කබඩ් එක මතින් තැබුවාය.

"තැන්කියු මල්ලියේ"

"යෝ ආ වෙල්කම් අක්කා"

නේත්‍රාගේ මුව මත තුනී මදහසක් ඇඳිණ. ඉන්නට තිබුනේ මේ වාගේ පිරිමි බාල සහෝදරයෙක්යැයි ඇයට දසවෙනි වරටත් සිතුණි.

"හරි. ෆෝ ත්‍රී ටූ වන්"

දේවක හන්තානය පැත්ත බලාගෙන කෝපි උගුරක් බී කීවේය.

"සෝන්ග් එක සාස මේ."

"ඒක ලස්සනයි."

"මූවි එක ජබ් තක් හේ ජාන්. සෝන්ග් එක කියන්නේ ශ්‍රියා ගෝෂාල්. මියුසික් ඒ ආර් රහමාන්."

ඇය පපුවට ලොකු හුස්මක් ගත්තාය. ඉල්ලීම ඔහුගේය. එය ඉටුකළ යුතුය.

"සාස මේ තේරී...සාස මිලේ තෝ...මුජේ සා සායේ.

මුජේ සා සාසේ...මුඩේ සා සායේ..."

දේවක උන්නේ ඒ හඬට මත්වීගෙන මෙන්ය. ඇයට ඒතරම් ලස්සනට හින්දි ගීත කියන්නට හැකියැයි ඔහු සිතුවේ නැත. එහෙත් ඇය දක්ෂය.

"රෑ හුනේ චූ ලී ජිස් මිකි කුෂ්බූ තු

ජෝ පා සායේ තු ජෝ පා සායේ තු
ජෝ පා සායේ"

දේවක දෑස් පියාගත්තේය. ඇය ඒ බව දැක්කාය. ගීතයේ අන්තරා කොටස ඇය පටන් ගත්තේ ඔහු දෙස බලාගෙනමය.

"සාස මේ තේරී... සාස මිලේ
තෝ... මුජේ සා සායේ.
මුජේ සා සාසේ... මුඩේ සා සායේ"

ඔහු හුස්මක් පවා ගන්නේ නැද්ද?? ඇය පරිස්සමින් බලාගෙන උන්නාය.

"කබ තක් හෝෂ සමාබලේ කෝඊ
හෝෂ උඩේ තෝ උදානේ දෝ.
දිල් කබ සීති රාහචලා හේ.
රාහ මුදේ තෝ මුජ් ජානේ දෝ..."

හන්තානයම සන්සුන්ව දැහැනකට සමවැදී උන්නාක් සේය. යුවතියගේ

හඬින් ආවේ නොඉඳුල් යුවතියකගේ හදවතකින් එන පිරිසිදුම හඬකි. දේවක ඒ දැහැනින් මිදුනේම නැත. ඔහුට මිදෙන්නට ලෝබය. නොවේනම් මිදෙන්නට ඇයගේ හඬ ඉඩක් දෙන්නේ නැත.

"තේ රෙ කයා ලමේ දූබකේ අස්සර් අච්චී ලගී තනහා.

සාස මේ තේරී.තත සාස මිලේ තෝ මුජේ සා සායේ...මුජේ සා සායේ"

භාවනා ගීතය නිමාකළේ මෘදු හතියක්ද සමඟය. දේවකගෙන් බලාපොරොත්තුවූ අත්පොළසන් හඬ ආවේ නැත. ඒ වෙනුවට ඔහු ඇය දෙස බලාගෙනම උන්නේය. ඒ බැල්මෙන් ඇය ගැස්සී ගියාය.

"අර ඈත හන්තානේ ඉඳලා

කවුරුහරි ඒ සෝන්ග් එක කිව්වා වගේනේ. මාරයි පුදුම ලස්සනයි. අපරාදේ...”

“ඇයි අපරාදේ.”

“මේ සුපර් මාර්කට් එකකට වෙලා දුක් විඳින්නේ. නේද අක්කා.”

දේවක කීවේය. භාවනා අක්කා දෙස බලා සිනාසුනාය.

“කෝපි එක බොන්න.”

ඔහු කරුණාවෙන් කීවේය. මහා පිපාසාවකින් උන් කෙනෙක් මෙන් භාවනා කෝපි එක බොන්නට ගත්තාය. ඔහු හැදූ කෝපි එක රසය. ඇය නෙත්වලින් ඔහුට ප්‍රසංසා කළාය.

“ඒ ෆිල්ම් එක බලන්නම ඕන.”

“මං ළඟ ඩීවීඩි එක තියෙනවා. දෙන්නද දේවකයියට.”

ඇය ඇසුවාය.

"අපේ ගෙදර ඩීවීඩි එකක් නෑ මිස්. මම කම්පියුටර් එකෙන් බලන්නම්"

නේත්‍රාට නින්ද ගොස් තිබුනේ දෙන්නාගේ කතාව අතරවාරයේය.

"පව් අක්කට නින්දත් ගිහින්. මගේ සෝන්ග් එක එච්චරටම නිදිමතයි"

ඇය කීවාය.

"ඒක නෙමේ ඒ සෝන්ග් එක හරිම දුක්බරයි."

ඔහු කීවේය.

"එහෙම දුක හිතෙනම මීනින් එකක් නෙමේ දේවකයියේ තියෙන්නේ ඒකට."

"මම හින්දි දන්නේ නෑනේ."

"මම කියන්නම්. දුවලා එන්නම්. කෝ අහක බලාගන්න."

දේවක සිනාසී හන්තානය දෙස බලාගත්තේය. කෙල්ල පොරවාගෙන උන් බ්ලැන්කට් එක අස්සෙන් පැන නාන කාමරයට දිව්වාය. ඒත් දේවකගේ ඇස් පිටුපා යන යුවතිය වෙත ගියේ නොදැනීමය. ඇය නාන කාමරයේ දොර අසළදී දොර අල්ලාගෙන බැලුවාය. ඔහුගේ හොරය අසුවිය. භාවනා යටිතොළ හපාගෙන රැව්වාය. දේවක සිනාසී හන්තානය දෙසට නෙත් යැව්වේය.

නින්දක් පේන අහලක නැත. ඔහුත් සමඟ ඇහැරී නැලවෙන හිත ගැන භාවනාට පුදුමය. 'මේ රෑ හන්තානේ අපි දෙන්නා විතරක් ඇහැරලා. ඇයි මේ.' භාවනා ඇගේ සිතින් ඇසුවාය. කියන්නට තේරෙන්නේ නැත.

ඇය ආවේ කැඩපත දෙස බලාගෙන විනාඩියක් පමණ ඉඳලය. එන්නට පෙර ඇය එහි වූ විලවුන් බෝතලයෙන් බිංදු දෙකක් ගෙළ දෙපසට විදගත්තාය. 'හරියට එතන කවුහරි මේ රෑ ඉඹිනවා කියලා හිතාගෙන වගේනේ.' හිතෙන දේවල්වලට ඇයම සිනාසුනාය. හිතට යන දුරකට යන්නට දුන්නාට කමක් නැත. ඒත් හැබෑවට ඒ දුර යා හැකිද? දන්නේ නැත.

ඇය ආවේ සුවඳත් අරගෙනමය. ඔහු ඇඳ වියලුට බරවී ඇලයට නිදාගෙන උන්නේය. දෙදෙනා අතර ඇත්තේ අඩි දෙකහමාරක හෝ තුනක පමණ දුරක් පමණි. දේවක ඇය දෙසට හැරුණේය. භාවනා කොහොමත් බිලුන්කටි එක පොරවාගෙන හැරුනේ ඔහුගේ

පැත්තටය. යුවතිය කාමරයේ වූ අඬ අඳුරින් ඔහුගේ රූපයේ සමීප රූපයක් දෑසින් ගත්තාය.

"අර සෝන්ග් එකේ මීනින් එක."

ඇය සිනාසුනාය. දෙපසට වෙන ලවන් දෙස මෙහෙම බලාගෙන ඉන්නේ ඇයිදැයි ඔහුම සිතින් ඇසුවේය. මෙච්චර ළඟට එහෙම ගෑණු රූපයක් දෙස බලා හිඳ නැත. හිතම හෙල්ලී ඇත්තේ ඒ නිසාද??

"ඔයාගේ හුස්ම මගේ හුස්මත් එක්ක එක්වුණාම මම හුස්ම ගන්නවා"

ඇය එහෙම කිව්වේ ඔහුගේ දෑස් දෙස බලාගෙනමය. ඒක සිංදුවේ තේරුමද නොවේනම් ඇය කියූ දෙයක්ද කියා වෙන්ව හඳුනාගන්නට දේවක අපොහොසත් විය.

ඒත් ඔහු කල්පනාබරව අසාගෙන උන්නාය.

"ඔයා මං ළඟට ආවාම. ඔයාගේ සුවඳ මගේ ආත්මය ස්පර්ෂකරනවා."

ඇය යළිත් කීවාය. දේවක කාමරයේ විසිර විහිද ගිය සුවඳක් වින්ඳේය. ඒ මොහොතකට කළින් ඇය ගල්වාගෙන ආ විලවුන් බිඳුවේ සුවඳය.

"කොච්චර කාලයක් හැඟීම් පාලනය කරගෙන ඉන්ඩද? සිහිය නැතිවෙනවානම් නැතිවෙන්න දෙන්න. හදවත කොතනකදී හරි හැරෙනවානම්. හැරෙන්න දෙන්ඩ. මම ඔයාගේ සිතුවිලි අතර ඉන්නා විට. කාංසිය නැතිවෙලා යයි. එහෙම වෙන්ඩ දෙන්න."

ඇය බිලැන්කට් එකෙන් මුහුණ

පමණක් පෙන්වාගෙන කීවාය. දේවක හුස්මක්වත් ගත්තේ නැත.

"මේ රාත්‍රිය ගෙවෙන්නේ ඔයාගේ දෑත් අතර නම්...

උද්‍යසන හරිම පැහැබර වේවී."

ඒ වචන ආවේ උගුරින් මෙන්ය. ඒ තරම් මෘදු හඬකින් ගොරෝද හඬකින් එවදන් කිව යුතුද? ඇය කියන්නේ එහෙමය.

"ඔයා මගේ දෑස් තුළ ජීවත්වෙන්න පටන් ගත් දා සිට... එය නෙත්වෙනවා.

මගේ ළඟට ඇවිත්...මාව අල්ලාගෙන කියන්න.

මා නමින් ඔබ දිව්රා කියන්න.

මගේ හුස්මක් වැටෙන්නේ...ඔයාගේ හුස්මක් මුසුවූ පසුව කියා...කියන්න."

භාවනා කීවාය. දේවක දෑස් අයාගෙන උන්නේය.

"දේවකයියේ."

ඇය කතාකළේ ඔහු දෑස් පියාගෙන උන් නිසාය.

ඔහු දෑස් විවර කළේ නැත.

ඇය ඔහු පැත්තේ තිබූ අතක් නිකමට මෙන් ඔහුගේ බාහුවකට ගෙන ගියාය.

"දේවකයියේ."

යුවතියගේ සිනිඳු අතක පහස ඔහුගේ බාහුවට දැනුණි. ඕනා වූයේ එයද?

දේවක දෑස් විවර කළේය.

"නින්ද ගියාද?"

ඇය මෘදුව ඇසුවාය. දේවක සිනාසුණේ දෑසිනි.

"මං අහගෙන හිටියේ. පුදුම

තේරුමක්."

භාවනා ඇගේ සුරත ගෙන ඇගේ කොට්ටය අස්සේ ගසාගත්තාය.

"එච්චර ලස්සනට ඒ තේරුම කිව්වේ කොහොමද මිස්."

ඒක ඇයවත් දන්නේ නැත. මේ සිංදුව ඇසූ දා භාවනා අන්තර්ජාලයට ගොස් එහි තේරුම බලාගත්තාය. ඒ මීට වසරකට පමණ පෙරය. එය මේ තරම් අපූරුවට තමාට මතක හිටියේ කෙසේද? ඇරත් මේ තරම් සුන්දර සිංහල වචනවලින්'

"මට එහෙම කියවුණා."

වැහි සීතලට සමාන සීතලක් හන්තානය පැත්තේ සිට ආවේය. භාවනා මොහොකට ඇකිලී ගියාය. කොහොමත් හෝටල් කාමරය

ඇතුළත වායුසමනය කර ඇත.

"සීතල වැඩිනම් ඒ සී වහන්නම්."

"එපා සීතල සනීපයි."

"පොරවගෙන ගුලිවෙලා ඉන්ඩ නේ."

"ඇයි පොරවන්නේ නැත්තේ"

"මට එහෙම සීතලක් නෑ."

ඇය බලාගෙනම උන්නාය.

"නිදිමතද?"

ඔහුට ඇසිණ. භාවනා නැතැයි කියන්නට මෙන් හිස දෙපසට වැනුවාය. මේ ගතවෙන්නේ මැදියම් රැය බව දෙදෙනාම දනී.

"ලයිට් එක තව චුට්ටක් අඩුකරන්න ඕනද"

"මිහ් මේ ගාණ ෂෝක්."

නැත්නම් මූණ පේන්නේ නැත.

"දේවකයියේ."

"මි."

"සාස්තර කියන්ඩ දන්නේ නෑ නේද?"

ඔහු සිනාසුනේ දෑස් වසන් කරගෙන මෙන්ය.

"මට හිතිලා කිව්වේ."

"එච්චර හොඳට. ඇත්තම ඇත්ත කිව්වේ."

දේවක කිසිවක් කීවේ නැත.

"ඇත්තද මම කිව්වේ."

"මි. ගොඩක්."

ඔහු පොරවනය ගෙන යන්තම් වතට දමාගත්තේය.

"දෙයක් අහන්ඩද?"

"හා."

කෙල්ල මොනවා අහයිද කියා

දේවක සිතුවේය.

"සීගිරි එකටම ආවේ ඇයි."

ඇය ඇසුවාය. දේවක සිතුවේ ඒ ප්‍රශ්නයට කොහොම උත්තර දෙන්නද කියාය.

"හේතුවක් කියන්නම ඕනද"

"ඒ කියන්නේ තියෙනවා."

"ම්. දවසක මම කියන්නම්."

ඔහු කීවේය.

"ඇයි එහෙම ඇහුවේ."

"එහෙම හිතුන නිසා."

"ඒක සාමාන්‍ය දෙයක්නේ. ඉන්ටර්වීව් එකක් කෝල් කළාම කට්ටිය එනවනේ තව අය ආවේ"

"දන්නේ නෑ. ඔයා ආපු එක. වෙනස්."

"වෙනස් ඇති. මට බොරුවක් කියන්න බෑ. දවසක කියන්නම් ඇයි

කියලා."

"කියන්නම ඕන හොඳද?"

"පොරොන්දු වෙනවා."

ඇය සිනාසුනාය.

"ගොඩක් රෑ වෙලා. නිදාගන්න."

"වින්ඩෝ ඇරලා හන්තානේ ඉඳලා කවුරුහරි පනියිද?"

"මං බලාගෙන ඉන්නම්. ඇහැරගෙන."

ඔහු නිදාගන්නේ නැත්ද? භාවනාගේ දෙනෙත් යන්තමට පියවිණ. එහෙත් ඒ සැනෙකින්ම ඇය දෑස් විවර කළාය. ඔහු වත රැළි පොරවනය පැත්තක තබා ඇඳෙන් නොබැස දෙපා පමණක් බිමට දැම්මේය. ඊටත් පසුව ඇයගේ පහත් වී තිබූ පොරවනය ගෙන හරියට සකසා උරහිස දක්වාම හොඳින්

පෙරෙව්වේය. භාවනා පුදුමයෙන් බලාගෙන උන්නාය.

"නිදාගන්න. බුදු සරණයි."

දේවක කීවේ යන්තමට ඇගේ හිස පිරිමැදය. කුමක් හෝ හේතුවක් නිසා ඇයගේ දෑස් තෙත්විය.

"බුදු සරණයි. අයියත් නිදාගන්න."

"හා."

හරි ඉක්මනට භාවනාගේ දෙනෙත් පියවිණ. දැන් වෙලාව රාත්‍රී දෙකය. ඔහු ඇගේ පැත්තට හැරී ඒ මුහුණ දෙසම බලාගෙන උන්නේය. නිදිබර බව බේරෙන ඒ මුහුණ මොහොතකට දෝතට ගන්නට හිතෙනා තරම්ය.

ඔහුට සිහිවූයේ මොහොතකට පෙර ඇය කියූ සාසමේ ගීතයේ තේරුමේ එක් වැකියක්ය.

"කොච්චර කාලයක් හැඟීම්

පාලනය කරගෙන ඉන්ඩද? සිහිය නැතිවෙනවානම් නැතිවෙන්න දෙන්න. හදවත කොතනකදී හරි හැරෙනවානම්. හැරෙන්න දෙන්ඩ. මම ඔයාගේ සිතුවිලි අතර ඉන්නා විට...කාංසිය නැතිවෙලා යයි..එහෙම වෙන්ඩ දෙන්න."

සිහිය නැතිවෙනවානම් නැතිවෙන්න දෙන්න දේවකටත් ආසය.

# 29

උඩ පේරාදෙණියේ දයාරත්න වෙද මහතාගේ නිවස පිහිටියේ සුන්දර තැනකය. එතරම් උස් නොවූ කන්දක් පාමුළ වූ ඒ නිවස දකිද්දී නේත්‍රාගේ සිතට පෙර ඇතිනොවූ විශ්වාසයක් ඇති විය. ඇය මේ ගමන ආවේ දේවකගේ බලකිරීමට මිසක මේ ගමනින් මේ පණ නැති දෙපාවලට පණ එතැයි සිතාගෙන නොවේ. එහෙත් තම ජීවිතය වෙනුවෙන්

දෙයක් අවංකව කරන්නට යන කොල්ලා ගැන ඇයට ඇතිව තිබුනේ කිව නොහැකි සහෝදර ප්‍රේමයකි.

මැයි මාර ගසක් යට දේවක වාහනය නවතා බැස්සේය. නේත්‍රා ඇඳගෙන උන්නේ බතික් මෝස්තරයේ සායක් සහ සුදු බ්ලවුසයකි. දේවකත් සමඟ භාවනාද බැස්සාය. පසුපස අසුන අසළට ආ දේවක දොර ඇර සිනාසුනේය.

"අපි යන් අක්කේ."

නේත්‍රා අසරණව සිනාසුනාය. වෙද මහත්තයාගේ නිවස වෙත යා යුත්තේ අඩි විස්සක පමණ උස ගල් පඩි පෙළක් නැඟය. නේත්‍රා ඉහළ වූ නිවස දෙස බැලුවේ කිසිවක් නොකියාය.

"මම අක්කව ගන්නම්. එන්න"

ඊටත් පසු දේවක ඉතාමත්ම

දයාබර ලෙස නේත්‍රාව ඔසවා ගත්තේය. ඇයට බැලුනේ භාවනා දෙසය. මේ දර්ශනය භාවනාගේ හදවත තුළ මොකක්ද රසබර සතුටක් ඇති කළේය. එය විස්තර කළ නොහැක්කකි.

"අපි උඩට යන්. අක්කගේ ෆයිල් එකත් ගන්න මිස්"

"මං ගන්නම්"

"බුලත් අතත් ගන්න"

"ම්"

නේත්‍රා තමාව ඔසවාගෙන යන දේවක දෙස බැලුවේ ඔහුගේ ගෙළ තදින් අල්ලාගෙනය. ඔහු ඒ තරම් පහසුවෙන් අක්කාව ඔසවාගෙන යන්නේ කෙසේදැයි භාවනාට සිතාග න්නට නොහැකි විය. දේවකගේ බාහු ඉල්පී ඒවායෙන් අතගා බලන්නට

සිතෙනා තරම් පිරිමිකමක් ඇය දැක්කාය. ඇය පියමැන්නේ ඔහුට සමාන්තරවය.

"ඔයාට පින් මහත්තයෝ"

නේත්‍රා මුව පුරා කීවාය. දේවක සිනාසුනේය.

"මං එක දෙයක් විෂ් කරනවා අක්කා. මාළිගාවේදීත් ඒක කළා"

"ම්."

"ඔයා දවසක ඇවිදිනවා. අපිත් එක්ක"

"ම්. ඔයාලා දෙන්නත් එක්ක"

නේත්‍රා ඒ වදන් බරකර කීවාය. භාවනා බැලුවාය.

හිතුවට වඩා ඉක්මනින් දයාරත්න වෙද මහතාව හමුවෙන්නට ලැබිණ. දේවක ඔහුගේ මිතුරෙක් මාර්ගයෙන් සියල්ල සූදානම් කර තිබිණ.

"අපි වෙද මහත්තයා කොළඹින්. අසේළගේ යාළුවෙක් මම. දවස් ගාණක් මම මෙහේ ආවා. වෙද මහත්තයාට මතක නැතුව ඇති"

දේවක බුලත් අත වෙද මහතාට දී වැන්දේය. භාවනාද වැන්ඳාය. නේත්‍රා දෑත් එක්කළේ පුටුවේ ඉඳගෙනමය.

"මී තුණුරුවන් සරණයි. කියමුකෝ බලන්න. කවුද ලෙඩා මේ දරුවද?"

වෙද මහතා නේත්‍රා දෙස බලා ඇසුවේය

"ඔව් වෙද මහත්තයා අපේ අක්කා. අක්කගේ මේ කකුල් දෙක"

වෙද මහතා පුටුවක් ළඟට ගත්තේය.

"තියමු බලන්ට කකුල් දෙක මෙතන."

නේත්‍රාට අසීරුත් ඒකය. ඇය

අසරණව බැලුවාය.

"මං තියන්නම්."

"මිහ්. ඇයි තියන්ට අමාරුද දරුවෝ."

"ඔව් වෙද මහත්තයා. එහෙම අමාරුයි. දෙපැත්තට පුළුවන් උස්සන්න බෑ."

"මි."

වෙද මහතා දේවක දෙස බැලුවේය. දේවක ඇයගේ දෙපා ගෙන පුටුව මතින් තැබුවේය.

"ඔයා ඇඳුම ටිකක් උඩට කරමුකෝ. අපි බලමු."

භාවනා නේත්‍රාගේ සාය මඳක් උඩට කළාය. ඊටත් පසුව වෙද මහතා නැගිට රාක්කයක තිබූ තද කොළ පැහැගත් තෙල් බෝතලයක් ගෙන ඉන් සෑහෙන තරමක් අත්ලට

ගත්තේය. පසුව ඔහු ඉහළ සිට පහළට නේත්‍රාගේ දෙපාවල එය ගෑවේය.

"මේක අතට ගන්න මේ දරුවා."

දේවක දෙසට බුලත් කොළයක් දිගුකර වෙද මහතා කීවේය.

"දැන් මේ මැටි පහනට තියලා බුලත් කොලේ රත්කරලා අක්කගේ කකුල් දෙක තවන්ට. දිගටම මම ටිකකින් එන්නම්. ම්"

"හොඳමයි වෙද මහත්තයා"

දේවක නේත්‍රාගේ දෙපා අසළ දණ ඔබාගෙන ඔහු කියූ ලෙසම කළේය. නේත්‍රා තෙත්ව ගිය දෑසින් බලාගෙන උන්නාය.

"ඔයා පව්"

දේවක සිනාසුණේය.

"සනීපයක් දැනෙනවද අක්කා"

නේත්‍රා භාවනාගේ අතක් අල්ලාගෙන සිනාසුනාය.

"මාත් කරන්නද දේවකයියේ"

"මිස් ඉන්නකෝ. මේක මට පුළුවන්. අපේ අක්කනේ"

නේත්‍රාට ඔහු ගැන පුදුමය.

"හරි සනීපයි"

"වෙද මහත්තයා අපිට තෙල් එහෙම දෙයි. ආපු ගමන් මෙහෙම කරන්න ඇත්තේ මොකක්හරි හේතුවක් නිසා."

"ම්"

ඔහු තරම් ලස්සනට තමාට අක්කාගේ දෙපා තවන්නට නොහැකි යැයි භාවනා සිතුවාය. ඔහු අක්කාගේ දෙපා ළඟ බිම දණ ඔබාගෙන එය කරන්නේ වෙනමම දැහැනකට සමවැදී මෙන්ය.

වෙද මහත්තයා පැමිණි දේවක එය කරන අයුරු බලාගෙන උන්නේය. දයාරත්න වෙද මහතා සිනාසුණේ කරුණාබර ලෙසිනි.

"මාස නමයක් අක්කා වෙනුවෙන් මේ පුතාට මේක කරන්න පුළුවනැයි. මී. උදේ හවා."

වෙද මහත්තයා ඇසුවේය. නේත්‍රා පුදුමයෙන් භාවනා දෙස බැලුවාය.

දේවක සිනාසුණේ සැහැල්ලුවෙනි.

"අපේ වෙද මහත්තයා මට කියන්නකෝ මාස නමයක් නෙමේ දහ අටක් නැත්නම් විසි හතක්. කියන කාලයක් මම අක්කා වෙනුවෙන් මේක කරන්නම්. ඒක මොකක්ද?"

නේත්‍රාගේ පමණක් නොව භාවනාගේද පපුව ඇවිලිණ. 'ඔයා කවුද දේවක' ඇසිය යුත්තේ එයයි.

"ම්. හොඳයි. එහෙම සහෝදරයෝ හිඟයි. බොහෝම හිඟයි"

වෙද මහතා කීවේය. භාවනා දේවක දෙස බලාගෙන උන්නේ කෘතවේදීවය. මේ ඔහුගේ සොහොයුරිය නොවේ. එහෙත් ඔහු වැනි මල්ලී කෙනෙක් ඇත්තටම අක්කාට ඇතැයි වැනි හැඟීමක් භාවනාට දැනුණි.

වෙද මහතා ඉන් පසු පැය දෙකකට ආසන්න කාළයක් පුරා නේත්‍රාව පරීක්ෂා කළේය. එය පුදුමාකාර පරීක්ෂාවක් විය. ඇයට සුදු රෙදි කඩක් ඇඳගෙන ලී ඇඳක වැතිරී සිටින්නට සිදුවිය.

අවසානයේදී වෙද මහතා කතාකරන්නට පටන් ගත්තේය. භාවනා නේත්‍රා පමණක් නොව

දේවකද උන්නේ ගැහෙන සිතකිනි.

"අක්කව සනීප කරන්න පුළුවන් නේද වෙද මහත්තයා."

ඔහු දේවක දෙස බලා මෘදුව සිනාසුනේය.

"අපි මාස නමයකින් අක්කව ඇවිද්දවමු. ම්. ඒක එහෙමමයි කියලා හිතා ගන්නකෝ මේ දරුවෝ."

දේවකගේ දෙනෙත් තෙත්විය. ඔහු තෙත දෑසින්ම නේත්‍රා දෙස බැලුවේය. කොල්ලාගේ ඇස්වල වූ තෙතමනය නේත්‍රා පමණක් නොව භාවනාද දැක්කාය.

"මේ පුතා අව යන්නේ. අපි පුර දවසක් බලලා වෙදකම් පටන් ගමු. ම්. බලමු කවදද කියලා?"

ඔහු දින දර්ශනය ගෙන බැලුවේය. භාවනා නේත්‍රාගේ බාහුව පිරිමැද්දාය.

මේ කතාව නේත්‍රාට අදහාගන්නට බැරි තරම්ය.

"හරි අපි දාහත්වෙනිදා පටන් ගමු. එදාට හොඳ නැකතක් තියෙනවා. එක්කන් එන්න පුළුවනැයි"

"එහෙමයි වෙද මහත්තයෝ. අපිට කියන දවසකට එන්න පුළුවන්. ඒක අමාරු නෑ. දවසක් දෙකක් වුනත් නැවතිලා හරි ඉන්න පුළුවන්"

දේවක කීවේ බියක් නැතිවය. භාවනාද හිස සැළුවාය.

"ප්‍රශ්නේ තියෙන්නේ දරුවගේ කකුල් දෙකේ නෙමේ. ස්නායුවල. අපි බෙහෙත් කරන්නේ ඒකට. කකුලට තෙල් සාත්තුවක් කරනවා විතරයි. ඒක මේ දරුවා කරන්න ඕන."

"එහෙමයි වෙද මහත්තයා."

"එක බෙහෙත් වර්ගයක් තියෙනවා

මගේ ළඟ අහවර වෙලා. එහෙම වුනොත් තුන්වෙනි මාසේ විතර ඒක මට ඉන්දියාවෙන් ගෙනත් දෙන්ට ඕන. තේරුණාද?"

"අපි ගෙනත් දෙන්නම් වෙද මහත්තයා ඒක කරන්න පුළුවන්"

දේවක කීවේ භාවනා දෙස බලාගෙනය.

"අපි එහෙනම් දාසයවෙනිදා උදේම ඇවිත් ඉන්නම් වෙද මහත්තයා"

"ම් හොඳා. මාළිගාවටත් ගිහින් දාහත්වෙනිදා උදේ හතට මෙතන ඉන්ටකෝ"

දේවක පඬුරු තැබූ බුලත් අත ඔහුගේ මේසය උඩින් තැබුවේය.

"දුකක් හිතේ තියාගන්ට එපා දරුවෝ. අපි මේක කරනවා. ම්.

උපරිම අවුරුද්දක් යන්ට පුළුවන්. එක එක්කෙනාගේ ස්නායුවල තත්වය අනුව. ඒත් අපි ඇවිදිනවා."

නේත්‍රාගේ දෑස් තෙත්ව තිබුණි.

"වෙද මහත්තයට පින්"

නේත්‍රා අමාරුවෙන් පහත් වී වැන්ඳාය.

නේත්‍රාව දේවක ඔසවාගෙන පහළට ආවේ එක්කාගෙන ආවාටත් වඩා ආදරයෙනි. නේත්‍රාගේ දෑස්වලින් කඳුළු ආවේය.

"අඩන්න එපා අක්කේ. අපි දවසක මේ පඩිපෙළ බැහැගෙන යන්නේ ඇවිදගෙන."

ඔහු කීවේය.

ඇයට කියන්නට දෙයක් තිබුණි. එහෙත් මෙහෙම යද්දී අමාරුය. ගල් පඩිපෙළ බැහැගෙන එද්දී භාවනාව

වැටෙන්නට ගියේය.

"පරිස්සමින්."

දේවක කීවේය. භාවනා නොවැටී බේරුනේ ඔහුගේ උරහිසට සුරත තබාය.

"තව චුට්ටෙන් මං රෝල් වෙලා බිම. මටත් යන්න වෙන්නේ එහෙනම් වීල් චෙයා එකෙන්."

ඇය සිනාසී කීවාය.

"එහෙම වුනත් බයවෙන්න එපා. අපි සනීප කරගමු."

දේවක කීවේය. 'එහෙම වුනොත් ඔයා මගේ කකුල්වලත් තෙල් ගායි. ඒත් ඇයි දේවක' භාවනා අක්කාව වඩාගෙන යන දේවකගේ මුහුණ දෙසම බලාගෙන සිතුවාය.

පේරාදෙණියෙන් පිටවී යන්නට දුකය. තව දවසක් දෙකක් මෙහෙම

ඉන්නට තිබුණානම් කියා භාවනාට සිතෙයි. භාවනා වාහනයට ගොඩවූයේ ඒ දුක හිතේ තියාගෙනමය.

"මිස්"

දේවක වාහනය පණගන්වන්නේ නැතිවමම කතාකළේය. 'මං එයාට ලස්සනට අයියා කියනවා එයා මෙතන මිස් කියනවා.' භාවනා සිතුවාය.

"මි."

"අම්මටයි තාත්තටයි කෝල් එකක් අරන් කියන්නකෝ. අක්කව සනීපකරන්න පුළුවන් කියලා කිව්වා කියලා එයාලටත් ආසයිනේ."

දේවක කීවේය. භාවනාට බැලුවේ පිටුපස උන් නේත්‍රා දෙසය.

"පුදුම සතුටක් දැනෙයි එයාලට. මං කියන්නම්."

දේවක වාහනය ගත්තේය. භාවනා

නිවසට ඇමතුමක් ගත්තාය.

"අම්මා මං. මේ පේරාදෙණියේ ඉඳලා."

භාවනාගේ හඬේ තිබුනේ කිවනොහැකි තරම් සතුටකි.

"ඔව් මේ දැන් පෙන්නලා එළියට ආවා විතරයි. හරි පුදුම තැනක් අම්මා. දන්නවද අම්මා. අක්කව මාස නමයකින් සනීප කරනවා කිව්වා ඔව් ඇවිද්දවනවා. ඇත්තමයි"

භාවනා කීවාය. අම්මාට ඇඬුණි.

"අනේ ඉතින් අඬන්න එපා"

ඒ ටික කියද්දී භාවනාටත් ඇඬුණි.

"ඉක්මනට එන්නම්. ඔව්. හා. බුදු සරණයි."

භාවනා දුරකථනය කනෙන් ගත්තේ කඳුළු පිසදමාගෙනය.

"පව් එයා අඬනවා."

ඇය කීවාය. ඔහු අම්මාටත් තාත්තාටත් කතාකරන්න කීවේ මේ නිසාය. භාවනා කෘතවේදීව බැලුවාය.

"තාත්තට මිස්"

"මේ ගන්නවා"

නේත්‍රා පිටුපස සිට කඳුළු පිසදාගත්තාය.

"තාත්තා මං සුද්දි."

ඇය කීවාය. 'සුද්දියෙක්ම තමා' දේවකට සිතුණි. 'මටත් බැරිද දන්නේ නෑ සුද්දි කියන්න'

"ඔව් මේ එහේ ඉන්නේ. ගුඩ් නිව්ස් තාත්තා. අපිට අක්කිව සනීපකරගන්න පුළුවන්. ඔව්. ෂෝක් වෙද මහත්තයා කෙනෙක්. අක්කව ගොඩක් වෙලා බැලුවා තෙල් සාත්තුවකුත් කළා. ඔව් දේවක අයියා කළේ. මාස නමයකින් ඔයාගේ ලොකු දුව ඇවිදිනවා

තාත්තා. දුක් වෙන්න එපා."

භාවනා කීවාය. තාත්තාගේ කටහඬ ටිකකට නැතිවිය. අක්කාට මෙහෙම වෙද්දී ඔහු කොතරම් දුකක් විඳින්නට ඇත්දැයි භාවනා සිතාගත්තාය.

"හැමදේම කරනවා තාත්තා හැමදේම. මී. අපි ඇවිත් විස්තර කියන්නම්. හොඳේ මේ තාම පේරාදෙණියේ."

භාවනා කීවාය. ඇය දුරකථනය තබා ආසනයේ දිග ඇදී පිටුපස උන් අක්කාගේ අතක් අල්ලාගත්තාය.

"අඬන්නෙපා අක්කා."

දේවකටද දුකය. භාවනා දේවක දෙසට හැරී පසුව ගියරය මත තිබූ ඔහුගේ වමතට සුරත තැබුවාය. ඇයගේ අතින් ආ මෘදු රස්නය

දේවකව මොහොතකට කම්පනයට පත්කළේය.

"හැමදේකටම දේවකයියට පින්."

ඇය කීවාය. එහෙමම කීවාය. එහෙම කියන්නේ නැත්නම් එය ගුණමකුකමකි.

"එහෙම කියන්න එපා. මගෙත් අක්කා කියලා හිතන්නකෝ."

ඔහු කීවේය. ඒ වචන ටිකට කෙල්ලෝ දෙන්නාගේම පපුව ඇකිලිණ. 'ඇත්තටම ඔයා මගේ මල්ලී කෙනෙක් වෙන්න ඇති' නේත්‍රාට සිතුණි.

"ඉතින් අපි මෙහෙමම යන්නද ලෑස්තිය අපරාදෙනේ අයියෝ."

භාවනා කීවාය. දේවක සිනාසුනේය.

"හවස් වෙන්න ගියාම ඇත්ද මිස්."

"චුට්ටක් රෑ වුනත් මොකෝ"

කෙල්ලත් ආස එහෙම රෑ වී ගෙදර යන්නටය. ඒකෙ මොකක්ද දෙයක් ඇත.

"එහෙමනම් අපි නුවරඑළිය පැත්තෙන් යමු මෙතනින් නුවරඑළියට ගිහින් දවල්ට එහෙන් කාලා එහෙම අපි හැටන් හරහා පහළට බහිමු කමක් නැද්ද අක්කා"

දේවකා ඇසුවේය.

"අක්කා හරි. අපි යන්"

භාවනා කීවාය. නේත්‍රා පිටුපස සිට සිනාසුනාය.

"අපි ඉතින් මේ සතුට ටිකක් සමරන්නත් ඕනනේ. නේද අක්කා."

භාවනා කීවාය. තවමත් මේ දේවල් නේත්‍රාට සිතාගන්නට අමාරුය.

"අක්කා"

"මල්ලී"

"අක්කා විශ්වාස ගන්නේ නෑ අක්කා"

"අනේ විශ්වාසයි මල්ලි"

"ඒ විශ්වාසයෙන්ම ඉන්න. ඒක නැතිකරගන්න එපා"

"මාව හැමදාම මෙහෙම පේරාදෙණි එක්කගෙන එන එක මල්ලිට වදයක් වෙයිද දන්නේ නෑ"

ඇය අමාරුවෙන් ඇසුවාය. දේවකට දුක සිතුණි.

"අනේ තාම මේ මාව තේරුම් අරන් නෑනේ. මොනවා කරන්නද?"

කොල්ලා කිව්වේ දුකිනි. නේත්‍රාටද දුක සිතුණි. ඇය අමාරුවෙන් ඉදිරියට පැමිණ දේවකගේ උරහිසට අතක් තැබුවාය.

"ඔයා පුදුම කෙනෙක්නේ මල්ලියේ.

වෙලාවකට විශ්වාස කරන්න බෑනේ කොල්ලෝ මෙච්චරම හොඳ නෑනේ"

ඇය එහෙමම කීවාය. භාවනාටද ටික වෙලාවක සිට එය කියාගන්නට ඕනකමින් උන්නාය. ඒත් ඇයට එය අමාරුවිය. 'අක්කා කියපු එක හොඳයි.'

"අපිත් හිතුවේ ඒක තමා."

භාවනා උගුරෙන් මෙන් කිවාය. දේවක ලැජ්ජාවෙන් හිස කැසුවේය.

"මට ඉතින් අක්කවයි මිස්වයි මගේම අය වගේනේ. එහෙම පිට කියලා මම හිතන්නේ නෑනේ."

'ඇත්තටම ඔයාලා දෙන්නා මගේම අය තමයි' දේවක සිතින් කීවේය.

"අපිත් එහෙම තමයි හිතන්නේ."

"ඒක මට ඇති."

ඔහු කීවේය.

"ඉතින් දවල්ට නුවරඑළියේ කොහෙන්ද කන්නේ දේවකයියේ."

"නුවරඑළියේ කන්න තැන්ද නැත්තේ මිස් රහට බත් ටිකක් කාලා යමු අපි."

"ම්."

භාවනා ආසනයේ හරි බරි ගැසුණේ දිග ගමනක් යන්නට ඇති නිසාය.

# 30

නුවරඑළියට කිට්ටු වෙද්දී සීතල ඕනවටත් වඩා දැනුණි. දේවක වාහනයේ වායු සමීකරණය ක්‍රියා විරහිත කර වීදුරු පහත් කළේ ස්වභාවික සීතල ඇතුළට එන්නට දෙමිනි. මේ දැනෙන පිවිතුරු සීතල හදවතට ගෙන එන්නේ වෙනස් සතුටකි. දවසක් දෙකක් නුවරඑළියේ නැවතී යන්නට තරම් ආසාවක් භාවනාට දැනුණි.

"ඊයේ රෑ අපි මෙහේ ඉන්න තිබුණේ"

"අපි දැන් දිගටම එනවනේ"

"හා. එනකොට මේ පැත්තෙන් එමුකෝ. උදේ පාන්දරම අපි පේරාදෙණි යන්."

දේවක හිස වැනුවේය.

"මල්ලිගේ හොඳ පණ යයි වගේ"

නේත්‍රා කීවාය.

"මල්ලි ෆිට් නේද මල්ලි"

භාවනා ඇසුවාය. දේවක දඹරැඟිල්ල දිගු කළේය. භාවනා තොල්පට තදකර සිනාසුනාය.

"අද වැස්සක් නෑ. ඒත් සීතල හොඳටම තියෙනවා."

"නුවරඑළියට වහිනකොට ෂෝක්ද?"

"වහිනකොට ඇවිදින්න බෑ රූම් එකට වෙලා පොරවගෙන කෝපි බිබී ඉන්න පුළුවන් සීතලේ"

"එහෙමත් ෂෝක්නේ ඉතින්."

භාවනා ඇස් කොනකින් මෙන් දේවක දෙස බැලුවාය.

"ඊයේ රෑ අක්කා මේ බලාගෙන ඉඳිද්දී නිදිනේ."

"මට සනීපෙට නින්ද ගියා මල්ලි"

"අපි නිදාගන්නකොට දෙකයි අක්කේ"

භාවනා දේවකට රැව්වේය. 'ඒක මොකටද අක්කට කියන්න ගියේ රෑ දෙක වෙනකල් මොනවද කළේ කියලා බලනවනේ' භාවනා සිතින් කීවාය.

"මට යන්තමට ඇහුණා"

නේත්‍රා කීවාය.

“අපි ගී රස වින්ඳා. තේරුමත් එක්ක.”

භාවනා කීවාය. ‘නැත්නම් හිතයි වෙන මොනවාහරි කළා කියලා.’

“ඊට පස්සේ අනිත් එක්කෙනත් මෙන්න නිදි. මම ඉතින් ටිකක් ඇහැරගෙන උන්නා.”

‘මම කොහොම උන්නද දන්නේ නෑ’ ඇය සිතුවාය. උදේ නැඟිට්ද්දී පොරවනයත් ඇගේ නැත.

“චුට්ටක් ගොරවනවත් එක්ක”

දේවක කීවේය. භාවනා ඔහුගේ අතට ගැසුවාය.

“අනිත් දවසේ වෙනම කාමරයක් අරන් දෙනවා. අපි ළඟ තියාගත්ත නිසා තමයි ඔක්කොම.”

කෙල්ල කීවාය. ‘අරන්ම දෙයි කොල්ලට වෙනම කාමරයක්’ නේත්‍රා

සිතින් කීවාය.

"අනේ එහෙම කරන්න එපා"

දේවක බයාදුව කීවේය. 'එයාටත් ඕන මෙයාගේ අස්සේ ඉන්න' නේත්‍රා සිතුවාය. දෙන්නා අතර මොකක්ද රසබර දෙයක් සිදුවෙමින් පවතින බව නේත්‍රාට ඉවෙන් මෙන් දැනුණි. ඈය ඒ ගැන යටි සිතින් සතුටකින් උන්නාය.

"අර ඉන්දියාවෙන් ගෙනල්ලා දෙන්න කිව්ව බෙහෙත් තමයි මාර වැඩේ නේද මිස්."

දේවක වෙද මහත්තයා කියූ දෙයක් සිහිවී ඇසුවේය

"ඒක ඉතින් පුළුවන්නේ."

"කොහොමද"

"ඒකත් මේ අපිම ගිහින් ගමු නේද අක්කා."

"අනේ සුද්දි මම කොහොමද යන්නේ ෆ්ලයිට් එකක. ඒක අමාරුයි."

භාවනා දුක්බරව බැලුවාය.

"අපිට ඉතින් යන්න දෙන එකක් නෑනේ."

භාවනාගේ කටහඬ දුක්බරය. ඇය සිතාගෙන උන්නේ මේ නුවර යනවා වගේ ඉන්දියාවටත් ගිහින් එන්නය. කෙල්ලගේ සිතුවිලි එහෙමය.

"මම කොහොමහරි එන්නම් බබා."

නේත්‍රා සන්සුන්ව කීවාය. කෙල්ල ඒ ගමන යන්නට ආසාවෙන් ඉන්නා බව නේත්‍රා දනී.

"දේවකයියට පාස්පෝට් තියේද?"

භාවනා ඇසුවාය. දේවක හිස වැනුවේය.

"යන්නද උන්නේ."

"අප්පච්චිව දාලා එහෙම යන්න බෑනේ මිස්. අප්පච්චියි මායි දෙන්නම ඩුබායි කන්ස්ට්‍රක්ෂන් කම්පනි එකකට යන්න ට්‍රයි එකක් දුන්නා. ඒත් අප්පච්චි පස්සේ ඒකට කැමතිවුනේ නෑ"

"ඒක හොඳයි."

භාවනා කීවාය. එහෙම කියවුනේ ඇයිදැයි ඇයම දන්නේ නැත.

නුවරඑළිය නගරයට ළංවෙද්දී සීතල තවත් වැඩිවිය. දේවක වැලිමඩ පාරෙන් ග්‍රෙගරි වැව ඉස්මත්තට වාහනය දැම්මේය. තුනී මිහිදුම් තට්ටුවක් පැමිණ වැව ඉහත්තාවේ නතරව තිබුණි. භාවනා ඒ දෙස බලාගෙන උන්නේ වශීවී ගිය දෑස් ඇතිවය.

"මේ හරියේ ටිකක් නවත්තලා

යන්ද"

"හා ආසයි."

"සීතලනම් ස්වීටර් ගමු"

"මේ ටිකනේ පස්සේ එන දවසක ගමු."

දේවක ග්‍රේගරි වැව ළඟටම කර වාහනය නැවැත්වීය.

"බබයි මල්ලියි බැහැලා ඇවිදලා එන්න. මම අම්මා එක්ක චුට්ටක් කතාකර කර ඉන්නම්."

නේත්‍රා කීවාය.

"හා. එයා අඬනවා"

"පව් මං ගන්නම්"

භාවනාත් දේවකත් බැස්සේ එකටම වාගේය. මීදුමත් සීතලත් නිසා යුවතිය උන්නේ දෑත් හකුළාගෙනය. තද හිරු එළියක් තිබුනේ නැත. ඒත් මන්දාරමක්ද නැත. මේ අහසට

ඇය ආසය. තාමත් උදෑසන නිසා ග්‍රෙගරි වැව අසළ සෙනඟද නැත. දෙන්නා ඇවිද්දේ එකටම වාගේය. දේවක දෑස් කොනකින් බැලුවේය. ඔහු යුවතියව දැක්කේ මීදුමට පසුබිම්වය.

"හිතට හරී සැනසිමක් දැනෙනවා."

භාවනා කීවාය. දේවක අත් බැඳගෙන බලාගෙන උන්නේය.

"ඒ සැනසීමට යන්න දෙන්න එපා මිස්."

ඔහු කීවේය. භාවනා බැලුවාය. ඔහුට දෙයක් කියන්නට ඇත.

"දෙයක් කිව්වොත් ඉෂ්ඨ කරනවද?"

"හා දැන්මම"

"ගුඩ්"

ඇය කීවාය

"මොකක්ද මිස්?"

"මේ"

ඔහු බලාගෙනම උන්නේය.

"මට මිස් නැතුව වෙන මොකක්හරි කියන්න."

ඇය කීවාය. එහෙම කියද්දි මොකක්ද දුරස් බවක් දැනෙයි. භාවනා එයට කැමති නැත.

"එහෙම කිව්වාම හැමෝම බලනවනේ. හොඳ නෑනේ. නේ."

ඔහු කීවේය.

"කවුරුවත් ළඟ නැතිවෙලාවට කියන්න පුළුවන්නේ."

"එහෙම කියන්නම්."

"මොකක්ද කියන්නේ"

"සුද්දි"

ඔහු කීවේය. ඔහු එහෙම කියයි කියා ඇය සිතුණේ නැත. 'මං හිතුවා නංගි කියයි කියලා.' ඇය සිතුවාය.

"එහෙම කියන්න බෑනේ ඉතින් නේ."

"කවුද කිව්වේ"

"මං කැමතියි"

"කවුරුවත් නැති වෙලාවට තමයි"

"මි. අම්මයි තාත්තයි අක්කලා දෙන්නයි සීයයි විතරයි එහෙම කියන්නේ හැබැයි"

"කමක් නැද්ද?"

කෙල්ල තොල්පට තදකළාය. පසුව ඈත කඳු මත නතරවී තිබූ මීදුම් දෙස බලාගෙන සිනාසුනාය. දේවකද කිසිවක් කීවේ නැත.

"දැන් සුද්දිට හිතෙනවා අර ඈත තියෙන ගෙදර මිදුළට වෙලා

ඉන්නනේ"

ඔහු ඇසුවේය. භාවනා ගැස්සී මෙන් බැලුවාය.

"කොහොමද එහෙම හිතුවා කියලා දන්නේ?"

"එහෙම හිතුවා නේ."

"ම්. ඇත්තටම හිතුවා. එතන ලස්සනයි. අහිංසක තනි තට්ටුවේ ගෙයක්. කොහොමද හිතුවේ"

"මම කිව්වේ මට සාස්තර කියන්න පුළුවන් කියලා."

"පස්සේ කිව්වේ එහෙම කියන්න බෑත් කියලා."

ඔහු සිනාසුනේය.

"ඔහොම කෙනෙක් දැක්කමයි මම මේ."

"මොකක්ද?"

"මං හිතන දේවල් එහෙමම කියන."

ඇය අවංකව කීවාය. දේවක කිසිවක් කීවේ නැත ඔහු කිසිවක් කියතැයි ඇය සිතුවේද නැත. සමහර දේවල් එහෙමම කියන්න අමාරුය. එය ඇයද දනී.

# 31

භාවනාගේ සිතට එදා රෑ අතගා බලන්නට හැකිතරම් පාළුවක් දැනුණි. මේ තරම්ම පාළුවක් අද දැනෙන්නේ ඇයිදැයි ඇයටම සිතාගන්නට අමාරුය. පෙරදා රැයේ අමායා හිල්ස් හෝටලයේදී සිදුවූ සියල්ල ඇයට එකින් එක සිහිවෙන්නට විය. ඇයගේ මුව මත තිබුනේ තුනී හසරැල්ලකි.

කොළඹට එද්දී හවස් විය. මේ රෑත් කොහේ හෝ නැවතී එන්නට තිබුණා කියා භාවනාට දැන් සිතෙයි.

එතරම් ලෝබකමක් සමහර දේවල් ගැන ඇතිවෙන්නේ ඇයි? ජීවිතයේ ගෙවා දැමූ රසබරම සති අන්තය ගෙවා දැමූයේ මේ ගමනේදීය. එය ඒ තරම්ම විශේෂ සති අන්තයක් වූයේ දේවක නිසාද? 'ඔයා කොහොමත් මොකක්ද මට කරලා දේවක අයියේ. අන්තිමට ඔයාට මිස් කියන්න එපා කිව්වාම ඔයා කියනවා සුද්දි කියන්නම් කියලා'

දැන් වෙලාව රාත්‍රී එකොළහය. භාවනා ගෙදර අයත් සමඟ රෑ කෑම ගෙන ආවේ දැන් ටිකකට කලිනි. අද රෑ කෑම මේසයේදී වැඩියෙන්ම කතාවුනේ අක්කාගේ කකුල සනීප කරන්නට පුළුවන් වෙන එක ගැනය. හැමෝම පින් දුන්නේ දේවකටය.

"කොල්ලව ගනිද්දී මට ඕක

හිතුණා මොකක්ද විශේෂයක් තියෙනවා කියලා"

රඹුක්වැල්ල මහතා කිවේය. 'සීයට ඕක හිතෙන්න කලින් මට හිතුණේ' ඒත් කියන්නට අමාරුය.

"ඔයාලා එකතුවෙලා අක්කව ඇවිද්දවලා දෙන්නකෝ. ඉතුරු ටික මම බලාගන්නම්."

මිලින්ද කීවේය. භාවනා තාත්තා දෙස බැලුවේ කෘතවේදීවය.

"අපට මාස නමයක් දෙන්න තාත්තා ඒක කරනවාමයි."

නේත්‍රා ඇඬුවාය.

"ඔයාව සනීපකරගන්න කරන්න පුළුවන් හැමදේම මම කරනවා"

මිලින්ද කීවේය.

"මාත් එහෙම හිතුවේ නෑ තාත්තා මේ කොල්ලගේ පිස්සු කියලා

හිතුවේ. ඒත් ගියාට පස්සේ එහෙම විශ්වාසයක් ආවා.”

නේත්‍රා කීවාය.

“වෙද ගෙදර තියෙන්නේ කන්ද උඩ. පඩි විස්සක් තිහක් නැඟලා යන්නෝන. වීල් චෙයාර් එකෙන් යන්න බෑ. මේ පොඩි එකා මාව උස්සගෙන යන්නේ. පව්.”

නේත්‍රා කීවාය. භාවනාගේ දෙනෙත්ද තෙත්විය.

“තව තෙල් ගාන්නම් කියලත් වෙද මහත්තයට පොරොන්දු වුණා.”

ඇය කීවාය.

“අපි හිතමුකෝ කොල්ලා අපේ කෙනෙක් කියලා ලොකු පුතේ”

මිලින්ද කීවේය. රඹුක්වැල්ල මහතාද හිස වැනුවේය.

“කොහොමත් මේ කොල්ලා

සාමාන්‍ය කොල්ලෙක් නෙමේ. මොකක්හරි තියෙනවා”

ඇය එහෙමම කීවාය. මිලින්ද භාවනා දෙස බැලුවේ පුදුමයෙනි. ‘අනේ ඇයි තාත්තා මං දිහා බලන්නේ’

“එහෙම හොඳ කොල්ලෙක් පුදුමයක් තමා. අපි කොල්ලා ගැන බලමුකෝ.”

මිලින්ද කීවේය.

“යන වියදම් මගෙන් ඉල්ලගන්න සුද්දි”

මිලින්ද කීවේය.

“හා තාත්තා. එහෙම වියදමක් නෑ. පැට්‍රල් වියදමයි රෑ නවතින වියදමයි තමයි”

“මං දෙන්නම් ඒක”

කෑම මේසයේදී ඔහු ගැන කතා වූ

දේවල් ඔහුට කියන්නට ඇත්නම්. ඒත් දැන් වෙලාව රෑ එකොළහය. 'කිලෝ මීටර් පන්සිය ගාණක් ඩ්‍රයිව් කරලා මහන්සිත් ඇතිමහන්සියට නිදාගන්න ඇති' ඇය සිතුවේය.

ඒත් නිදාගන්නට පෙර ඔහුට එක ඇමතුමක් ගෙන නිදාගන්න ඇත්නම් යැයි සිතෙන්නේ ඇයි? 'මේක ලෙඩක් සුදූ' ඇය තමාටම කියාගත්තාය.

මහ වෙලාවක් ගියේ නැත. කෙල්ලගේ දුරකථනය නාදවිය. 'ඔයානම්' ඇයට නිකමට සිතුණි.

පුදුමයකට මෙන් කතාකළේද දේවකය. ඇය පපුවට අතක් තියාගත්තාය. 'මේක වෙන්නේ කොහොමද කියලා කියන්න වෙයි ඔයාට දවසක. මං හිතන දේ ඔයා කරනවා. නැත්නම් කියනවා.'

"දේවකයියේ."

ඇය කතාකළේ උගුරෙන් මෙන්ය. එහෙම වදන් පිටවෙන්නේ ඇයි?

"අපේ සුද්දි නිදාගෙනද හිටියේ?"

හදවත අස්සේ තිබූ යමක් උඩට කඩාගෙන එන්නාක් මෙන්ය. භාවනා ලොකු හුස්මකින් පපුවම පුරවාගත්තාය.

"සුද්දි නිදි නෑ දේවකයියේ"

ඇය කීවාය.

"දැන් රෑ එකොළහත් පහුවෙලානේ"

ඇය සිනාසුනාය.

"දැන් කාලා උඩට ආවේ. අද රෑ කෑම ටිකක් පරක්කුවුණා. අක්කගේ මේ වැඩේ ගැන කියෙව්වනේ"

"කට්ටිය මොකද කියන්නේ සුද්දි ඉතින්"

ඔහු එහෙම කතාකරන්නේ කෙසේද? මේ තරම් ළඟන්නා ලෙස.

"කතාවුනේද?"

"ම්"

"කතාවුනේ මේ සීගිරි එකට අලුතෙන් ආපු ප්‍රමෝෂන් කොල්ලා ගැන තමයි. අපි සේරම කිව්වා. හැමදේම."

"අනේ"

"හාස්කමක් වුනොත් ඒ ඔයා නිසා" ඇය කීවාය.

"ඒ හාස්කම වෙනවා. අපි හැමෝම නිසා අපේ විෂ් එක නිසා" ඔහු කීවේය.

"මහන්සිනේ නිදාගන්න එපැයි" ඇය කීවාය.

"අප්පච්චි එක්ක කයියක් දාගෙන හිටියා. මාත් විස්තර කිව්වා."

ජීවන් අද කොල්ලා කියූ දේවල් අසා ඉඳ සතුටට පත්වූවේය. ඔහු නේත්‍රාට ඇත්තටම ආදරය කළේය. ඇයද කුඩා වියේදී මේ ජීවන් බාප්පාට හරිම ආදරේය.

"අප්පච්චිටත් සතුටුයි"

"අනේ දවසක අප්පච්චිට එන්න කියන්නකෝ සීගිරි එකට අයියේ."

'එයාට දැන්මම එන්න බෑ සුද්දි' එහෙම කියන්නට ඔහුට සිතෙයි.

"මං කියන්නම්. උදේ යනවා. රෑ වෙලා එනවනේ."

"ඉතින් කෙල්ලෙක් නෑනේ ඔච්චර මැරෙන්න"

ඇය කීවාය.

"මාත් කියනවා"

"පච්. මොනවද ඉතින් කෑවේ"

මෙහෙම ඇසෙන්නේ ඇයි?

"අද තාත්තා පොඩි මාළු වගයක් ගෙනල්ලා හේරත් මාමා ඒක බැදලා කිරි හොදියි පොල් සම්බෝලයි හදලා මරු පාර."

කොල්ලා කිව්වේ එහෙමය.

"කනකොට මට ඊයේ අපි කාපු හැටි මතක්වුණා."

ඔහු කීවේය.

"ම් මටත් මතක් වුණා."

ඇය අවංකව කීවාය.

"නිදාගන්න. රෑ වෙලානේ. උදේන්ම එනවනේ"

"එන්නම එපැයි අපි අනිද්දා ඉඳලා සීගිරි එක වහලනේ."

"දැන් මොනවත් ඒ ගැන මතකත් නෑ."

ඇයට ඇත්තටම එහෙම දේවල් වෙයි.

"බුදු සරණයි"

"උදෙන්ම එන්න."

ඇයට ඉබේටම කියවිණ. දේවකගේ පපුව සිරවිය. 'සුද්දි මට මොනවද කළේ' ඔහු සිතින් ඇසුවේය. 'ඔයා සුද්දිට මොනවද කළේ' ඇයද සිතින් ඇසුවාය.

# 32

සීගිරි සුපර් මාර්ට් වැසුණි. අද මේ සීගිරි සුපර් මාර්ට් එක වැසෙන්නේ එක කොල්ලෙක්ගේ වචනයකටය. දේවක උන්නේ තරමක් හෙල්ලීය. එහෙත් ඔහු ඒ බව කාටවත් කිව්වේ නැත. කරන්නට ඇති වැඩ ටික සති පහ හයකදී ඉවර කරගන්නට හැකිවෙතැයි විශ්වාසයක් ඔහුගේ හිතේ විය. එහෙත් එය විශ්වාසයක් පමණක්ම

විය. වැඩ කරගෙන යද්දී මොන මොන බාධක ඒදැයි දන්නේ උඩ ඉන්නා දෙවියන් පමණි. එහෙත් දේවක උන්නේ යකෙක් මෙන් ආවේෂ වීය. සීගිරි සුපර් මාර්ට් වැසෙන්නේ සති හයකටය. එය යළිත් මාර්තු මාසයේ විසි දෙවෙනිදා විවෘත කරන්නට නියමිතය.

උදේ රඹුක්වැල්ල මහතා සීගිරි එකේ මුළු කාර්ය මණ්ඩලයමත් කළමණාකරණයේ නියුතු සියල්ලන්මවත් එක්කර රැස්වීමක් තැබුවේය. මේ සති තුනේදී සිගිරි එක වෙනස් වෙන්නේ කොහොමද කියා ඔහුගේ සිතේවත් හරියට චිත්‍රයක් නැත. ඒ හැමදේම තිබුනේ දේවකගේ ඔළුවේය. රඹුක්වැල්ල මහතා කළ එකම දේ කොල්ලාව විශ්වාස කිරීමය.

"අපි ටිකක් වැටිලා හිටියේ. ඒත් වැටිච්ච තැන වැටිලම ඉන්න අපට බෑ අපි නැඟිටිනවා. එහෙම නැඟිටින්නේ අලුත් පෙනුමක් අලුත් හැඩයක් අලුත් වැඩපිළිවෙලක් එක්ක. මේ අලුත් වෙනස සම්පූර්ණයෙන්ම කරන්නේ දේවක. එයාට මෙතන ඉඳලා මම සීගිරි එකේ කළමණාකරණය බාරදෙනවා මේ සති හයට. අපි දේවකට උදව් කරමු."

රඹුක්වැල්ල මහතා කීවේය. කෝසලත් මිහිරංගත් සමච්චලයට මෙන් සිනාසුනෝය. ඒ සිනහව භාවනා හොඳින්ම දැක්කාය. මලීෂා උන්නේ මේ කියන කිසිවක් විශ්වාස නොකර ඇයගේම ලෝකයක තනිවී ජංගම දුරකථනය ඔබමිනි. භාවනා මේ සියල්ල තේරුම් ගත්තාය.

'කොල්ලට මැනේජ්මන්ට් එක මේ සති හයේදී දෙනවා කිව්වාම මූණුවල් දෙක වුණා. ඔයාට ලොකු චැලේන්ජ් එකක් තියෙන්නේ දේවක අයියේ. ඔයා අපිව පුදුම කරවලා පෙන්නනවා ඒක මට විශ්වාසයි.' භාවනා සිතින් කීවේ ඔහු දෙස බලාගෙනමය.

"දේවකට ස්ටාෆ් එකටම දෙයක් කියන්න තියෙනවානම් දැන් කියන්න."

රඹුක්වැල්ල මහතා කීවේය. දේවක හිස වැනුවේය.

"මේ වීදුරු දොර අද වැහෙනවා. ඉස්සරහ කා පාක් එකත් වැහෙනවා. ටකරන් තාප්පෙකින්. ඊට පස්සේ මෙතනින් යන අපේ කස්ටමස්ලා ඇතුලේ මොනවද වෙන්නේ කියලා දන්නේ නෑ. ඒත් එයාලා බලාගෙන යන්නේ මෙතනින්. සීගිරි එක

වහලනේ රෙපෙයාර්වලට වෙන්න ඇති එහෙම කියයි. එච්චරයි. මේක ඇතුලේ මොනවද වෙන්නේ කියලා එයාලා හිතනවා. අපිට පුළුවන් සාමාන්‍ය දෙයක් කරන්න. මේ බිත්ති ටිකක් කලර් වොෂ් කරලා. අපේ ස්ටාෆ් යුනිෆෝම් ටිකක් වෙනස් කරලා. මේ රාක්ක එහෙට මෙහෙට කරලා කොඩි ටිකක් එල්ලලා ආයෙත් ඕපන් කරන්න පුළුවන්. ඒත් ඒක දැක්කා කියලා කස්ටමර් පුදුම වෙන්නේ නෑ. ඒක මේවා වහන්නේ නැතුවත් කරන්න පුළුවන්. ඒත් අපි හදන්නේ මාර්තු විසි දෙවෙනිදා මෙතනින් යන කස්ටමර්ව පුදුම කරවන්න. මෙතන අපිට හාස්කමක් කරන්න වෙනවා. ඒක මට තනියෙන් කරන්න බෑ. මට සර්ගේ ආශිර්වාදය ඕන. භාවනා මිස්ගේ නේත්‍රා මිස්ගේ

මඟපෙන්වීම ඕන. මිහිරංග සර්ගේ කෝසල සර්ගේ ගයිඩ් එක ඕන. ඔයාලා හැමෝගෙම හෙල්ප් එක ඕන. එහෙම වුනොත් අපට දිනන්න පුළුවන්. අපට දිනන්න පුළුවන්. අපි ඒක විශ්වාස කරනවානම්. නේද?"

දේවක කීවේය. භාවනාගේ පපුවට මොකක්ද විය. කිසිවෙක් කතාකළේ නැත.

"ක්‍රිස්තු පූර්ව හතරවෙනි සියවසේ උතුරු මැද පළාතේ වනාන්තරය මැද තිබුණා ගලක්. මහ අමුතු විදිහේ ගලක් මිනිස්සු ඔය ගල දිහා හැමදාම බලාගෙන උන්නා කිසි වෙනසක් දැක්කේ නැහැ. ඒත් අනුරාධපුර රාජධානියේ රජකරපු කාශ්‍යප රජතුමා මේ ගල දිහා බලාගෙන උන්නා එයාට මොකක්ද

දැනුණා. පස්සේ එයා ඒ ගල උඩ අලුත් රාජධානියක් හැදුවා. ඒක ආලකමන්දාව. ගල තමයි සීගිරිය. සාමාන්‍යයෙන් දකින දේක වෙනසක් දකින්න ඕන එහෙම වුනොත් විතරක් අපිට වෙනස් දෙයක් කරන්න පුළුවන්. අපිත් සීගිරි. සීගිරි ගලේ නම විතරක් අපිට තිබ්ලා වැඩක් නෑ. අපි සීගිරි ගල වගේ වෙනස් වෙන්න ඕන. අපි ආලකමන්දාවක් හදමු. අපේ කස්ටමර් ආසයි එයාව පුදුම කරවන්න දෙයක් මේක ඇතුලේ තියෙනවානම්. මොකද එයාට අපි ළඟටම එන්නෝන නෑ බඩු ගන්න. හැමතැනම සුපර් මාර්කට් තියෙනවා. මොකක්හරි විශේෂත්වයක් අපි ගාව තියෙනවානම් එයා අපි ගාව නවතියි. එයාව නවත්තගන්න ඕන. ආයේ දාලායන්න බැරි විදිහට

එයාව අපි අල්ලගන්න ඕන. ඒක තමයි අපේ සටන. ඒක තමයි අපේ චැලේන්ජ් එක. ඒකම තමා හීනෙත්. අපි මේ හීනේ සැබෑකරමු. ඒක මට බෑ. ඒත් අපිට පුළුවන්. මට අපේ අත් විශ්වාසයි. අටට ඩියුටි රිපෝට් කරලා හතට අටට ඩියුටි ඕෆ්වෙලා යන්න මේ දවස් ටිකේ බෑ. අපිට ටිකක් වැඩිපුර වැඩකරන්න වෙනවා. ඒක කරමු. එච්චරයි. අපිට පුළුවන්."

දෑස් තෙත්ව ගොස් තිබියදී මුල්ම අත් පුඩිය ගැසුවේ භාවනාය. ඉන්පසු සියල්ලෝම අත් පොළසන් දුන්නෝය. එහෙත් මිහිරංගත් කෝසලත් මලීෂාත් අත් බැඳගෙනම උන්නෝය. භාවනා එයද දැක්කාය. 'කුහකකම කොල්ලගේ කතාව කටු අනිනවා වගේ ඇති. මාරයි' භාවනා සිතුවාය. ඔහුත් සීගිරි ගල මෙන් සාමාන්‍ය

කෙනෙක් නොවේ. පුදුම කෙනෙකි.

රඹුක්වැල්ල මහතා දේවක දෙස බලාගෙන උන්නේ ආදරයෙනි. කොල්ලාව ගන්නට හිතුන එක ගැන ඔහු තවත් වරක් ආඩම්බර විය.

“එහෙනම් අපි වැඩ පටන් ගමු පුතා”

රඹුක්වැල්ල මහතා කීවේය.

“හොඳමයි සර්. අද අපි කන්ට්‍රැක්ට් දුන්න හැමෝම එනවා සර්. මේ ඉස්සරහ ග්ලාස් අපි රිමූ කරලා අලුතෙන් දානවා. ඉස්සරහ කා පාක් එක ගලවලා අලුතෙන් ගල් දානවා. අපේ බේකරි ෂොප් එකක් එළියේ හැදෙනවා මීට් සෙක්ෂන් එකක් හැදෙනවා වෙජිටබල් කෝනර් එක හදන්න අදම ගන්නවා. එතකොට රනින්

කිචන් එක අපි සර් පුච්චපු දන්කොටු ගඩොලින් අදම හදන්න ගන්නවා. ලයිට් සිස්ටම් එකත් ගලවනවා සර්. බේකරි කිචන් එකත් අදම හදන්න ගන්නවා අපි දිගටම රෑත් වැඩ සර්. නේත්‍රා මිස් ගොඩක් දේවල් ඕඩර් කරන්න අරන් තියෙන්නේ සර්. ඒ බඩුත් ස්ටෝර්ස් එනවා. අපි ඒවා වෙනම එන්ටර් කරන්න ඉන්නේ. කැෂියර් සිස්ටම් එකේ පොඩි වෙනස්කම් ටිකක් අපි කරනවා සර්. එයාලත් එනවා."

දේවක කීවේය. මිහිරංග අසාගෙන උන්නේය. 'උඹ වැඩ කරපන්. අපි ලස්සනට වැඩේ දෙන්නම්. අපිටත් ඕන ඒකම තමයි. ඔහොම යන් උඹ ලස්සනට කොළේ ඉරාගනී එදාට සීගිරියේ ගිහින් ගල හූරපන් පරයා' මිහිරංග සිතින්

කීවේය.

"මූ අලි පොර වගේ කතාව නේ."

කෝසල ඇසුවේ රහසින් මෙන්ය.

"අපි නූල ටිකක් දීලනේ තියෙන්නේ. වෙලාවට දල්වමු."

ඔහු කීවේය. කෝසල දබරැඟිල්ල දිගු කළේය. මිහිරංග සිනාසුනේය.

දේවකත් නේත්‍රාත් භාවනාත් වැඩ බෙදාගත්තෝය. ඔහුත් සමඟ කතාකරන්නට දෙයක් තිබුණද වැඩ අධිකකම නිසා භාවනාට එයට වෙලාවක් ලැබුනේ නැත. දේවක එක දිගටම උන්නේ වැඩ වලය. ඔහු සීගිරි හී කාර්ය මණ්ඩලය අද ලස්සනට හැසිරවූවේය.

"අද අනූ කැෂියර් සෙක්ෂන් කියලා දෙයක් නෑ ඔක්කොම බලන්නෝන ඔයා මේ බුක් කෝනර්

එක ළඟ බලන්න ඕන හරි. හෙට ඉඳලා පොත් එනවා ඒවා වෙනම එන්ටර් කරන්න ඕන දැනට ඒවා යන්නේ මේන් ස්ටෝර්ස් එකට නෙමේ. භාවනා මිස්ගේ රූම් එකට."

දේවක කියනවා භාවනා අසාගෙ නය. ඇය උන්නේ කැෂියර් සිස්ටම් එක පරීක්ෂාකරන ගමන්ය. 'හොඳ වැඩේ මුන් මාත් එක්ක හුරතල් වෙනවා දේවක ලස්සනට අල්ලගෙන වැඩ.' භාවනා සිතුවාය. ඇයගේ මුව මත වූයේ තුනී සිනාවකි. ඔහු සීගිරි සුපර් හී කා පාක් එකේ වැඩ බලද්දී භාවනා ඔහු දෙස බලාගෙ නම උන්නාය. 'ඔයාට බයත් ඇති. නොකිව්වට' ඇයට නිකමට සිතුණි. 'තාම පොඩි කොල්ලෙක්නේ'

දේවකගෙන් උදේට කෑවාද

කියාවත් අසන්නට භාවනාට නොහැකි විය. ඇය අද ඔහුටත් එක්කම ඉඳි ආප්ප ගෙනාවාය. දැන් දහයත් පසුවී ඇත. 'කන සිහියක් නෑ වගේ'

එක වෙලාවක දේවක අලුතෙන් හදන රනින් කිවන් එකේ සිට දුවගෙන ආවේය. භාවනා උන්නේ කාර්යාලයට පිවිසෙන දොර ළඟය.

"තත්පරේකට එනවද?"

ඇය ඇසුවාය. දේවකට දුක සිතුණි.

"අනේ මම මේ වැඩ නිසා දුව දුව හිටියේ."

"හරී. චුට්ටක් එන්නකෝ."

කෙල්ල කීවාය. දේවක ඇය පිටුපස ආවාය. අද සාරියක් ඇඳගෙන ආවේ අපරාදේ කියා

කෙල්ලට සිතුණි. හෙට සිට ඩෙනිමට බහින්නට ඇය සිතාගෙන උන්නාය. එවිට පහසුය.

"කාලත් නෑනේ. නේ."

දේවක බැලුවේය. භාවනා හැරී සිනාසුනාය.

"මතක නැතිවුණා."

"එහෙම බෑ මාත් කාලා නෑ ඉඳි ආප්ප ගෙනාවා කාලා යන්න."

ඇය ඉඳි ආප්ප මුල දෙක මේසය මත තැබුවාය. දේවක ඉඳගත්තේය.

"උන්නට හිතේ බරයි නේද?"

ඇය කරුණාවෙන් ඇසුවාය. දේවක හුස්මක් සමඟ සිනාසුනේය.

"මට කියන්න"

"ටිකක්. මේක ගේමක්නේ මිස්."

ඇය දොර දෙස බැලුවාය. කිසිවෙක් නැත.

“මෙතන කවුරුවත් නෑ”

ඔහු කීවේ කිසිවෙක් නැති තැන තමාට සුද්දි කියනා බවය.

දේවක සිනාසුණේය.

“මටත් ඉතින් ගෙනාවද?”

“මී. අම්මත් ඇහුවා”

ඇයට කියවිණ.

“මං හින්දා නේ”

“ඒකනේ. කන්නකෝ.”

“ම.ට අද රෑ ඉන්න වෙයි.”

“මාත් ගෙදර ගිහින් එන්නම්.”

ඇය කීවාය.

“අම්මා බලයි.”

“එකොළහ විතර වෙනකල් ෂේප් ඉතින්.”

දේවක සිනාසුණේය.

“මං ඩිනර් ගෙනත් දෙන්නද?”

"අම්මා ඒ පාර බලයි. අපි ආප්ප ටිකක් ගෙනත් කමු."

"හා.මේක වදයක්. මම මේ ඩෙනිමක් දාගෙන එන්නම්."

එය කියද්දී ඇය දෙනෙත් පමණක් ඔසවා බැලුවාය. දේවක සිනාසුනේය.

"මොක ඇන්ඳත් සුද්දි ඉතින් ලස්සනයිනේ ස්කට් ඇන්ඩ් බ්ලවුස්වලට ගොඩක් ලස්සනයි."

දේවක අමාරුවෙන් කීවේය. භාවනා තොල්පට තදකරගෙන සිනාසුනාය.

"අර දෙන්නා කෝ. ආවද ඒ පැත්තේ."

භාවනා අසන්නේ මිහිරංගත් කෝසලත් ගැන බව දේවක දනී.

"එහෙට මෙහෙට වෙලා හිටියා.

මාව දකිනකොට ෆෝන් එක කණේ ගහගන්නවා."

දේවක කීවේය. භාවනා බලාගෙ නම උන්නාය.

"ටිකක් පරිස්සමින්."

"මං දන්නවා සුද්දි."

"දේවක අයියව මරන්න තරම් කේන්තියි ඒ දෙන්නට."

ඒ බව දේවකද දැනගෙන උන්නේය. මේ ඔවුන්ගේ සීගිරි එකය. සීගිරි පවුලේ නීත්‍යානුකූල හිමිකරුවන් ඔවුන්ය. භාවනාත් නේත්‍රාත් කෙල්ලෝ දෙන්නාය. ඒත් දැනට පේන්න ඉන්නා පුත්තු දෙන්නා ඔවුන්ය.

"මොකක්මහරි අමාරු තත්වයක් තිබුනොත් මට කියන්න තනියම විඳවන්නේ නැතුව. මං දන්නවා මේක

ලේසි නෑ."

දේවකට ඇය ගැන ඇතිවූයේ කිව නොහැකි තරම් ආදරයකි. ඔහු ඇය දෙස බැලුවේද ඒ ආදරබර දෙනෙතින්මය.

"සුද්දි එහෙම කියන එකම ඇති."

ඔහු කීවේය. ඉඳි ආප්ප මුලේ පැත්තකින් තිබූ දේවකගේ අත මතට මෘදුව අතක් තබා භාවනා බැලුවාය.

"මං ඉන්නවා."

'හැමදාම' ඒ ටික ඇයට කියවුණේ නැත. 'මටත් උණ ගන්න වගේ අනේ' ඇය තමාටම කියාගත්තාය.

# 33

"දේවක සර්ට මලීෂා මිස් ටිකක් එන්න කිව්වා."

ස්ටාෆ් එකේ කෙල්ලෙක් පැමිණ එසේ කියද්දී දේවක උන්නේ අලුතෙන් හදන බුක් කෝනර් එකේ වැඩ භාවනාත් සමඟ බලමිනි. ඒක ලස්සනට එනවා කියා ඇයට සිතුණි. භාවනා සිතාගෙන ඉන්නේ මේ බුක් කෝනර් එකේ වැඩ ඇයම බලන්නටය. එහි මොකක්ද කියුට්

ගතියක් ඇත.

"මට."

"ඔව්. ස්ටෝර්ස් ළඟ මිස් ඉන්නවා"

ඇය කීවාය. දේවක බැලුවේ භාවනා දෙසය.

"යන් මාත් එන්නම්."

භාවනා කීවාය. මේකේ මොකක් හෝ දෙයක් ඇතැයි ඇයට නිකමට සිතුණි. භාවනාද දේවක සමඟ ආවාය. දෙන්නා එකටම එද්දී මලීෂා බලාගෙනම උන්නාය. 'එයාට එන්න කිව්වාම මොකද මෙයත් එන්නේ.' මලීෂා සිතුවාය. 'එන හැටි එකට ගෑවි ගෑවිමෙයාලා නිකං කොල්ලයි කෙල්ලයි වගේනේ මෙතන'

මට මිස් කතාකළාද?"

දේවක ඇසුවේය. මලීෂා හිස වැනුවාය. භාවනා ඇගේ ජංගම

දුරකථනය ඔබමින් වෙන වැඩකට හිත යොදවනවාක් මෙන් උන්නාය. ඒත් ඇය අවධානයෙන් උන්නාය.

"මෙන්න ස්ටෝර්ස් එකේ කී එක. කීස් දෙකක් තියෙනවා දෙකම මෙතන තියෙනවා. මට මේක පෙන්නලාම දෙන්නෝන මම හෙට ඉඳලා සති දෙකක් ලීව් මගේ ස්ටඩීස්වලට."

මලීෂා කීවාය. භාවනා සිතින් සිනාසුනාය. 'මෙයයි මායි කරන ස්ටඩීස්. ඕලෙවල් දෙපාරක්ම කළා. දෙපාරම ෆේල්. ෆේස් බුක් එකේ වෙන්න ඇති ස්ටඩීස් කරන්නේ' ඇය සිතින් සිතුවාය.

"ස්ටෝර්ස් තියෙන විදිහට ඇතිනේ. ආයේ චෙක් කරන්න දෙයක් නෑනේ නේද?"

දේවක ඇසුවේය.

"එහෙම බෑ අයි ඩෝන්ට් හැව් රෙස්පොන්සිබල්."

ඇය කීවාය. දේවකට බැලුනේ භාවනා දෙසය. ඇය කොහොමත් ස්ටඩීස් කරන එක හොඳය. ඒකවත් හරියට ඉංග්‍රීසියෙන් කියාග න්නට බැරිය. භාවනා දෙතොල් තදකරගත්තාය.

"ඕකේ විල් සී."

දේවක කීවේය. මලීෂා මේක කරන්නේ මිහිරංගගේ උපදෙස් මතය. 'තමුසේ හැමදේම පෙන්නනවා විශේෂයෙන් ඇතුලේ ස්ටෝර්ස් එකේ තියෙන පර්ෆියුම් ස්ටොක් එක. හරිද?' මිහිරංග කීවේය. යතුරත් ඔහු අතට දී එයත් පෙන්වූ පසුව ආයේ දේවකට කියන්නට දෙයක් නැත.

"මේ ග්‍රොසරීස්. මේවා ගැන නිශාන්ත දන්නවා. මේ එක්ස්පෙන්සිව් අයිටම් දාන තැන. මේක බලන්න."

සුවඳ විලවුන් තොගය තිබුණේ එහිය. දේවක හිස පමණක් දමා බැලුවේය.

"මේවා සේල්ස් එකට දාලා තිබුණේ නෑනේ."

ඔහු ඇසුවේය.

"ඒක සේල්ස් අයගෙන් අහන්න. හරිනේ. මේ පැත්තත් බලන්න."

මලීෂා කීවාය. දේවක උඩින් පල්ලෙන් බැලුවේ මේ ස්ටෝර්ස් ලබන සතියේ සිට වෙනස්වෙන නිසා එවිට බලනවා කියා සිතාගෙනය.

"ඕකේ. එහෙනං මං කීස් හෑන්ඩ් ඕවර් කළා. බඩුත් පෙන්නුවා ඕකේ."

ඇය ඇසුවාය. 'මේක මළ

වදයක්නේ.' දේවක සිතින් ඇසුවේය. ඔහු ස්ටෝර්රුවේ සිට ආවේ භාවනා දෙසද බලාගෙනය. ඔහුට දාඩියත් දමා තිබුණි.

දේවක ස්ටෝර්රුව එහෙමම වසා දැමුවේය.

"මේක මුල ඉඳලා හදන්න ඕන මිස්. අපි එතකොට බලමු. සබන් අස්සේ කරවල. විම් අස්සේ හඳුන්කූරු. ඩෝග් ෆුඩ් අස්සේ බැදපු පහේ."

දේවක කීවේය. භාවනාද එය අනුමත කළාය.

"මාත් හිතනවා. ස්ටෝර්ස් කරන්න ඕන ඒ ගැන ලොකු අවබෝධයකින්. මෙයා ඉන්න තරමක් ඉන්නේ ෆේස් බුක් එකේ."

ඇය කීවාය.

"මං මේ වගේ අයව ගොඩක් දැකලා තියෙනවා මිස්."

ඔහු කීවේය. භාවනා දේවක දෙස බැලුවේය.

"ඒත් මේ වගේ හෝන්තුවක් දැකලා නැතුව ඇති."

දේවක යතුර භාවනා අතට දුන්නාය.

"මේක මිස් ළඟ තියාගන්න. අද මගේ කලිසම බහිනවා දාගන්න බැහැ."

ඔහු එහෙමම කීවේය. ඇයට සිනා ආවේ ඉබේටමය.

"ඇයි බහින්නේ."

"මේ දවස්වල ඉණ අඟලක් විතර බැහැලා වගේ. ඉතින් ට්‍රවුසර් එක ලූස්."

"කන්නේ නෑනේ. පව්. කඩං

වැටෙයිද දන්නේ නෑ.”

“අල්ලගන්නවා.”

ඇය සිනාබර දෙනෙත් බිමට බරකරගත්තාය. භාවනා දේවක දුන් ස්ටෝරුවේ යතුරු දෙක එහෙමම ඇගේ ලොකර් එකට දැමුවාය.

# 34

"මොකද වුණේ."

මිහිරංග මලීෂාට කතාකර ඇසුවේය.

"වැඩේ හරි. මෑන් ඇවිත් ඇතුළත් බලලා යතුරත් බාරගත්තා කීස් දෙක දැන් මිනිහගේ අතේ. පර්ෆියුම් ස්ටොක් එක විශේෂයෙන් පෙන්නුවා ඇයි ඇහුවා මේවා සේල්ස් දාලා නැත්තේ මං කිව්වා ඒවා සේල්ස් අයගෙන් දැනගන්න කියලා. මිනිහා

කට වහගත්තා.”

“වෙරි ගුඩ්. දැන් හෙට ඉඳලා තමුසේ ලීව් දානවා ආයේ මේ පැත්ත පළාතේ එන්න එපා මම කියනකල්.”

“ලොකු දෙයක්.”

ඇය කීවාය.

මිහිරංග තනිවම සිනාසුණේය.

“උඹට ස්ටෝර්ස් පෙන්නුවේ උඹ පොර නිසා කියලා හිතන්න ඇති. දැන් කීස් දෙකත් උඹගාව අපි ළඟ මොනවත් නෑ.බඩුත් උඹ දැක්කා තියෙන. දැන් ලස්සනට මගේ ළඟ තියෙන ඩුබ්ලිකේට් කී එකෙන් ස්ටෝර්ස් ඇරලා බඩුටික පාන්දර ලස්සනට පන්නනවා ඊට පස්සේ දෙන්නම් ලස්සනට. සතියකින් මම ඇවිත් සේල්ස් ඇනලයිස් එක හදනවා. එතකොට බඩු නෑ.”

මිහිරංග සැළසුම හැදුවේ එහෙමය. මේ සුවඳ විලවුන් තොගය සීගිරි එකෙන් පන්නන්නට ඔහු ආරක්ෂක නිළධාරියාවද අල්ලාගත්තේය. ඒ සියල්ල සැළසුම් කර තිබුණේ අද මහ පාන්දරය. අද රෑ ඔහු සීගිරි එකේ නවතින බව මිහිරංග දනී. ඔහු යන වෙලාව හරියටම බලා ඒ දේ කරන්නට පුළුවන.

මිහිරංග දේවකව ඉවත්කරන්නට තවත් සැළසුමක්ද දමා තිබුණි. ඒ ඔහුට හිතවත් සේවයන් තිදෙනෙක් යොදවාය. ඔවුන් හෙට අනිද්දා වෙද්දී රඹුක්වැල්ල මහතාට මේ ගැන පැමිණිලි කරන්නට නියමිතය. ඔවුන් කියන්නට ඉන්නේ 'දේවක සර් එක්ක වැඩකරන්න බෑ. බල්ලන්ට වගේ බණින්නේ අපි අස්වෙනවා

සර්.' කියාය. සේවකයන්ට හරියට සළකන්නේ නැති ඉහළ කළමණාකරුවන් කීපදෙනෙක්වම සීයා සේවයෙන් ඉවත්කළ බව මිහිරංග දැනගෙන උන්නේය. මේ සියල්ල මිහිරංග සැළසුම් කළේ ඔහු මේ කිසිවකට සම්බන්ධ නැති සේය.

දැන් කොහොමත් සීගිරි එක ඇත්තේ වසා දමාය.

"මෙහෙමම මේක ක්ලෝස් කරලා දාන්න වෙන තැනට ගේමක් දෙන්නෝන මචං. එහෙම වුනොත් අපේ ප්ලෑන් එක හරි."

මිහිරංග ඊයේ කෝසලට කීවේය. නිධානයක් බඳු ව්‍යාපාරයක් වලපල්ලට යැවීම කොතරම් මෝඩ වැඩක්ද කියා මිහිරංග දැන උන්නේ නැත. මොළයක් ඇති කෙනෙක්

සුපර් මාර්කට් එකක් නොව කඩ කෑල්ලක් පවා වසා දමන්නට යන්නේ නැත. බිස්නස් එකක් හැදීම කොතරම් අමාරුදැයි ඔවුන් දනී. ඒ පිටුපස අනන්ත දුක්වේදනා දහදිය කඳුළු ඇත. ව්‍යාපාරයක් ගොඩනඟා ඇත්තේ ඒ තුළිනි. සීගිරි එක ආරක්ෂාකරගතහොත් දවසක මිහිරංගගේ දරුවන්ට පවා අභිමානයෙක් ඉන්නට පුළුවන. එහෙත් ඔහු එය තේරුම් ගන්නේ නැත. ඔහු මේ දිනවල සිතන්නේ සීගිරි එක කොටස් කළ පසුව ඔහුගේ කෑල්ලගෙන මොනවාවත් නොකර ඉන්නටය.

"ආයේ මේක බිල්ඩ් කරන්න බෑ මචං. සීයා වුනත් මේක අත්ඇරලාම දායි. මේ ෆුඩ් සිටි කීල්ස්ලා එක්ක කොහොමද බං ෆයිට් එකක්

දෙන්නේ.”

කෝසළද කීවේය.

“සීගිරි එක කරගෙන යන්න භාවනාටයි නේත්‍රාටයි ලොකු ඕනකමක් තියෙනවා. මුන්ට මේක වෙනම ආතල් එකක්නේ. සාරි ගහගෙන මෙතනට එන්නේ මේක නිකං අලි බිස්නස් එක කියලා හිතාගෙන.”

මිහිරංග කීවේය.

“සීගිරි එක වහපු දාට මුන් නිකම්ම නිකං කෑලි දෙකනේ.”

මිහිරංග හිස වැනුවේය.

“මූවත් යවලා මෙතන අවුලක්ම කරලා අපි අම්මලා දෙන්නව ටිකක් වයින් කරලා එවන්න වෙනවා.”

“ඇයි මචං.”

“එයාලා දෙන්නා තමයි

කියන්නෝන මේක වැඩක් නෑ මේක වහලා දාලා බෙදලා දාන්න කියලා. සීයට කට උත්තර නැතිවෙන්න තමයි වැඩේ දෙන්නෝන. එයා ඕකේ නම් වැඩේ ගොඩ."

මිහිරංග කීවේය.

"මචං ගේම මාට්ටු වෙන එකක් නෑ නේද"

කෝසල බියෙන් මෙන් ඇසුවේය.

"මාට්ටු වෙන්න කවුද බං ගේම් ගහන්නේ. උඹ හිතුවද මං පුරුදු වෙන්න ගේම් ගහනවා කියලා."

මිහිරංග දෙස කෝසල බලාගෙන උන්නේ පුදුමයෙන් මෙන්ය. ජීවත්වෙන්නට මේ තරම් ගේම් ගහන්නට ඕනා කියා කෝසල සිතුවේ නැත. 'දවසක මූ මටත් ගේමක් ගහයි එහෙමට බුවා.' කෝසල

සිතුවේය.

සීගිරි සුපර් එකක් දැන් නැත. ඇත්තේ තනිකරම අලුත් වැඩබිමකි. විවිධ අංශවල කොන්ත්‍රාත්කරුවන් විස්සක් පමණ සීගිරි එක අලුතින් ගොඩනැඟීමට මේ වැඩකටයුතු බාරගෙන තිබුණි. ඔවුන් සියයකට ආසන්න කම්කරුවන් පිරිසක් එයට යොදවා තිබුණි. දේවක හය වෙද්දී අලුත් ෆ්ලෑෂ් ලයිට් හතරක් සීගිරි එකම එළිය වෙන්නට දැමුවේය. දැන් එය නියම වැඩබිමකි. සීගිරි එක ඉදිරිපිට කා පාක් එකේ පස් අඟල් පහක් පමණ ඉවත්කර තිබුනේ 'ඉන්ටර්ලොකින් පාවින්ග්ස්' නම් වූ කොන්ක්‍රීට් තීරු අල්ලන්නටය. අලුත් සුපර් මාර්කට්වල ඉදිරිපසට අල්ලන්නේ ඒවාය. එවිට මඩ වෙන්නේ නැත. දේවක උද්‍යාන

අලංකාරණ සමාගමකට කතාකර 'ෆොක්ස් ටේල්' වශයෙන් හඳුන්වන පාම් වර්ගයේ ගස් විස්සක් ඇණවුම් කර තිබුණි. ඒත් සමඟම හැකි තරම් විශාල අරලියා ගස් දෙකක්ද ගෙනෙන්න කියා ඔහු උපදෙස් දුන්නේය. ඒ අරලියා ගස් දෙක සිටවන්නේ එළියේ බේකරි ෂොප් එක අසළය. එවිට වෙනමම ලස්සනක් එයට එන බව ඔහු දැනගෙන උන්නේය.

සීගිරි එක ඇතුලේ වැඩ හරිම කලබලයෙන් නමුත් පිළිවෙලට කෙරෙමින් තිබුණි. දේවක වැඩිපුරම උන්නේ රනින් කිචන් එකත් බේකරි කිචන් එකත් හදන තැන්වලය. ඔහු ගිමන් නිවාගත්තේ බුක් ෂොප් එක හදන තැනට ඇවිත්ය.

සෝදා හම ගිය ඩෙනිම් කලිසමක් හා සුදු ඩයලොග් ටී ෂර්ට් එකක් ඇඳගෙන රබර් සෙරප්පු දෙකක් දමාගෙන දේවක වැඩකළේය. අවුල්ව ගිය හිසකේද වෙහෙසබර මුහුණද යන්තම් දහදිය තට්ටුවක් ආ වතද කොල්ලාට ගෙන ආවේ වෙනස්ම ලස්සනකි.

ජීවන් කතාකළේ කොල්ලා අද ගෙදර එන්නේ නැති බව දැනගෙ නය. 'ඔයාගේ කොල්ලා ඔයාම හදපු සීගිරි එක අද තනියම හදනවා සුදු නෝනා ටිකක් ඒකව බලාගන්න' ජීවන් ඔහුගේ මියගිය බිරිඳට කීවේ වරක් දෙවරක් නොවේ. කොල්ලා බාරගත්තේ එසේ මෙසේ අභියෝග යක් නොවේ. ඔහුගේ වයසට මේ වගකීම් බර වැඩිය. ඒත් අවසානයේදී කොල්ලා ජයගන්නා බව ජීවන්

ඉවෙන් මෙන් දැනගෙන උන්නේය. 'අම්මම තමයි' ඔහු සිතුවේය. ජීවන් හේරත්ට කියා සීනි සම්බෝල පාන් ටිකක් හදා හේරත්වත් දාගෙනම සීගිරි එක පැත්තට ආවේය. කොල්ලා සීගිරි එක හදන්නේ ටකරන් වලින් සිගිරි බිමම වසාය. කළ යුත්තේද එයම බව ජීවන් දනී. වෙනස්කමක් කරන විට එය වැසිය යුතුය. ලස්සන එවිටය.

ජීවන් කතාකළේ සීගිරි එක පේන මානයේ සිට ත්‍රී වීලරය තුළට වීය.

"අප්පච්චී."

"වැඩද පුංචි මහත්තයෝ."

ජීවන් ඇසුවේ ආදරයෙනි.

"එකසිය ගාණට අප්පච්චි. මට කතාකරන්න වුනෙත් නෑ. ටිකක් ගේමක්නේ අප්පච්චි මේක."

කොල්ලා ගැන ජීවන්ට දුකය.

"එහෙම ගේමක් කියලා හිතන්න එපා. ඔයාට පුළුවන්."

"අප්පච්චී ගෙදර ආවද?"

ජීවන් සිනාසුනේය.

"මං ඇවිත් මේ හේරත්ට කියලා සීනි සම්බෝල පාන් ටිකක් හැදුවා. මේ ළඟට ඇවිත් ඉන්නේ පුංචි මහත්තයෝ. මං හේරත් අතේ ඒක එවන්නම්. කන්න."

දේවකට හරි දුකය. ඔහු මෙහෙම කරන්නේ තමා නොකා නොබී වැඩකරනවා කියා සිතාගෙනය. 'අම්මා නැති අඩුවත් නොදැනෙන්න ඔයා මට ආදරේ කරන්නේ' දේවක සිතුවේය.

"මං දුවලා එන්නද අප්පච්චී."

"එපා පුතේ ඔයා ඉන්නකෝ. මං

හේරත් මාමව චවන්නම්. චයාට ඔතන පෙන්නලා තියන්නත් ඕනනේ. කාලා ඉන්න මහත්තයෝ."

"හා අප්පච්චී."

ජීවන් තනිවම සිනාසුනේය. ඔහු හේරත්ව සීගිරි චකට යවා ඈත සිට ඒ දෙස බලාගෙන උන්නේය. කොල්ලා අලුතින් මවන සීගිරි චක දකින්නට දැන් ජීවන්ටද ආසය. සමහරුන්ට උපතින්ම හාස්කම් කරන්නට පුළුවන. තමාගේ කොල්ලාටත් චහෙම කරන්න පුළුවන් කියා ජීවන් විශ්වාස කළේය. චහෙම තමා කරන චක ගැන ඔහුට පුදුම නැත. දෙමව්පියන් චහෙමය. චීත් ජීවන්ට පුදුම රඹුක්වැල්ල පවුලම කොල්ලාව විශ්වාස කළ චක ගැනය.

"ඔයා මාව විශ්වාස කළේ නෑ

තාත්තේ. ඒත් දැන් මගේ කොල්ලව විශ්වාස කරනවා ඒ ගැන මට කොච්චර සතුටක් තියෙනවද කියලා ඔයා දන්නේ නෑ"

ජීවන් රහසින් මෙන් දෙනෙත් පිසදාගත්තේය.

# 35

භාවනා අල්මාරිය ඇරගෙන කැරකුණේ අඳින්නේ මොකක්ද කියා සිතමින්ය. මේ රෑ ආයෙත් සීගිරි එකට දුවන්නේ ඒක හදන්න තමාට අමුතුවෙන් කරන්නට දෙයක් නැති බව දැනගෙනමය. ඒත් එතන කාන්දම් ඇත. අද හදවත යකඩ ඇණයක් සේ එයටම ඇදෙන හේතුව කුමක්ද කියා ආයේ ඇයට හිතන්න ඕන නැත. 'ඔයා මාව ලෙඩෙක්

කරලා දේවක.දැන් මම ඉන්නේ සෑහෙන අසනීපවෙලා' භාවනා සිතුවාය.

ඇය හිතාගෙන උන්නේ ඩෙනිම් ජීන්ස් එකට ටී ෂර්ට් එකක් ඇඳගෙන එන්නටය. එහෙම හිතුවේ දවල් දෙකේ සිටය. කෙල්ලෝ එහෙමය. අඳින දේවල් ගැන සමහරවිට හිතන්නේ දවස් දෙක තුනක සිටය. ඒක විකාරයකි. ඒත් කෙල්ලන්ට ජීවිතය කියන්නේත් ඒ විකාරයමය. 'ඔයා කියන්නේ සුද්දි මොක ඇන්ඳත් ලස්සනයි කියලා. ආයේ මොකට හිතනවද?' ඇය සිතුවාය. පසුව තොල්පට මුව තුළට දමාගෙන තනිවම සිනාසුනාය.

අවසානයට ඇය තෝරාගත්තේ ඇගේ කොළ පැහැගත් ටයිට් ස්කට්

එකත් සුදු ටී ෂර්ට් එකත්ය. 'ස්කට් ඇන්ඩ් බ්ලවුස් ඇන්ඳාම සුද්දි ගොඩක් ලස්සනයි' එහෙම ඔහු දවල් කීවේය. දැන් හිතේ දුවන්නේම ඒ කතාවය. 'මේකා මහ කපටියෙක්ද කොහෙද' සාය වතට තබා බලමින් ඇය සිතුවාය. ඒක ඇන්ඳ විට දණිහිසෙන් අඟල් දෙක තුනක් පමණ උඩට දෙපා නිරාවරණය වෙයි. ඇය මුහුණට පොඩි ක්ලීන් අප් එකක් දමාගත්තේ දැන් ටිකකට පෙරය. එහෙම දැමූ විට දවසක වෙහෙසබර බව මොහොතකින් නැතිවී යයි.

තාරකා කෙල්ලට ගත්තේ ඇය අළිමින් සිටිද්දීය. හෙට ඇය ලංකාවට එන බව භාවනා දැනගෙන උන්නාය. පොඩි අක්කාව දකින්නටත් ආසය. දහවල් තාරකා ඇගේ ෆේස් බුක් පිටුවට ඇය එමිරේට්ස් නිළ

ඇල්ලිමින් සැරසී ෆ්ලයිට් එකේ සිටින පින්තූර කිහිපයක් අප්ලෝඩ් කර තිබුණි. භාවනා සෑහෙන වෙලාවක් ඒ දෙස බලාගෙන උන්නාය. මේ මගේ අක්කා නේදැයි සිතෙද්දී ඇයට මොකක්ද මිහිරි සතුටක් දැනුණි.

"ෆොටෝස් ටික සෝ කියුට් සුදූ. දැන් කොහෙද ඔය."

භාවනා ඇසුවාය.

"මේ තාම ඩුබායි පැටියෝ. හෙට පාන්දර දෙකට මෙහෙන් ෆ්ලයිට් එක තියෙන්නේ. උදේ මම එනවා."

ඇය කීවාය.

"මම ඇවිත් අම්මටත් ෆොටොස් ටික පෙන්නුවා. එයාට හරි ආසයි."

"තාත්තට පෙන්නුවේ නෑ සුදූ."

තාරකා ඇසුවාය.

"රෑට පෙන්නන්නම්. මටනම් පුදුම

ආසයි.”

“උඹට තව මොනවාහරි ඕනනම් කියපන් පැටියෝ. අද හවස විතරයි මට තියෙන්නේ.”

“අනේ ඉතින් පස්සේ ගන්න පුළුවන් නේ. ආයෙත් අනිද්දා යනවනේ.”

“ම්. අම්මට කියපන් කිරිබත් ඕන කියලා සුද්දියේ හොඳේ. හරි ආසයි බං කන්න.”

භාවනාගේ දෑස් කඳුළින් පෙඟී ගියේ හේතුවක් ඇතිවම නොවේ.

“පව්. මම කියන්නම්. ඇවිත් ටිකක් නිදාගන්න. අපි රෑට එකට නිදාගමු. ම්. නිවිස් ගොඩයි.”

“හා. මම උඹ ගාවට එන්නම්. අක්කිවත් ගමුකෝ.”

භාවනා සිනාසුනාය. ලොකු වූ

පසුව කාමර තුනකට ගියද කෙල්ලෝ තුන්දෙනා ආස පුංචි කාලයේ මෙන් එකට ඉන්නටය.

"සුදූ මේ."

භාවනා කීවේ රහසින් මෙන්ය.

"සුද්දි."

"මේ පොඩි ප්‍රසන්ට් එකක් දෙන්න මේ පිස්සෙක්ට. රිලැක්ස් ටී එකක් වගේ දෙයක්. එච්චර ඕනමත් නෑ. මේ දන්නේ නැද්ද?"

කෙල්ල තැටමුවාය. තාරකාට දුකය. මේ කෙල්ල කොල්ලෙක් ගැන කියනවාමය.

"හරි. එහෙම කිව්වාම ඇති. මම ගේන්නම්. කොල්ලා මීඩියම් සයිස් නේ."

ඇය ඇසුවාය. භාවනාට සිනාග යේය.

"ම්. චුට්ටක්."

ඇයට එහෙම කියන්නත් ලැජ්ජය.

"සුද්දියේ."

"ම්."

"නැගලා යනවද බං"

ඇය ඇසුවාය.

"එහෙම දෙයක් නෑ අයියෝ. මේකා හොඳ එකා. ඒකයි."

ඇය එහෙමම කීවාය. කුළුඳුලේ කොල්ලෙක් ගැන කියන නංගී ගැන තාරකාට දුකය.

"හරි. මං ගේන්නම්. හෙටම දෙමු. ආවාම මට කියපන් හොඳේ ස්ටෝරිය."

"නොට් යෙට් අනේ. එන්නකෝ ඔයා. දකින්නත් ආසයි."

ඇය කීවාය.

"බුදු සරණායි. පරිස්සමින් එන්න.

මං එහෙනම් ඔයා එනකල් උඩේ ටිකක් ඉන්නවා. කිස් එකක් දීලා තමයි යන්නේ."

"සී යූ බබා. ටේක් කෙයා. අව් ලව් යූ."

"මී ටූ"

භාවනා දුරකථනය තැබුවේ එයට සද්දෙට හාදුවක්ද දීය. පසුව ඇය තනිවම සිනාසුනාය. පසුව ඇය ඇඳගෙන ඇගේ පටි සෙරප්පු දෙකද දමාගෙන කුඩා අත් බෑගයට ෆෝන් එකත් පර්ස් එකත් පමණක් දමාගත්තාය. භාවනා පහළට එද්දී හතර වටින්ම කළුවර වී තිබුණි. මෙහෙම රෑක ගමනක් යන එකෙත් මොකක්ද සතුටක් ඇත.

ඉඳුනිල් කෙල්ල දෙස පහළ සිටම බලාගෙන උන්නාය.

"දැන් කන්නේ මැණික."

ඇය ඇසුවාය.

"ඩිනර් මොනවාහරි ගෙන්නගෙන කන්නම් අම්මා. එතන ස්ටාෆ් එක වැඩනේ. උන් එක්ක මොනවාහරි කනවා."

'මමම කයි උන් එක්ක. මේ යන්නේ ස්ටාෆ් එකේ කොල්ලෙක් එක්ක රෑට ආප්ප කන්න' ඇය තමාටම කියාගත්තාය.

"ගොඩක් රෑ වෙන්න එපා."

ඉඳුනිල් කීවාය. භාවනා රැව්වාය.

"එක දුවෙක් කිලෝ මීටර් දාස් ගාණක් එහා ඩුබායි සිටි එකේ. ඒක ගාණක් නෑ මට රෑ නොවී එන්නලු. චුට්ටක් රෑ වෙලා ආවාම මොකද අනේ."

කෙල්ල කීවාය. ඉඳුනිල්

සිනාසුනාය.

"අක්කි කතාකළා උදේ එනවලු."

"ම්. එයාව දකින්නත් ආසයි."

"උදේට කිරිබත් ඕනලු. පව්"

ඉඳුනිල්ටත් දුකය.

"එහෙනං චිකන් කරියකුත් හදන්න වෙයි. තියෙනවද දන්නෙත් නෑ චිකන්."

"මම එනකොට ගේන්නද?"

"කරුණාදාස අතේ එවන්නකෝ මැණික. අක්කට කිරිබත් කනවානම් චිකන් කරි ඕනමයි."

පොඩි අක්කාට එහෙමය. දවල්ට කද්දී ඇයට සොසේජස් ඕනය. උදේට කද්දී ඔම්ලට් ඕනය. අම්මා මේ සියල්ලම දැනගෙන උන්නාය. කරදරයක් දුන්නේ නැත්තේ නේත්‍රා පමණය. මේකත් හොඳ බඩ්ඩ බව

අම්මා දනී. ඒත් මේ කෙල්ලෝ තුන්දෙනා ඇයට පණ වාගේය.

"මං යනවා. සාදු."

භාවනා යන්තමට පහත් වී අම්මාට වැඳ පිටවූවාය. කෙල්ල නලව නලවා යන හැටි ඉඳුනිල් බලාගෙන උන්නාය. දැන් සාලයම සුවඳය.

# 36

දැන් රෑ හතය. සීගිරි එක අලුතින් නිමවන කොන්ත්‍රාත්කරුවන් සියල්ලම එක හුස්මට වැඩය. දේවක පැත්තකට වී බලාගෙන උන්නේය. මේ කලබලය දකින කෙනෙක්ට පිස්සු හැදුනේ නැත්නම් පුදුමය. එහෙත් දේවකගේ සිතේ තිබුනේ එක හීනයක් පමණි. මේ කලබල සියල්ලම සතියකින් නිමාවෙයි. ඊට පසු ඇරඹෙන්නේ සිහිනය පින්තාරු

කිරීමේ මොහොතය. එහෙම ෆයිනල් චිත්‍රයක් හිතේ ඇඳගෙන වැඩකරද්දී පහසුය.

දේවක පැත්තකට වී සීගිරි එක දෙස බලාගෙන සිතුවේ ලයිටින් සිස්ටම් එකත් එයටම අල්ලා තිබූ කැමරා සිස්ටම් එකත් සවුන්ඩ් සිස්ටම් එකත් ගලවනවාද කියාය. එය සෑහෙන වැඩකි. මේ සියල්ල තිබුණේ සිවිලිමට අල්ලාය. ඒවා ටික එකවර ගැලෙව්වොත් අලුතින් නිමවන්නට අඩුම ගාණේ ලක්ෂ හතර පහක් යන බව දේවක සිතුවේය.

"සිස්ටම් එක මෙහෙමම තියලා වෙනම විදිහකට ලයිට් ටිකක් විතරක් දාගන්න පුළුවන්නම් වැඩේ පනහකින් විතර ඉවරකරගන්න පුළුවන්."

ඔහු සිතුවේය. දේවක අවසානයට

සිතුවේ සීගිරි හී සිවිලිමේ අල්ලා තිබූ කිසිම ඉලෙක්ට්‍රොනික උපාංග යක් ගලවන්නේ නැතුව තබන්නටය. එය අවධානම් වැඩකි. සිවිලිම අලුතින් පේන්ට් කරන නිසාත් එයට අලුතින් විදුලි පහන් දමන නිසාත් අලුත් පෙනුමක් කොහොමත් එයි. දේවක දමන්නට සිතාගෙන උන්නේ අඩු විදුලියක් යන එල් ඊ ඩී විදුලි පහන්ය. සුපර් මාර්කට් එක ඇතුළත ලා කහ පැහැයක් ගන්නට ඔහු සිතාගෙන උන්නේය.

"කැමරා සිස්ටම් එකක් අලුතින් දාන්න එකක්වත් ඉල්ලනවා. ඒක බොරු වියදමක්."

දේවක වැඩබිමේ සිටම තීරණය කළේය. හොඳ කළමණාකරුවෙක් එහෙමය. හදිස්සි තීරණවලට එයි.

එහෙත් දවල් මිහිරංග ඔහුට හිතවත් සේවකයෙක් ලබා දේවකගෙන් අවශ්‍ය තොරතුරක් ලබාගත්තේය. මිහිරංගටත් දැනගන්නට ඕනා වී තිබුණේ සීගිරි සුපර් හී සීසීටීවී කැමරා උපාංග පද්ධතිය ගලවනවාද කියාය.

ඒ වෙලාවේ දේවක උන්නේ මේවා අද රෑ ගලවාදමන්නටය.

"සර් මේ මෙතන පර්ෆියුම් රැක් එක ගාවට කැමරා එකක් නෑ. අලුතින් මේවා අල්ලනකොට එතනට එකක් දාන්න වෙයි. කට්ටිය කස්ටමස්ලා ගොඩක් පර්ෆියුම් බොට්ල් ඕපන් කරනවා."

ආරියරත්න කීවේ කැමරා පද්ධතිය ගලවනවාද කියා කෙළින්ම අහන්න බැරි නිසාය.

"අද අපි ඔක්කොම ගලවනවානේ ආරියරත්න. ඔයා ඒක කිව්ව එක හොඳයි. මම එතනට එකක් දාන්නම්."

දේවක කීවේය.

"මේ සිස්ටම් එකම ගලවනවද සර්."

දේවක උන්නේ වැඩකය. ඔහු සිතන්නේ නැතුවම හිස වැනුවේය.

"ඒක හොඳයි. මේවා ගොඩක් පරණයි දැන්."

ආරියරත්න එහෙමම මිහිරංගට ඇමතුමක් ගත්තේය.

"දැනටමත් මේවා ඩිස්කනෙක්ට් කරලා තියෙන්නේ සර්. රෑ මේවා ගලවනවා."

මිහිරංගට පණිවිඩය ලැබිණි. ඔහු සිනාසුනේය.

*** *** *** *** ***

දේවක උන්නේ සීගිරි එක ඇතුළේ වූ රනින් කිචන් එක හදන තැනය. රනින් කිචන් එකක් යනු සුපර් මාර්කට්වල ඇති අලුත්ම විශේෂාංගයකි. දේවක එහි වෙනම මෙනූ එකක් දාන්නට සිතාගෙන උන්නේය. පාරිභෝගිකයන් ඉන් පිසූ ආහාර ද්‍රව්‍ය මිළට ගන්නට පුළුවන. පාරිභෝගිකයෙක්ට ෆරයිඩ් රයිස් එකක් ඕනානම් බඩු ගන්නට පෙර යද්දීම එය රනින් කිචන් එකට කියා යන්නට පුළුවන. බඩු අරගෙන නිමා වෙද්දී ඔහු ඇණවුම් හදා අවසානය. ඉන් වෙනමම ආදායමක් ලබන්නට දේවක සිතාගෙන උන්නේය.

රනින් කිචන් එක හදන්නේ තරමක් පිච්චූ දන්කොටු ගඩොලිනි. මේ වැනිම විවෘත කුස්සියක ඡායාරූපයක් ඔහු අන්තර්ජාලයෙන් ලබාගත්තේය. දේවක කොන්ත්‍රාත්කරුට දුන්නේ ඒ ඡායාරූපයය.

"මට මේ විදිහට කිචන් එක ඕන මේ පැත්තෙන් ඕපන් කරලා. මේ ගාණට. කස්ටමර් කෙනෙක්ට චෙෆ්ගේ ඉනෙන් ඉහළ පේනවා. ලිප පේන්නේ නෑ. නමුත් ලිපේ උයනවා කියලා පේන්න ඕන."

ඔහු කීවේය. දැන් මේ ඒක හැදෙන්නේ ඒ ලෙසිනි. පිසූ ආහාර තබන්නට වෙනමම කවුන්ටරයක්ද ඒ ඉදිරියේ ඇත.

රනින් කිචන් එකට කෝකියන්

දෙදෙනෙක් බඳවාගන්නට දැන්වීමක්ද පළ කෙරිණ. එය මේ සතියේ ඉරිදා පුවත්පතක පළවෙයි. මේ සියල්ලම තනිවම හිත හිත කරන්නේ කොහොමද කියා නේත්‍රාට පුදුම සිතුණි.

“මං ඒක බලලා දාන්නම් මල්ලි. ඔයා අනිත් වැඩ ටික බලන්නකෝ.”

නේත්‍රා කීවේ කොල්ලා ගැන දුක සිතීය.

භාවනා ආවේ දේවක කිචන් එක හදන හැටි පරීක්ෂාකරමින් සිටිද්දීය. කෙල්ලට කළින් ආවේ ඇගේ සුවඳය. රාක්ක පැත්තකට ඇද ඇති නිසා දැන් සීගිරි එක මැද හිස්ය. කෙල්ල ආවේ ඒ මැදිනි. විදුලි පහන් එළි මැදින් ඇය එද්දී දේවක බලාගෙනම උන්නේය. ‘ඒ

උඹටත් පිස්සුද බං උණ හපුළුවා වගේ කෙල්ල දිහා බලාගෙන ඉන්න. ඒ මූ කෙල්ලෝ දැකලා නෑ වගේනේ බං.' දේවකගේ සිත කියන්නට විය. 'කාටද බං නොබලා ඉන්න පුළුවන්.' ඔහු සිතට කීවේය. යුවතිය ඈත සිට සිනාසීගෙනම ආවාය. ටයිට් ස්කට් එකට යුවතියගෙන් එන්නේ වෙනස්ම අනුරාගී යොවුන් සුන්දරත්වයකි. එය රස නොවිඳ ඉන්නට තරම් දේවකගේ සිත විරාගික නැත.

ඇය ඇවිදගෙන එන්නේ තමාගේ හදවත මතින් යැයි දේවකට නිකමට සිතුණි. 'මං දිහාම බලාගෙන ඉන්නවනේ. ඇයි මේ දේවක' භාවනා සිතුවාය. එහෙත් තමාත් එන්නේ ඔහු දෙසම බලාගෙන නොවේද??

"මං හිතුවා එන එකක් නෑ

කියලත්.”

ඔහු කීවේ කලබල ස්වරයෙනි.

“ඇයි ඒ?”

“නෑ මේ හතත් වුනානේ”

භාවනා මිහිරි ලෙස සිනාසුනාය.

“එහෙම දුවලා එන්න බෑනේ. වැඩනේ.”

කෙල්ල අද්ද් පද්දා කීවාය.

“යම යුද්දේ වගේ නේ.”

භාවනාටනම් උණ ගන්නත් වාගේය. මේ සියල්ල ඔහු එකලාසයක් කරන්නේ කෙසේද කියා ඇයටනම් හිතාගන්නටත් අමාරුය.

“ඒ වගේ තමයි. ළඟ ඉඳගෙනම කරගන්න වෙනවා. අපිට සතියයි මේ වැඩවලට තියෙන්නේ සුද්දි.”

දේවක රහසින් මෙන් කීවේය.

භාවනා දිලිසෙන දෙනෙතින් සිනාසුනාය.

“තේකක්වත් බිව්වේ නෑනේද?”

“ස්ටාෆ් එකට කිඹුලා එක්ක තේ ගෙනත් දුන්නා. මම තාම බිව්වේ නෑ.”

ඔහු කීවේය. ඔහු එහෙමය.

“මං තේ ගේන්න කියන්නද?”

දේවක ඇයත් සමඟම කාර්යාල කාමරයට ආවාය.

“අප්පච්චි සීනි සම්බෝල පාන් ගෙනත් දුන්නා.”

දේවක කීවේය.

“අනේ අප්පච්චී ආවද?”

“මෙහෙට ආවේ නෑ. හේරත් මාමා අතේ එවලා තිබුණා.”

ඔහුගේ අප්පච්චී කොතරම් හොඳ කෙනෙක් වෙන්නට ඇත්දැයි භාවනා

සිතුවාය.

කාර්යාල කාමරය නිසලය. පාළුය. එහි දැන් තනිවී ඉන්නේ භාවනාත් ඔහුත් පමණය.

"මං මගේ රූම් එකේ කී එක ගෙනත් නෑ."

"මෙහෙන් ඉමු."

දේවක අමුත්තන් සඳහා පනවා ඇති කුෂන් සෝපාව ඇයට පෙන්නුවේය. යුවතිය එහි ඉඳගත්තේ සෑහෙන ජිම්නාස්ටික් එකක් දමාය. 'ටයිට් ස්කට් එකක් ඇඳන් ආවානම් දැන් ඉතින් ඇඹරී ඇඹරී ඉඳපන්' ඇය තනිවම කීවාය. ටයිට් ස්කට් එකක් ඇන්ඳ විට ඉඳගන්නට අමාරුය. දෙපාවලින් සෑහෙන ප්‍රමාණයක් එවිට පෙනෙයි. දේවක බිත්තිය දෙස බලාගෙන සිනාසුනාය.

භාවනා රැව්වාය.

"මොකෝ හිනාවෙන්නේ."

ඇය යටිතොල හපාගෙන ඇසුවාය.

"මම හිනාවුනේ නෑ මිස්."

ඔහු කීවේය.

"මේ සීනි සම්බෝල පාන් කමු."

භාවනා පෙත්තක් ගත්තාය. සීනි සම්බෝල සුවඳින් කාමරය පිරී ගියේය.

"ගොඩක් කන්නේ නෑ හොඳේ. රෑට ආප්ප කන්න තියෙනවා."

ඇය කීවාය.

"නමයට විතර ගෙනත් කමු."

මෙහෙම ගෙවෙන ජීවිතයේ මොකක්ද දෙයක් ඇත. භාවනා බැලුවේ ඔහු ඇඳගෙන උන් ටී ෂර්ට් එක දෙසය.

"මේ ටී එක"

"ඇයි සුද්දි."

"නෑ සයිස් මීඩියම්ද?"

ඇය ඇසුවාය. දේවකට පුදුම සිතුණි.

"ඔව්. ඇයි."

"නෑ නිකං. මම ස්මෝල්නේ. ඒකයි."

දේවක පුදුමයෙන් බැලුවේය.

"අපේ පොඩි අක්කා හෙට උදේ එනවා. රෑ දෙකට ඩුබායිවලින් ෆ්ලයිට් එක කෙල්ලට. හවස කතාකළා."

භාවනා ඔහේ කියවයි. එහෙම කියවෙන්නේ ඇයි කියා ඇයටම තේරෙන්නේ නැත.

"සුද්දිත් හොඳයි එයා හොස්ටස් කෙනෙක් වෙන්න."

ඔහු කීවේය.

"මී. ශ්‍රී ලන්කන් ඇප්ලයි කරන්න ඉන්නේ."

භාවනාට කියවිණ.

"අනේ."

ඇය දෙනෙත් පමණක් එසෙව්වාය.

"ඔයා දැන් කිව්වේ."

"ඒ මේ ලස්සන නිසා කිව්වේ."

හදවත පැද්දෙයි. නැලවෙයි.

"තාත්තා මට යන්න දෙන්නේ නෑ. එක පවුලකින් එක්කෙනෙක් එහෙම ගියාම ඇති කියලා කියන්නේ. ඒකිට හොඳ නිදහස."

ඇය කීවාය.

"පොඩි දුව ඉතින් හුරතලේට ගෙදර ඉන්න එපැයි. ඒකයි"

භාවනා දෙනෙත් එසෙව්වාය.

"දේවකයියේ."

ඇය ගියේ මොනවද අසන්නටය. දේවක බැලුවේය.

"සුද්දි."

"දුවන්න වගේනේ මෙතනින් ටිකක් ඉඳගන්න වැඩක් අහන්න"

ඇය කීවාය. 'දෙයියනේ මම මොනවද අහන්න යන්නේ' භාවනා ගැහෙමින් සිතුවාය. අහන්නට දෙයක් නැත්නම් අරම කීවේ ඇයිදැයි ඇයම සිතුවාය. මේ දවස්වල සිහිකල්පනාවක් ඇත්තේම නැත.

"මොකක්ද සුද්දි."

ඔහු ඇසුවේ කුතුහලයෙනි. දේවකගේ දිලිසෙන දෑස් දෙස තත්පර පහක් පමණ බලාගෙන උන් භාවනා පසුව නෙත් බරකරගත්තාය. ඇය මේ වෙලාගන්නේ අහන්නට

දෙයක් හදාගන්නටය. ඒත් හිත අහන්න ගියේ වෙන යමක්ද??

"මම ටික දවසක ඉඳලා උන්නේ දෙයක් අහන්න."

"අහන්නකෝ."

ඔහු කීවේය.

"මේ සීගිරි එකටම එන්න මොකක්හරි හේතුවක් තියෙනවද කියන්න."

ඇය ඇසුවාය. දේවක නෙත් බරකරගෙන ටික වෙලාවක් උන්නේය. ඇයට මේ වෙලාවේම මේ ඇත්ත කියා දමන්නට ඔහුට සිතෙයි. එහෙත් සීගිරි සුපර් එක ගොඩනඟන්නට ගත් අභියෝගය සාර්ථක නොවුනහොත් දේවක ඉන්නේ මේ සීගිරි එකට සමුදෙන්නටය. එසේ වුවහොත් මේ ඇත්ත සදාකාලිකවම තමාගේත්

අප්පච්චීගේ හිතේ තියෙන එක හොඳය.

"ඇයි එහෙම හිතුවේ."

"එහෙම හිතෙන නිසා."

"මට ඒක කියන්න ටික දවසක් දෙන්න."

"ඒ කියන්නේ දෙයක් තියෙනවා."

දේවක අසරණව සිනාසුනේය.

"මට දවසක ඇත්තම කියනවා නේ."

"ඔව් සුද්දි. කියනවා."

"මුලින්ම ආවේ සීගිරි එකට. එදා ආවේ ෂොපින් කරන්න නෙමේ නේද? මෙතන බලාගෙන යන්න නේද මි."

දේවක හිස වැනුවේය.

"මම නරක දේකට ආවා නෙමේ සුද්දි."

"කවුද දැන් එහෙම කිව්වේ."

ඔහු සිනාසුණේය.

"මගේ ජීවිතේ පිටිපස්සේ පොඩි කතාවක් තියෙනවා සුද්දි. මම ඒක කියනවා. සමහරවිට සුද්දිට විතරක්. මේ සීගිරි එකත් එක්ක බැඳිච්ච කතාවක් ඒක."

භාවනාගේ දෙපතුල් පවා සීතල වීගෙන ගියේය. 'ඔයා කවුරුහරි විශේෂ කෙනෙක් කියලා මටත් හිතෙනවා. එදත් හිතුණා අදත් හිතෙනවා'

"මේවා මෙහෙම වෙනස්ම විදිහට ගොඩනඟනකොට හොඳ කම්පනීස්වලින් දේවකයියට ඔෆර්ස් එයි."

දේවක සිනාසුණේ වෙනස්ම ලෙසය.

"එහෙම ඔෆර් බාරගනී කියලා

හිතනවද?”

“ඒ ඇයි.”

“ඒකටත් හේතුවක් තියෙනවා”

“ඒකවත් මට කියන්න.”

ඇය ආයාචනා කළාය. දේවකගේ දෑස් තිබුනේ ඇගේ දෑස්වල ඇලීය. ඇලවීය.

“මම මිස්ලත් එක්ක වැඩකරන්න ආසයි.”

‘ඔයා කියන්න ගිය දේ නෙමේ කිව්වේ. ඒත් ඔයාගේ ඇස් මට හැමදේම කියනවා දේවක’ භාවනා දිග සුසුමක් හිමිහිට පපුවට ගනිමින් සිතුවාය.

“අද අප්පච්චිට ඉතින් පාළුත් ඇති පුතා නැතුව.”

භාවනා කීවේ දේවක සමඟ සීගිරි සුපර් මාර්ට් ඉදිරිපසට එමිනි.

එළියට වී කා පාක් එක හදන දෙස බලාගෙන ඉන්නා එක අපූරු වැඩකි.

"මට කියන්නේ පුංචි මහත්තයා කියලා එයා."

ඔහු කීවේය. භාවනා තොල්පට තදකරගත්තාය.

"ඇයි ඉතින් මිස් හිනාවුනේ"

ඔහු ඇසුවේය. භාවනා තදකරගෙන උන් දෙතොල්පට මුදාහැරියාය. ඇගේ සිනහව මේ වගේ වෙහෙසබර රැයක වෙහෙස නිවාලයි.

"මේ ඉතින් පුංචි මහත්තයෙක්යෑ."

'තඩි කොල්ලෙක්නේ.' ඇය එය කිවේ නැත. හිතේ තියාගෙන සිනාසුනා පමණි. ද්වේකද ඇගේ සිනහවට එක්විය.

"එයා ඉතින් එහෙමනේ කියන්නේ

සුද්දි."

ඔහු ඇයට කියන හුරතල් නම බරකර කීවේය.

"අපිටත් ඉතින් සුද්දි කිව්වට ඇති සුදක් නෑනේ නේද?"

ඇය නෙත් බරකරගෙන කීවාය. දේවක ඒ අවසරයෙන් තත්පර කිහිපයක් ඇය දෙස බලාගෙන උන්නේය.

"මටත් මේ වගේ දුවෙක් හිටියනම් මාත් එහෙම කියයි හැබැයි."

ඔහුගේ කතාවට ඇයට දුක සිතුණි.

"හරි ඉතින්. අපිටත් මෙහෙම පුතෙක් හිටියනම් අපිත් එහෙම කියයි ඉතින්."

ඇය මුමුණා කිවේ නැලවෙමිනි. තමා පැමිණ කොල්ලාට වැඩ ටික

වත් කරගන්නට දෙන්නේ නැතැයි භාවනාට සිතුණි. 'මේ වෙලාවේ එයාගේ පපුවේ බිත්තර තැම්බෙනවා ඇති. මේක සති දෙකකින් ඉවරකරන එක ලොකු චැලේන්ජ් එකක්නේ. මං ඇවිත් මෙතන මනමාල කතා කියනවා' ඇයට සිතුණි.

"දාහත්වෙනිදා වෙද්දී අපි මේ වැඩවලින් තුන්කාලක්ම ඉවරකරලා තියෙන්නේ. ඒ නිසා හොඳයි."

"ඇයි දාහත්වෙනිදා දේවක අයියේ."

දේවක ඇය දෙස බලා සිනාසුනේය.

"අක්කගේ වෙදකම් පටන්ගන්නේ එදානේ. වෙද මහත්තයා කිව්වේ. එදාටනේ නැකතක් තියෙනවා කිව්වේ."

භාවනාට ඒ බවක් සිහිවුණේ නැත.

"අනේ මට මතකත් නැතිවුණා. ඇත්තනේ."

"අපි දාසය වෙනිදා කැන්ඩි යන්. සමහරවිට අපිට දාහත දවසම ඉන්න වෙයි."

එදාටත් රෑ පුරාම අවදිව ඉන්නවාද කියා අසන්නට භාවනාට සිතුණි.

"තව සිංදුවක් දෙකක් සුද්දිට පුරුදුවෙලා එන්න වෙයි."

ඔහු කීවේය. ඔහුගේ බැබළෙන දෑස් බොහෝ දේ කීවේය.

"එහෙම කරන්නම්කෝ. අහිංසක රසික ඉල්ලීම්නේ ඉතින්."

ඇය ඇඟිලි පටලවමින් කීවාය.

# 37

සීගිරි සුපර් හී තිබූ ලක්ෂ පහක් පමණ වටිනාකමින් යුතු සුවඳ විලවුන් තොගය ස්ටෝරුවෙන් ඉවත් කෙරුණේ පසුදා පාන්දර හතරකුත් ගණනකටය. දේවක සීගිරියෙන් පිටවූයේ පාන්දර හතරයි දෙකටය. එහෙත් ඔහු පිටවූවා කියා ආරක්ෂක ලොග් පොත් සටහන් වූයේ පහයි තිස් තුන ලෙසටය.

මිහිරංග මේ සුවඳ විලවුන්

තොගය සීගිරි සුපර් වෙතින් පැන්නුවේ එහි ආරක්ෂක නිළධාරීන්ගේද සහය ඇතිවය. මිහිරංග ඒ සඳහා හොඳ පුරුදු කාරයෙක් යොදාගත්තේය. හරියටම උදේ හතරයි පනස් පහට ඒ සුවඳ විලවුන් තොගය ස්ටෝරුවේ පසුපස දොරෙන් පිටකර සුදු හයි එස් වාහනයකට පැටවිණ. මල්ෂා ස්ටෝරුවේ යතුරු දෙකම දේවකට බාරදී තිබුණි. ඒ නිසා කිසිම කෙනෙක් ළඟ ස්ටෝරුවේ යතුරු නැතැයි දැන් මිහිරංගට පවසන්නට පුළුවන. එහෙත් ඒ යතුරු බාරදෙන්නට පෙර මිහිරංග ස්ටෝරුවේ ඩුප්ලිකේට් යතුරක් නාවින්නෙන් කප්පවා ගත්තේය.

සුවඳ විලවුන් තොගය එහෙමම රැගෙන ගියේ මිහිරංගගේ

මිතුරෙකුගේ නිවසකටය. දෙවන මෙහෙයුම ඇරඹෙන්නේ තවත් දින දෙකකින් පසුවය. එහි එක මෙහෙයුමක් වූයේ මේ සුවඳ විලවුන් තොගයෙන් ටිකක් මිහිරංගගේම මිතුරෙකුට අයත් ෆැන්සි ෂොප් එකක අලෙවියට තැබීමය. එහි මේවා අලෙවි කරන බව සීගිරි සුපර් වෙතට ආරංචිය ගෙන එන්නට නියමිතව ඇත්තේ කෝසළටය. එය ඔහු පැමිණ කියන්නේ සුවඳ විලවුන් තොගය නැතිබවට ආරංචිය පැතිර ගොස් ඒ ගැන පරීක්ෂණ ඇරඹුවාට පසුවය.

දෙවෙන මෙහෙයුම කරන්නේ මිහිරංගය. ඒ ද්වෙකට එරෙහිව පොලීසියේ පැමිණිල්ලක් කිරීමෙන්ය. ඒ පොලිස් පරීක්ෂණය ව්‍යාප ලෙස පවත්වන්නට කළ හැකි සියල්ලමත් ඔහු දැන් කතාකරගෙන අවසානය.

ප්‍රතිඵලය ඔහුට සීගිරි සුපර් වෙතින් ඉවත්වෙන්නට සිදුවීමය. කාටවත් ඔහු වෙනුවෙන් කතාකරන්නට නොහැක. ඔහු ඉන්පසු සීගිරි සුපර් හී බඩු පන්නන හොරෙකි. කවුරුවත් හොරු වෙනුවෙන් කතාකරන්නේ නැත. කිසිම ලෙසකින් නැත.

"හරි සර් බඩු ටික බෑවා."

මිහිරංගට පණිවිඩය ලැබිණ.

"කිසිම විට්නස් එකක් තිබ්බෙ නෑ නේද උඹ."

"පිස්සුද සර්."

"හරි. දැන් උඹ ගෙදර පලයන්. උදේ දහයට විතර සීගිරි එකට වැඩට වරෙන්. මොනවත්ම කතාකරන්න එපා. දේවකයට සර් කියාගෙන වැඩ කරපන්"

"ඕකේ සර්. මම එහෙනම් ගියා."

මිහිරංග ෆෝන් එක උඩ දමා ඇල්ලුවේය. 'දැන් යන්න ලෑස්තිවෙයන් දේවක උඹගේ වැඩ අවසානයි. අවසානෙටම අවසානයි. දවස් දෙකකින් මම පත්තුකරනවා' මිහිරංග සිතින් කීවේය. දවස් දෙකකින් සේල්ස් ස්ටොක් එක ගන්නේ තමාය. ඒකට තමාට අයිතියක් ඇත. සුවඳ විලවුන් තොගය ස්ටෝරුවේ නැති බව එළිවෙන්නේ එවිටය. එදාට සීගිරි එක අලුතෙන් ගිනි තියන්නට මිහිරංග සිතාගෙන උන්නේය.

ඔහු එහෙමම කෝසළට ගත්තේය. ඔහුද උන්නේ නිදි නැතිවය.

"වැඩේ හරි කෝසළයා. බඩු එළියේ."

මිහිරංග කීවේය.

"න්නෑ උඹ මාර පොරක්නේ බං."

ඔහු කීවේය. 'උඹ තාම දන්නේ නෑ මේ මිහිරංගගේ හැටි. උඹත් ටිකක් පරිස්සම් වෙලා හිටපන්' මිහිරංග සිතින් කෝසළට කීවේය.

"මේ දවස් ටිකේ සීගිරි එකට දවල්ට දවල්ට වරෙන්. ඔය රවුමක් දාලා පලයන් හොඳද?"

"එළ මචං. මම එන්නම් උඹත් එනවනේ."

"එනවා එනවා. සමහරවිට මේ එන අන්තිම දවස් ටික වෙන්නත් පුළුවන්නේ මෙහෙමම සීගිරි එක වැහෙනවා බං."

මිහිරංග සිතුවේ එහෙමය.

"අපි කළා කියලා කොහෙන්හරි මාට්ටු වෙයිද මචං."

කෝසළ ඇසුවේ බියෙනි.

"එහෙම මාට්ටු වෙන්න ගේම් දෙනවද ඩෝ. උඹ නිකං ළඳ වගේනේ කතාකරන්නේ."

"එහෙම නෑනේ නේද?"

මිහිරංග සිනාසුනේය. පසුව ඔහු දුරකථනය විසන්ධිකර ඇඳට පැන්නේය. පුරා රැයක්ම නිදි වර්ජිතව උන් නිසාදෝ මිහිරංගට ඉක්මනින්ම නින්ද ගියේය.

*** *** *** *** ***

එහෙත් මහා පාන්දර අතුරුගිරියේ නිවසට ආ දේවක එක පැය බාගයක්වත් නිදාගත්තේ නැත. ඔහුට එහෙම නිදිමතක් තිබුනේද නැත. අවශ්‍යනම් මෙසේ රාත්‍රී දෙක

තුනක් වුව නොනිදා ඔහුට ඉන්නට පුළුවන. නුවර පෙරහැර සමයේ ජංගම දුරකථන ජාලයක අලෙවි සම්බන්ධතා මැදිරියක් බාරව උන්නේ දේවකය. ඔහු පෙරහැර දවස් ටිකේම උන්නේ නොනිදාය. මධ්‍යම පළාතේ වාර්තාගත දුරකථන සම්බන්ධතා අලෙවිය ඔහු කළේ ඒ දවස් කිහිපයේය. දේවක නිදාගත්තේ මහනුවර මහා රන්දෝලි පෙරහැරත් නිමා වූ පසුය. එදා ජීවන්ටද පුදුම සිතුණි.

සමහර කොල්ලෝ උපතින්ම එහෙමය.

දේවක නෑවේ පාන්දර හයටය. ඒ වෙද්දී අතුරුගිරිය වෙල් යායට යන්තමට උදා හිරු පතිතවී තිබුණි. ටික වෙලාවක් ඒ දෙස බලාගෙන

උන් දේවක පුංචි ළිඳෙන් සීතල වතුර බාල්දියක් ගෙන එහෙමම හිසට දමාගත්තේය. මේ වතුර ටිකේ හාස්කම් බලයක් ඇති බව දේවක දැනගෙන උන්නේය. පුරා රැයක නිදිබරබව යවන්නට එයට හැක.

පෙරදා රැයේ භාවනා ඔහුත් සමඟ රාත්‍රී දහය වෙනතුරු උන්නාය. එය ජීවිතයේ ගතකළ රසබරම රැ යවල්වලින් එකක් විය. කෙල්ල පුංචි සඳක් මෙන් දේවක වටේ උන්නාය. තමාගේ වටේ රැස් වළල්ලක් ඇත්තාක් වැනි යැයි ඔහුට සිතුණි.

රෑ ආප්ප ගෙනවිත් දෙන්නාම කෑවේ එකටය.

"මං ගියාම ඉතින් දේවකයියා පව්. තනියම නයිට් එක අඳිනවා."

ඇය කීවේ ඇය ආසම කළ

ආප්ප වාටි ලුණු මිරිස් සමඟ කන අතරතුරය. දේවක කෑවේ ඇය කා ඉතුරු කළ ආප්ප මදය. 'එහෙම ලේසියි' ඇයට නිකමට සිතුණි.

"ඒක ගාණක් නෑ සුද්දි. මට මේක පුරුදුයි."

"හෙටත් මෙහෙමම ඉන්නද කල්පනාව."

"මේ දවස් ටිකේම. ඊට පස්සේ නිදාගන්න පුළුවන්නේ."

ඔහු කීවේය.

"මමත් ෆුල් නයිට් එකක් දාන්න එන්නම්කෝ."

මොකක්ද හේතුවක් නිසා ඔහුට සිනාගියේය.

"ඇයි හිනාවුණේ."

ඇය ආප්ප වාටියක් කමින් ඇසුවාය.

"නෑ නිකං හිනාගියේ."

"නිකං හිනායන්නේ නෑනේ."

"ඒක ඉතින් පුරුදුවෙලා ඉන්න එක හොඳයි."

ඔහු කීවේය.

"ඇයි අර."

"නෑ ඉතින් මැරිකරපු කාලෙක මහත්තයා එක්ක ෆුල් නයිට් අඳින්න එපැයි."

භාවනා යටිතොල හපාගෙන බැලුවාය. 'ඒකට ෆුල් නයිට්ම අඳින්න ඕනයෑ' ඇයට කියවෙන්නට ගියේ ඒකය.

"ඇයි ෆුල් නයිටම."

"එහෙම වෙයි ඉතින්."

"මමනම් අහලා තියෙන්නේ මේ ඔය මොකක්ද එකක් කළාට පස්සේ මහත්තයා අනිත් පැත්ත හැරිලා

දොයි කියලා. එහෙම නෝනා එක්ක නයිට් එකම අදින මහත්තයලා දැන් නෑ."

ඇය එහෙමම කීවාය. දේවක දෙනෙත් එසෙව්වේය. 'මොනවද අනේ මාත් කියන්නේ.' පසුව ඇයම සිතුවාය.

"බැන්ඳාම බලන්නකෝ සුද්දි."

"එහෙමද හිතන් ඉන්නේ දේවකයියා. අා නෝනා එක්ක නයිට් එකම අඳින්නද?"

දේවක කිසිවක් කීවේ නැත. ඔහුගේ දෑස්වල වූයේ මනමාල පාටකි.

"අම්මා බලාගෙන ඇති. ගොඩක් රෑ වෙනකල් ඉන්න එපා."

ඔහු පසුව මෘදුව කීවේය.

"නයිට් එකක් ඇද්දාම අනිත්

දවසෙම නිදාගන්න වෙනවා පුරුදු නැති වුණාම. එහෙමත් වැඩක් නෑනේ."

"මං එහෙම තමයි. ෆිල්ම් එකක් බැලුවා ළඟදී එක වෙනකල්. නිදාග න්නකොට දෙකයි. අනිත් දවසේ නැඟිට්ටෙ දවල් එකොළහට."

භාවනා කීවාය.

"ඒ නැඟිටලත් තෝන්තුවාව වගේ නේ."

"ම්. ඉතින් දේවකයියටත් එහෙම වෙයිනේ."

"මට පුරුදුයි."

"එහෙනං කෙල්ලට නිදාගන්න දෙන එකක් නෑ."

දේවකගේ මුවේ තිබූ ආප්ප කටක් ඔහුට ඉස්පොල්ලේ යන්නට ගියේය. 'හිනාවෙන්න දෙයක් කිව්වයෑ

මෝඩයෝ.'

"ඇයි හිනාවෙන්නේ. මම කුණුහරුපයක් කිව්වයෑ."

"නෑ නෑ. මට හිතිච්ච දෙයක් නිසා හිනාගියේ."

"මොකක්ද?"

ඇය නැලවෙමින් ඇසුවාය.

"එක නෝනා කෙනෙන් එහෙම කිව්වලු."

"කොහොමද?"

"රෑ ඉතින් මේ මහත්තයා වැඩේට සෙට් වෙලා."

දේවක රහසින් මෙන් කීවේය. භාවනාගේ දෑස් විශාල විය.

"මොන වැඩේටද?"

ඇය ඇසුවාය.

"සුද්දි ටියුබ් ලයිට්නේ."

ඇය තොල්පට තදකරගත්තාය.

"ආ ඒක"

"ඔව් ඒක තමා."

ඔහුද කීවේය. ඇය සිනාව තදකරගෙන උන්නාය. 'ඒකට කියන්නේ වැඩේ කියලද'

"ඉතින්."

"ඉතින් නෝනා නිදිලු. දැන් මහත්තයාගේ ට්‍රයි එක කෙල්ලව ඇහැරවගන්න එකලු."

"හ්හා. එයා නිදි."

"නිදි කියන්නේ හොඳටම නිදි."

"ඉතින් පස්සේ."

"පස්සේ ඉතින් දන්නවනේ මේ."

"මං දන්නේ නෑ."

ඇය කීවාය. දේවක රැව්වේය.

"හරි හරි ඉතින්."

"අන්තිමට නෝනා චස් ගාලා කියනවලු. වද දෙනවනේ සුද්දා. නිදාගන්නවත් දෙන්නේ නෑනේ. ආ ඔන්න කරගන්න දෙයක් කරගන්ඩ. මං නිදි. එහෙම කියලා නයිට්ටිය උස්සලා ආයෙත් නිදාගත්තලු."

දේවක මුව තදකරගෙන කිවේය.

"පලයන් මෝඩයා. කුණුහරුප කියන කැත."

ඇය සිනාව නවත්වාගත නොහැකිව ඔහුට ආප්පයකින් ගසමින් කීවාය.

මේ උදෑසනේ දේවකට එය සිහිවී යළිත් සිනාවක් ගියේය. ඒවා අසා ඇය තමා ගැන මොනවා සිතුවාද කියා දේවක සිතුවේය.

"ඔහොම හිටියට ඔයත් ආසයි ඒවා අහන්න."

ඇයගේ ඇස් ඔහුට සිහිවිය.

රෑ ඇය යන්නට හදා වාහනයට ගොඩවූ පසුවත් බලාගෙන උන් අයුරුද දේවකට සිහිවිය. 'අපි දෙන්නා අතර මොකක්හරි ඇතිනොවුනොත් තමා පුදුම සුද්දි'

"මොකද පුංචි මහත්තයෝ ළිඳ දිහා බලාගෙන හිනාවෙන්නේ. ටෙනිසන් කුරේවත් ළිඳ ඇතුලෙද?"

ජීවන් සරමත් කැසපට ගහගෙන ළිඳ ළඟට ආවේ එහෙම කියාගෙ නමය. මේ දවස්වල කොල්ලාගේ මුහුණේ මතුවෙන අලුත් පෙම්වත් බව ජීවන් බලාගෙනය. 'ඔයාගේ පොඩි දූත් එක්ක කතාවක් නොගියොත් තමා පුදුම මිලින්ද' දේවක සිතින් කිව්වේ ඔහුගේ මස්සිනාටය.

දේවක ලැජ්ජාවෙන් බාල්දිය ළිඳට

දැම්මේය.

"එහෙම නෑ අප්පච්චි."

දේවක ලැජ්ජාවෙන් කීවේය.

"මේ පාන්දරම නාන්නේ. පැයක් දෙකක් ඇලවෙලා ඉඳලම නාගන්න තිබ්බනේ."

"එහෙම බෑ අප්පච්චි. අට වෙද්දී මම කට්ටියට එන්න කියලා තියෙන්නේ. නිදාගෙන බෑ."

නිදාගත්තොත් යළිත් ඇහැරෙද්දී අමාරුය. දේවක එය අත්දැකීමෙන් දනී.

"කොහොමද වැඩ පුංචි මහත්තයෝ."

"තිතට යනවා අප්පච්චී. සීගිරි එක මම පෙරළලා තියෙන්නේ. දැන් ආවොත් සීයටත් උණ ගන්නවා."

ඔහු කීවේය.

"එයාට ඔයාව ගොඩක් විශ්වාසයි. එහෙම නැත්නම් ඔය වගේ කරන්න ඉඩදෙන්නේ නෑ."

"මාත් ඒක දන්නවා අප්පච්චි."

"මං හේරත්ට කිව්වා කැකුළු බත් ටිකක්ම හදන්න කියලා. සැමන් තෙල් දාලා."

කොල්ලා එහෙම කන්නට ආසය. ආසම කළේ සැමන් තෙල් දමා පරිප්පු තෙම්පරාදුත් සමඟ කන්නටය. ජීවන් හේරත්ට කිව්වේ බිත්තරයකුත් තම්බා තියන ලෙසය.

"මං මේක කොහොමහරි කරනවා අප්පච්චී."

දේවක කීවේය. ජීවන් සිනාසුනේය.

"ඔයාට පුළුවන් එයාලව පුදුම කරවන්න. බයවෙන්න එපා."

ජීවන් හැමදාම මේක කීවේය.

"ඒක කරන්න බැරිවුනොත් අප්පච්චී මම සීගිරි එකේ ඉන්නේ නෑ. මට ඒ හාස්කම කරන්න බැරිනම් මම යනවා."

දේවක කීවේය. ජීවන් හිස වැනුවේය. එහෙත් කොල්ලා එය නියත වශයෙන්ම කරන බව ඔහු දැනගෙන උන්නේය.

"මම ඊයේ කළුතර සයිට් එකකට ගියා යන ගමන් කළුතර බෝධියටත් බාරයක් වුණා."

ජීවන් කීවේය. දේවක අප්පච්චී දෙස බැලුවේ කෘතවේදීවය.

"අපිත් අප්පච්චි හිමිහිට ගේ කෑල්ලක් හදන්න ගමු නේ."

දේවක කීවේය.

"මාත් ඒකමයි හිතන්නේ. ඇයි

ඔයාට හිතෙනවද කොළඹම ඉන්න වෙයි කියලා."

කොල්ලා හිස කැසුවේය.

"නෑ මේ. එහෙමම කියලා නෑ."

"හරි හරි. මං කොහොමත් ඉඩමක් බලන්න ඉන්නේ. අපි දෙන්නත් එක්ක වෙලාවක යන්කෝ රවුමක්. මට ලෝන් එකක් ගන්නත් පුළුවන් දැන්. එහෙම කරලා අපි කැන්ඩි ගේ විකුණමු. ම්. ඒකෙන් ගේ හදන්න ගන්න පුළුවන්."

"අප්පච්චි කැමතිනම් විතරක්."

"ඔයානේ පුතේ කැමතිවෙන්න ඕන. මට කොහෙත් එකයි."

දේවක බලාගෙන උන්නේය.

# 38

භාවනා ඇඳටම වී උන්නේ අද සීගිරි එකට යන්නේ දවල් වී නිසාය. තාරකා උදෙන්ම එනවා කිව්වාට එන්නේ නමයට දහයට බව භාවනා දනී. 'එහෙම බස් එකෙන් බැහැලා එනවා වගේ ෆ්ලයිට් එකකින් බැහැලා එන්න බෑනේ' ඇය සිතුවාය.

පොඩි අක්කාත් සමඟම වාඩිවී කිරිබත් කටක් කන්නට ඇයට ආසය. අද රෑ ඇය ඉන්නා නිසා හොඳය.

රෑට ඇඳේ තුරුල් වී කියවන්නට පුළුවන.

පෙරදා රැයේ වූ දේවල් එකින් එක භාවනා සිහිකළාය. රෑ එද්දී ඔහු පාරටම පැමිණ බලාගෙන උන් අයුරු භාවනාට සිහිවිය. 'ඔයා වගේ කෙනෙක් මේ සීගිරි එකට ආවා කියලා හිතද්දීත් පුදුමයි දේවකයියේ.' ඒ පුදුමය තවමත් මේ හිතේ ඇත.

ඔහු පාන්දර පිටත්වෙද්දී එස් එම් එස් එකක් එවා ඇති.

"සුද්දි මම යනවා. උදේ එනවා."

ඇයගේ දෑස්වල තුනී තෙතමනයක් තිබුණි. 'පව් යද්දී පාන්දර හතරයි. දැන් ගිහින් ආයෙත් එනවනේ. කොහොමද එහෙම දුක් විඳින්නේ' ඔහු කියන්නේ එය දුකක් නොවෙන බවය. විඳින දුකත් දුකක් ලෙස

නොකියා විඳින ඔහු පුදුමයකි.

භාවනා ඔහුට නොගත්තේ ගෙදර ගිහින් ටිකක් ඇලවී ඇතැයි සිතාගෙනය. උදේ හයයි තිස් පහට දේවක ඇයට ගත්තේය.

"මං හිතුවා නිදි ඇති කියලා. ඒකයි ගත්තේ නැත්තේ. යනකොට හතරයිනේ දේවකයියේ."

දේවක සිනාසුනේය.

"ඇවිත් නෑවා සුද්දි. දැන් ෆ්‍රෙෂ්."

"මට එකොළහට නිදාගෙන තාම නිදිමතයි."

ඇය ඇත්තම කීවාය.

"උදේ ටිකක් ඉඳලනේ එන්නේ නේද පොඩි අක්කා එනවනේ"

"ම්. එයා අටට ලෑන්ඩ් කරන්නේ. ටිකක් එයා එක්ක ඉඳලා එන්නම්."

එහෙම කියවෙන්නේ ඇයි.?

"මොනවාහරි කාලාම එන්න හොඳේ."

'ඇවිත් කන්න මාත් නෑනේ උදේ' ඇයට කියන්නට ඕනා වියය.

"මේ හේරත් මාමා කැකුළු බත් හදනවා. පොල් සම්බෝලයි පරිප්පුයි සැමන් තෙල්දාලයි."

ඇය කෙළ ගිල්ලාය.

"චූටි බත් එකක් බැඳගෙන එන්නද? කෙහෙල් කොළේක. ආවාම කන්න."

ඔහු කරුණාවෙන් ඇසුවේය. බිත්තරයකුත් තියා එහෙම බත් එකක් බැන්ඳ විට දවල් වී කද්දී රසය. ඔහුගේ කතාවට භාවනාගේ දෑස් තෙත්විය.

"මාත් මේ කිරිබත් ගේන්ඩද කියලා අහන්න හිටියේ. පොඩි අක්ක එන

නිසා අම්මා කිරිබත් හදනවා කිව්වා. චිකන් එක්ක."

දුරකථන රැහැන් පවා උණු වී ගිය සෙයක් ඔහුට දැනුණි.

"කන්නනම් ආසයි එහෙම."

ඇය හුස්මක් පපුවට ගත්තාය.

"මං ඒක බෙදන් එන්නම්. දේවකයියා මට සැමනුයි බතුයි ගේන්න."

ඇය කීවාය. දුරකථනය තබා භාවනා එහෙමම යළිත් කොට්ටයට බරවුවාය. 'පුංචි ආදර කතාවක් පටන් ගන්න ආසයි දේවකයියේ.' ඇස් පියාගෙන ඇය සිතින් කීවාය.

තාරකා නිවසට ආවේ එමිරේට්ස් ගුවන් සේවයේ ගුවන් සේවිකාවන් අඳින නිළ ඇඳුම පිටින්මය. ඒක පෙන්වන්නට ඇයට ආසය. මේ ඇගේ

සිහිනයයි. එය නිවසේ හැමෝම දැනගෙන උන්නෝය. කවුරුවත් ඇගේ ඒ සිහිනයට කිසිවක් කීවේ නැත.

"අනේ මගේ පොඩි අක්කගේ ලස්සන."

භාවනා තාරකාව සාලයේදීම වැළඳගත්තේ හරි ආදරයෙනි. එය පුදුමාකාර වැළඳගැනීමක් විය. මොකක්ද හේතුවක් නිසා භාවනාගේ දෙනෙත්ද තෙත්විය. පොඩි අක්කා අන් කවරදාටත් වඩා අද ලස්සනයි කියා භාවනාට සිතුණි. එය හරි ලෝබ හිතෙනා ලස්සනකි. ලා බටර් පැහැයට හුරු එමිරේට්ස් ගුවන් සේවයේ නිළ ඇඳුම තාරකාට ගෙනවිත් තිබුනේ චාම් අහිංසක ලස්සනකි.

"අනේ සුදූ උඹ ඉතින් අඬනවනේ

පැටියෝ.”

තාරකා කීවාය. භාවනා සිනාබරව හිස වැනුවාය.

“ඉතින් මට ආසයිනේ.”

තාරකා කෙල්ලගේ මුහුණම අතගෑවාය. තම සොයුරියගේ මුහුණට අලුතින් වැටී ඇති පෙම්වත් පාට තාරකාව පුදුම කළේය. කෙල්ලගේ ජීවිතයට මොකක් හෝ වෙමින් පවතින බව ඇය ඉවෙන් මෙන් තේරුම් ගත්තාය. ඒක ඇසිය යුත්තේ මෙහෙම නොවේ. රෑක ඇඳේ පෙරලී බදාගෙනය. කෙල්ලත් එහෙම වෙලාවට නොකියන දේවල් පවා කියයි.

“අම්මා පොඩි අක්කා ආවා.”

භාවනා කෑ ගැසුවාය. ඇයගේ කෑ ගැසීමට ඉඳුනිල් පමණක් නොව

මිලින්දද දුවගෙන ආවේය. තාරකාව දැක අම්මාගේත් තාත්තාගේත් ඇස්වල මතුවූ ආසාව භාවනාද දැක්කාය. 'එයාලටත් හරි ආසයි.' ඇය සිතුවාය.

"අදනේ ඔයාගේ ලස්සන දැක්කේ."

මිලින්ද ආසාවෙන් කීවේය. තාරකා සිනාසුනේ කවරදාකවත් නැති තරම් ලැජ්ජාවකිනි.

"දැන් අම්මටයි මටයි හරි ආසයි ඔයා යන ෆ්ලයිට් එකක යන්න."

මිලින්ද කීවේය. ඉඳුනිල් තෙත්ව ගිය දෑස් පිසදාගත්තාය. තාරකා අම්මාව වැළඳගත්තේ ආදරයෙනි.

"මම අම්මවයි තාත්තවයි අක්කවයි කෙල්ලවයි දවසක එක්කගෙන යනවා. බලන්නකෝ."

ඇය කීවාය.

"රෑම ෆ්ලයිට් එකේ නේද?"

"ඔව් තාත්තා. එහෙන් එයාපෝට් ආවේ පාන්දර එකටමේ ඒ ආපු ගමන්."

එක දුවෙක්ට මෙහෙම යන්න දුන්න එකත් හොඳයි කියා අද මිලින්දට සිතුණි. ඇගේ ජීවිතය ඇය තෝරාගත්තාය.

"වොෂ් එකක් දාගෙන කිරිබත් කටක් කාලම නිදාගන්න."

අම්මා කීවාය.

"මං ඔක්කොටම ප්‍රසන්ට් ගෙනාවා. සීයට කතාකරලා එන්නම් අම්මා."

තාරකා රඹුක්වැල්ල මහතාගේ කාමරයට ගියේ කෙල්ලවත් ඇදගෙ නමය. රඹුක්වැල්ල මහතා උන්නේ ඇඳගනිමිනි.

"සීයේ."

රඹුක්වැල්ල මහතා තාරකා දෙස බැලුවේය.

"අනේ මගේ කෙල්ලනේ. අඳුනගන්නත් බෑ."

තාරකා ගොස් සීයාව වැළඳගත්තාය. ඔහු ඇයගේ හිස අතගෑවේ භාවනා දෙසද බලාගෙනය.

"මං කාලයක් ඔයා ගැන හරි බයේ හිටියේ. අද ඒ බය නැතිවුණා."

රඹුක්වැල්ල මහතා අවංකව කීවේය.

"මං දන්නවා සීයා. දැන් ලයිෆ් එක මෙහෙම යනවා. එහෙම අවුල්වෙන්නේ නෑ."

තාරකා කීවාය. ඔහු තාරකාගේ හිස අතගෑවේය.

"අපි දෙන්නා දවසක අක්කා ඉන්න ෆ්ලයිට් එකේ යන් නේද මැණික."

රඹුක්වැල්ල මහතා කීවේ භාවනා දෙසද බලාය.

"මං ඔයාලව එක්කගෙන යනවා සීයා.හරි ආසයි එහෙම."

තාරකා කීවාය.

"ඔයාව බලන්නම එනවා. ඉස්සෙල්ලා සුද්දිව එක්කගෙන යන්න. එයා ගිහින්ම නෑනේ."

භාවනා දෑස් පුංචි කළාය. දවසක එහෙම යන්නත් ආසය.

"මං බබාට කියලා තියෙන්නේ සීයා. තනියම යනකොට පාළු නිසා මම මේ කිව්වේ දවසක කොල්ලා එක්කම යන් කියලා. එහෙමනේ ලස්සන සීයා."

රඹුක්වැල්ල මහතා සිනාසී හිස වැනුවේය.

"එහෙම තමා ලස්සන. තාම මේ

කොල්ලෙක් ගැන ආරංචියක් නැති එකනේ වැඩේ පුතේ.”

“ඔහොම යනකොට කතාවක් යයි සීයා.ඩෝන්ට් වොරී.”

රඹුක්වැල්ල මහතා ඇය දෙස බලද්දි කෙල්ල ලැජ්ජාවෙන් බිම බලාගත්තාය. ‘කතාවක් නොගියොත් තමා දැන් පුදුම’ භාවනා සිතුවාය. මොකක්ද හේතුවක් නිසා මේ කතා මෙහෙම යද්දී ඇයට සිහිවෙන්නේ දේවකය.

“අක්කා ඇහැරලානේ. යන්.”

භාවනාවද ඇදගෙන නේත්‍රාගේ කාමරයට යන්නට ගියාය. මඟදී ඇය කෙල්ලගේ අතක් තදින් අල්ලාගත්තාය.

“බබා”

“ම්”

"මං කොල්ලට දෙන්න ප්‍රසන්ට් එකක් අරන් ආවා හොඳද?උඹ කිව්වේ."

ඇය කීවාය.

"එයා මේ අනේ එහෙම. මං නිකං කිව්වේ."

භාවනා තැටමුවාය.

"මොකක්ද සුදූ. ඕකනේ උඹ එක්ක බැරි. අවංක වෙයන්කෝ කෙල්ලේ."

භාවනා සිනාසුනාය.

"මටත් බලන්නෝන මේකව. මං බලලා කමෙන්ට්ස් කියන්නම් හොඳද?"

ඇය කීවාය.

"ම්."

එහෙම අසා දැනගන්න ඇයටත් ආසය. 'චීත් එහෙම ඔයා එක්ක දෙයක් නෑත් එක්කනේ අනේ.' ඇය

සිතින් කීවාය. එහෙම නැතැයි කියන්නේ කෙසේද??

තාරකාත් භාවනාත් යද්දි නේත්‍රා උන්නේ රෝද පුටුවට වී ඇගේ අල්මාරිය ඇරගෙන අමාරුවෙන් ඇඳුමක් ගන්නට උත්සහා ගනිමිනි. එය දැක තාරකාගේත් භාවනාගේත් දෙදෙනාගේම දෑස් තෙත්විය. තාරකා ගොස් අක්කාව දැඩිව වැළඳගත්තාය.

“අනේ පිස්සී. ඔයා ආවද පැටියෝ.”

නේත්‍රා ආසාවෙන් තාරකාව තුරුල්කරගත්තාය.

“ම්. ආවා”

“කෙල්ලගේ ලස්සන බලන්නකෝ සුද්දි. මේ.”

නේත්‍රාගේ ඇස්වල කඳුළු විය.

“මාව දැක්කහම ඔයත් අඬනවා.

මේකිත් ඇඬුවා.”

තාරකා කීවාය.

“ඉතින් ඇඬෙනවා තමා සුදූ”

තාරකා නේත්‍රාගේ රෝද පුටුව ළඟ දණ ඔබාගෙන ඇගේ දෙපාවලට හිස තැබුවාය. භාවනා එදෙස බලාගෙන උන්නේ භාවනා දෙසද බලාගෙනය.

“කවදද බබා අක්කගේ ට්‍රීට්මන්ට් පටන් ගන්නේ.”

“මේ දාහත අපි යනවා පොඩි අක්කේ නුවර.”

“අපිට දැන් හොඳ කොල්ලෙකුත් ඉන්නවනේ නේද අක්කා.”

තාරකා කීවාය. කෙල්ල හැම විස්තරයක්ම තාරකාට කියා ඇත.

“ම්. හොඳ කොල්ලෙක් ඉන්නවා තමයි”

නේත්‍රා කීවේ භාවනා දෙසද

බලාගෙනය. භාවනා දෙනෙත් බර කළාය.

"අක්කා"

"ම්"

"ස්ටෝරියක් යයිද?"

තාරකා කෙළින්ම ඇසුවාය. ඇය එහෙමය.

"ඒක අහන්නෝන සුද්දිගෙන් තමයි ඉතින්"

ඇය කීවාය.

"මේ දවස් දෙක තුනට මේකි ලස්සනනම් වෙලා"

"ඒකනේ"

"කෙල්ලට ලැප්ප හිතිලා."

නේත්‍රා කීවාය.

"අක්කා ඇඳුමක්ද බැලුවේ"

භාවනා අල්මාරිය ළඟට විත්

ඇසුවාය.

"ඔව් සුද්දියේ. කැෂුවල් ඇඳුමක්. සීගිරි එක පැත්තට යන්නෝනනේ. කොල්ලා රෑ තනියම වැඩනේ"

"මී. පාන්දර හතරට ගෙදර ගියේ. දැන් ඔය ආයෙත් එනවා කිව්වා."

"පච්."

ඇය කීවාය. භාවනා අක්කාට අඳින්නට ඇඳුමක් තෝරා දුන්නාය.

"වොෂ් එකක් දාගෙන එන්න. අම්මා කිරිබත් හදනවා."

"රයිට් අවේ. විස්තර ගොඩක් තියෙනවා. මම ඇවිත් කියන්නම්."

තාරකා ගියේ එහෙම කියාය.

# 39

තාරකා දේවක වෙනුවෙන්ම ගත් ටී ෂර්ට්ස් දෙකත් පිරිමි සුවඳ විලවුන් බෝතලයත් රහසින්ම භාවනාට දුන්නාය.

"ලස්සනට ටී ෂර්ට්ස් දෙකක්නේ පොඩි අක්කේ"

භාවනා එය අතට ගත්තේ ලෝබකමිනි.

"ම්. ඩුබායි සිටි සෙන්ටර් එකෙන් ගත්තේ. කොල්ලට ඇතිවෙයි නේද?"

භාවනා ලැජ්ජාවෙන් සිනාසුනාය.

"ඇති වෙයි"

ඇය අමාරුවෙන් කීවාය.

"මී. මේ පර්ෆියුම් එක ගත්තේ නම් ඩියුටි ෆ්‍රී එකෙන්. හරි සුවඳයි."

"මම මේ ටික දෙන්නම් අපේ පොඩි අක්කා දුන්නා කියලා. හා."

"මී. උඹ කියපන් උඹයි කිව්වේ කියලා ගේන්න"

"අනේ"

භාවනා එයද සීගිරි එකට රැගෙන යන්නට ගත්තාය. දැන් උදේ දහයත් පසුවී ඇත. මේ පැය කිහිපයට ඔහුව නොදැක ඇස්වලට ඇතිවූ අලුත් දැවිල්ල කුමක්ද කියා භාවනාම දන්නේ නැත. ඇය ඔහුට කන්නට කිරිබත් පාර්සලයක්ද ගත්තාය. කෙල්ල කිරිබත් පාර්සලයක්

බැඳලා ඉල්ලද්දී ඉඳුනිල් ඒ කාටද කියා ඇසුවේ නැත. ඒත් කෙල්ල ඇතිවෙන්න කිරිබත් උදේ කෑව බව ඇය හොඳින්ම දැක්කාය. මේ ඉල්ලන්නේ කාට හෝ ගිහින් දෙන්නටය. එහෙම දෙන්න කෙනෙක් මේ තාක් සීගිරි එකේ උන්නේ නැති බව ඉඳුනිල් හොඳින්ම දැනගෙන උන්නාය. ඇයට සිහිවුනේ එදා නිවසට ආ තරුණියාවය. මොකක්දෝ හේතුවක් නිසා ඉඳුනිල්ගේ මුහුණට සිනාවක් ආවාය.

# 40

එක රැයක් තුළ නිමාකර ඇති වැඩ කන්දරාව දකිද්දී භාවනාට පුදුමත් සිතුණි. මේ සියල්ල කළේ ඔහුගේ ඇති කැපවීම නිසාය. ඔහු පෙනෙන්නට උන්නේ නැත. භාවනා සීගිරි වැඩබිම පුරා වට දෙක තුනක්ම ගියාය. ඒත් ඔහු පෙනෙන්නට නැත.

"කොහෙද පිස්සෝ ගියේ."

භාවනා සිතින් දේවකට බැන්නාය.

ඇය සීගිරි එක ඉදිරිපිට වාහන පාක් එක හදන තැනට පැමිණි ඔහුට

ඇමතුමක් ගත්තාය. 'ඔක්කොම වැඩ නවත්තලා කොල්ලා මං එනකොට පිළිගන්න ඉන්නයෑ.මටත් පිස්සු' ඇය පසුව තමාටම බැණගත්තාය.

"දේවකයියේ කොහෙද?"

ඇය ඇසුවාය.

"මං සුද්දි මේ ඇක්ෂන් කිචන් එක යට."

"මං බැලුවනේ."

"මං මේ කිචන් ටේබල් එක යට. ගෑස් ලයින් එක චෙක් කරනවා"

භාවනා සිනාසුනාය. ඇය එහෙමම ආවේ ඔහු සීගිරි එකේ අලුතින් නිමවන ඇක්ෂන් කිචන් එක වෙතය. සීගිරි එකට අලුතින් එකතුවෙන මේ විශේෂාංගය බොහෝ සේ ජනප්‍රිය වෙන බව භාවනාටද දැනෙයි. ඔහු සිතාගෙන ඉන්නේ එහි පුදුමාකාර

දේවල් හදන්නටය.

ඩෙනිම් කළිසමට සුදු ටී ෂර්ට් එකක් ඇඳගෙන උන් දේවක ගෑස් ලයින් පරීක්ෂාකර බලා නැඟිට්ටේය. ඔහු නැඟිට්ටේ එතනට ආ භාවනගේ දෙපාවලට සමාන්තරවය. කොල්ලා හරි ලස්සනට ඇයගේ දෙපා දැක්කේය. අද ඇය ඇඳගෙන විත් ඇත්තේ අමු කහ පැහැගත් ගවුමකි. ආයෙත් ගෑස් ලයින් එක බලන්නට යටට යන්නට දේවකට ආසාවක් ආවේය. ඔහු ඒ හැඟීම් සිනාබරව මැඬගත්තේය.

"මං මෙතනින් ගියානේ."

"මම ඇළින්නේ නෑනේ මිස්. අද හරි වෙනස්නේ."

ඔහු කීවේය. අගේ දෙනෙත් පොඩි තොරණක ලයිට් වැලක් වාගේය.

"දැන් ඇති."

ඇය කීවාය. දේවක සිනාසුනේය.

"පොඩි අක්කා ආවද?"

"මී. එමිරේට්ස් යුනිෆෝම් පිටින් ආවේ. හරිම ලස්සනයි. මේ."

භාවනා පෙන්වූයේ ඇයගේ ජංගම දුරකථනයෙන් උදේ ගත් ඇගේත් තාරකාගේත් පින්තූරය. දේවක බලාගෙනම උන්නේය. 'ඔයා බලන් ඉන්නේ පොඩි අක්කා දිහා නෙමේනේ මෝඩයෝ.'

"හරිම ස්වීට්."

"එයා කොහොමත් ස්වීට් තමයි."

භාවනා කීවාය.

"නෑ මේ ස්වීට් කිව්වේ පොඩි අක්කා නෙමේ. මිස්."

දේවක කීවේය. භාවනා දෙනෙත් බරකළාය. 'මංද' ඇය අසන්නේ

සිතෙන්ය.

"පොඩි අක්කට මේ මං කිව්වා දේවකයියා ගැනත්. එයා මේ අයියටත් පොඩි ප්‍රසන්ට් එකක් ගෙනත්. අපිට ගන්න ගමන්."

භාවනා ඇය අත තිබූ එමිරේට්ස් බෑගය ඔහුට පෑවාය. දේවකට පුදුමය. 'ඔයා ගේන්න කියලා ඇති පොඩි අක්කට. පව්' දේවක සිතුවේය.

"අනේ මේ මට."

"මි.ටී ෂර්ට්ස් දෙකක් ගෙනත් හරිම ලස්සනයි.තව පර්ෆියුම් එකක්."

ඇය කීවාය. දේවක බෑගය ඇතුළට අත දමා බැලුවේය. ඔහුගේ දෑස්වල මොකක්ද කැවුනේය.

"මිස්"

"දේවකයියේ."

"එහෙම ඉතින් කාට ගේන්න

කියලද කිව්වේ. පොඩි අක්කා බලනවනේ.”

ඇය සිනාසුනාය.

“මං කොහොමහරි කිව්වනේ. හොඳද?”

“මරු ටී ෂර්ට්ස් දෙක. නුවර යනකොට අඳින්න තියාගන්නම්.”

“ම්. ඒක හොඳයි තමා.”

“ඉතින් පොඩි අක්කටත් තැන්කියු කියන්නෝනනේ.”

භාවනා තොල්පට හැදුවාය. පසුව ඇය දුරකථනය අතට ගෙන තාරකාගේ අංකය ඉන් ගත්තාය. ද්වේකට පුදුමය. ‘මේ කෙල්ල කෝල් කරනවනේ දැන්මම’

“පොඩි අක්කා. ඔයා දොයිද? ආ නෑ මේ.”

“කියපන් බබා”

“නෑ මේ අර ටී ෂර්ට්ස් ගෙනාවේ. මේ දේවකයියට.”

“කොල්ලා මරු කිව්වා නේද බබා.”

“ම්. මේ දැන් ඉන්නවා. කතාකරන්න ඕනලු අක්කට.”

භාවනා ජංගම දුරකථනට දේවකට පෑවේය. ඔහු එය ගත්තේ භාවනා දෙස බලා සිනාසීය.

“මිස් මම දේවක”

ඔහු ගෞරවයෙන් කීවේය. භාවනාට දුකත් සිතුණි.

“අනේ අයියේ. එහෙම ඔට්ටු නෑ බං.මම තාරකා. තාරු කියන්නකෝ. ප්‍රසන්ට් එක හොඳද ඉතින් අයියේ”

“හරිම ලස්සනයි. භාවනා මිස් මේ දැන් ගෙනත් දුන්නේ.”

“කෙල්ල තමා කිව්වේ මට ගේන්න

කියලා. දේවකයියට දෙන්න."

මොනවා කියන්නද කියා දේවකට තේරෙන්නේ නැත. කෙල්ලත් ඔහුගේ කට දෙස බලාගෙන ඉඳියි.

"එයා එහෙමනේ නේද?"

"මී. එයාට ඔයාව ගොඩක් ස්පෙෂල්. කවදාවත් අපේ සුද්දි එහෙම කියලා නෑ. මේ ෆස්ට් ටයිම්"

තාරකා කීවාය.

"මං දන්නවා."

"ඔයාව දකින්න ආසයි. මම එනවා සීගිරි එකට."

"ආයෙත් ගොඩක් තැන්කියු නංගී"

ඔහු කීවේය.

"හරි අයියේ. අපේ බබාට දෙන්නකෝ ටිකක්"

දේවක දුරකථනය භාවනාට දුන්නාය. ඇය තොල්පට තදකරගෙන

උන්නා මිසක කතාකළේ නැත.

"ෂෝක් කොල්ලා සුදූ. ස්වීට්."

තාරකා කිව්වේ එහෙමය.

"මී. හවස කොහේහරි යනවද පොඩි අක්කේ."

"චූටි ගමනක් තියෙනවා. ගිහින් එන්නම්. පොඩි ගෝරියක් අල්ලන්න තියෙන්නේ. එතනින් ක්ලෝස්"

ඇයගේ වැඩ ගැන භාවනා දනී. 'හිටපු බෝයි ෆ්‍රෙන්ඩ් එයා හොස්ටස් කෙනෙක් වුණාට කැමති නෑ. රණ්ඩු.' භාවනා දුරකථනය විසන්ධි කරමින් සිතුවාය.

"ෂෝක් කොල්ලෙක් කියන්නේ පොඩි අක්කා"

භාවනා කීවේ සිනාබරව දෙනෙත් සඟවාගෙනය. දේවක ලැජ්ජාවෙන් සිනාසුනේය.

"එයාට කොල්ලෝ ගැන පශ්චාත් උපාධියක් තියෙනවා. දාසයේ ඉඳලා බෝයි ෆ්‍රෙන්ඩ්ස්ලා ඉන්නේ."

භාවනා කීවාය.

"සුද්දිට ඉඳලා නෑ"

ඔහු ඇසුවේය. භාවනා රැව්වාය.

"ඉන්ඩ තිබුණා තමයි"

ඇය කීවාය.

"එකපාරම ඉතින් හස්බන්ඩ් එක්කම අෆෙයා එකක් පටන් ගන්නකෝ."

දේවකගේ කතාවට ඇය දිලිසෙන දෑසින් බලාගෙන උන්නාය. මොනවා කියන්නද කියා ඇයට සිතාගන්නට නොහැකි විය.

"බලන්නෝන"

භාවනා කීවාය.

# 41

අලුතින් ලස්සන වෙන සීගිරි එකේ ලස්සන බලන්නට අද මිලින්දත් සීගිරි එකට ආවේය. ඔහු සීගිරි එක පුරාම ඇවිද්දේ රඹුක්වැල්ල මහතාත් සමඟය. දෙදෙනාටම දේවක හැමදේම පැහැදිළි කළේය.

"මෙතන ඉඳලා බැලුවාම මුළු සීගිරි එකම පේන විදිහට අපි අලුතින් සුපර් මාර්කට් එක ඇරේන්ජ් කරන්නේ සර්. ඒක එහෙම පේන්න ඕන."

මිලින්ද හිස වැනුවේය.

"ඇයි දේවක මේ බේකරි සෙක්ෂන් එක ළඟ බක්කි ටිකක් හදන්නේ."

මිලින්ද ඇසුවේය.

"මේක සර් අපි එක එක බ්‍රේඩ් වර්ග දාන්න. මේ බක්කිවලට අපි පස්සේ වේවැල් කූඩ බස්සනවා. ඒවට තමා බ්‍රවුන් බ්‍රෙඩ් රෝස් පාන් සැන්ඩ්විච්ස් පාන් එහෙම දාන්නේ. ටිකක් වෙනස් ක්‍රමයක්. පාන් එක ගොඩට තියෙනකොට ගන්න හිතෙයි කියලා හිතෙනවා."

මිලින්ද හිස වැනුවේය. එය ඔහුත් අනුමත කළේය.

"මාළු ස්ටෝල් එක ටිකක් අයිනටම වෙන්න දැම්මේ සර් ස්මෙල් එක එන්න පුළුවන් නිසා. ඒකට අපි

උඩින් පොලේ මාළු ලෑල්ලේ වගේ උඩින් වොටි සීයේ ලයිට් එල්ලන්න යන්නේ. පොඩි මාළු ලෑල්ලක ගතියක් ගන්න. මාළු අයිස් එක්ක ගොඩවල් ගහලා තියන්න යන්නේ”

මිලින්ද සිනාසුනේය.

“මාළු කපන්න කෙනෙක් හොයාග න්න වෙයි දේවක.”

“ඒක මහ දෙයක් නෙමේ සර්. අපිට පුළුවන්. මම එක්කෙනෙක් එක්ක කතාකරගෙන යන්නේ.”

මිලින්දට පුදුමය. මොකක්දෝ හේතුවක් නිසා ඔහුට සිහිවුනේ ඔහුගේ මියගිය නංගීවය. ඇයටත් තිබුනේ මේ වාගේ අදහස්ය. අලුත් අදහස්ය.

“තාත්තට මතකද අපි සීගිරි එක දාපු මුල්ම දවස්වල නංගී කිව්වා

අපි මොරටුවෙන් මාළු ගෙනත් දාමුද කියලා නේද තාත්තේ."

මේ කතාකරන්නේ තම අම්මා ගැන බව දේවක දනී.

"අපි ඒකට ටිකක් අදිමදි කළා නේද පුතා"

"ඒකනේ තාත්තේ. දැන් හැම සුපර් මාකට් එකකම මාළු තියෙනවා."

දේවක දුක්බරව බලාගෙන උන්නේය. 'ඔයා කරන්න ගිය දේ මම කරනවා අම්මා. බයවෙන්න එපා' ඔහු අම්මාට සිතින් කීවේය.

"හොඳයි දේවක. කරගෙන යන්න.බජට් එක පනීද?"

"මං හිතන්නේ නෑ සර්. අපි පිරිමහගෙන යන්නේ."

රඹුක්වැල්ල මහතා කොල්ලාගේ

පිටට තට්ටුවක් දැම්මේය.

"මට සර් තව එක දෙයක් කරන්න අවසර දෙන්න සර්."

දේවක ඉල්ලුවේය. රඹුක්වැල්ල මහතාත් මිලින්දත් දෙදෙනාම බැලුවෝය.

"කියන්න දේවක."

"මේ දෙපැත්තෙම තාප්ප මට කඩන්න දෙන්න.මට ඕන සීගිරි එක ටිකක් අන්ලිමිටඩ් පෙන්නන්න සර්. ඒකට මේ තාප්ප කෑලි බාධාවක්. මේ හැමදේම අයින් කරලා එක යායකට මට සීගිරි එක ගන්න පුළුවන්නම්"

දේවක ඇසුවේය. රඹුක්වැල්ල මහතා බැලුවේ මිලින්ද දෙසය. කොල්ලාගේ අදහස මිලින්දද තේරුම් ගත්තේය. එහෙම කළ විට ටවුම මැද යායකට සීගිරි එක පෙනෙයි.

"කරන්න දේවක. ඒත් ආරක්ෂාවට අපි යකඩ දම්වැලක් දාමු. ම්"

"ඔව් සර්.ඒක කරනවා. අපි වටේට ගස් ටිකත් දානවනේ. තැන්කියු සර්"

මිලින්ද සිනාසුනේය. භාවනා ඔහු දෙසම බලාගෙන උන්නේය. 'හෙට අනිද්දා ඔයා කියයිද දන්නේ නෑ සීගිරි එකම කඩන්නෝන කියලා. ඇඟත් එක්ක හිරිවැටෙනවනේ දේවක' භාවනා සිතුවාය. ඒත් හැමදේම තිබුනේ ඔහුගේ හිතේය.

"දේවකයියේ."

තාත්තාත් සීයාත් ගියපසු භාවනා දේවකට ළංවූවාය.

"මිස්."

"බය නැද්ද?"

ඇය නිකමට ඇසුවාය. දේවක සිනාසුනේය.

"ගේමක් දෙන්න ඕන මිස්. එහෙම බයවෙලා බෑ. අපි කරමුකෝ."

"ම්.මාව නිකං මේ හිරිවැටිලා වගේ. බයත් එක්ක."

දේවක භාවනා දෙසම බලාගෙන මොහොතක් උන්නේය.

"අපි මේක කරමු."

ඇය හිස වැනුවාය.

# 42

හවස් වරුවේ රඹුක්වැල්ල මහතාත් නේත්‍රාත් භාවනාත් දේවකත් මිහිරංගත් සීගිරි එකේ අලුත් අලෙවි සැළැස්ම ගැන කතාකරමින් උන්නෝය. මිහිරංග බලාගෙන උන්නේ මේ වෙලාව එනතුරුය.

"දැන්ට අපි ගාව කොච්චර බඩු ස්ටොක් එකක් තියෙනවද ලොකු දුව."

රඹුක්වැල්ල මහතා ඇසුවේ

නේත්‍රාගෙනි.

"මලීෂා අද නෑ නේද ලොකු මල්ලි."

නේත්‍රා ඇසුවාය.

"එයා අක්කා නිවාඩු ගත්තනේ. ස්ටඩීස් වගයකට. මං හිතනනේ ස්ටෝස්වල කීස් මෙයාට හෑන්ඩ් ඕවර් කළා."

මිහිරංග කීවේය.

"මං ළඟ කීස් තියෙනවා සර්. අපි ස්ටොක් එකක් ගත්තේ නෑ තාම."

දේවක කීවේය.

"ඒක ගන්න ඕන. අපි දැනගන්න ඕනනේ අපේ දැනට තියෙන ස්ටොක් එකේ වැලුයු එක."

"මං ඒක බලන්නම් සීයා"

භාවනා කීවේ දේවකට ඒ තරමටම වැඩ නිසාය.

"ඔයාට වැඩනේ. අපි ඒක මිහිරංගට බාරදෙමු."

මිහිරංග සිනාසුනේය.

"ඕකේ සීයා මම බලන්නම්. මට කීස් ටික දෙන්න. මං දැන්මම ස්ටාෆ් එකේ අයව දාන්නම් ඒකට."

මිහිරංග බලාගෙන උන්නේ මේ මොහොත එනතුරුය. භාවනා ස්ටෝරුවේ යතුරු ටික ගෙනවිත් දුන්නේ දේවක අතටය. දේවක එය මිහිරංග සොයාගෙන විත් දුන්නේය.

"මං මොනවත් බැලුවේ නෑ සර්."

දේවක කීවේය.

"මට එපා. ඕක ස්ටාෆ් එකේ දයාරත්නටයි දිසාටයි බාරදෙන්න. ඒ දෙන්නා ස්ටොක් එක බලයි. වෙනදටත් ස්ටොක්ස් ගන්නේ එයාලා දෙන්නා."

මිහිරංග තරහක් නැතුව කීවේය. දේවක දයාරත්නව සොයාගෙන ගොස් ස්ටෝරුවේ යතුරු බාරදුන්නේය. වෙලාව දවල් තුන පමණ විය. දයාරත්න මිහිරංගගේ සහචරයෙක් විය. ඔහු දවස් දෙකක් දයාරත්නට බොන්නට අරගෙන දුන්නේය.

"මේ ස්ටෝර්ස්වල කීස්."

"ඕකේ සර්. තැන්කියු."

"මිහිරංග සර්ගෙන් මොකක්ද කරන්න ඕන කියලා අහගන්න."

"හරි සර්"

දයාරත්න තනිවම සිනාසුනේය.

තමාට එරෙහිව දරුණු කුමන්ත්‍රණයක් මේ මොහොතේ ක්‍රියාත්මක වන බව දේවක දැනගෙන උන්නේ නැත. ඔහු පුරුදු ලෙස

වේගයෙන් සීගිරි එක අලුතින් ගොඩනැඟීම් දැවැන්ත මෙහෙයුමේ යෙදෙමින් උන්නේය.

සීගිරි හී ස්ටොක් ගැනීම ඇරඹිණ. මිහිරංග ඔහුගේ මේසයට වී බටහිර ගීතයක් දමාගෙන රස වින්දේය. දැන් කරන්නට ඇති එකම දේ එයය. තව මොහොතකින් සීගිරි එකම ගිනි ගනු ඇත.

ඒ මොහොතේ දේවක උන්නේ රඹුක්වැල්ල මහතාගේ කාමරයේය. ඔහු රඹුක්වැල්ල මහතාව හමුවුනේ තනිවමය.

"කියන්න පුතා."

දේවක සිනාසුනේය. පසුව ඔහු බ්‍රව්න් පේපර් බෑගයක දැමූ රුපියල් මුදල් මිටියක් මේසය මත තැබුවේය. රඹුක්වැල්ල මහතා එදෙස බැලුවේ

පුදුමයෙන්ය.

"මේ සල්ලි පුතා"

දේවක සිනාසුනේය.

"මෙතන සර් රුපියල් තුන් ලක්ෂ විසිදාහක් තියෙනවා. කෑෂ් වලින්."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය. එපමණ මුදලක් තියෙන බවක් ඒ මිටියෙන්ම කියන්නට පුළුවන. ඒත් මේ කොල්ලා මේ මුදල් මෙතන තැබුවේ ඇයි?

"අපි සර් ඇතුලේ ඩිමෝලිෂන් වැඩවලට ලක්ෂ දාහතරක් ගෙව්වා. පෙරේදා."

"ඔව් පුතා. මමනේ අත්සන් කළේ."

"එතකොට සර් කිවන් එකටයි මීට් සෙක්ෂන් එකටයි ඇඩ්වාන්ස් දාසයක් ගෙවලා තියෙනවා"

රඹුක්වැල්ල මහතා හිස

වැනුවේය.

"එළියේ කා පාක් එක හදන්නත් ඇඩ්වාන්ස් කළා"

ඔහු යළිත් හිස වැනුවේය.

"මේ ගොඩක් කන්ත්‍රැක්ටර්ස්ලා මම හොයාගත්තේ සර්. සමහර අයට මම කතාකරලා ගෙන්න ගත්තා."

ද්වේක පැහැදිළිකළේය.

"එයාලා සර් මට වෙනම කොමිෂන් එකක් ගෙව්වා. මේ ඒ ඔක්කොම කමිෂන්වල එකතුව සර්. මම ඒක එපා කිව්වේ නෑ. ඒක ගත්තා. එහෙම නොගත්තත් සර් එයාලා මේ ගාණ අපෙන් ගන්නවා. මේ කමිෂන් එක ගත්ත නිසා අපේ ගාණ අඩුවෙනවා."

රඹුක්වැල්ල මහතාට පුදුම සිතුණි. කොල්ලාට මේ ලක්ෂ තුනහමාරම

කිසිම ප්‍රශ්නයක් නොමැතිව ගන්නට තිබුණි. ඒත් කොල්ලා එහෙම කළේ නැත. ආයතනවල වැඩ බාරදෙන අයට රහසින් කොමිස් මුදලක් ගෙවන බව රඹුක්වැල්ල මහතා දනී. එය නතරකළ නොහැකි දෙයකි. එහෙත් කොල්ලා එය ලබාගෙන නැවත ආයතනයටම එය දුන්නේය. රඹුක්වැල්ල මහතා දේවක දෙස බලාගෙනම උන්නේය.

"ඔයාගේ අවංකකම ගැන මට හරි ආඩම්බරයි පුතා. ඔයාව මේ සීගිරි එකට ගත්ත එක ගැන මට ගොඩක් සතුටුයි."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මේක සර් අපිට තව වැඩකට ගන්න පුළුවන්. මට එහෙම ප්‍රයිවට් කමිෂන් ඕන නෑ සර්. කවදාවත් නෑ.

මේක හදන්නයි මට ඕන. මං දන්නවා සර් කවදාහරි මාව බලාගන්නවා කියලා.”

දේවක කීවේය. රඹුක්වැල්ල මහතා සංවේදීව හිස වැනුවේය.

“ඔයා හරි. ඔයාව අපිට සම්පතක්. ලොකු සම්පතක්.”

රඹුක්වැල්ල මහතා කීවේය.

“මේ මේ සල්ලි ටික නේත්‍රා මිස්ට බාරදෙන්නම් සර්. එකවුන්ට් එකට දාන්න.”

දේවක කීවේය.

“නෑ පුතා. ඔහොම තියන්න.ලොකු දුවටයි පොඩි දුවටයි ටිකක් එන්න කියාගෙනම යන්න.”

රඹුක්වැල්ල මහතා කීවේය. දේවක හිස වනා නැඟිට්ටේය. ඔහු ආවේ නේත්‍රාගේ කාමරයටය.

භාවනාද ඇයත් සමඟම උන්නාය.

"මිස්ලා දෙන්නටම සර් ටිකක් එන්න කිව්වා."

භාවනා දේවක දෙස බැලුවාය.

"ඇයි දේවකයියේ."

"එහෙම මොනවත් කිව්වේ නෑ මිස්."

භාවනා නැඟිට නේත්‍රාගේ රෝද පුටුවට අතක් තැබුවාය.

"ගිහින් බලමු අක්කා."

දෙදෙනාම රඹුක්වැල්ල මහතාගේ කාමරයට ආවෝය.

"මෙතන ලොකු පුතේ තුන්ලක්ෂ විසිදාහක් තියෙනවා."

"හා සීයේ."

"බෑන්ක් එකට දාන්න." නේත්‍රා බැලුවාය. සීයා ඉන්නේ සතුටිනි.

"මේ සල්ලි ටික දැන් මට ගෙනත්

දුන්නේ දේවක."

"ඇයි සීයා"

භාවනා ඇසුවාය. රඹුක්වැල්ල මහතා සියල්ල විස්තර කළේය.

"මට පුදුම මේ කොල්ලා අපටම ලැබුණ එක පුතේ."

රඹුක්වැල්ල මහතා කීවේය. භාවනාගේ දෙනෙත් තිබුනේ තෙත්වය.

"එයා හරි පුදුම කෙනෙක් තමා සීයේ. මේ නිසා නෙමේ. ගොඩක් දේවල් නිසා."

භාවනා කීවාය. කෙල්ල අඬනවාද කියාත් නේත්‍රාට සිතුණි.

"මාව සීයේ මේ කොල්ලා මෙහෙම උස්සගෙන ගියේ. මටත් මල්ලිලා කියන්න තව දෙන්නෙක් ඉන්නවනේ සීයේ. ඒත් මේකා."

නේත්‍රා කීවාය.

"අපි කොල්ලව රැකගන්න ඕන"

රඹුක්වැල්ල මහතා කීවේය. ඒත් කොල්ලාට එරෙහිව දැවැන්ත කුමන්ත්‍රණයක් දියත්වෙමින් පවතින බව කිසිවෙක් දැනගෙන උන්නේ නැත. එය තව විනාඩි කිහිපයකින් පත්තුවීමට නියමිතය.

"කොල්ලට තිබුණා මේ සල්ලි ටික තියාගන්න. එහෙමයි කරන්නේ ගොඩක් වෙලාවට. ඒක හොයන්න බෑ."

"ම්. අපේ කෙනෙක් වගේ සීයේ."

නේත්‍රා කීවාය. නේත්‍රා බලාගෙ නම උන්නාය. දේවකව දුටු පළමු මොහොතේ ඇතිවූ අමුත්ත- නේත්‍රාට සිහිවිය.

"මේ සල්ලි නෙමේ සීයා. මේ."

නේත්‍රා කියාගෙන ගිය දේ නවතා බැලුවේ හදිස්සියේ දොර ඇරගෙන ආ කෙනෙක් නිසාය.

ආවේ මිහිරංගය. ඔහු ආවේ ආවේස වූ විලාසයෙනි. එය හොඳ රංගනයක් විය.

"මේ වගේ දේවල් මේ සීගිරි එකේ වෙන්න දෙන්න බෑ සීයා. නෙවර්."

මිහිරංග ආවේ එහෙම කියාගෙ නමය. භාවනා පුදුමයෙන් බැලුවාය. 'මෙයාට හදිස්සියේ ආපු අස්ස කුලප්පුව මොකක්ද' භාවනා සිතුවාය.

"කලබල නොවී මොකක්ද වෙලා තියෙන්නේ කියලා කියන්න මිහිරංග."

රඹුක්වැල්ල මහතා සන්සුන්ව කීවේය.

"වෙලා තියෙන්නේ කවදාවත්

වෙච්ච නැති දෙයක්. මේවා හදනවා නෙමේ වනසනවා.”

මිහිරංග කීවේය. මොකක්ද හේතුවක් නිසා භාවනාට යමක් දැනුණි. මේ කියන දේත් දේවකත් අතර සම්බන්ධයක් ඇතැයි ඇයට නිකමට සිතුණි.

“මිහිරංග. කියන දෙයක් පිළිවෙලට තේරෙන්න කියන්න. මොකක්ද දැන් වෙලා තියෙන්නේ.”

රඹුක්වැල්ල මහතා ඇසුවේය. නේත්‍රාද මිහිරංග දෙස බැලුවාය.

“කියන්න මල්ලි. මොකක්ද වෙලා තියෙන්නේ.”

නේත්‍රා ඇසුවාය.

“ස්ටෝර්ස්වල තිබ්බ ලක්ෂ හයක් වටින පර්ෆියුම් ස්ටොක් එකක් මිසින්. සීගිරි එකේ කොහේවත් ඒක නෑ.”

මිහිරංග කීවේය. භාවනාගේ ළයට මොකක්ද අනියත බියක් දැනුණි. මේ බිය පසුගිය දවස් කිහිපයේම ඇයට දැනුන බියක් විය.

"මිහිරංග හොඳට චෙක් කළාද?"

"මමම ගිහින් චෙක් කළා සීයා."

ඔහු කීවේය. භාවනා පරිස්සමින් බලාගෙන උන්නාය.

"දැන් මොකක්ද මිහිරංග අයියා කියන්නේ."

භාවනා ඇසුවාය. ඇයට දැනගන්න ඕනා වියය.

"ඒක ස්ටෝර්ස්වල නෑ. එක්කෝ කවුහරි ඇතුලේ කෙනෙක් පන්නලා නැත්නම් එළියෙන් ඇවිත් උස්සලා."

මිහිරංග කීවේය. 'ඔයා දවස් දෙක තුන නයිට් කළා. වාහන වලින් ආවා ගියා. මේ චෝදනාව කෙලින්ම

එන්නේ ඔයාට දේවකයියේමම මේක දැනගෙන උන්නා’ භාවනා සිතුවාය.

“දැන් මලීෂා මොනවද කියන්නේ.”

නේත්‍රා ඇසුවාය. ස්ටෝර්ස් බාරව උන්නේ ඇයය.

“සීගිරි එක වහන දවසේ ස්ටෝර්ස් කීස් නංගි දේවකට බාරදුන්නා. එදා ඉඳලා නංගි නිවාඩු.”

මලීෂා ස්ටෝර්ස්වල යතුරු බලෙන්ම වාගේ දේවකට බාරදුන් බව භාවනා දැනගෙන උන්නාය. ‘අපි බලමුකෝ.’ ඇය හිමිහිට සිතුවාය.

“දැන් එතන ලක්ෂ කීයක පර්පියුම්ස් තිබුණාද මිහිරංග.”

“මම දැන් ඉන්වොයිස් චෙක්කළා සීයා. පන්ලක්ෂ අනූහය දාහක්.”

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"අපි දේවකගෙන් අහලා බලමු. දේවකනේ පහුගිය දවස් ටිකේ හිටියේ. එයා පරිස්සමට කොහේහරි තිබ්බද දන්නේ නෑනේ."

රඹුක්වැල්ල මහතා අභ්‍යන්තර දුරකථනය ගෙන දේවකව කැඳෙව්වේය. දේවක ඒ වෙද්දී සිදුවීම දැනගෙන හමාරය. ඔහු එයට බිය වූයේ නැත. දේවක එය බාරගත්තේ හරිම සැහැල්ලුවෙනි. තමා වරදක් කර නැත්නම් බිය විය යුතු නැති බව දේවක දැනගෙන උන්නේය.

ඒත් මෙතන මොනවා හෝ දෙයක් සිදුවී ඇති බව පමණක් දේවකට වැටහිණ. ඔහු ඒ ගැන වැඩිදුර හිතන්නට ගියේ නැත.

දේවක ආවේ ඔහු අතේ තිබූ

දිග ටේප් එකද අතැතිවමය. පිටත බේකරි ෂෝප් එක හදන ප්‍රමාණය ඔහු කොන්ත්‍රාත්කරු සමඟ බලමින් උන්නේය.

"සර් මට කතාකළාද?"

මිහිරංගද එතන සිටිනවා දැක දේවකට යමක් සිතුණි. එහෙත් මේ ප්‍රශ්න තමා ඔළුවට ගන්න අවශ්‍ය නැත.

"දේවක මේ ස්ටෝර්ස්වල බඩු වගයක ෂෝටේජ් එකක් ඇවිත්. ඒකයි කතාකළේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඔවු සර්. මටත් දයාරත්න දැන් කිව්වා. ඒක මලීෂා මිස් මට ස්ටෝර්ස් බාරදෙන වෙලාවේ ස්ටෝර්ස්වල තිබුණා සර්. පර්ෆියුම් ස්ටොක් එක මලීෂා මිස් මට ස්පෙෂලි පෙන්නුවා.

ඉට් වොස් දෙයා සර්. අයි සෝ."

දේවක කීවේය. රඹුක්වැල්ල මහතා සිනාසුණේය. කොල්ලා එය කිව්වේ හරි සැහැල්ලුවෙනි. අවුරුදු පනහක ව්‍යාපාරික අත්දැකීම් ඔහුට ඇත.

"ඒකනේ කියන්නේ සීයා."

මිහිරංග කීවේය.

"දැන් ඒ පර්ෆියුම් ස්ටොක් එක ස්ටෝර්ස්වල නෑ කියන්නේ දේවක."

"ඔව් සර්. එහෙම නැතිවෙන්න බෑ. අපි ස්ටෝර්ස් ලොක්කරපු ගමන් තිබ්බේනේද මිස්."

දේවක භාවනා දෙසද බලා කීවේය. භාවනාද මිස වැනුවේය.

"එතන ප්‍රශ්න දෙකක් තිබුණා සර්. එකක් ඒ පර්ෆියුම් ස්ටොක් එක ඉන්වොයිස් කරලා තිබුනේ මීට

මාස හතරකට කලින්. එතකොටත් ඒ පර්ෆියුම් බොට්ල්ස් එකසිය තිස් නමයක් ස්ටොක් එකේ තිබිලා තියෙනවා. මේ අලුත් ස්ටොක් එක අරන් තිබුණේ එහෙම තියෙද්දී සර්. ඒකනේ ගත්ත ස්ටොක් එක එහෙමම තිබුණේ. ලක්ෂ හයක බඩු."

දේවක කීවේය. නේත්‍රා සිනාසුනාය.

"ඇයි එහෙම පර්චසින් කළේ මිහිරංග මල්ලි."

නේත්‍රා ඇසුවාය.

"දැන් මෙතන තියෙන ප්‍රශ්නේ ඒක නෙමේනේ අක්කා. මොනවාහරි බඩු තිබ්බනේඒක  දැන් නෑනේ. ෆාස්ට් මූවින් බඩු ස්ටොක් එකේ තියෙන්න ඕන."

මිහිරංග කීවේය.

"ෆාස්ට් මූවින් බඩුනම් මාස හතරක් එහෙමම බඩු තිබ්බේ සර්"

දේවක කීවේය.

"දැන් මේ බඩු මිසින්. ඒකට මොකද වෙන්නේ. කීස් තිබුනේ දේවක ළඟ. නයිට් ඇද්දේ දේවක. මේවට වගකියන්න ඕන ඔයා."

මිහිරංග කීවේය. භාවනා සිනාසුනාය. මිහිරංග එන්නේ මෙතනට බව ඇය දැනගෙන උන්නාය.

දේවක සිනාසුනේය.

"අපි ස්ටෝ රූම් ඕපන් කලේ නෑ. නේද මිස්."

දේවක කීවේය.

"ඔව්. දේවක මලීෂාගෙන් කීස් ගත්ත ගමන් මට හෑන්ඩ් ඕවර් කලේ. ඒවා අදයි එළියට ගත්තේ. තිබ්බේ

මගේ කබඩ් එකේ. දේවක අතේ කීස් තිබුනේ නෑ සීයා. මගේ අතෙයි තිබුනේ. එතන මොකක්හරි දෙයක් වුණානම් මායි වගකියන්න ඕන."

භාවනා එහෙමම කීවාය. 'ඔයා පව්' දේවක අසරණව භාවනා දෙස බලා සිතුවේය.

"ඔයාට මෙතන පර්ෆියුම් පන්නන්න ඕනකමක් නෑනේ බබා"

මිහිරංග කීවේය. භාවනා සිනාසුනාය.

"අපි සර් මේක හොයමු. එහෙම වෙන්න බෑනේ. මොකද මාත් දැක්කා පර්ෆියුම් ස්ටොක් එක එතන තියෙනවා. ඒත් මම මලීෂා මිස්ගෙන් ඒක ඇහුවා. එයා පෙන්නන්දී."

දේවක කීවේය.

"හොයන්න ඕන තමයි. පොඩි

ගාණක් නෙමේනේ.සික්ස් හන්ඩ්‍රඩ් තවුසන්ඩ්."

දේවක්ද හිස වැනුවේය.

"මේක බලන්න ලොකු පුතේ. මොකක්ද වෙලා තියෙන්නේ කියලා."

රඹුක්වැල්ල මහතා එය පැවරුවේ නේත්‍රාටය.

"මම බලන්නම් සීයා."

නේත්‍රා කීවාය.

"පහුගිය දවස් ටිකේම මේක ඇතුළට වාහන දහයක් පහළොවක් ආවා. එක එක වෙහිකල්ස්. ඒ වෙහිකල් එකක දාලා මේවා ලේසියෙන්ම පන්නන්න පුළුවන් සීයා"

"ඇයි අපේ සිකියුරිටි නිදිද?"

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"සිකියුරිටි හට් කඩලනේ සීයා. මෙතන ඔක්කොම දැන් අවුට් ඔෆ්

ඕඩර්නේ. ඒකනේ අවුල”

මිහිරංග කීවේය.

“සොරි සර්. එහෙම කිසිම දෙයක් අවුට් ඔෆ් ඕඩර් වෙන්නේ නෑ සර් මෙතන. කවුරු‍ෑ බැලුවේ නැතත් මම එන යන වාහන ඔක්කොම බැලුවා. මේක මට බාරදුන්නේ. මම ඒක මගේ ජීවිතේ ගියත් කරනවා. එක විනාඩියක් මම ඇහැ පියෙව්වේ නෑ.”

හොඳම දේ සීයා මේක පොලීසියට කියන එක. එයාලා අවශ්‍ය විදිහට ඉන්වෙස්ටිගේෂන් එක කරයි.”

මිහිරංග කීවේය.

“ඔව්. ඒත් අපි ඉස්සෙල්ලා මේක බලලා ඉමු. එහෙම නැත්නම් පොලීසියට කියමු.”

රඹුක්වැල්ල මහතා කීවේය.

"අපි මේකට අත ගැහුවොත් සර් පස්සේ පොලීසිය අපිට වෙන දෙයක් කියයි නේද සර්? දැන්මම පොලීසියට මේක කියන එක නේද හොඳ? ඇයි මේක දැනගත්ත වෙලාවේ කිව්වේ නැත්තේ කියලා එයාලා අහයිනේ නේද?"

දේවක කීවේය. ඒ කතාවට මිහිරංගටද දාඩිය දැම්මේය. එහෙත් ඔහු ඒ බවක් පෙන්නුවේ නැත.

"මාත් කියන්නේ ඒකයි සීයේ. අපි පොලීසියට කියමු."

භාවනාද කීවාය.

"මම කට උත්තර දෙන්නම්. කීස් තිබුනේ මම ගාවනේ."

"මාත් දෙනවා සර්. නයිට් හිටියේ මමනේ"

දේවකද කීවේය.

# 43

ලක්ෂ හයක සුවඳ විලවුන් තොගය නැතිවීමේ කතාව සීගිරි එක පුරාම ලැව් ගින්නක් සේ පැතිර ගියේය. ඒ කතාවට දයාරත්න දේවකගේ නම හිතා මතාම එකතු කළේය.

“යකා වගේ මේක අදිනකොට අපිට හිතුණා මීය කඩන්නේ අත ලෙවකන්න නෙමේ කියලා.”

දිසානායක කීවේය. සමහරු එයට එකඟව හිස වැනුවෝය.

සමහරු කතානොකර උන්නෝය. මේ පැතිරෙන කතා දේවකගේ කණටත් ආරංචි විය. ඔහුගේ හදවතට අමිහිරි දුකක් දැනුණි. එහෙත් ඔහු දරාගෙන උන්නේය.

කැෂියර් අංශයේ අනුරාධා පැමිණ මේ පැතිරෙන කතා ගැන භාවනාට කීවාය. ඇය ඒවා අසාගෙන උන්නේ දැඩි වේදනාවකිනි.

"දේවක කවදාවත් එහෙම කරන්නේ නෑ. මුන්ට පිස්සු."

භාවනා අනුරාධා සමඟ ස්ටාෆ් එකටම බැන්නාය.

"අනේ මන්දා මිස්."

ඇය කීවාය.

දේවකව ඉක්මනින්ම තනිකරගෙන කතාකිරීමේ අවශ්‍යතාවය භාවනාට දැඩිව දැනුණි. එහෙත් ඒවා

කතාකරන්නට පෙරම පොලීසිය සීගිරි එකට ආවේය. ඔවුන් මුළින්ම ගියේ රඹුක්වැල්ල මහතාගේ කාමරයටය. පසුව මිහිරංගවත් දේවකවත් භාවනාවත් නේත්‍රාවත් ගෙන්නුවෝය. වෙන වෙනම ඔවුන්ගේ කට උත්තර ලියා ගැනිණ. පසුව ඔවුන් ස්ටෝරුවේ පරීක්ෂාවක නිරත විය.

"අපිට ෆින්ගර්ප්‍රින්ට්ස් ගන්න බෑ. මොකද ඊට පස්සේ ස්ටාෆ් එක මේකට ඇවිත්නේ"

පොලීසිය කීවෝය. මේවා සියල්ල මිහිරංග කළින්ම සැළසුම් කර තිබුණි.

"කවුද මෙතන නයිට් එක හිටියේ."

ඒ ගැන පොලීසිය වරක් දෙවරක්

නොව කිහිප වාරයක් ඇසුවෝය. දේවක ආ ගිය වේලාවන් සටහන් කර ගැනිණ.

පොලීසිය පැමිණ ගිය පසුත් දේවක ඔහුගේ පුරුදු වැඩ කරගෙන ගියේය. අද රාත්‍රියේ ඇක්ෂන් කිචන් එක වඩා පුච්චන ලද ගඩොල් අල්ලන්නට නියමිතව තිබුණි. ඊට අමතරව මුළු සීගිරි එකම අලුතින් පේන්ට් කරන්නට දේවක දාගෙන උන්නේය. මේ කිසිම හේතුවක් නිසා ඒවා නවත්වන්නට නොහැක.

එහෙත් ඔහු වෙලාවක් බලා රඹුක්වැල්ල මහතාගේ කාමරයට ගියේය

"සර්"

"කියන්න පුතා"

රඹුක්වැල්ල මහතා කතාකළේ

සන්සුන්වය. මේ බොහෝමයක් චෝදනා එල්ල වෙන්නේ කොල්ලාට බව රඹුක්වැල්ල මහතා දැනගෙන උන්නේය.

"දේවක මේවා හිතට ගන්න එපා"

දේවක අසරණව සිනාසුනේය.

"මට සර් මගේ වැඩටික කරගෙන යන්න තිබුණානම් ඇති. අද රෑ මේ වැඩ ටික තියෙනවා සර් කරන්න"

ඔහු වැඩ ලිස්ට් එක රඹුක්වැල්ල මහතාට කියාගෙන ගියේය.

"ඔයා ඒ ටික කරගෙන යන්න. අපි මේවා පස්සේ බලමු."

"තැන්කියු සර්"

දේවක ගියේය. භාවනා දොරකඩම උන්නාය. ඔහුගේ මුහුණ දෙස භාවනා බැලුවේ අසරණවය. 'ඔයාට දුකත් ඇති. නෑයි කියන්න

බෑ. මෙච්චර මේ සීගිරි එක හදන්න දුක් විඳිනවා. තව ස්ටාෆ් එක හොරා කියලත් කියනවා.' භාවනා සිතුවාය.

"මිස්."

දේවක කීවේය.

"මට කතාකරන්න ඕන. මෙතන බෝ සෙවණ දන්නවා නේද?"

එය නිස්කලංක අවන්හලකි. දේවකත් දවසක් එතනට ගොස් ආප්ප කෑවේය.

"ඔව් මිස්."

"එතන උඩ ඉන්න. මම එනවා. මොනාවහරි ඕඩර් කරලා ඉන්න උඩට වෙලා"

ඇය කීවාය. දේවක හිස වැනුවේය. කොල්ලා සීගිරි කාර්යාලයෙන් පිටවෙන්නට හදද්දී ඔහුගේ අම්මාගේ පින්තූරය දැක

එතන නැවතුනේය. පසුව අම්මා දෙස බලා සිනාසුනේය.

"මම බය නෑ අම්මා. ඒත් මට දුකයි."

ඔහු රහසින් මෙන් කීවේය. එහෙම බලාගෙන ඉන්නවා නේත්‍රා දුටුවාය. ඇය උන්නේ රෝද පුටුව තල්ලුකරගෙන ඇගේ කාමරයෙන් පිටතට එමිනි.

"ඇයි දේවක"

දේවක ගැස්සුනේය. නේත්‍රා බැලුවේ ඔහු බලාගෙන උන්නේ කා දෙසද කියාය.

"නෑ මිස් මේ පින්තූරේ දිහා බැලුවේ."

ඔහු කීවේය. කොල්ලාගේ ඇස්වල තුනී තෙතමනයක් විය.

"මල්ලිට දුකයි නේ"

ඇය ඇසුවාය. දේවක සිනාසුණේය. ඔහු නේත්‍රා තල්ලුකරගෙන ආ රෝද පුටුවේ හැඩලය අල්ලාගත්තේය.

"මට දුකයි තමයි අක්කේ. ගොඩක් දුකයි. ඒත් බයක් නම් නෑ. මේ අත්දෙක බලන්න අක්කා"

කොල්ලා හැඩලයෙන් අත් දෙක ගෙන ඇයට පෙන්වූවේය.

"ම්."

"මේ අත්දෙකින් අක්කා බුදු සාදුට පඬුරු දෙතුන් දාහක් දාලා තියෙනවා. මල් ලක්ෂයක් විතර මම පූජකරලා තියෙනවා. මම මේ අත්දෙකින් පවක් කරන්නේ නෑ. මට ඉන්නේ මිස් මගේ අප්පච්චි විතරයි. එයා විතරමයි. පුංචි කාලේදීම මට අක්කා ගොඩක් දේවල් නැතිවුණා.

ඒ නිසා මම නැතිවෙනවට හරි බයයි. ගොඩක් බයයි. ඒනිසා මම පින් කරනවා. පව් කරන්නේ නෑ. පව් කරන අයගෙන් දෙවියෝ ගොඩක් දේවල් අයින් කරනවා. දවසක මම මගේ පුතාට අක්කා මේ අත්දෙකින් කවන්නේ. මගේ දුවගේ කොණ්ඩේ බඳින්නේ මම. මගේ නෝනගේ බඩ අතගාන්නේ මම. ඒ නිසා ඒවා කරන මේ අත්දෙක මට පුළුවන් උපරිමයෙන් මම ආරක්ෂාකරග න්නවා. පිරිසිදුව තියාගන්නවා. ඒ නිසා මට බයක් නෑ. මම කවුද කියන්න මම දන්නවා අක්කා"

දේවක කීවේය. නේත්‍රා කඳුළු පිරි දෑසින් කොල්ලාට එහා උන් භාවනා දෙස බැලුවාය. ඇයද පැමිණ මේ කතාව අසාගෙන උන්නාය.

"ඔයාට අප්පච්චී විතරක් නෙමේ ඉන්නේ. ඒ ටික විතරක් මතක තියාගන්න."

භාවනා ඔය ටික කියා ඇගේ කාමරයට ගියාය. දේවක පුදුමයෙන් නේත්‍රා දෙස බැලුවාය.

"කෙල්ල කියන්නේ ඇත්ත. අපි ඔයාට ඉන්නවනේ මල්ලියේ"

"මට ඒ ඇති අක්කා. මම ලෝකය විශ්වාස කරන මිනිහෙක් නෙමේ."

දේවක කීවේය. ඔහුගේ ඇස්වල වූ තුනී තෙතමනය නේත්‍රාගේ හදවතට ගෙන ආවේ තදබල වේදනාවකි. කොල්ලාට මෙහෙම චෝදනාවක් ඉබේටම ආවා නොවන බව නේත්‍රාටද ඉවෙන් මෙන් දැනුණි. එහෙත් නීතිය විශ්වාස කරන්නේ හදවත විශ්වාස කරන

දේම නොවේ. සාක්ෂිය. සමහර දේවල් සම්බන්ධයෙන් සාක්ෂි ඉතාම වැදගත්ය. නීතිය ඉදිරියේ කෙනෙක්ට තමන්ගේ පපුව ඇද අවුස්සා පෙන්වන්නට නොහැකිවන අවස්ථා අනන්තවත් තිබේ.

දේවක පිටත බේකරි ෂොප් එක හදන්නට අවශ්‍ය හැම උපදෙසක්ම දුන්නේය. ඔහු එහි දළ සටහනක්ද ගසාගෙන උන්නේය. මේ සිදුවෙන කිසිම හේතුවක් නිසා සීගිරි එක අලුතින් නිර්මාණය කිරීමේ සැළසුම් දියකර හරින්නට දේවක සූදානම් වූයේ නැත. පරාජය බාරගන්නට ඔහුගේ කිසිම සූදානමක් නැත.

සුවඳ විලවුන් තොගයට වූයේ කුමක්ද කියා කියන්නට දේවකද දැනගෙන උන්නේ නැත. එහෙත්

එයට කුමක් හෝ අද්භූත දෙයක් වෙන්නට ඇත. ඒ සිදුවූ දේ තමාගේ නමත් සමඟ ලස්සනට සම්බන්ධවී ඇත. එතන සැළසුමක් තිබෙන්නට ඇත.

සීගිරි හී ස්ටාෆ් එකේ බොහෝ දෙනා තමා දෙස අද බලන්නේ වපර ඇහින් බව දේවක දැනගෙන උන්නේය. ලෝකයේ ඉන්නා හැමෝගේම ඇස්දෙස බලාගෙන ගමනක් යන්නට පුළුවන්ද කියා ඔහු සිතුවේය. එහෙම සිතනවානම් කාටවත් කිසිම ගමනක් යන්නට නොහැක. භාවනා තමාට පැය බාගයකින් 'බෝ සෙවණට' එන්නට කීවේ ඇයිදැයි දේවක සිතුවේය. 'ඔයා මොකක්හරි කියන්න එන්න කියන්නේමේ වෙන දේවල් නිසා ඔයාගේ හිතට මොකක්හරි

දැනෙනවා.' දේවක සන්සුන්ව මොහොතක් උන්නේය. ප්‍රශ්න එද්දී කලබලවීම හොඳ නැත. හොඳම දේ සන්සුන් වීමය. අමාරුත් ඒකමය. අරමුණක් කරා යද්දී වැඩියෙන්ම හානිවෙන්නේ කෙනෙක්ගේ ඉදිරියට එන දහසකුත් එකක් ප්‍රශ්නවලින් නොවේ. ඒ ප්‍රශ්නවලින් කලබල කරගන්නා හිත නිසාය.

කෙහෙල් අත්ත කටු අත්තට වැටුණත් එකය. කටු අත්ත කෙහෙල් කොලයට වැටුණත් එකය. දෙකෙන්ම වෙන්නේ කෙහෙල් කොළේ ඉරෙන එකය. කොළේ ඉරාගන්නේ නැතුව ගමනක් යන්නට කෙනෙක් ඉගෙනගන්න ඕනය. දේවක ඒ බව දැනගෙන උන්නේය.

ඔහු සීගිරි එක ඉදිරියෙන්

ත්‍රීවීලරයකට ගොඩවුණේ මුහුණට වතුර ටිකක් දමාගෙන ලේන්සුවෙන් එය තෙත මාත්තු කරන ගමන්ය. යමක් සිදුවුවහොත් හෙළවෙන්නේ සීගිරි පවුල තමා ගැන තැබූ විශ්වාසය බව දේවක දැනගෙන උන්නේය. 'ඔයා විතරක් මාව විශ්වාස කරනවානම් මට ඇති.' ඔහු සිතුවේය.

"බලමුකෝ."

ඔහු තත්පරය දෙක තුනක් දෑස් වසාගෙන ඉඳ සිතුවේය.

# 44

භාවනා ඇගේ අත් බෑගය කරට දමාගෙන මොහොතක් ඇගේ පුටුවටම වී උන්නාය. තමාව වෙව්ලන බව භාවනා තේරුම් ගත්තාය. කවදාවත් මෙහෙම වෙව්ලා නැත. හරියට උණ ගන්නට එන්නාක් මෙන්ය. උඩුතොලින් ලේ රසක් දැනෙන තරමට ඇය දසන් අතරට උඩු තොල හිරකරගෙන මොහොතක් උන්නාය.

ඇය කල්පනාබරව ජංගම දුරකථනයෙන් දේවකගේ අංකයට ඇමතුමක් ගත්තාය. මොහොතකින් එය සම්බන්ධ විය.

"පිටවුණාද දේවකයියේ."

ත්‍රී වීලරයක හඬ භාවනාට ඇසුණි.

"ඔව් මේ ළඟ සුද්දි."

"මං එනවා. උඩට වෙලා ඉන්න."

ඇය එසේ කියා ඇමතුම විසන්ධි කළාය.

පසුව එහෙමම නැඟිට නේත්‍රාගේ කාමරයට ගියාය. නේත්‍රා නෙත්පුරා භාවනා දෙස බැලුවාය. කෙල්ලගේ මුහුණේ ගන්නට දෙයක් නැත. ඇය ඉන්නේ මේ සිදුවූ සිදුවීමෙන් කම්පනයට පත්වී බව නේත්‍රා තේරුම් ගත්තාය.

"එයා කවදාවත් එහෙම කරන්නේ නෑ අක්කා. මට ඒක කෝටියක් විශ්වාසයි. කන්ට්‍රැක්ටර්ස්ලාගෙන් ලැබිච්ච කමිෂන් එක පවා ඇවිත් බාරදුන්න කොල්ලා."

භාවනා කීවාය. ඇයගේ දෙනෙත් තෙත්ව තිබුණි. නේත්‍රා කෙල්ලගේ අත උඩින් අතක් දැම්මාය.

"මං ඒක දන්නවනේ සුද්දියේ."

නේත්‍රා කීවාය.

"මුළු ස්ටාෆ් එකම දේවකට මහ වහුතු කතා කියන්නේ. මට හරි බයයි."

භාවනා කීවාය.

"හැමදේම විසඳෙයි. බයවෙන්න එපා. අපි දන්නවනේ අපේ කොල්ලා ගැන"

නේත්‍රා කීවේ සැහැල්ලුවෙනි.

"ස්ටෝර්ස්වල කීස් තිබුනේ මම ගාව.ඒවා මලීෂා දුන්න ගමන්ම දේවක මට හෑන්ඩ් ඕවර් කළා."

නේත්‍රා හිස වැනුවාය.

"මොකක්හරි වුණා."

"මට තේරෙනවා මොකක්ද වුනේ කියලා. ඒත් කොහොමද වුනේ කියලා හිතාගන්න බෑ. මිහිරංගට කවදාවත් නැතුව සීගිරි එක ගැන හදිස්සි කැක්කුමක් ඇවිත්. එළියට යන්න බෑ මෙතන අලි පොරක් වෙලා. ස්ටාෆ් එකත් වටකරගෙන ඉන්නේ"

භාවනා කීවාය. සමහර දේවල් නවත්වන්නට අමාරුය. මිහිරංගටද තමාටත් නංගීටත් ඇති අයිතියම සීගිරි එක සම්බන්ධයෙන් ඇති. හොඳම දේ ඉවසන එකය.

"මං යනවා."

"ෂී. මේ සීයා කිව්වා සිකියුරිටි ෆර්ම් එකට කතාකරලා එක්ස්ට්‍රා සිකියුරිටි කෙනෙක්ව දාන්න කියලා. මම ඒක ඇරේන්ජ් කරලා එන්නම්. බබා යන්න."

නේත්‍රා කීවාය. භාවනා සීගිරි එක මැද්දෙන් ආවේ නිහඬවමය. සීගිරි එක මැදදී ඇයට මිහිරංගව හමුවිය. නේත්‍රා අත් බැඳගෙන මිහිරංග ළඟ නතර වූවාය.

"ස්ටාෆ් එක බණින්නේ අපිටත් එක්ක බබා. සර්ලා මේක එළියෙන් ආපු හොරුන්ට බාරදුන්නේ නරියට කුකුල්ලු බාරදෙනවා වගේනේ කියලා කියන්නේ. කතාව ඇත්ත."

මිහිරංග කීවේය. භාවනා සිනාසුනාය. ඒ සිනහව මිහිරංගව කුප්පවන සිනාවක් විය.

"අපි එහෙම කාටවත් සීගිරි එක බාරදුන්නේ නෑ. අපිනම් මැරීගෙන සීගිරි එක ගැන බලනවා මිහිරංග අයියේ. මම මේ දවස් ටිකේම රෑ දහය වෙනකල් සීගිරි එකේ හිටියා. මොන ප්‍රශ්න ආවත් සීගිරි එක අලුතින් හදලා තමයි අපිත් පස්ස බලන්නේ. මේ වගේ මයිනර් කේස්වලට ඒක නතරකරන්න බෑනේ"

භාවනා කීවාය. මිහිරංග සිනාසුනේය.

"වට්. මේක මයිනර් කේස් එකක්. සික්ස් හන්ඩ්‍රඩ් තවුසන්ඩ් බබා.ඩෝන්ට් තිංක් ලයික් දැට්."

"අපි බලමුකෝ. නේද? ඔයා අද කවදාවත් නැතුව හවසත් සීගිරි එකේ. සෑහෙන කාලෙකින් මම මේ දැක්කමයි"

භාවනා ඇඟුට පතට නොදැනී මෙන් කීවාය. 'මේකී මාවමයි ෆෝකස් කරන්නේ.' මිහිරංග සිතුවේය.

"ස්ටෝර්ස් සෙක්ෂන් එකේ මටයි අයිති. ඒකනේ මට තියෙන කැක්කුම. මේක බබාට වුණානම් බබත් එහෙම ඉඳියි"

"ඉතින් මම ගාවනේ ස්ටෝර්ස්වල කීස් තිබුනේ. මම මේ ඉන්නේ ෂෝක් එකට. අයියා බයවෙන්න එපා. ඔයා කවදාවත් ඒ පර්ෆියුම් ස්ටොක් එක පන්නන්නේ නෑනේ"

භාවනා කීවාය.

"යන් මාත් යනවා ගෙදර. මම ඩ්‍රොප් කරන්නම්."

මිහිරංග කීවේය.

"ම්හ්. මට අද හොඳ ෆිල්ම් ටිකක් බලලා ගන්න තියෙනවා. රෑට

බලන්න. තිබ්බ ෆිල්ම්ස් ඉවරවෙලා. පොඩි අක්කිත් ඇවිත්නේ. රෑට පොඩි ජොලියක් දාගෙන බලන්නෝන."

ඇය කීවාය.

"කොහොමද තාරුට අලුත් ජොබ් එක ෆිට්ද?"

මිහිරංග ඇසුවේය.

"මි. මං යනවා."

භාවනා මොහොතක් සීගිරි එකේ තැන තැන වැඩකරන කොන්ත්‍රාත් සේවකයක් දෙස බලාගෙන උන්නාය. දේවක ගොස් ඇත්තේ ඒ සියළු වැඩ බාරදීය. ඇය දිග සුසුමක් පිටකළාය. 'ඔයාගේ හිත ටිකක් හදන්න වෙනවා. ඒක මගේ යුතුකම.' ඇය සිතුවාය. භාවනා වාහනයට ගොඩවූයේ එසේ සිතමින්මය.

# 45

කෝසලත් මිහිරංගත් ඔවුන්ගේ අම්මලාව මේ වෙද්දී සිගිරි එකේ වෙමින් පවතින දේවල් ගැන දැණුවත් කර තිබුණි.

"සීයා මේවා දන්නේ නැද්ද පුතා"

සුරංග ඇසුවාය.

"සීයට ඔක්කොම ඉන්ෆෝම් කරලා තියෙන්නේ අම්මා. ඔයයි පුංචියිත් ගිහින් හවසට මේවා කියන්න. නැත්නම් මේවා උන්ටම යනවා"

මිහිරංග කීවේය.

"මං යනවා. එහෙම එක එකාලට මේකේ නටන්න දෙන්න බෑනේ."

කෝසලළගේ කතාව අසා රුවත්තිත් කීවේ එයමය. ඇය ඒ වෙලාවේම එය ඉඳුනිල්ටද වාර්තාකළාය. ඉඳුනිල් සීගිරි එකේ වැඩගැන ගෙදර කතාකරන්නට කැමති නැත. ඇය කිසිම දිනයක එය කළේ නැත.

එහෙත් ඇය ඒ ගැන මිලින්දට කතාකර කීවාය.

"සීගිරි එකේ මොකක්ද ප්‍රශ්නයක් යනවා. බලලා තාත්තට කතාකරන්න."

ඉඳුනිල් කීවාය.

"මොකක්ද ඉඳුනිල්"

"මොකක්ද මේ බඩු වගයක්

නැතිවෙච්ච කතාවක්. මේ රුවන්ති ඇවිත් කිව්වේමමා දන්නේ නෑ"

මිලින්ද ඒ වෙලාවේම රඹුක්වැල්ල මහතාට ගත්තේය.

"තාත්තේ.මොකක්ද මේ සීගිරි එකේ ප්‍රශ්නයක් යනවා කියන්නේ."

රඹුක්වැල්ල මහතා සිනාසුනේය.

"මේ ස්ටෝර්ස්වල තිබ්බ පර්ෆියුම් ස්ටොක් එකක් මිසින්වෙලා පුතා"

"එතකොට."

"නෑ. මේ අලුත් කොල්ලනේ හිටියේ දිගටම නයිට් එකට. ඉතින් ස්ටාෆ් එකම සැකකරන්නේ කොල්ලව. ඒකා එහෙම දෙයක් කරන්නේ නෑ"

රඹුක්වැල්ල මහතා විස්තර කළේය. දේවක ඔහුට ලැබුණු කොමිස් මුදල්ද තමාට බාරදුන් බවද

රඹුක්වැල්ල මහතා කීවේය.

"ඒත් දේවක වගකියන්න ඕනනේ තාත්තාඅපි එයාටනේ සීගිරි එක බාරදුන්නේ මේ දවස් ටිකේ."

"ඔව්. පොලීසියට කියලා තියෙන්නේඅපි බලමු පුතා."

"දැන් සීගිරි එක ක්ලෝස් කරලත් තියෙන වෙලාවේ. ඔක්කොම කඩලත් එක්කනේ නේද තාත්තා."

මිලින්ද ඇසුවේය.

"ඔව්. පොඩි ප්‍රශ්නයක් තමයි පුතා.අපි බලමු."

"තාත්තා දේවක ගෙනත් අහන්න."

"මං ඇහුවා.කොල්ලා කියන්නේ මේ ගැන හොයන්න කියලා. ඒත් සීගිරි එක හදන වැඩවලට බාධාවක් කරන්න එපා කියලා. ඒක කරගෙන යන්න දෙන්න කියලා කියන්නේ."

මිලින්ද යමක් සිතුවේය.

"එහෙම වුනොත් ලොකු ප්‍රශ්නයක් තමා තාත්තේ."

"ඔව්. මටත් හිතෙනවා. ඔයා රෑට එන්නකෝ. අපි බලලා කතාකරමු."

රඹුක්වැල්ල මහතා කීවේය. මිලින්ද කතාකර දුරකථනය තියන්නටත් පෙර සුරංගි කතාකළාය. ඇය කතාකළේ පරල වූ ලෙසය.

"මේ කොහෙවත් යන හොරුන්ට පෝස්ට් දීලා ලස්සනට තිබ්බ සීගිරි එක තාත්තා කඩන්න දුන්නා. දැන් අපේ කොල්ලන්ටවත් දෙයක් කරගන්න බෑ. මොකක්ද තාත්තා මේ කරන්නේ. අපේ දරුවන්ට තියෙන දේවල් ඇයි මෙහෙම විනාස වෙන්න අරින්නේ."

සුරංගිගේ හදිස්සි පරලවීම

රඹුක්වැල්ල මහතා ගණන් ගත්තේ නැත.

"දැන් ඔයා ඕක කියන්නද මට කතාකළේ"

රඹුක්වැල්ල මහතා ඇසුවේය.

"මම තාම කතාකළේ නෑ තාත්තේ. රෑට එන්න ඉන්නේ. තාත්තා හිතන්නේ අපි නිකං ඉඳී කියලද?"

සුරංගි කීවේ එපමණකි. මේ සියල්ලටම මුහුණ දෙනවා කියා රඹුක්වැල්ල මහතා සන්සුන්ව සිතුවේය.

නේත්‍රා රෝද පුටුවත් කරකවාගෙන රඹුක්වැල්ල මහතාගේ කාර්යාල කාමරයට ආවාය. සීයා ඉන්නේ ප්‍රශ්නයකින් බව නේත්‍රා දනී. මුළු සීගිරි එකම කඩාදමා අවසානය. මේ සියල්ල අලුතින් ගොඩනඟන

සැළසුම් ඇත්තේ දේවක ළඟය. දැන් කොල්ලා ඉන්නේ චෝදනා පත්‍රයක් අතැතිවය.

"සීයා."

නේත්‍රා කතාකළේ සන්සුන්වය.

"ලොකු පුතේ."

"සීයට මොකක්හරි දැනෙන්නේ නැද්ද"

නේත්‍රා ඇසුවාය.

"එහෙම කිව්වේ පුතේ."

නේත්‍රා බැලුවාය.

"මේ වෙන දේවල් එක පිට එක වෙනවා වගේ නේද?දැන් ඔය කතාකළේ ලොකු නැන්දා නේද?"

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

"මම මේක හොයන්නම් සීයා. සීයා ඒක හිතන්න එපා."

"ඒක හොයන එකට වඩා දැන් තියෙන්නේ මේවට මුහුණදෙන එකනේ ලොකු පුතේ."

රඹුක්වැල්ල මහතා කීවේය.

"මොනවා වුණත් අපිට මේ කොල්ලව විශ්වාස කරන්න වෙනවා සීයා."

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය. එය අමාරු දෙයක් නොවේ.

"ස්ටාෆ් එක ඇවිත් කියනවා ස්ටාෆ් මීටින් එකක් තියන්න කියලා."

ඔහු කීවේය.

"අපි හෙට කතාකරලා කියමු. වංචාවක් වුණාම හැමෝම කලබලවෙනවනේ සීයා. ඒකයි"

රඹුක්වැල්ල මහතා හිස වැනුවේය.

# 46

දේවක බෝ සෙවණ අවන්හලේ උඩු මහළට ගියේ ආප්ප ටිකක් ඇණවුම්කර ක්‍රීම් සෝඩා බෝතලයක්ද රැගෙනය. ඔහු මහා පිපාසාවකින් උන්නාක් මෙන් ක්‍රීම් සෝඩා බෝතලයෙන් බාගයක්ම බීගෙන බීගෙන ගියේය.

හිත අද ටිකක් හෙල්ලී ඇති බව දේවකටද වැටහෙයි. මේ වාගේ දරුණු චෝදනාවකට මේ මුහුණ

දෙනවාමය. පොල් අතු සෙවිලිකළ බෝ සෙවණ අවන්හලේ උඩු මහලේ උන්නේ දේවක ඇරුණු කොට පෙම් යුවළක් පමණි. ඔවුන් එකිනෙකාගේ අත් අල්ලාගෙන ඔවුන්ගේම ලෝකයක තනිවී උන්නෝය. එකම බටයකින් පෝටෙලෝ බොමින් ඔවුන් සිටින්නේ කොතරම් සැහැල්ලු සැනසීමකින්දැයි දේවක සිතුවේය.

ඒ සමනළ සැහැල්ලු බව තමාගේ හිතට නැත. ඔහුගේ සිතට මහා දුකක් දැනුණි. ජීවිතය පටන් ගනිද්දීම ප්‍රශ්නවලින් පිරී ගිය කටුක අත්දැකීම් ගොඩකට තමාට මුහුණදෙන්නට වුවා නොවේද කියා දේවකට සිතුණි. මේ සියල්ල හැරදමා ගොස් පොඩි රස්සාවක් කර හවසට ගෙදර ඇවිත් සිංදුවක් අසා සැහැල්ලුවෙන් ඉන්නට තිබුණා නොවේද කියා දේවක

සිතුවේය.

එහෙත් එය සිතන මොහොතේම ඔහුගේ හදවත පුරා ඇයගේ අති විශාල සමීප රූපයක් මතුවිය. දේවක මොහොතකට ඇස් පියාගෙන ඒ රුව දෙස බලාගෙනම උන්නේය.

ඔහු යටිතොල හපාගෙන උන්නේය. 'මේ හැම දුකක්ම මැද්දෙන් ඔයාගේ හමුවීම උනානේ කියලත් හිතෙනවා.' දේවක සිතුවේය.

භාවනා බෝ සෙවණේ උඩු මහළට ආවේ සන්සුන්වය. ඇය මුළින්ම දැක්කේ එහි උන් පෙම්වතුන් යුවළය. ඇය උඩට එන වෙලාවේ කෙල්ල උන්නේ පහත්වී කොල්ලාගේ අත සිපගනිමිනි. ඒ දර්ශනයෙන් කෙල්ලගේ හිතපුරා මොකක්ද දෙදරීමක් ඇතිවිය.

යුවතිය තරුණයාගේ අත සිපගෙ නම උන්නාය. භාවනා අමාරුවෙන් දෙනෙත් එහෙට මෙහෙට කළාය. ඇය දේවකව දැක්කේ පසුවය.

දේවකව දකින වෙලාවේ ඔහු උන්නේ දෑස් පියාගෙන ඇඟිලිතුඩුවලින් ඇස් තදකරගෙ නය. භාවනා අත් බෑගයේ පටියට අල්ලාගෙන මොහොතක් බලාගෙන උන්නාය. 'ඔයාට දුකයි.එහෙම නෑයි කියන්න බෑ. පව්' ඇය සිතුවාය. භාවනා දේවක වෙත ගියේ සන්සුන්වය. ඇයගේ අත ගියේ ඔහුගේ හිස අසළටය. එහෙත් ඇය අත ගත්තාය.

"දේවකයියේ."

භාවනා කතාකළාය. දේවක ගැස්සීමෙන් දෑස් විවරකළේ එවිටය.

ඔහු දැක්කේ තමා ළඟම සිටගෙන බලාගෙන උන් භාවනාවය. ඇයි හමුවූයේ අසාමාන්‍ය ලෙසිනි. භාවනා ටික වෙලාවක් බලාගෙනම උන්නාය.

"ඇයි මේ ඇසුත් එක්ක රතුවෙලා."

ඇය ඇසුවාය.

"අනේ නෑ සුද්දි මේ. ත්‍රී වීල් එකේ එද්දී දූවිල්ල ගිහින්."

'ඔයාට බොරු කියන්න දන්නේ නෑ' ඇය සිතින් කීවාය.

"ම්"

භාවනා දේවක අසළ තිබූ පුටුවට බරවූවාය. ඇයගේ දෙනෙත් ගියේ ඔහු අසළ තිබූ ක්‍රීම් සෝඩා බෝතලයටය. එයින් බාගයක්ම ඔහු බී ඇත.

"තිබහයි"

ඇය ක්‍රීම් සෝඩා බෝතලයට අත

ගෙන ගියේ එහෙම කියාගෙනමය.

"ඉන්න මම ස්ට්‍රෝ එකක් ගෙනත් දෙන්නම්."

ඔහු නැඟිටින්නට ගියේය. භාවනා අතින් ඔහුව නැවැත්තුවේය.

"ඉන්න."

දේවක බලාගෙන සිටිද්දීම භාවනා ඔහු මුව ගෑ බටයෙන්ම ක්‍රීම් සෝඩා බෝතලයේ ඉතිරි බාගය නිමා කළාය. පසුව ගුඩුස් එකක් ඇර සිනාසුනාය. දිලිසෙන දෑස් හමුවිය. ඇයට නිකමට මෙන් යළිත් පෙම් යුවළ දෙස බැලුණි. කෙල්ල ඉන්නේ කොල්ලාගේ අත ඉල්ලාගෙන මොනවද අත්ලේ අඳිමිනි. භාවනා  තොල්පට මුව තුළට දමාගෙන සිනාසුනාය. 'මටත් කාගෙ 'හරි අතක් ඉල්ලගෙන මොනවාහරි ලියන්න හිතෙනවා' ඇයට කියන්නට

හිතෙන්නේ මේවාය.

"ඒවා බලන්න එපා. අපෙත් හැඟීම් ඇවිස්සෙනවා."

ඔහු කීවේය. භාවනා ඔහුගේ අතට ගැසුවාය.

"ඒ දෙන්නව දැක්කම මොනවද දන්නවද මට හිතුණේ මිස්."

කෙල්ල රැව්වාය. කවුරුවත් නැති තැන තමාට මිස් කිව යුතු නැත.

"ම්."

"ඔය තියෙන සැනසීම නෑනේ කියලා හිතුණා"

දේවකගේ වචන භාවනාගේ සිතට ගෙන ආවේ බරකි. තමා එද්දී ඔහු අරම උන්නේ කළකිරීමෙන් ඔද්දල්වූ සිතින්ද??

"දේවකයියේ."

ඇය පහත් හඬින් කතාකළාය.

"හරි දුකෙන් නේද ඉන්නේ."

ඇය ඇසුවාය. ඔහු කතාකළේ නැත.

"මං දන්නවා. ඔය මූණ දැක්කොම මට පේනවා. මම හිතුවේ නෑ එච්චරම වැටෙයි කියලා."

දේවකට දුකක් දැනුණි.

"මට ඒ චෝදනාව දරාගන්න බෑ සුද්දි."

ඔහු ඇත්තම කීවේය. ඇයගේ හදවතම කැපීගෙන ගියේය. එය කොතරම් දරුණු චෝදනාවක්ද කියා භාවනාද දනී.

"මට දුක නෑ කියලද හිතන්නේ."

ඇය ඇසුවාය. ඔහු ඇයගේ දෑස් දෙස බලාගෙනම උන්නේය. භාවනාගේ යටි පතුල්වල සිට ඇවිලීමක් උඩට ආවේය. තමා දෙස

කිසිවෙක් එසේ බලා නැත. එය විශ්වාසය.

"මේක ප්ලෑන් කරලා කරපු දෙයක්."

"මාව කොටුකරන්න."

ඔහුද කීවේය. භාවනා හිස වැනුවාය.

"සුද්දි මට මේක කලින් කිව්වා."

"මට දැනුණා."

"ස්ටාෆ් එක පුදුම කතා කියන්නේ. සමහරු මගේ මූණටම. අවුරුදු දහයක්වත් ගාන්න බඩු දැන් තියෙනවා නේද කියලා කවුද ඇහුවා."

භාවනා තොල්පට දසන් අතරට තදකරගෙන උන්නාය.

"මේ පටන් ගත්තා විතරයි."

ඇය කීවාය. දේවකද හිස වැනුවේය.

"මට දැන් හරි බයයි.මට මේක කරගන්න බැරිවෙයි කියලා. සර් කොයිවෙලාවක හරි."

"ඒක වෙන්න දෙන්නේ නෑ."

"නෑ සුද්දි. ආයතනවල වැඩකරන විදිහක් තියෙනවා. එතනදී හැඟීම් බලපාන්නේ නෑ. තීරණ ගන්නේ වෙනස් විදිහට."

ඔහු කීවේය. හදිස්සියේම ඔහු මේසය මත තිබූ භාවනාගේ අතක් අල්ලාගත්තේය. එය භාවනා බලාපොරොත්තු වූ දෙයක් නොවේ. එහෙත් ඔහුගේ අතින් එන රස්නය ඇය දරාගත්තාය. එය සන්සුන් මොහොතක් විය.

"මට එක දෙයක් පොරොන්දුවෙන්න සුද්දි."

ඇය බලාගෙනම උන්නාය.

"මම සීගිරි එක හදන ප්ලෑන් එක ඔක්කොම හරියටම කියන්නම්. සුද්දි මේක කරන්න. සමහරවිට මට යන්න වෙයි."

දේවක ප්‍රථම වරට කීවේය. එවන් දෙයක් වෙන්නට යන බව ඔහුට ඉවෙන් මෙන් දැනුණි. භාවනාගේ දෙනෙත් පලාගෙන මෙන් කඳුළක් කඩාගෙන වැටුණේය.

"දේවකයියේ."

ඇය කතාකළාය.

"ම්."

කියන්නට ගිය දේ කියාගන්න බැරුව මෙන් ඇය මොහොතක් බලාගෙන උන්නාය.

"එ.හෙම ඔයාට යන්න දෙයි කියලා හිතනවදම්.මේ මම."

එහෙම දෙයක් කිව්වේ ඇයි?

කියන්නට ගියේ එයමද? නැත්නම් වෙන දෙයක්ද?

"ඒත්."

"ඔයාට එහෙම යන්න දෙන්න බෑ.කවදාවත් බෑ.ඒකට ගොඩක් හේතු තියෙනවා.මේ වෙලාවේ කියන්න බෑ."

භාවනා කීවාය. දේවක ඇයගේ සුරත දෙසම බලාගෙන මොහොතක් උන්නේය.

"මමත් කවදාවත් එහෙම යන්න හිතුවේ නෑ සුද්දි."

ඔහු අසරණව කීවේය.

"ඇයි ඒ."

ඇය ඇසුවාය. අහන්නට ගිය ප්‍රශ්නයට උත්තර ඔහුගේ වදන් අස්සෙන්ම සොයාගන්නට ඇත්නම්!

"මේ වෙලාවේ ඒක කියන්න බෑ."

"කවදද එහෙනම් කියන්නේ."

ඇය ඇසුවාය. භාවනාගේ දෙනෙත් තිබුනේ ඔහුගේ දෑස්වලට ඇලීය.

"දවසක් එයි."

"මිඳවසක් එයි."

ඇයද එය ප්‍රතිරාවය කළාය.

"මේ වෙලාවේ මේ වැඩ අවුල්වෙන්න දෙන්න බෑ.මම හැමදේම රෑට කියන්නම්. හෙට ඉඳලා ටිකක් ඒකට අටෙන්ඩ් වෙන්න පුළුවන් වෙයි නේද?"

ඇය හිස වැනුවාය. ඔහු කියනා සමහර දේවල් ප්‍රායෝගික වෙන්නට පුළුවන.

"හිතාගෙන උන්න හැමදේම ඒ විදිහටම කරන්නෝන.පොඩ්ඩක්වත් වැරදෙන්න බෑ."

"එහෙම වෙන්නේ නෑ. මම

ඉන්නවනේ."

දේවකගේ හිතට සැනසීමක් දැනුණි.

"සමහරවිට අද රෑට ගෙදර ලොකු කතාවක් යනවා.එහෙම නෑ කියලා කියන්න මට බෑ. සීගිරි එක ෆැමිලි බිස්නස් එකක්.මේක ගොඩග න්න කාටවත් ඕනකමක් නැතිවුණාට මේකට අයිතිවාසිකම් කියන්න ගොඩක් ඉන්නවා."

"එහෙම වුනොත් සුද්දි."

"මම කියනවා මම හැමදේම බාරගන්නවා කියලා.එයාලට බෑ මට විරුද්ධවෙන්න."

දේවක හිස වැනුවේය.

"ඒත් දේවකයියේ මම කියලා කෙනෙක් නෑ."

ඇය කීවාය. දේවක දෙනෙත්

එසෙව්වේය.

"මාව ගයිඩ් කරන්න. ඔයා වෙනුවෙන් මම මේක කරන්නම්.ම්."

දේවකගේ අත ඇගේ අත මතට වැටුණි. ඔහු ප්‍රථම වරට සිනාසුනේය. භාවනාගේද මුවඟ තුනී සිනාවක් නැගිණ.

"හිනාවෙනකොටනේ ලස්සන."

ඇය කීවාය. ඔහු පොඩි දරුවෙකු සේ හිස කැසුවේය.

"මේක අප්පච්චිට අද මම කියනවා. එයාට නොකියා ඉන්න බෑ. හදිස්සියේ මාව"

ඇය බැලුවාය. එහෙම දෙයක් විය හැකිද?

"සුද්දි යන්න.රෑ වෙනවා."

ඔහු දුබල හඬකින් කීවේය.

"මම අද තව පැය දෙකක් විතර

ඉඳලා යනවා.කරන්න ඕන හැමදේම මම රෑට කතාකරලා කියන්නම්."

"මි පරිස්සමින්."

ඇය උන් අසුනෙන් නැගිටින්නේ නොමැතිව මොහොතක් බලාගෙන උන්නාය. පසුව පපුවම හිස්කර මෙන් සුසුමක් හෙළා නැගිට්ටාය.

සීගිරි දෙවන කොටස
මින් නිමා වේ.

සීගිරි එකෙන් දේවකට සදහටම
සමුගන්න වේද..?
සිය මවගේ උරුමයෙන් සීගිරි සුපර් වෙත
පය තැබූ දේවක සීගිරි එකට
පමණක් නොව මුළු කොළඹටම
අද රාත්‍රියේ සමු දෙයිද..?
භාවනා සිය හදවතේ උපන් කුළුඳුල් ප්‍රේමය
එහෙමම හදවතේ ගල් කර ගනීද..?
මේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු රැගෙන
සීගිරි 3
දැන් ඩවුන්ලෝඩ් කරගත හැක.